246 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 246 - இல. 7
Volume 246 - No. 7

2016 සැප්තැම්බර් 22 වන බ්‍රහස්පතින්දා
2016 செப்ரெம்பர் 22, வியாழக்கிழமை
Thursday, 22nd September, 2016


# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
පාර්ලිමේන්තුව ස්ථාවර නියෝගවලට අනුව කටයුතු නොකිරීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

වතු කම්කරුවන්ට නිවාස ලබා දීම
දිවි නැගුම සංවර්ධන නිලධාරින් බඳවා ගැනීම සඳහා වූ තරග විභාගයේදී අපේක්ෂකයන්ට සිදු වූ අසාධාරණය

**විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත :**

දෙවන වර සහ තුන් වන වර කියවා සම්මත කරන ලදි.

**කල්තැබීමේ යෝජනාව :**

සිරියානු අර්බුදයට සාමකාමී විසඳුමක්

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
பாராளுமன்ற நிலையியற் கட்டளைகளுக்கு அமைந்தொழுகாமை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

தோட்டத் தொழிலாளர்களுக்கு வீடுகள் வழங்குதல்
திவிநெகும அபிவிருத்தி உத்தியோகத்தர் ஆட்சேர்ப்புக்கான திறந்த போட்டிப் பரீட்சையில் அபேட்சகர்களுக்கு ஏற்பட்ட அநீதி

**பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம் :**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

சிரியா பிரச்சினைக்குச் சமாதானத் தீர்வு

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Nation Building Tax (Amendment) Bill: Determination of the Supreme Court
Non-compliance with Standing Orders of Parliament

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Provision of Houses for Estate Workers
Injustice Caused to Candidates at the Competitive Examination for Recruitment of Divineguma Development Officers

UNIVERSITIES (AMENDMENT) BILL:

Read a Second, and the Third time and passed

ADJOURNMENT MOTION:

Peaceful Resolution to the Syrian Conflict

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2016 සැප්තැම්බර් 22 වන බ්‍රහස්පතින්දා***
*2016 செப்ரெம்பர் 22, வியாழக்கிழமை*
*Thursday, 22nd September, 2016*

**පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### NATION BUILDING TAX (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේදී අභියෝගයට ලක් කරන ලද "ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

එකී පනත් කෙටුම්පත, සමස්තයක් වශයෙන් හෝ එහි විධිවිධාන කිසිවක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.



***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**A BILL TITLED, "NATION BUILDING TAX (AMENDMENT)"**

**In the matter of an application under and in terms of Article 121 read with Article 120 and Article 83 of the Constitution to determine whether the above Bill is inconsistent with the Constitution of the Democratic Socialist Republic of Sri Lanka**

**BEFORE**

| | | |
|---|---|---|
| K. Sripavan | - | Chief Justice |
| Anil Gooneratne, | - | Judge of the Supreme Court |
| Prasanna S. Jayawardena, P.C. | - | Judge of the Supreme Court |

**S.C.(S.D.) No.34/2016**

| | |
|---|---|
| **Petitioner** | P. Liyanaarachchi, Attorney-at-Law, "Saketha", Midellawita Road, Galahitiyawa, Ganemulla. |
| **Counsel** | Dharshana Weraduwage |
| **Respondent** | Hon. Attorney General, Attorney-General's Department, Colombo 12. |
| **Counsel** | Mrs. Farzana Jameel P.C., Additional Solicitor General with Yuresha de Silva, Senior State Counsel |

Court assembled for hearing on 20th September 2016.

The Bill titled "Nation Building Tax (Amendment)" which seeks to amend certain provisions of the Nation Building Tax Act No. 9 of 2009 was challenged by the Petitioner as to its constitutionality.

The Petitioner alleges that Clauses I, 2(2)(a)(iii), 2(2)(b), 4(2)(b) and 5 violate Articles 03,04,12(1), 13(6), 27(1), 27(2)(a),111(c) of the Constitution. The main argument of the Petitioner is that the aforesaid Clauses, purporting to have retrospective operation violate Articles 03, 04 and 12(1) of the Constitution.

Article 75 of the Constitution empowers the Parliament to make laws including laws having retrospective effect. Thus, it is well recognized that the power to legislate includes the power to legislate prospectively as well as retrospectively. This Court expressing its view in respect of a Special Determination on the Bill titled "Code of Criminal Procedure (Special Provisions)" S.C. S.D. 16/2012 and S.C. S.D. 17/2012 noted as follows with regard to the enactment of retrospective legislation.

> *"Retrospective legislation would in most instances validate or invalidate the rights of parties and therefore the mere fact that in this instance Clause 8 validates the acts referred to therein with retrospective effect does not necessarily mean that it constitutes a usurpation of judicial power by the legislature".*

Further, in relation to the **Inland Revenue (Amendment) Bill** S.C.S.D. 3/1980, this Court made the following observations:-

> *".....This is however, fiscal legislation and it is a matter for the legislature to decide what consideration relating to the amelioration of hardship or to the interests of the economic progress of the people should be given effect to. Presumably this provision is sought to be enacted on the basis of economic consideration in respect of which the decision must **largely be left to the legislature in view of the inherent complexity of fiscal adjustment of diverse elements that requires to be made."*** (emphasis added)

[ගරු කථානායකතුමා]

Thus, once the legislature decides to give retrospective operation to the Nation Building Tax (Amendment) Bill with effect from 1st January 2016, the Court should not substitute its own opinion for the opinion of the legislature. As Warrington L.J. in ***Short** Vs. **Poole Corp* (1926) C.H. Division 60(91)** stated that *"with the question whether a particular policy is wise or foolish the Court is not concerned; it can only interfere if to pursue it is beyond the powers of the authority."* Accordingly, the power to tax retrospectively is an incident of sovereignty and is co-extensive with the subjects to which the sovereignty extends. It is unlimited in its range acknowledging in its very nature no limits so that security against its abuse, if any, is to be found only in the responsibility of the legislature which imposes the tax on the people who are to pay it.

Learned Counsel for the Petitioner submitted that Clause 4(2)(b) of the Bill introduces Nations Building Tax in addition to the existing tax on telecommunication levy. In the case of *Ananthakrishnan* Vs. *Madras* AIR (1952) 395 at 408 the Court observed as follows :-

> *"The Law undoubtedly is that the sovereign power of taxation is absolute, that it could be exercised up to any limit, that the determination of that limit is for the legislature and that it knows no limitations except what are prescribed by the Constitution. The laws fixing taxes cannot be questioned on the ground that the tax is heavy and oppressive ...."*

Thus, it is well established in taxing matters, the legislature has the greatest freedom in selecting persons or objects it will tax and such steps taken by the legislature is not open to attack on the basis that the legislature taxes some persons or objects and not others. Once the legislature decides the limit within which the law applies, the law cannot operate unequally within the limit so decided by the legislature.

This Court in S.C. Special Determination No. 17/1997 (Bill to Amend the Inland Revenue Act No. 28 of 1979) referred to the approach that should be followed by Court with regard to taxing Statutes as follows:-

> *"The principles that govern the approach of the court to taxing statute, where the basis of classification is challenged, were lucidly set out by Hedge J. in the following terms:*
>
> *It is not in dispute that taxation laws must also pass the test of article 14. That has been laid down by this court in Moopil Nair v. State of Kerala (1961 3 SCR 77). But as observed by this court in East India Tobacco Co. vs. State of Andhar Pradesh (1963 1 SCR 404, 409), in deciding whether the taxation law is discriminatory or not it is necessary to bear in mind that the State has a wide discretion in selecting persons or objects it will tax, and that a statute is not open to attack on the ground that it taxes some persons or objects and not others; it is only when within the range of its selection, the law operates unequally, and that cannot be justified on the basis of any valid classification, that it would be violative of article 14. It is well settled that a State does not have to tax everything in order to tax something. It is allowed to pick and choose districts, objects, persons, methods and even rates for taxation if it does so reasonably.*

*Mr. Goonewardena cited the decision of the Supreme Court of India, Kerala Hotel Restaurant Association vs. State of Kerala and others, 1990 S.C. cases (Tax 309) where Verma J. stated "The extent to which the revenue is required from a particular source is a matter of fiscal policy and if the legislature chooses to be satisfied with the raising of that amount alone which can be recovered from the affluent, it cannot be faulted for not dragging the impecunious also in the tax net. Even otherwise the play in the joints permitted to the legislature for making classification in a taxing provision is greater....." In the course of his judgment Verma J. cited the following passage from the judgment of Venkarachaliah J. in the case of P.M. Ashwathanarayana Setty vs. State of IKarnataka (1989) Supp (1) SCC 696) : "Though other legislative measures dealing with economic regulations are not outside article 14, it is well recognized that the State enjoys the widest latitude where measures of economic regulations are concerned. These measures for fiscal and economic regulations involve an evaluation of diverse and quite often conflicting economic criteria and adjustment and balancing of various conflicting social and economic values and interests. It is for the State to decide what economic and social policy it should pursue and what discriminations advance those social and economic policies. In view of the inherent complexity of these fiscal adjustments, courts give a larger discretion to the legislature in the matter of its preferences of economic and social policies and effectuate the chosen system in all possible and reasonable way."*

The Court therefore does not see any violation of the provisions of the Constitution by imposing Nation Building Tax in addition to the telecommunication levy.

Counsel further argued that the validation Clause, namely, Clause 5, violates Articles 3, 4, 12(1) and 27(1) of the Constitution. The legal effect of the said Clause is to validate certain taxes calculated and collected by the Commissioner-General of Inland Revenue and the Director General of Customs under Sections 4 and 5 respectively of the principal enactment from persons to whom the Act applies and further to provide that such provisions shall not affect any decision or order made by any Court or any proceedings pending before any Court in respect of any such tax collected.

This Court while expressing its determination on the "Powers of Attorney (Amendment) Bill – S.C. (S.D.) 8/2013 quoted with approval the following passage from M.M. Seervai in constitutional Law of India" 4th Edition, Vol 3 – page 2311.

Citing the Supreme Court judgment of India in ***Mahal Chand Sethia*** Vs. ***W.B. (cr. App 75 of 1969)*** Seervai states:

> "An *Amending Act simpliciter will cure the defect in the statute only prospectively. But as a legislature has the competence to pass a measure with retrospective effect, it can pass an Amending Act to have effect from a date which is past. Usually legislatures pass Acts styled Amending and Validating Acts, the object being not only to amend the law from a past*

*date but to protect actions already taken which would otherwise be invalid as done without legislative sanction. There is nothing in our Constitution which creates a fetter on legislature's jurisdiction to amend laws with retrospective effect and validate transactions effected in the past."*

Accordingly, the Bill which seeks to give effect to validate certain taxes collected from persons to whom this Act applies with effect from 1st January 2016 is not inconsistent with the provisions of the Constitution.

In the circumstances set out above, we determine that neither the Bill as a whole nor any of its provisions thereof is inconsistent with the Constitution.

K.SRIPAVAN
CHIEF JUSTICE

ANIL GOONERATNE
JUDGE OF THE SUPREME COURT

PRASANNA S. JAYAWARDENE, P.C.
JUDGE OF THE SUPREME COURT

---

** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]*
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

## II

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
## MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESSS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2016 සැප්තැම්බර් මස 22වන බ්‍රහස්පතින්දා එනම්, අද දින අපර භාග 4.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගීවන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම්දීමට කැමැත්තෙමි.

## III

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුව කටයුතු නොකිරීම
## பாராளுமன்ற நிலையியற் கட்டளைகளுக்கு அமைந்தொழுகாமை
## NON-COMPLIANCE WITH STANDING ORDERS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විශේෂයෙන්ම මෙය ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය සඳහායි. පාර්ලිමේන්තු සභා ගර්භයේදී එකිනෙකාට චෝදනා කර ගනිමින් ස්ථාවර නියෝගවලට පටහැනිව ක්‍රියා නොකරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. ඊයේ එවැනි සිද්ධීන් කිහිපයක් ඇති වුණා. මෙය පාර්ලිමේන්තුවේ ගරුත්වයට ද හානිකර බව අප තේරුම් ගත යුතුයි.

එමෙන්ම පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඊයේ සිවුපා හඬ නඟමින් ක්‍රියා කළ ආකාරය ගැන ජනතා අවධානය යොමු වී තිබෙනවා. එම හැසිරීම අදාළ මන්ත්‍රීවරුන්ගේ මෙන්ම, ඔවුන් නියෝජනය කරන දේශපාලන කණ්ඩායමේ කීර්ති නාමයට ද කැළැලක් බව පෙන්වා දෙන අතර ඉදිරියේදී එවැනි සිද්ධීන් ඇති වුවහොත් ස්ථාවර නියෝග අනුව මට දැඩි පියවර ගැනීමට සිදු වන බවත් දැන්වීමට කැමැත්තෙමි.

තවද, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව මන්ත්‍රීවරුන් නිතරම කටයුතු කළ යුතු බවටද මා අවධාරණය කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා 2016 ජනවාරි 01 වැනි දින සිට 2016 අප්‍රේල්

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

07වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 125 යටතේ පිහිටුවා තිබෙන පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා විධියට 2015 නොවැම්බර් මස 26වන දින පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් 26දෙනෙකු විසින් මාව තෝරා පත් කර ගත්තා. ඉන් අනතුරුව, මේ සියලුම සාමාජිකයින්ගේ සහයෝගය, දායකත්වය මත ජනවාරි මස 09වැනි දින සිට අප්‍රේල් මස 07වැනි දින දක්වා ආයතන 41ක් අපි මෙම කාරක සභාවට කැඳවා, විශේෂයෙන්ම අද ඉදිරිපත් කරනු ලබන පිටු 139කින් යුතු මෙම වාර්තාවේ පොදු නිරීක්ෂණ 16ක් ඇතුළත් කර තිබෙනවා. එම නිරීක්ෂණවලින් 09ක් විශේෂ නිරීක්ෂණ. ඒ වාගේම මෙම ආයතන 38 සම්බන්ධව වෙන් වෙන් වශයෙන් කරුණු 268ක් පිළිබඳව අපි අනාවරණය කර ගත් තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් කරලා තිබෙනවා.

1978 වර්ෂයේ රැස් වූ පළමුවෙනි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිට මේ දක්වා රැස් වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා 11ක් මඟින් පාර්ලිමේන්තුවට මෙවැනි වාර්තා 31ක් ඉදිරිපත් කරලා තිබෙනවා. අද අපි ඉදිරිපත් කරනු ලබන්නේ 32වැනි වාර්තාවයි. අවුරුද්දක් තුළ කැඳවූ ආයතනවල තොරතුරු පරීක්ෂා කරලා ඒ අවුරුද්ද තුළදීම වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන පළමුවෙනි අවස්ථාව මෙයයි. ඒ සම්බන්ධයෙන් අපේ කාරක සභාවේ සියලුම සාමාජිකයින් ඉතාමත් සතුටු වනවා. මීට පෙර පැවැති කාරක සභාවන් ඉතාමත් හොඳින් ඒ යුතුකම් හා වගකීම් ඉටු කරලා තිබෙනවා වාගේම, මේ අවුරුද්දේ මාස හතරක් තුළ ආයතන 38ක් කැඳවා මේ අවුරුද්ද තුළදීම අදාළ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මෙවර මා සභාපතිත්වය දැරූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවටත් පුළුවන්කම ලැබුණා. ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මඟින් පත් කරනු ලැබූ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා සභාපතිත්වය දරන අනුකාරක සභාවේ කටයුතු ද මේ වන විට කර ගෙන යනවා.

විශේෂයෙන්ම අපේ කාරක සභාවෙන් අනාවරණය වුණු ප්‍රධාන කරුණක් තමයි, අපේ රටේ රාජ්‍ය ආදායමට දායක වන කිසිදු ප්‍රධාන ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳව භාවිතයක් නොමැති වීම. ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මේ ආයතනවලින් කිහිපයක්. මේක ප්‍රධාන ප්‍රශ්නයක්. එම නිසා අනුකාරක සභාව මේ පිළිබඳව ඉතාම හොඳින් අවධානය යොමු කරමින්, මේ මාසය අවසාන වන විට අපේ රටේ රාජ්‍ය ආයතනවල පරිගණක භාවිතය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරලා, මේ අවුරුද්ද අවසාන වන විට අදාළ අමාත්‍යාංශ විසින් ඒ අනුව කටයුතු ක්‍රියාත්මක කරයි කියා අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම, දෙසැම්බර් මාසය තුළ තවත් ආයතන 50ක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තවත් වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අවශ්‍ය ක්‍රියා මාර්ග මේ වන විට ගනිමින් සිටිනවා.

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අපි මේ කරනු ලබන්නේ පශ්චාත් පරීක්ෂණයක් පමණක් බව. යම් යම් ආයතනවල, යම් යම් දෙපාර්තමේන්තුවල අඩු පාඩුකම් සිද්ධ වුණාට පස්සේ විගණකාධිපතිවරයා ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අපි පශ්චාත් පරීක්ෂණ පවත්වනවා. මේ දේ හැම දාම කරමින් සිටීම තුළින් පමණක් "නිසි වගකීම් ඉටු වුණා"ය කියන්න පුළුවන්කමක් අපට ලැබෙන්නේ නැහැ.

අපේ රටේ මූල්‍ය පාලනයේ වගකීම පැවරෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ මූල්‍ය පාලනය පිළිබඳ වගකීම ඉටු කරනු ලබන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් තුළින්. ඒ නිසා පශ්චාත් පරීක්ෂණ කිරීම තුළින් පමණක් මේ වගකීම හරිහැටි ඉටු කළාය කියන්න අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර කාරක සභාවත් සමඟ එක්ව මේ වගකීම් ඉටු කිරීම සඳහා නව ක්‍රමවේද ගණනාවක් අද වන විට හඳුන්වා දීලා, ක්‍රියාත්මක කරමින් තිබෙනවාය කියන කාරණයත් මා ඉතාම සතුටින් හා වගකීමකින් යුතුව ප්‍රකාශ කරන්න ඕනෑ.

එහි පළමු පියවර වශයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට විශේෂ ඒකක 19ක්, අමාත්‍යාංශ 51ක්, දෙපාර්තමේන්තු 89ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක්, පළාත් පාලන ආයතන 325ක්, පළාත් සභා 09ක්, සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 314ක් වශයෙන් ආයතන 842ක් කැඳවීමට බලාපොරොත්තු වනවා. ආයතන 842ක් එක කාරක සභාවකට කැඳවන්නේ කොහොමද කියන එක පිළිබඳව අමුතුවෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා ඒ ආයතන 842 සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව මේ වන විට ඉතාම සාර්ථක පරිගණක වැඩසටහනක් සකස් කරලා තිබෙනවා. ඒ සෑම ආයතනයක්ම ඒ පරිගණක වැඩසටහන අනුසාරයෙන් නිරීක්ෂණයට ලක් කිරීමේ හැකියාවක් තිබෙනවා. නියාමක වැඩසටහනක් විධියට අද එය ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ලබන අවුරුද්ද තුළ ඒ වැඩසටහන හඳුන්වා දීලා, ඒ ආයතන 842ම වාර්ෂික ඇගැයීමකට ලක් කරලා, ඒවා පිළිබඳව සොයා බලලා, එයින් ලැබෙන තොරතුරු අනුසාරයෙන් දුර්වල ආයතන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කැඳවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒක අනිවාර්යයෙන්ම සිදු කළ යුතු කරුණක්. අපේ නියාමක ව්‍යාපෘතිය ඉතාම සාර්ථකයි. දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සඳහා අපි ඒ අත් හදා බැලීම් කරලා තිබෙනවා. අද එහි සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවා. ඒ අනුව ලබන අවුරුද්දේ අපි බලාපොරොත්තු වෙනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට ලක් කළ යුතු අපේ රටේ සියලුම ආයතන එම පරිගණක වැඩසටහන අනුසාරයෙන් අධීක්ෂණය කිරීමට. ඒ වාගේම, අපි යම් කිසි ආකාරයක ඇගයීමක් කළ යුතුයි. හැම දාම අඩුපාඩුකම් පෙන්වීමෙන් පමණක් මේ කාර්යය කරන්න අපට පුළුවන්කමක් නැහැ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ලැබෙන ගැටලු අඩු වුණොත්, ඒකත් හොඳ දෙයක්. ඒ තත්ත්වය තමයි අපි ළඟා කර ගත යුතු වන්නේ.

එක් ආයතනයක් පිළිබඳව වැරැදි, අඩු පාඩු විශාල වශයෙන් දිගින් දිගටම සිද්ධ වනවා නම්, මේ කාරක සභාවල වගකීම හරිහැටි ඉටු වුණාය කියන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වන්නේ, මෙවැනි වෙනස්කම් රාශියක් ඉටු කරමින් අපේ රටේ මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන වගකීම නිසි පරිදි ක්‍රියාත්මක කරන්නයි. පාර්ලිමේන්තුව තුළ සිටින සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් මේ කාරක සභාව තුළ ඉන්නවා. කිසිදු දේශපාලන පක්ෂ භේදයකින් තොරව, පොදු වගකීම මනාව අවබෝධ කර ගෙන, ඒ සියලුම සාමාජිකයින් කණ්ඩායමක් විධියට ඒ කාරක සභාව තුළ කටයුතු කළ බව මා ඉතාම සතුටින් මේ පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ.

සාමාන්‍යයෙන් මෙවැනි වාර්තාවක් ඉදිරිපත් කළාම විරුද්ධ පක්ෂයේ කවුරුන් හෝ තමයි ඒ පිළිබඳව විවාදයක් ඉල්ලන්නේ. නමුත් මේ ඊයේ අවසාන වාර්තාව පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවේදී, කාරක සභාවේ සියලුම සාමාජිකයින් ඉල්ලීමක් කළා, සියලුම සාමාජිකයන්ට මේ කරුණු පිළිබඳව කථා කරන්න ඕනෑය කියලා. එම නිසා අපේ පාර්ලිමේන්තුවේ කථානායකතුමා මේ පිළිබඳව පක්ෂ නායකවරුන් සමඟ සාකච්ඡා කර, දින 1ක හෝ දින 2ක හෝ දින 3ක විවාදයක් ලබා දීමට අවශ්‍ය කටයුතු

කරන්නය කියන යෝජනාවත් මේ අවස්ථාවේදී මා ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම අය වැය විවාදයට කලින් ඒ කාර්ය භාරය ඉටු කරන්න අපි බලාපොරොත්තු වනවා.

අවසාන වශයෙන්, මා මේ කාරණයත් කියන්න කැමැතියි. මේ කාරක සභාවේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් විශාල පිරිසක් අපට සහයෝගය, දායකත්වය ලබා දෙනවා.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා අපට ඉතාම ස්වාධීනව මේ කටයුතු කර ගෙන යාම සඳහා ලබා දෙන ශක්තිය කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම පාර්ලිමේන්තුවේ කථානායකවරයා විධියට ඔබතුමා මේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා අවශ්‍ය කරන සහයෝගය, දායකත්වය අපට ලබා දුන්නා. ඔබතුමා අපට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය; අවශ්‍ය කරන භෞතික සම්පත්; අවශ්‍ය කරන පුහුණුව ලබා ගැනීම සඳහා දේශීය වශයෙන් හා විදේශ රටවලත් සහයෝගය ලබා ගැනීමට විශාල උත්සාහයක් දරමින් තිබෙනවා. නමුත් මේක තවත් වේගවත් විය යුතුයි. අපි අප්‍රේල් මාසය දක්වා කැඳවූ ආයතන පිළිබඳව වාර්තාව තමයි අද ඉදිරිපත් කරන්නේ.

අපට අවශ්‍ය කරන භෞතික සම්පත් හා මානව සම්පත් පිළිබඳව කථා කරන විට මේ ගැනත් සඳහන් කළ යුතුයි. පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳව අපි ඉතාමත් සුබවාදීවයි දකින්නේ. ඒ අය සුබවාදීව කැපවීමකින් යුතුව කටයුතු කරනවා. නමුත් මේ කටයුතු ශක්තිමත් කිරීම සඳහාත්, තවදුරටත් මේ කටයුතු කඩිනම් කිරීම සඳහාත් යම් වැඩ පිළිවෙළවල් පිළිබඳව අවධානය යොමු කිරීම අනිවාර්යයෙන්ම විය යුතුය කියන එකයි අපි යෝජනා කරන්නේ. එම නිසා ඔබතුමාටත් විශේෂ ස්තුතියක් ප්‍රකාශ කරන අතර, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා, නියෝජ්‍ය මහ ලේකම්තුමා, සහකාර මහ ලේකම්වරුන් මෙන්ම ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජගත් ගජවීර මහත්මයාත්, තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මහේෂ් පෙරේරා මහත්මයාත්, හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ හැන්සාඩ් සංස්කාරකතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත්, කථා පරිවර්තක අංශයේ ප්‍රධානීන් ඇතුළු කථා පරිවර්තක අංශයේ කාර්ය මණ්ඩලයත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් අනුෂා සූරියප්පෙරුම මහත්මිය ඇතුළු පාර්ලිමේන්තු නිලධාරින් සහ සියලුම කාර්ය මණ්ඩලයත් මේ කටයුත්තේ දී ලබා දුන් සහයෝගය අපි මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම විගණකාධිපතිතුමා සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරිනුත් ලබා දුන් සහයෝගය මේ අවස්ථාවේදී අපි කෘතවේදීව සිහිපත් කරනවා.

අපි 26 දෙනා කණ්ඩායමක් විධියට කරන ලද මේ කැපවීම ඉදිරියට තව තවත් ශක්තිමත්ව කර ගෙන ගිහිල්ලා මේ රටේ පාර්ලිමේන්තුවට තිබෙන මුදල් පිළිබඳ පාලනයේ වගකීම, ඒ යුතුකම නිසි පරිදි ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් ඉටු කරනවාය කියන පණිවුඩය ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, එම වාර්තාව මුද්‍රණය කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ඔබතුමා කිවූ පරිදි ඉදිරියේදී මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කිරීමට අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවටත්, කෝප් කමිටුවටත් අවශ්‍ය පූර්ණ සහාය පාර්ලිමේන්තුවෙන් ලැබෙන බවත් මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න කැමතියි.

ඊළඟට, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගැන්වීම.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழுக்களின் அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2015 වර්ෂය සඳහා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව", "2014 සහ 2015 වර්ෂ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා", "2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා", "2013 වර්ෂය සඳහා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව" සහ "2013 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ වාර්ෂික වාර්තාව" සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, කළුතර දකුණ, උග්ගල්බොඩ, ගල් දෙක පාර, මහදූවේගම දරන ස්ථානයෙහි පදිංචි එල්.කේ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අබ්දුල් හලීම් මහතා - පැමිණ නැත.
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - திறன் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Skills Development and Vocational Training)

ගරු කථානායකතුමනි, මාදුරුඔය, ධීවර ගම්මානය, අංක 60/2 යන ලිපිනයෙහි පදිංචි එන්.ඩබ්ලිව්.පී. ජෝෂප් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මාතලේ, උකුවෙල, ගුරුලවෙල, අංක 139 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. රංජිත් වලකුඹුර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(i) බොකලගම, පැලපිටිගම, අංක 218/ඒ යන ලිපිනයෙහි පදිංචි ඒ.පී.ජේ.ඩී. අමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;
(ii) ඇහැලියගොඩ, රජමහා විහාර මාවත යන ලිපිනයෙහි පදිංචි අයි.ඩී.එස්.කේ. ප්‍රේමනායක මහතාගෙන් ලැබුණු පෙත්සම;
(iii) කඩවත, ඇල්දෙනිය, 3වන පටුමග, පෙරමුණ මාවත, අංක 24/ඩී යන ලිපිනයෙහි පදිංචි පී. සනෝජා මදූෂානි ප්‍රනාන්දු මෙනවියගෙන් ලැබුණු පෙත්සම; සහ
(iv) කඩවත, ඉහළ බියන්විල, අංක 305/1සී යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ඩී. දූෂ්මන්ති මෙනවියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, වැරැල්ලගම, ඉඩමේගම, "පුෂ්පසිරි" යන ලිපිනයෙහි පදිංචි පුෂ්පා සංජීවනී ගොඩබැද්දගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(i) උයන්ගොඩ, කරගොඩ, ඉහළ විටියල, "භද්‍රා" යන ලිපිනයෙහි පදිංචි සී. වනිගසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(ii) ගල්කිස්ස, වනරතන පාර, අංක 17/5 යන ලිපිනයෙහි පදිංචි ලංකා දික්කුඹුර මහතාගෙන් ලැබුණු පෙත්සම;
(iii) පුහුල්වැල්ල, කිරින්ද, අම්පිටියවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.ජේ.එම්. රිෆ්කාන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(iv) වැලිගම, වල්ලිවිල, කුරුඳුවත්ත, ජාතික නිවාස, අංක 03 යන ලිපිනයෙහි පදිංචි ආර්. ලයනල් සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, ගනේමුල්ල, කොස්සින්න, අංක 245/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එන්.ඒ.ඩී.එන්. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, යටියන්තොට, කොළඹ පාර, අංක 20 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ.සී.එස්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -547/'16-(1), ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Industry and Commerce, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -742/'16-(1), ගරු බිමල් රත්නායක මැතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව : සේවය අහිමිවූවන්ට වන්දි

அரச வடிசாலைக் கூட்டுத்தாபனம் : சேவை இழந்தோருக்கு இழப்பீடு

STATE DISTILLERIES CORPORATION: COMPENSATION FOR EMPLOYEES

777/'16

3. **ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr) Nalinda Jayathissa)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1973 දී පිහිටුවන ලද රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව 1992දී පුද්ගලික අංශයට විකුණා දමන ලද බව පිළිගන්නේද;

(ii) එහිදී සුළු වන්දි මුදලක් ලබා දී සේවකයන් රාශියක් ඉවත් කළ බව දන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් 1994.10.20 දින පිහිටුවන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව සභාගත කරන්නේද;

(iv) සේවය අහිමි කිරීමෙන් අසාධාරණයට ලක් වූ 2,000ක පමණ සේවකයන් හට සාධාරණ වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1973 இல் நிறுவப்பட்ட அரச வடிசாலைக் கூட்டுத்தாபனம் 1992 இல் தனியார் துறையின ருக்கு விற்கப்பட்டுள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) அதன்போது சிறிய இழப்பீட்டுத்தொகை யொன்றை வழங்கி அதன் ஊழியர்கள் பலர் நீக்கப்பட்டதை அறிவாரா என்பதையும்;

(iii) இது தொடர்பாக 1994.10.20ஆம் திகதி நிறுவப் பட்ட ஜனாதிபதி ஆணைக்குழுவின் அறிக்கை யினைச் சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) சேவை இழக்கப்பட்டதன் மூலம் அநீதிக்குள்ளான சுமார் 2000 ஊழியர்களுக்கு நியாயமான இழப் பீட்டுத்தொகை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) whether he admits that the State Distilleries Corporation established in 1973 was sold to the private sector in 1992;

(ii) whether he is aware of the fact that the service of a large number of employees was terminated after paying a meagre sum as compensation;

(iii) whether the report of the Presidential Commission established in this regard on 20.10.1994 will be tabled; and

(iv) whether action will be taken to provide a reasonable amount as compensation to approximately 2000 employees those who faced injustice when their service was terminated?

(b) If not, why?

**ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)

(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) නැත.

(iii) නැත.

එවැනි වාර්තාවක් මුදල් අමාත්‍යාංශය සතුව නැත.

(iv) නැත.

(ආ) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව පෞද්ගලීකරණයේදී කාර්ය මණ්ඩලයේ කිසිම සේවකයෙකුගේ සේවය අවසන් කර නොමැති බව ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම විසින් මුදල් අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. (අ) හි (iii)ට පිළිතුර වශයෙන්, 1994.10.20 වැනි දින පිහිටුවන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවක් නැහැ කියලා නේද ගරු ඇමතිතුමා කිව්වේ?

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

මුදල් අමාත්‍යාංශයේ එවැනි වාර්තාවක් නැහැ කියන එක තමයි ගරු මන්ත්‍රීතුමනි මම කියන්නේ. ඔබතුමාගේ මේ ප්‍රශ්නයට පසුව සහ මීට පෙරත් ලියලා තිබෙනවා ජනාධිපති කාර්යාලයට, මේ ආකාරයේ සියලුම කොමිෂන් සභාවල වාර්තාවන් තිබෙනවා නම් ඒවා එවන්න කියලා. Presidential Commission on Taxation එකේ වාර්තාව පසු ගිය අවුරුද්දේ අපි සභාගත කළා වාගේ, මේ සම්බන්ධයෙනුත් එවැනි වාර්තාවක් තිබෙනවා නම්, අපි එය ලබාගෙන පාර්ලිමේන්තුවේදී සභාගත කරන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr) Nalinda Jayathissa)

1992දී සේවය අවසන් කරන ලද 2,000ක පමණ පිරිසකගෙන්, සැලකිය යුතු පිරිසක් අපව මුණ ගැහිලා තිබෙනවා.ඔවුන් අතේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ පිටපතකුත් තිබුණා. ඒ නිසා ඔබතුමාට ඒක ඉදිරිපත් කරන්නට මට පුළුවන්. ගරු ඇමතිතුමා, අපි මේ කාරණය දිගින් දිගටම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවටත් ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් මේ ගත වුණු මාස 08 තුළම මුදල් අමාත්‍යාංශය පැත්තෙන් මේ සඳහා උත්තර දීම ප්‍රමාද කරනවා. මෙතැනදී සිදු විය යුත්තේ මේ සේවකයන්ට භාණ්ඩාගාරයෙන් මුදල් ගෙවීමයි. නමුත් දිගින් දිගටම, දිගින් දිගටම ප්‍රමාද කිරීමක් තමයි සිද්ධ වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තමුන්නාන්සේගේ අර්ථකථනය තමයි ඒක. අපි එවැනි පටු දේශපාලනයක් කරන්නේ නැහැ. අපි දෙන්න තිබෙනවා නම් දෙනවා, දෙන්න අවශ්‍ය නැත්නම් දෙන්නේ නැහැ. අවශ්‍ය නැති දේකට දෙන්න බැහැ. ඔබතුමන්ලා මොන විධියට තර්ක විතර්ක කළත් මේක සමබරතාවයෙන් දිය යුතුයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒක පටුද පළල්ද කියලා බලා ගන්නට පුළුවන් වෙන්නේ තමුන්නාන්සේලාගේ ක්‍රියා මාර්ගය මතයි. මොකද, මේක දැන් අවුරුදු 22ක පමණ සිට තිබෙන ප්‍රශ්නයක්. මේ අය දැන් අවුරුදු 70ක් 80ක් වයස්ගත වුණු පුද්ගලයන්. ඒ නිසා මේ සේවක පිරිසත් සමඟ විධිමත් සාකච්ඡාවක් පවත්වලා අදාළ බලධාරීන් කැඳවා - මුදල් අමාත්‍යාංශයේ වෙන්න පුළුවන්, වෙනත් ආයතනවල වෙන්න පුළුවන්.- ඒ සඳහා විසඳුමක් දෙන්න කියන එකයි අපි කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමා, අපේ සංකල්පය වන්නේ බෝඩ් ලෑලි අල්ලනකම් ඉඳලා සාකච්ඡාවට ගෙන ඒම නොවෙයි. අපි ඊට පෙර ක්‍රියා කරනවා. මේ අවස්ථාවේ නැවත කියන්නේ එවැනි අවශ්‍යතාවක් නැති නිසා සාකච්ඡා කරන්න දෙයක් නැහැ කියලායි. නමුත් ඔබතුමා කියනවා නම් මෙවැනි ප්‍රශ්නයක් තිබෙනවා කියලා, අපි අපේ නිලධාරින් යොදවලා ඔබතුමා ඔය කියන කාරණයට යම්කිසි ඇහුම් කන්දීමක් කරන්නට කටයුතු කරන්නම්. නැති අවශ්‍යතාවක් ඇති කරන්නට අපිට අවශ්‍ය නැහැ.

ඒ විතරක් නොවෙයි. අපි මේ අවස්ථාව වන විට සුරාබදු තුළින් අපේ බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා. මීට පෙර ලැබුණු රුපියල් මිලියන 1,900ක් පමණ වූ මාසික බදු ආදායම දැන් රුපියල් මිලියන 11,800ක් පමණ වෙනවා. එයින් සියයට 73ක් මේ ආයතනය තුළින් ලැබෙනවා. මේ වාගේ ඒවා මීට පෙර සියයට 58යි ලැබුණේ. දැන් අප මේ සියලුදේම වැඩි කර කර යන්නේ. යම් විධියකින් දෙයක් දෙන්න තිබෙනවා නම් අප සතුටින් එය ලබා දෙන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේක බෝඩ් ලෑලි ඇල්ලීම සම්බන්ධ ප්‍රශ්නයක් හෝ මිනිස්සු පාරට බැසීම සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. මෙය ඔබතුමන්ලා දන්නා ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, මීට අවුරුද්දකට කලින් - විපක්ෂයේ ඉන්න කාලයේ- මේ ප්‍රශ්න ගැන කොහොමද කථා කළේ කියා ඔබතුමා මතක් කර ගන්න. මේ ආණ්ඩුව බලයට පත් කර ගන්න මේ ප්‍රශ්න කථා කරලා තමුන්නාන්සේලා එක එක පොරොන්දු දීලා තිබෙනවා. සාකච්ඡා කරලා, මේවාට පොරොන්දු දීලා තමයි දැන් මේ ඒවා කඩ කර තිබෙන්නේ. අඩු තරමේ මේ ප්‍රශ්නය ගැන සොයා බලන්න පිහිටුවපු ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාවක්වත් නැහැ කියනවා නම්, මේ ගැන දන්නේවත් නැහැ කියනවා නම්, මේ ඉස්කාගාරය පෞද්ගලික අංශයට විකුණලා ඒ සේවකයන්ට වුණේ මොකක්ද කියාත් තමුන්නාන්සේ දන්නේ නැත්නම් මොකක්ද ඇති වැඩේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප විපක්ෂයේ ඉන්න කාලයේ කටයුතු කළ ආකාරය මතක් කිරීම ගැන මා සතුටු වෙනවා. අප විපක්ෂයේ ඉන්න කොට කියපු දේ ආණ්ඩු පක්ෂයට ආවාම කරන්නේ නැහැ කියා හිතන්න එපා. ඒ දේවල් කරන පක්ෂයක් වශයෙන් අප කියන්නේ මේකයි. ඔබතුමන්ලාගේ දේශපාලන සංස්කෘතියේ වුණු දේවල් ගැන කියලා අපව ඒ ඉලක්කයෙන් මනින්න එපා. යම් දේවල් දෙන්න තිබෙනවා නම් අප ලබා දෙන්නම්. නමුත්, මේ ප්‍රශ්න සම්බන්ධයෙන් අසාධාරණ මට්ටමට ගෙනැත්, "අප කරන්නේ නැහැ", මේක කළ යුතුයි", "කරවු" කියන මතයෙන් නම් අප සාකච්ඡා කරන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -813/'16- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු පියංකර ජයරත්න මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - State Minister of Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, මට හැමදාම තිබෙන්නේ ඌව පළාත් සභාවට සම්බන්ධ ප්‍රශ්නවලට උත්තර දෙන්නයි. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති තුනක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අම්පාර දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිලධාරින් : යතුරු පැදි ලබා නොදීම

## அம்பாறை மாவட்ட வெளிக்கள உத்தியோகத்தர்கள் : மோட்டார் சைக்கிள் வழங்காமை

## FIELD OFFICERS OF AMPARA DISTRICT: NON-PROVISION OF MOTORCYCLES

825/'16

**5. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2014 වර්ෂයේ අය වැය යෝජනාවක් අනුව දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම ක්ෂේත්‍ර නිලධාරින්ට යතුරුපැදි ලබාදුන් බව පිළිගන්නේද;

(ii) උක්ත අය වැය යෝජනාවට අනුව මුදල් අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛය පරිදි අදාළ යතුරුපැදි සඳහා අත්තිකාරම් මුදලක් ගෙවිය යුතු වුවත්, අම්පාර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරින්ට ඒ සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා නොදීමෙන් ගැටලුවක් ඇති වූ බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් දැනට අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍ෂේත්‍ර නිලධාරින් 5000ට පමණ යතුරු පැදි නොලැබීමේ තත්ත්වයක් මතු වී ඇති බව පිළිගන්නේද;

(iv) අම්පාර ප්‍රදේශයේ දුෂ්කර අතුරු මාර්ගවල ගමනාගමන පහසුකම් නොමැති බැවින්, එම ක්‍ෂේත්‍ර නිලධාරින් සඳහා යතුරු පැදි ලබාදී ඔවුනට සහනයක් සැලසීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014ஆம் ஆண்டின் வரவு செலவுத்திட்ட முன்மொழிவொன்றின் பிரகாரம் நாட்டின் சகல மாவட்டங்களிலும் வெளிக்கள உத்தியோகத்தர் களுக்கு மோட்டார் சைக்கிள்கள் வழங்கப் பட்டன என்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(ii) மேற்குறித்த வரவு செலவுத்திட்ட முன்மொழிவுக் கமைவாக நிதி அமைச்சினால் வெளியிடப்பட்ட சுற்றறிக்கையின் பிரகாரம் குறித்த மோட்டார் சைக்கிள்களுக்காக முற்பணம் செலுத்தப்பட வேண்டியுள்ள போதிலும், அம்பாறை மாவட்ட வெளிக்கள உத்தியோகத்தர்களுக்கு அதற்கான வாய்ப்பு வழங்கப்படாததன் காரணமாக பிரச் சினையொன்று ஏற்பட்டதென்பதை அறிவாரா என்பதையும்,

(iii) இதன் காரணமாக தற்போது அம்பாறை மாவட் டத்தில் சுமார் 5000 வெளிக்கள உத்தியோகத்தர் களுக்கு மோட்டார் சைக்கிள்கள் கிடைக்காமற் போகின்ற நிலைமை உருவாகியுள்ளதென்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்,

(iv) அம்பாறை பிரதேசத்தில் பின்தங்கிய துணை வீதிகளில் போக்குவரத்து வசதிகள் இல்லை யென்பதால், மேற்படி வெளிக்கள உத்தியோகத் தர்களுக்கு மோட்டார் சைக்கிள்களைப் பெற்றுக் கொடுத்து அவர்களுக்கு நிவாரணம் வழங்கு வதற்கு நடவடிக்கை எடுப்பாரா என்ப தையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) whether he accepts that the field officers of each district of the island were given motorcycles in accordance with a budget proposal of year 2014;

(ii) whether he is aware that even if an advance should be paid for the motorcycles accordance with the circular issued by the Ministry of Finance pertaining to aforesaid budget proposal, an issue arose due to the fact that the field officers of the Ampara District were not given an opportunity in that regard;

(iii) whether he accepts the fact that 5000 field officers of Ampara District, are unlikely to get motorcycles due to aforesaid reason; and

(iv) whether steps will be taken to provide aforesaid field officers with motorcycles as a relief measure since there are no transport facilities in the difficult by roads of Ampara District?

(b) If not, why?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) නැත. අම්පාර දිස්ත්‍රික්කයේ 2014.12.31 දිනට පෙර මුදල් ගෙවා තිබූ ක්ෂේත්‍ර නිලධාරින්/ නිලධාරිනියන් 966දෙනෙකු සඳහා යතුරු පැදි ලබා දී ඇති බවට පළමුව දිස්ත්‍රික් ලේකම් සනාථ කර තිබූ අතර, පසුව එම සංඛ්‍යාව 1,051ක් බව සනාථ කර ඇත. පසු ගිය ජනාධිපතිවරණ සමයේ යතුරු පැදි ලබා දීම මැතිවරණ රාජකාරිවලට බාධා ඇති බන බැවින් එම වැඩසටහන තාවකාලිකව අත්හිටුවා ඇත. මෙම වැඩසටහන පිළිබඳව නිසි උපදෙස් නොලද නිසා අම්පාර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරින් 2,739කට හා නිලධාරිනියන් 2,346කට නියමිත කාලයට ප්‍රථමව මුදල් ගෙවීමට නොහැකි වී ඇති බව දිස්ත්‍රික් ලේකම් වාර්තා කර ඇත. ජනාධිපතිවරණයෙන් පසුව අම්පාර දිස්ත්‍රික් ලේකම්තුමා විසින් නැවත වරක් උපදෙස් අපේක්ෂාවෙන් සිටි බැවින් ක්ෂේත්‍ර නිලධාරින් 5,000කට පමණ යතුරු පැදි සඳහා මුදල් ගෙවීමට නොහැකි වූ බව වාර්තා කර ඇත. යතුරු පැදි ලබා ගැනීමට හිමිකම් ලබන එහෙත් විවිධ හේතු මත මුදල් ගෙවීමට නොහැකි වූ ක්ෂේත්‍ර නිලධාරින් අම්පාර දිස්ත්‍රික්කයේ පමණක් නොව, අනෙකුත් දිස්ත්‍රික්කවලද සිටිය හැක.

(iii) ඔව්. එවැනි තත්ත්වයක් දිස්ත්‍රික් ලේකම් වාර්තා කර ඇත.

(iv) 2015.11.20 දින දක්වා මුදල් ගෙවා ඇති නිලධාරින් සඳහා පමණක් යතුරු පැදි ලබා දීමට ක්‍රියා කරනු ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම තුළම උත්තරේ තිබුණා. ඒ කියන්නේ, (අ) (ii)ට පිළිතුර ලෙස "නැත" කියා කිව්වාට, ඔබතුමා ඉතා පැහැදිලිව කියනවා, "966දෙනෙකුට පමණයි යතුරු පැදි ලබා දී තිබෙන්නේ. ක්ෂේත්‍ර නිලධාරින් 2,739කට හා නිලධාරිනියන් 2,346කට නිසි උපදෙස් නොලැබුණ නිසා යතුරු පැදි ලබා ගැනීමට මුදල් තැන්පත් කරන්න බැරි වුණා" කියලා. ඒකම තමයි මම අහලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, "අම්පාර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරින්ට ඒ සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා නොදීම" කියන්නේ, ඒ ප්‍රශ්නය.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු කථානායකතුමනි, 966දෙනෙකු සඳහා යතුරු පැදි ලබා දී ඇති බවට පළමුව දිස්ත්‍රික් ලේකම් සනාථ කර තිබුණාට, ඒ දිස්ත්‍රික් ලේකම්තුමාම පසුව කියලා තිබෙනවා, එහෙම මුදල් තැන්පත් කරන්න; අත්තිකාරම් ගෙවන්න අවශ්‍ය නැහැ. යතුරු පැදි දෙනවා, එතකොට මුළු ගණනම එකපාර ගෙවන්න කියලා. නිසි උපදේශය හරියට නොලැබිච්ච නිසා, ඔබතුමා කිව්වා වාගේ ක්ෂේත්‍ර නිලධාරින් 2,739කට හා නිලධාරිනියන් 2,346කට ඒ අවස්ථාව ලැබිලා නැහැ. ප්‍රශ්නයේ (iii) වැනි කොටස වෙනුවෙන් ඔබතුමා කළ පැහැදිලි කිරීමට අනුව ඔබතුමාම පිළිගන්නවා, 5,000කට පමණ මේ අවස්ථාව ලැබිලා නැහැ කියලා. ගරු කථානායකතුමනි, අම්පාර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරින් 966දෙනෙක් විතරක් නොවෙයි ඉන්නේ. අනෙක් කාරණය, යතුරු පැදි දුන්නේ දුෂ්කර ගමන් අපහසුතා තිබෙන නිලධාරින්ටයි. ලංකාවේ එවැනි ගමන් අපහසුතා වැඩිපුරම තිබෙන දිස්ත්‍රික්කය හැටියට අපිට හිතන්න තිබෙන්නේ අම්පාර දිස්ත්‍රික්කයයි. අම්පාර දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රවාහන පහසුකම් පිළිබඳවත්, දුර සහ අනෙකුත් පහසුකම් ගැනත් කල්පනා කරන කොට අපිට එහෙම හිතෙනවා. ඒ නිසා ඔබතුමා දීපු උත්තරයේ තිබෙනවා, මගේ ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර.

ගරු කථානායකතුමනි, 5,000කට පමණ මේ අවස්ථාව නොලැබී තිබෙන්නේ ඒ අයගේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. අදාළ දිසාපතිවරයා ඒ වෙලාවේදී නිසි උපදෙස් ලබාදීමක් කරලා නැති නිසා සහ ඔවුන්ට අත්තිකාරම් මුදල් බඳින්න අවස්ථාවක් නොලැබීම නිසා තමයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් අහන්නේ එකම අතුරු ප්‍රශ්නයයි. මේ අය විශේෂ රාජකාරි කරන පිරිසක් නිසා මේ ගැන විධිමත් පරීක්ෂණයක් පවත්වලා, ඔවුන්ට මේ පහසුකම ලබාදෙන්න ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ සම්බන්ධයෙන් ඔබතුමා ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලාත් පසු ගිය කාලයේ මන්ත්‍රීවරු ගණනාවක් ප්‍රශ්න කළා. ඊට පසුව මේ උදවිය ගෙන්වලා සාකච්ඡා කරපු අවස්ථාවේදී දැනගන්න ලැබුණේ ඒ දිස්ත්‍රික් ලේකම්තුමා අවස්ථාව දීලා තිබුණේ නැහැ, ඒ ගොල්ලන්ට මුදල් ගෙවන්න කියලා. එතුමා කරපු අඩු පාඩුව නිසා අපි ආණ්ඩුවක් වශයෙන් මේක විවෘත කළා නම්, රටේ හැම කොනකම මේක නැවත පටන් ගන්නවා. ඒක දරා ගන්න බැරි මට්ටමකට යනවා. ඔබතුමා ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා මෙහි සැබෑ තත්ත්වය කිව්වේ අපිට හංගන්න දෙයක් නැති නිසායි. යතුරුපැදි ලබා දෙන්න දිස්ත්‍රික් ලේකම්ගේ අදක්ෂතාව නිසා හරි, ඕනෑකමක් තිබුණේ නැති නිසා හරි ඒ සම්බන්ධයෙන් අපි මොනවාද කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා එවැනි පිළිතුරක් ලබා දුන්නාට පසුව, අපි මොනවා ගැන අතුරු ප්‍රශ්න අහන්නද? මොකද, අය වැය යෝජනාවේදී ඉදිරිපත් කළේ රටේම ක්ෂේත්‍ර නිලධාරින්ට යතුරු පැදි ලබා දෙනවා කියලායි. යතුරු පැදි නොදී ඉන්න නොවෙයි. දැන් කියන්නේ, ක්ෂේත්‍ර නිලධාරින්ට යතුරු පැදි නොදී ඉන්න කථාවක්. එහෙන් මෙහෙන් වංගු ගහලා අවසානයේ දී ඉල්ලන කෙනෙකුට යතුරු පැදි දෙනවා නම්, එම උත්තරය ගැළපෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, අම්පාර දිස්ත්‍රික්කයේ -මම අනෙක් දිස්ත්‍රික්ක සම්බන්ධව වෙනම ප්‍රශ්න අහන්නම්.- ක්ෂේත්‍ර නිලධාරින්ට අසාධාරණයක් සිදු වුණු බව එතුමා පිළිගන්නවා. දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මම අහන්නේ, ඒ අසාධාරණකම අපට කලින් ඔබතුමන්ලා හඳුනා ගෙන තිබුණා නම්, සාකච්ඡා කරලාත් තිබෙනවා නම්, ඒ අසාධාරණයට ලක් වූවන්ට යතුරු පැදි ලබා ගැනීම පිළිබඳව ඔබතුමා ලබා දෙන පිළිතුර මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, එවකට තිබුණු ප්‍රවාහන ප්‍රශ්නය උග්‍ර නිසා තමයි එවැනි දෙයක් ඉදිරිපත් කළේ. ඊට වැඩිය මුදල් වෙන් කරලා අපේ ප්‍රවාහන ඇමතිතුමා දක්ෂ ලෙස ප්‍රවාහන ක්ෂේත්‍රය වැඩි දියුණු කරලා තිබෙන නිසා, එවැනි අවශ්‍යතාවක් නැහැයි කියලා තමයි මට හිතෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නයක් නැහැ. මට වැටහෙන විධියට නම්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙහි statement කරන්න බැහැ, ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න. නැත්නම් අපට කාල වේලාව මදි වෙයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා මේ කියන්නේ, මේ පාර්ලිමේන්තු පාරේ තිබෙන තත්ත්වයයි. අම්පාරේ මෙට්‍රෝ එක තිබෙනවානේ. ඒකෙන් තමයි ඒ අය වැඩට එන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා මේ ගරු සභාවේදී සුදනන් වාගේ හැසිරෙන්න අවශ්‍යතාවක් නැහැ. මේ ගරු සභාවේදී අපව හාස්‍යයට ලක් කරලා, එළියට ගිහිල්ලා තවත් එකක් කියනවා. අපි අපේ එක්සත් ජාතික පක්ෂයෙන් ඔය වාගේ තුට්ටු දෙකේ දේශපාලනය කරන්නේ නැහැයි කියන එක මම ඔබතුමාට මතක් කරනවා. ඔබතුමන්ලා උදේ පාන්දර කෑ ගහලා මේ ප්‍රශ්නය පෙන්වන එක නොවෙයි තිබෙන්නේ. [බාධා කිරීම්]

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් : විශේෂ ශ්‍රේණියට උසස්වීම්

### பொதுச் சுகாதாரப் பரிசோதகர்கள் : விசேட தரத்துக்குப் பதவியுயர்த்துதல்

### PUBLIC HEALTH OFFICERS: PROMOTIONS TO SPECIAL GRADE

581/'16

**6. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2005 වර්ෂයේදී විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබූ දකුණු පළාත් සභාවේ පළමු පන්තියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) දකුණු පළාත් සභාවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව, 2005 වර්ෂයෙන් පසු පළමු ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් වාර්ෂිකව අයදුම් පත් කැඳවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 2013 වර්ෂයේදී විශේෂ ශ්‍රේණි උසස්වීම් සඳහා අයදුම් පත් කැඳවන තෙක් 2005 වර්ෂයෙන් පසු විශ්‍රාම ගිය සුදුසුකම් සම්පූර්ණ කළ පළමු පන්තියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) අසාධාරණයට ලක් වූ එම නිලධාරීන් වෙනුවෙන් රජය ගත් ක්‍රියා මාර්ග මොනවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) 2013 වර්ෂයේදී අයදුම් පත් කැඳවීමෙන් පසු විශ්‍රාම ගිය විශේෂ ශ්‍රේණිය හිමි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම විශේෂ ශ්‍රේණියේ තනතුරු ලබාදීම සඳහා ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකස් කර තිබේද;

(iii) 2013 වර්ෂයේදී අයදුම් පත් කැඳවීමෙන් පසු ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව විශ්‍රාම ගිය විශේෂ ශ්‍රේණිය හිමි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා උසස්වීම් ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 ஆம் ஆண்டில் விசேட தரத்திற்கு பதவியுயர்வு பெற்றுள்ள தென்மாகாண சபையின் முதலாம் வகுப்பைச் சேர்ந்த பொது சுகாதார பரிசோதகர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தென்மாகாண சபையின் ஆட்சேர்ப்பு நடைமுறையின் பிரகாரம், 2005ஆம் ஆண்டுக்கு பின்னர் முதலாம் தர பொது சுகாதார பரிசோதகர் களிடம் இருந்து வருடாந்தம் விண்ணப்பங்கள் கோரப்பட்டனவா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா ?

(ஆ) (i) 2013 ஆம் ஆண்டில் விசேட தர பதவியுயர்வுக்கான விண்ணப்பங்கள் கோரப்படும் வரை 2005ஆம் ஆண்டுக்கு பின் ஓய்வுபெற்ற தகைமைகளை பூர்த்தி செய்துள்ள முதலாம் வகுப்பைச் சேர்ந்த பொது சுகாதார பரிசோதகர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) அநீதிக்கு ஆளாகியுள்ள மேற்படி உத்தியோகத்தர்கள் தொடர்பாக அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2013ஆம் ஆண்டில் விண்ணப்பங்கள் கோரப்பட்டதன் பின்னர் ஓய்வுபெற்றுள்ள விசேட தரத்திற்கு உரிய பொது சுகாதார பரிசோதகர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) மேற்படி விசேடதரப் பதவிகளை வழங்குவதற்காக மூப்புரிமைப் பட்டியலொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்,

(iii) 2013ஆம் ஆண்டில் விண்ணப்பங்கள் கோரப்பட்டதன் பின்னர் மூப்புரிமை பட்டியலின் பிரகாரம் ஓய்வு பெற்றுள்ள விசேட தரத்திற்குரிய பொது சுகாதார பரிசோதகர்களுக்கு பதவியுயர்வு வழங்கப்படும் திகதி யாதென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he state-

(i) the number of Grade One Public Health Inspectors of the Southern Provincial Council who were promoted to Special Grade in the year 2005; and

(ii) as per the recruitment procedure of the Southern Provincial Council, whether applications have been called annually from Grade One Public Health Inspectors after the year 2005?

(b) Will he inform this House-

(i) the number of Grade One Public Health Inspectors who retired after the year 2005 having fulfilled the required qualifications until applications were called for the promotion to Special Grade in the year 2013; and

(ii) the steps taken by the government with respect to the said officers who have been subject to injustice?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(c) Will he also inform this House-

(i) the number of Public Health Inspectors entitled to Special Grade who retired after applications were called in the year 2013;

(ii) whether a seniority list has been prepared for granting the posts of this Special Grade; and

(iii) the date on which promotions will be granted to the Public Health Inspectors entitled to the Special Grade who retired as per the seniority list after applications were called in the year 2013?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) 09(නවය)කි.

(ii) නැත.

(ආ) (i) 22 (විසිදෙක)කි.

(ii) අදාළ තනතුරෙහි සේවා අවශ්‍යතාවක් නොමැති බැවින් 2013.01.01 දින සිට තනතුර අහෝසි වී ඇත. එබැවින්, එම කාල වකවානුව තුළ විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා කටයුතු කිරීමේ හැකියාවක් නොමැත.

(ඇ) (i) 09 (නවය)කි.

(ii) ඔව්.

(iii) 2013.01.01 දින වන විට සේවයේ යෙදී සිටි, සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභාවට අයත් සියලු නිලධාරීන් සඳහා සම්මුඛ පරීක්ෂණ, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් 2016.10.04 දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු අමාත්‍යතුමනි, විශ්‍රාම ගිය එම නවදෙනාට ඒ අය සේවය කරපු කාලය ආශ්‍රයෙන් කුමන ආකාරයක හෝ සහනයක් ලබා දෙන්න අමාත්‍යාංශයට පුළුවන්කමක් නැද්ද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මා නම් දන්නේ නැහැ, විශ්‍රාමික අයට එවැනි සහනයක් ලබා දීමට හැකියාවක් දැනට තිබෙනවාද කියා, ඔවුන් පළාත් සභාවක් යටතේ සිටි නිසා. කෙසේ වුණත් මම ආපසු සොයා බලන්නම්, ඒ අයට යම්කිසි සහනයක් ලබා දෙන්න පුළුවන්ද කියා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ලා ඔවුන්ගේ රාජකාරිය සිදු කිරීමේදී ඔවුන්ට තිබෙන බරපතළම ගැටලුවක් තමයි ඒ අයට තිබෙන බල ප්‍රදේශය පුළුල් වී තිබීම. සමහර වේලාවට ඒ අයට පරීක්ෂා කිරීමට තිබෙන ස්ථාන සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඩෙංගු පිළිබඳව විශේෂ අවධානයක් යොමු වෙලා විශේෂ ක්‍රියාන්විතයක් සිදු වෙන මොහොතක ඒ අයගේ වපසරිය තවත් පුළුල් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ බල ප්‍රදේශය කුඩා කරලා වැඩි පිරිසක් සේවයට බඳවා ගැනීමට රජයත්, පළාත් සභාත් මොන විධියේ දැක්මකින්ද කටයුතු කරන්නේ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපි දැනටමත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය පුළුල් කිරීමට ක්‍රියා කර තිබෙනවා. ඒ වාගේම මහජන සෞඛ්‍ය හෙදියන්ගේ නැති කර තිබුණු සේවය නැවත ආරම්භ කිරීමට ක්‍රියා කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, මහජන සෞඛ්‍ය හෙදියන්ගේ සේවය යළි ආරම්භ කිරීමට කොපමණ කාලයක් ගත වෙනවාද, පළමුවැනි වටයේදී කී දෙනෙකු බඳවා ගන්න බලාපොරොත්තු වෙනවාද සහ එසේ බඳවා ගැනීම සිදු වෙන්නේ කවදාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සියලු දත්ත මේ වේලාවේ මට යොමු කරලා නැති නිසා දැන් ඒ ගැන මට කියන්න පුළුවන්කමක් නැහැ. නමුත් දැන් සම්පූර්ණයෙන්ම හැම MOH Division එකකටම Public Health Nurseලා පත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා.

## සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් : හම්බන්තොට දිස්ත්‍රික්කය

### ஊழியர் சேமலாப நிதியக் கணக்குகள் : அம்பாந்தோட்டை மாவட்டம்

### EMPLOYEES' PROVIDENT FUND ACCOUNTS: HAMBANTOTA DISTRICT

743/'16

7. **ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ,

(i) ලියා පදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂි කර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் அம்பாந்தோட்டை மாவட்டத்தில்,

(i) பதிவு செய்திருந்த ஊழியர் சேமலாப நிதியக் (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(ii) புதிதாகப் பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் புதிதாக பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை,

(i) அரசாங்கத்துக்கு உரித்தான கம்பனிகள்;

(ii) பகுதியளவிலான அரச நிறுவனங்கள்;

(iii ) தனியார் துறை;

(iv ) கைத்தொழில்துறை;

(v ) விவசாயத்துறை;

(vi ) சேவைத் துறை;

இதற்கமைய ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House separately in relation to years 2013, 2014 and 2015 -

(i) the number of registered Employees' Provident Fund (EPF) accounts; and

(ii) the number of Employees' Provident Fund (EPF) accounts registered anew;

(b) in the District of Hambantota?

(i) Will he also inform this House separately in relation to years 2013, 2014 and 2015, the number of Employees' Provident Fund (EPF) accounts registered anew and by -

(ii) state owned companies;

(iii) semi government institutions;

(iv) the private sector;

(v) the industrial sector;

(vi) the agricultural sector;

the service sector?

(c) If not, why?

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)

ගරු කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 38,404 |
| 2014 | 37,086 |
| 2015 | 37,316 |

(ii)

| වර්ෂය | අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 15,326 |
| 2014 | 16,143 |
| 2015 | 15,077 |

(ආ) (i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය වශයෙන් වර්ගීකරණය කරන ලද පද්ධතියක් දැනට සේවක අර්ථසාධක අරමුදල සතුව නොමැත.

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව "A" සිට "X" දක්වා වූ අක්ෂර අනුව නම් කරනු ලබන කලාපවලට අනුකූලව සේවා යෝජකයන් ලියා පදිංචි කරන දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. එලෙස ලියා පදිංචි වූ සේවා යෝජකයෙකුගෙන් යම් සාමාජිකයෙකු වෙනුවෙන් දායක මුදලක් ලද විට අදාළ සේවා යෝජකයාට හිමි අක්ෂරය හා අංකය යටතේ එම සාමාජිකයා ලියා පදිංචි කෙරේ.

(ඇ) පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2015 වෙන කොට තිබුණු සම්පූර්ණ ගිණුම් සංඛ්‍යාව 30,000යි කියලා නේද කිව්වේ?

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
2015 වර්ෂයේ 37,316යි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ තිබෙනවා, 2015 වර්ෂයේ අලුතෙන් ලියා පදිංචි වූ සංඛ්‍යාව 15,000යි කියලා.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
15,077යි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ක්‍රමවේදය පටන් ගත්තු දවසේ ඉඳලාම හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබිලා තිබෙන්නේ, 37,000යි. විශ්‍රාම යෑම නොසලකායි මම මේ අහන්නේ. ඔබතුමා කියනවා, එක අවුරුද්දක් ඇතුළත හම්බන්තොට දිස්ත්‍රික්කයේ රැකියා 15,000ක් ලියා පදිංචි වෙලා තිබෙනවා කියලා. මේක නිවැරදි පිළිතුරක් ලෙස භාර ගන්න අමාරුයි. මම කියන්නේ, ඔබතුමා වැරැද්දක් කරනවා කියන එක නොවෙයි. ඔබතුමාම කල්පනා කරලා බලන්න. මුළු කාලයටම තිබෙනවා, 37,000ක්. එක වසරකට 15,000ක් කියලා තිබෙනවා. ගිය අවුරුද්දේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රැකියා 15,000ක් ඇති වුණා කියලාද ඔබතුමා අපට කියන්නේ?

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
ගරු මන්ත්‍රීතුමනි, රැකියා 15,000ක් කෙසේ වෙතත් සමහර වෙලාවට දීපු රැකියා ගණනය කරලා නොතිබුණාද කියලා දන්නේ නැහැ. ඒ ගැන හොයලා බලලා මම ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, නිලධාරින් ලවා පිළිතුර හරියාකාරව පරීක්ෂා කරලා නැවත පිළිතුර ලබා දෙන්න කියලා. මොකද මේ පිළිතුර විශ්වාස කරන්න අමාරු නිසා.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
හැම දිස්ත්‍රික්කයකම විමර්ශනය කරනවා නේ. මම ඒ ගැන බලලා ඔබතුමාට දැනුම් දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිතුර නැවත ඉදිරිපත් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ප්‍රශ්න අංක 8-794/'16-(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Sports, I ask for two weeks' time to answer that Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකාව ආශ්‍රිත ජාත්‍යන්තර මුහුදු මාර්ගයේ යාත්‍රා කරන නෞකා: ආරක්ෂාව සපයන ආයතන
## இலங்கையின் சர்வதேச கடல் மார்க்கத்தில் பயணிக்கும் கப்பல்கள்: பாதுகாப்பு வழங்கும் நிறுவனங்கள்
## SHIPS SAILING IN INTERNATIONAL MARITIME ROUTE OF SRI LANKA : INSTITUTIONS PROVIDING SECURITY

826/'16

**9. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව ආශ්‍රිත ජාත්‍යන්තර මුහුදු මාර්ගයේ යාත්‍රා කරන නෞකා සඳහා අවි සහිතව ආරක්ෂාව සැලසීමට අවසර ලබා දී ඇති ආයතන කවරේද;

(ii) ඉන්දියන් සාගරය ආශ්‍රිත මුහුදේ මසුන් මැරීමේ නිරත විදේශීය ට්‍රෝලර් යාත්‍රාවලට අවි සහිත ආරක්ෂක භටයන් සැපයීමේ අවසරය ලබා දී ඇති ආයතන කවරේද;

(iii) ඉහත (i) සහ (ii) හි සඳහන් ආයතන වෙත එම අවසරය ලබා දී ඇති ක්‍රමවේදය කවරේද;

(iv) අදාළ ආරක්ෂාව සැපයීමේ අවසරය විනිවිදභාවයකින් හා විවෘත ටෙන්ඩර් ක්‍රමයක් මඟින් ලබා නොදෙන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு அண்மித்த சர்வதேச கடல் மார்க்கத்தில் பயணிக்கும் கப்பல்களுக்கு ஆயுதங்கள் சகிதம் பாதுகாப்பு வழங்க அனுமதி வழங்கப்பட்டுள்ள நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) இந்து சமுத்திரத்தை அண்மித்த கடலில் மீன் பிடித்தலில் ஈடுபடும் வெளிநாட்டு டோலர் படகுகளுக்கு ஆயுதங்களுடன் கூடிய பாதுகாப்புப் படையினரை வழங்க அனுமதி பெற்றுள்ள நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii ) மேலே (i ) மற்றும் (ii ) இல் குறிப்பிடப்பட்டுள்ள நிறுவனங்களுக்கு மேற்படி அனுமதி வழங்கப்பட்டுள்ள முறையியல் யாதென் பதையும்;

(iv ) குறிப்பிட்ட பாதுகாப்பினை வழங்குவதற்கான அனுமதி வெளிப்படைத் தன்மையுடனும் திறந்த கேள்விப் பத்திர விதிமுறைக்கமையவும் ஏன் வழங்கப்படுவதில்லை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) the names of the institutions which have been permitted to provide armed security for the ships that sail in International Maritime Route of Sri Lanka;

(ii) the names of the institutions which have been permitted to provide armed security guards for foreign trawlers that are engaged in fishing in the Indian Ocean;

(iii) the methodology adopted in granting permission to aforesaid institutions mentioned in (i) and (ii) above; and

(iv) as to why permission cannot be granted in a transparent manner, following an open tender procedure?

(b) If not, why?

**ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වරාය හා නාවික අමාත්‍යාංශයේ නිර්දේශය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත ශ්‍රී ලංකාවේ ලියා පදිංචි කරන ලද දේශීය වෙළෙඳ නෞකා නියෝජිත ආයතන 33ක් සඳහා ඔවුන් යටතේ ගිවිසුම්ගත විදේශීය සමුද්‍රීය ආරක්ෂක සමාගම් (Private Maritime Security Companies - PMSCs) 105ක් මඟින් ජාත්‍යන්තර මුහුදු මාර්ගයේ යාත්‍රා කරන නෞකා සඳහා ආරක්ෂාව සැලසීමට අවසර ලබා දී ඇත. ඇමුණුම (I)* බලන්න.

මීට අමතරව ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් ඇමුණුම (II)* හි සඳහන් පෞද්ගලික සමුද්‍ර ආරක්ෂක සමාගම්වල නෞකා සඳහා ආරක්ෂාව ලබා දේ.

(ii) ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගම

(iii) <u>වෙළෙඳ/මගී ප්‍රවාහන නෞකා සඳහා ආරක්ෂාව සැලසීම</u>

ඇමුණුම (I)හි සඳහන් විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම් (PMSCs) 105 සඳහා, එම සමාගම් අයිති රාජ්‍යයන්ගේ නීති රෙගුලාසිවලට අනුව හා නිර්දේශයන්ට යටත්ව වරාය හා නාවික අමාත්‍යාංශයේ නිර්දේශය මත ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දේ.

ඇමුණුම (II)හි සඳහන් සමාගම් සඳහා, ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ සේවා ගිවිසුමක් අත්සන් කිරීම මඟින් අවසර ලබා දී ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(iv) රටින් පිටත සිට රට තුළටත්, රට තුළ සිට රටින් පිටතටත් අවි ආයුධ ප්‍රවාහනය කිරීමේ කටයුත්ත ජාතික ආරක්ෂාවට සෘජුවම බලපාන කටයුත්තක් වන බැවින්, ශ්‍රී ලංකාව ආශ්‍රිත ජාත්‍යන්තර මුහුදු මාර්ගයේ යාත්‍රා කරන නෞකා සඳහා අවි සහිතව ආරක්ෂාව සැලසීමේ කටයුත්ත දැන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා දී ඇති අතර, එය විශිෂ්ට ලෙස නාවික හමුදාව විසින් සිදු කර ගෙන යනු ලබයි.

එමඟින් මෙම කර්තව්‍යයේ සම්පූර්ණ ආදායම නාවික හමුදාව හරහා රජයේ ආදායමට බැර කිරීමට ද හැකියාව ලැබී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එම පිළිතුර ලබාදීම සම්බන්ධයෙන් ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කිව්ව ආකාරයට ආයතන 33ක් සඳහා ආරක්ෂක ආයතන 105ක් ආරක්ෂාව ලබා දීම සහ ඊට අමතරව, සී/ස රක්නා ආරක්ෂක ලංකා ආයතනයට මේ දීලා තිබෙන ක්‍රියාවලියත් එක්ක දැන් ඒ සියලු කටයුතු -ඒ සියලු ආරක්ෂණ සේවාවන්- සිද්ධ කරන්නේ ඔබතුමා අවසානයේ දුන් උත්තරය අනුව නාවික හමුදාව විසින්ද? එහෙම නැත්නම් පෞද්ගලික ආරක්ෂක සේවා අංශ විසිනුත් -ඒ සමාගම් විසිනුත්- මේ ආරක්ෂක සේවාවන් තව දුරටත් පවත්වනවාද?

**ගරු රුවන් විජයවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana )

ගරු මන්ත්‍රීතුමනි, දැනට නාවික හමුදාවෙන් අවි ගබඩාව සඳහා ආරක්ෂාව ලබා දීලා තිබෙනවා. නමුත් දැනට පෞද්ගලික සමාගම්වලින් නම් ඒ වැඩ කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. මා හිතන හැටියට දැනට ට්‍රෝලර්වලට තමයි පෞද්ගලික සමාගම්වලින් ආරක්ෂක හටයින් ලබා දීලා තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මසුන් මැරීමේ නිරත ට්‍රෝලර් යාත්‍රාවලට අවිආයුධ සහිතව ආරක්ෂකයින් සැපයීමේ ක්‍රියාවලිය මීට කලිනුත් සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගමත් එක්ක ඇති කර ගත් ගිවිසුම අනුව කළා. නමුත්, එහි නීත්‍යානුකූලභාවයක් නැහැ. පාර්ලිමේන්තුවේ සභාගත කළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

වාර්තාවේත් ඒ පිළිබඳව තිබෙන නිසා මම එය වග කීමෙන් කියන්නේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීත් එම කරුණු අනාවරණය වුණා. එසේ තිබියදීත් තව දුරටත් ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගමට එම ගිවිසුම් දීර්ඝ කරමින් ආරක්ෂාව සැපයීම කරලා තිබෙනවා. ඒ නිසාම තමයි මේ ප්‍රශ්නය මතු කරන්න මට සිද්ධ වුණේත්. ඒ සමාගම් ලියා පදිංචි කරපු සමාගම් වන්න පුළුවන්. නමුත්, ඔවුන් හරියාකාරව නීත්‍යානුකූල ගිවිසුම්වලට එළඹිලා නැත්නම්, තව දුරටත් ඒ ගිවිසුම් මේ ආකාරයෙන්ම පවත්වා ගනිමින් ටෙන්ඩර් කැඳවීමක් හරි, වෙනත් පාර්ශ්වයන් සම්බන්ධ කර ගැනීමක් කරන්නේ නැතිව හරි ඒ කටයුත්ත දිගටම කරන්නේ ඇයිද කියන එක තමයි මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු රුවන් විජයවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana )

ගරු මන්ත්‍රීතුමනි, මම දන්නා තරමින් මීට පෙර ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගම සහ සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ ගිවිසුම් 9ක් පමණ අත්සන් කරලා තිබුණා. ඒ ගිවිසුම් 9න් බහුතරයක් අක්‍රියයි. ඒ වැඩ කටයුතු අපි ඉදිරියට කර ගෙන යන්නේ නැහැ. නමුත්, මේ ගිවිසුම දීර්ඝ කර ගෙන තිබෙනවා. මම දන්නා තරමින් ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගමේ බහුතරයක්ම ඉන්නේ රණ විරුවන්. ඒ ගොල්ලන්ගේ රැකියා ප්‍රශ්නය උඩ තමයි ඒ ගිවිසුම දීර්ඝ කරලා තිබෙන්නේ. වෙන මොකුත් නොවෙයි. ඒ ප්‍රතිපත්තියෙන් තමයි ඒ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ. මෙතැන ඒ ගිවිසුම් ටික ඔක්කෝම තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම්, මම ඒ ගිවිසුම් සභාගත කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණු සොයා බලා ඔබතුමාට ඒවා ඉදිරිපත් කරන්න පුළුවන් නේ?

**ගරු රුවන් විජයවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana )

පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු අනුර දිසානායක මහතා විසින් අසනවා ඇති.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර දිසානායක මැතිතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මෙය, වංචනික ගනු දෙනුවක් වාගේම, මේ ගනු - දෙනුවේ දේශපාලන බැඳීම් විශාල ප්‍රමාණයක් තිබෙන නිසාමත්, රටේ විශාල ලෙස ආන්දෝලනයට තුඩු දී තිබෙන ගනු දෙනුවක්. ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ පළ වූ පුවත් පත් සොයා බැලුවා නම්, මේ ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගමේ ගනු දෙනුව මාධ්‍ය ආයතනවල ප්‍රධාන ශීර්ෂ පාඨයක් බවට පත් වූ අවස්ථා ගණනාවක් තිබෙන බව අපට බලාගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඒ නිසා සාමාන්‍ය ගනු - දෙනුවකට වඩා සුපරික්ෂාකාරීව සහ අවධානයෙන් මේ ගනු දෙනුව ගැන සිටීමට ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා වශයෙන් ඔබතුමාට වග කීමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ අනුව පසු ගිය කාලයේ අත්සන් කරන ලද ගිවිසුම් නිසා ශ්‍රී ලංකා රජයට හිමි විය යුතු විශාල මුදල් ප්‍රමාණයක් ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පෞද්ගලික සමාගම වෙත ලබා දී තිබුණු බව තමයි දැන් පෙන්නුම් කරන්නේ. ඒවා අසාධාරණ ගිවිසුම්. ඒවා කිසිසේත්ම යුක්තිසහගත ගිවිසුම් නොවෙයි. නමුත්, ඒ අසාධාරණ අයුක්තිසහගත ගිවිසුම් හරහා පවා රුපියල් මිලියන 853ක් ශ්‍රී ලංකා රජයට ලැබිය යුතුව තිබුණා. ඒ කියන්නේ තමුන්නාන්සේලා ආණ්ඩුව ලබා ගන්නා අවස්ථාවේදී රුපියල් මිලියන 853ක හිඟ මුදලක් තිබුණා. තමුන්නාන්සේලා ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ අලුතෙන් ගිවිසුමක් අත්සන් කරනවා, ඇවන්ට් ගාර්ඩ් සමාගමෙන් ශ්‍රී ලංකා රජයට ලැබිය යුතු රුපියල් මිලියන 853න් රුපියල් මිලියන 255ක -රුපියල් ලක්ෂ 2,550ක- මුදලක් කපා හැරීමට. ගරු කථානායකතුමනි, මෙය අසාධාරණ ගිවිසුමක්. නියමිත ප්‍රමාණයෙන් මුදල් ලැබිලා නැහැ. හැබැයි, එසේ තිබියදී, ලැබිය යුතු මුදල් ප්‍රමාණයෙනුත් රුපියල් ලක්ෂ 2,550ක් වර්තමාන ආණ්ඩුව ඇවන්ට් ගාර්ඩ් සමාගමෙන් නොලැබිය යුතුයි කියා කපා හරිනවා. තමුන්නාන්සේ එවැනි මුදලක් කපා හැරීමට තීරණයක් ගත්තේ ඇයි කියා මම දැනගන්න කැමැතියි.

**ගරු රුවන් විජයවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana )

ගරු මන්ත්‍රීතුමනි, මේ තීරණය ගත්තේ මම නොවෙයි. මේ ගිවිසුම ඇති කරගෙන තිබෙන්නේ සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමත් සමඟයි. මේ කාරණයට ඇත්තටම මගේ සම්බන්ධයක් නැහැ. මම මේ ගැන සියලු තොරතුරු සොයා බලා ඔබතුමාට ඒ අවශ්‍ය තොරතුරු ටික ලබා දීමට කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා ඒ පිළිබඳ විස්තර සොයාගෙන ඉදිරිපත් කරයි. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, අපි එතුමාට ඒ අවස්ථාව ලබා දෙමු.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්ව කාරණය හරි. ඔබතුමා නොවෙයි, ඒ ගිවිසුමට අත්සන් කළේ. මම හිතනවා ඔබතුමා අත්සන් කළේ නැහැ කියලා. ගරු කථානායකතුමනි, එතුමාට අත්සන් කරන්න බලයක් නැහැ. මෙතැනදී මතුවන ප්‍රශ්නය තමයි ආණ්ඩුවට ලැබිය යුතු රුපියල් ලක්ෂ 2,550ක මුදල කපා හරිනවා නම්, ඒ රුපියල් ලක්ෂ 2,550ක මුදල ඇවන්ට් ගාර්ඩ් සමාගම තුළ පමණක් රඳා පවතින්නේ නැහැ. ගරු ඇමතිතුමනි, අනිවාර්යයෙන්ම මේ මුදල මේ ගිවිසුම සඳහා දායක වූ කණ්ඩායම් වෙත බෙදී යනවා. ඒ නිසා මේ පිළිබඳ පැහැදිලි වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

## වෛද්‍ය මධ්‍යස්ථාන සතු අනුබද්ධ ඔසුසැල් : ගුණාත්මකභාවය වර්ධනය කිරීම

மருத்துவ நிலையங்களுடன் இணைந்த மருந்தகங்கள் : தர மேம்பாடு

PHARMACIES AFFILIATED TO MEDICAL CENTRES: MAINTENANCE OF STANDARDS

584/'16

**10.** ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වෛද්‍යවරුන් සතු වෛද්‍ය මධ්‍යස්ථාන තුළ ඊට අනුබද්ධ ඔසුසැල්වල ඇති ඖෂධ පිළිබඳව හා එම ස්ථානයන්හි ප්‍රමිතිය පිළිබඳව පරීක්ෂා කිරීමට යාන්ත්‍රණයක් තිබේද;

(ii) එසේ නම්, අවසන් වරට එලෙස ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ඇති දිනය කවරේද;

(iii) එහිදී ප්‍රමිතියෙන් තොර ස්ථාන සඳහා නීතිය ක්‍රියාත්මක කර තිබේද;

(iv) එසේ නම්, නීතිය ඉදිරියේ වරදකරුවන් වූ වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වෛද්‍ය මධ්‍යස්ථාන සතුව හා ඊට අනුබද්ධව පවත්වාගෙන යන ඔසුසැල්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மருத்துவர்களுக்குச் சொந்தமான மருத்துவ நிலையங்களினுள் அதற்கு இணைந்ததான மருந்தகங்களில் உள்ள மருந்துகள் தொடர்பாகவும் அவ்விடங்களின் தரம் தொடர்பாகவும் பரிசோதிப்பதற்கான பொறி முறை ஒன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இறுதியாக அத்தகைய தளப் பரிசோதனையொன்று மேற்கொள்ளப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) அதன்போது தரநியமங்களுக்குப் புறம்பான இடங்களின் நிமித்தம் சட்டம் அமுல்படுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், சட்டத்தின் முன் குற்றவாளிகளாக்கப் பட்ட மருத்துவர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மருத்துவ நிலையங்களுக்குச் சொந்தமாகவும், அவற்றுடன் இணைந்ததாகவும் பேணிவரப்படு கின்ற மருந்தகங்களின் தரத்தினை மேம்படுத்து வதற்காக நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he state-

(i) whether there is a mechanism to examine the medicine available in pharmacies affiliated to medical centres owned by doctors and also to examine the standard of the aforesaid places;

(ii) if so, the date on which such a site inspection was done the last time;

(iii) whether legal action has been taken in the aforesaid inspections against the places which were not up to the proper standard; and

(iv) if so, the number of doctors who were convicted under the law?

(b) Will he inform this House-

(i) whether action has been taken to enhance the quality of the pharmacies owned by and affiliated to these medical centres; and

(ii) if so, the aforesaid actions?

(c) If not, why ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) 2016.08.31.

(iii) නැත. ප්‍රමිතිය පවත්වාගෙන යාමට උපදෙස් දී අවවාද කර ඇත.

(iv) පැන නොනඟී.

(ආ) (i) ඔව්.

(ii) අවශ්‍ය මාර්ගෝපදේශ සකස්කර ඒවා පිළිබඳ වෛද්‍ය ආයතනවල කාර්ය මණ්ඩල දැනුවත් කිරීම.

එම මාර්ගෝපදේශ රෙගුලාසි ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කිරීම.

එම මාර්ගෝපදේශ පෞද්ගලික වෛද්‍ය සේවා නියාමන සභාවේ වෙබ් අඩවියේ පළ කිරීම (www.phsrc.lk)

පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු හා උපදේශනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, වෛද්‍යවරුන් සතු වෛද්‍ය මධ්‍යස්ථාන තුළ තිබෙන ඔසුසැල්වල වාගේම පෞද්ගලික ඖෂධ වෙළෙඳසැල්වලත් සේවය කරන අති බහුතරයක් පිරිස නියමිත සුදුසුකම් සහ ඖෂධ ක්ෂේත්‍රය පිළිබඳව යම් දැනුමක් තිබෙන අය

[ගරු බුද්ධික පතිරණ මහතා]

නොවන බව සත්‍ය කාරණයක්. ඒ අය සේවයෙන් නෙරපීම -ඉවත් කිරීම- කෙසේ වෙතත්, ඒ අය මේ ව්‍යුහය තුළට ඇතුළත් කර ගැනීමට අමාත්‍යාංශය අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා පළමු වන අතුරු ප්‍රශ්නය විධියට මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ අය මේ ව්‍යුහයට ඇතුළත් කර ගන්න බැහැ. ඖෂධවේදීන් පුහුණු කිරීමට එක ක්‍රමයයි තිබෙන්නේ. අපට ඕනෑ විධියට ඖෂධවේදීන් පුහුණු කරන්න බැහැ. ඖෂධවේදීන් ප්‍රමාණය අඩු නිසා, නීතිය හරියට ක්‍රියාත්මක කළොත් ලංකාව පුරා තිබෙන විශාල ඔසුසැල් ප්‍රමාණයක් වැසී යනවා. ඒ නිසා අපි කල්පනා කරලා අලුතින් තීන්දුවක් ගත්තා, යම් නගරයක ඔසුසැල් ගණනාවක් -දහයක් විතර- තිබෙනවා නම්, ඒ නගරයට අවශ්‍ය ඔසුසැල් ප්‍රමාණය කොච්චරද -දෙකක්ද, තුනක්ද- කියලා තීන්දු කරලා, ඖෂධවේදීන් නැති ඉතුරු ඒවා වසා දැමීමට හෝ ඒවා සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඕනෑ කියලා. එහෙම නැතුව, යම් දුෂ්කර ගම්මානයක තිබෙන එකම ඔසුසැල ඖෂධවේදියෙක් නැහැ කියලා වහලා දැම්මොත් මිනිසුන්ට හදිසියකට ඖෂධයක් ගන්න තැනක් නැති වෙනවා. මේ අර්බුදයට අපි මුහුණපා තිබෙනවා. ඒ නිසා තමයි අපි දැන් ඖෂධවේදීන් ඇතුළු සියලුම අය පුහුණු කිරීමේ ප්‍රමාණය වැඩි කරලා තිබෙන්නේ. ඒවායේ ප්‍රතිඵල ලැබෙන්න තව අවුරුදු දෙක තුනක් යනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය මේ පිළිබඳව වරින් වර ඔබතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් ලිපි ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් වුණු නිසාද කොහේද ඒ අය මටත් ඒ ලියුම්වල පිටපත් එවා තිබෙනවා. බලපත්‍ර රහිතව පවත්වා ගෙන යන වෛද්‍ය මධ්‍යස්ථාන සම්බන්ධව, ඖෂධශාලාවල පැවැත්මට හානි වන අන්දමින් අධික වශයෙන් ඖෂධ ගබඩා කිරීම වැළැක්වීම හා ඖෂධවේදීන් නොමැතිව වෛද්‍යවරුන් පවත්වා ගෙන යන ඖෂධශාලා සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඒ අය ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම ඖෂධවේදීන් නොමැතිව වෛද්‍යවරුන් පවත්වා ගෙන යන ඔසුසැල් වැටලීම්වලදී හසු වුණාම අවවාද කිරීමෙන් පමණක් අපට යථාර්ථවාදී ප්‍රතිඵලයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පළමුවන වටයේදී අපි එහෙම කරනවා. වැටලීම් සඳහා අපේ වැටලීම් අංශයේ සිටින සේවකයන් සංඛ්‍යාව මදි. ඒ නිසා මම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, අපි ඉල්ලා තිබෙන ප්‍රමාණය අපට බඳවා ගන්න දෙන්න කියලා, ලංකාව වටා තිබෙන ඔසුසැල් වැටලීම සඳහා. අපි ලබන 23 වන දා ලංකාවේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ පළමුවන වරට මිල නියාමනය කරනවා. ඒ අනුව ඒ අය නියමිත මිලට ඖෂධ ලබා දෙනවාද කියලා පරීක්ෂා කරන්න වෙනවා. මා ඉල්ලීමක් කරලා තිබෙනවා, මේ පිරිස වැඩි කරන්නට. ඊට පස්සේ ඒ සියලු ඔසු සැල් පරීක්ෂාවට ලක් කරන්න කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ සම්බන්ධයෙන් පැවැති පනතට වඩා ශක්තිමත් පනත් කෙටුම්පතක් ගෙන ඒමට කටයුතු සම්පාදනය කර තිබියදී, වෛද්‍යවරුන් පිරිසකගේ හෝ කණ්ඩායමක බලපෑම මත ඒ පනත් කෙටුම්පත නතර කර තිබෙනවාද, එය, මේ ඖෂධ ශාලාවල ප්‍රමිතිය පිළිබඳ, ඖෂධවේදීන් පිළිබඳ කාරණා යටපත් වීමට හේතුවක් බවට පත් වෙලා තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කාගේවත් බලපෑමකට නොවෙයි. පනත් කෙටුම්පත ගෙනෙන්න පුළුවන්. නමුත් ක්‍රියාත්මක කරන්නේ කෙසේද? ලංකාවේ තිබෙන පෞද්ගලික ඔසු සැල් ප්‍රමාණයට අවශ්‍ය ඖෂධ ප්‍රමාණය නැතුව තිබියදී, අපි නිෂ්පාදනය කරන්නේත් නැත්නම්, පනතක් මඟින් මෙය අනිවාර්ය කරනවාය කියලා ඒ අයට කිව්වොත්, එතැනදී නීතිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද? ඒවා වහන්න ගියොත් රටේ විශාල අර්බුදයක් ඇති වනවා. සාමාන්‍ය මනුෂ්‍යයකුට ඖෂධයක් ලබා ගැනීමට නොහැකි වනවා. මෙය ප්‍රායෝගික ප්‍රශ්නයක්. නිකම් බොරුවට පනත් කෙටුම්පත් pass කරලා වැඩක් නැහැ, ඒ පනත ක්‍රියාත්මක කරන්නේ නැත්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 -744/'16- (1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 -827/'16- (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

On behalf of the Minister of Public Enterprise Development, I ask for two weeks' time to answer that Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න.

ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### I

### වතු කම්කරුවන්ට නිවාස ලබා දීම
### தோட்டத் தொழிலாளர்களுக்கு வீடுகள் வழங்குதல்
### PROVISION OF HOUSES FOR ESTATE WORKERS .

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர் கௌரவ பழனி திகாம்பரம் அவர்க ளிடம் எனது கேள்வியைக் கேட்க அனுமதித்ததற்கு உங்களுக்கு நன்றி கூறுகின்றேன்.

2014ஆம் ஆண்டின் வரவு செலவுத் திட்ட யோசனைக்கு அமைவாகத் தோட்டத் தொழிலாளர்களுக்கு ஐம்பதாயிரம் வீடுகளை அமைக்கும் திட்டத்தின்கீழ், களுத்துறை மாவட்டத்தில் அகலவத்தை-டெல்சித் தோட்டத்தின் லேன்ஸ்கேப் பிரிவிலும் தெனியாய பகுதியிலும் வீடுகளை அமைக்கவென 2014ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 23ஆம் திகதி அன்றைய பெருந்தோட்டத்துறை அமைச்சரும் இன்றைய திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சருமான கௌரவ மஹிந்த சமரசிங்ஹ அவர்களால் வெகு கோலா கலமாக அடிக்கல் நாட்டப்பட்டதாகவும் அத்திட்டத்திற்கு அமைய இதுவரை அந்த மக்களுக்கு எவ்வித வீடுகளும் கட்டிக்கொடுக்கப்படவில்லை என்றும் தெரியவருகின்றது. ஒரு வீடு 12 இலட்சம் ரூபாய் செலவில் நிர்மாணிக்கப்படுமென அன்றைய நகர அபிவிருத்தி அதிகாரசபையினால் அறிவிக்கப் பட்டிருந்த நிலையிலேயே அந்த அடிக்கல் நாட்டு நிகழ்வு இடம்பெற்றதாகவும் களுத்துறை மாவட்டத்தில் மொகமதியா தோட்டம், அஷ்க்வெலி தோட்டம், ஹெதிகல தோட்டம் போன்றவற்றிலும் இத்திட்டத்தின்கீழ் வீடுகள் அமைக்கப் படுமெனக் கூறப்பட்டதாகவும் அப்பகுதி மக்கள் தெரிவிக்கின்றனர். அப்பகுதி தோட்ட மக்கள் நீண்ட காலமாகவே திருத்தங்கள் ஏதும் மேற்கொள்ளப்படாத மிகவும் பழைமை வாய்ந்த 'லயன்' அறைகளில் பல்வேறு சிரமங்களுக்கு மத்தியிலும் தங்களது குடியிருப்புக்கள் எந்த நேரமும் உடைந்து விழலாமென்ற அச்சத்துடனும் வாழ்ந்து வருகின்றனர். எனவே இம்மக்களது வீடமைப்புத் திட்டங்கள் தொடர்பில் நாம் முக்கிய அவதானம் செலுத்த வேண்டியுள்ளது. அந்த வகையில் பின்வரும் வினாக்களை நான் விடுக்க விரும்புகின்றேன்.

**மேற்படி ஐம்பதாயிரம் வீட்டுத் திட்டமானது தற்போது தங்களது அமைச்சின்கீழ் முன்னெடுக்கப்படுகின்றதா? அப்படியாயின் மேற்படி தோட்டத் தொழிலாளர்களுக்கு இத்திட்டத்தின் கீழ் வீடுகள் வழங்கப்படுமா?**

**இத்திட்டம் முன்னெடுக்கப்படாவிட்டால், மேற்படி தோட் டத்தொழிலாளர்களின் வீட்டுப் பிரச்சினைகளைத் தீர்ப்பது தொடர்பில் தங்களது அமைச்சு ஏதேனும் திட்டங் களைக் கொண்டுள்ளதா?**

மேற்படி எனது கேள்விகளுக்கு கௌரவ அமைச்சர் அவர்கள் பதில் கூறுவாரென எதிர்பார்க்கின்றேன்.

**ගරු පලනි දිගම්බරම් මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பழனி திகம்பரம் - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர்)
(The Hon. PalanyThigambaram - Minister of Hill Country New Villages, Infrastructure and Community Development)

2014ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 23ஆம் திகதி களுத்துறை டெல்சித் பகுதியில் அப்போதைய பெருந்தோட்ட கைத்தொழில் அமைச்சரின் தலைமையில் முன்னெடுக்கப்பட்ட தாகக் கூறப்படும் வீடமைப்புத் திட்டத்துடன் தற்போது நான் பொறுப்பேற்றுள்ள அமைச்சுக்கு எவ்வித தொடர்பும் இல்லை. இதற்கான பதிலை பெருந்தோட்ட கைத்தொழில் அமைச்சரிட மிருந்தே பெறவேண்டும் என்பதை இந்தச் சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மேலும், 2014ஆம் ஆண்டு வரவு செலவுத் திட்டத்தின் போது கௌரவ டக்ளஸ் தேவானந்தாவும் நானும் இணைந் திருந்த அரசாங்கம் ஐம்பதாயிரம் வீடமைப்புத் திட்டம் ஒன்றை பெருந்தோட்ட மக்களுக்கென அறிவித்தது உண்மையே. ஆனால், அதற்கான நிதி ஒதுக்கீடு தொடர்பில் தெளிவில்லை. நான் அறிந்தமட்டில் அப்படியொரு வீடமைப்புத் திட்டம் அங்கு செயற்படுத்தப்படவில்லை. ஆனாலும் இப்போது மேதகு ஜனாதிபதி அவர்களினதும் மாண்புமிகு பிரதமர் அவர்களினதும் தலைமையிலான நல்லாட்சி அரசாங்கம் பெருந்தோட்ட மக்களுக்கு 7 பேர்ச் காணியுடன்கூடிய தனி வீட்டுத்திட்டத்தைச் செயற்படுத்த நிதியும் பூரண ஒத்துழைப்பும் வழங்கி வருகின்றதென்பதை மகிழ்ச்சியுடன் தெரிவித்துக் கொள்கின்றேன்.

எனது அமைச்சின் வீடமைப்புத் திட்டத்தில் நுவரெலியா, பதுளை, கண்டி, மாத்தளை, இரத்தினபுரி, கேகாலை, காலி ஆகிய மாவட்டங்களுடன் தற்போது களுத்துறை மாவட்டமும் உள்ளடக்கப்பட்டுள்ளது. தற்போதைக்கு களுத்துறை மாவட்டத்தில் மொஹமதியா தோட்டத்தில் 25 வீடுகளும் ஹெதிகல தோட்டத்தில் 13 வீடுகளும் கோவின்ன தோட்டத்தில் 26 வீடுகளும் நிர்மாணிக்கப்பட்டு வருகின்றன. இவ்வருட இறுதிக்குள் இவ்வீடுகள் மக்களிடம் கையளிக் கப்படும். அதுமாத்திரமன்றி, 'லயன்' வீடுகளை இல்லா தொழித்து, தனி வீடுகளில் பெருந்தோட்ட மக்களை வாழவைக்க வேண்டுமென்ற நோக்கத்தில் மலையக மக்கள் வாழும் பகுதிகளில் பல தடைகளைத் தாண்டி முழுமூச்சுடன்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

வீடமைப்புத் திட்டத்தை நான் முன்னெடுத்து வருகின்றேன். அதன் பயனாக அடுத்த வருடத்தில் மலையக மக்களுக்கு பத்தாயிரம் வீடுகளைப் பெற்றுக்கொடுக்க நல்லாட்சி அரசாங்கம் தீர்மானித்துள்ளது. அதன்மூலம் மக்களின் வீட்டுப் பிரச்சினைக்கு தீர்வு வழங்கப்படுமென்பதைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மலையக மக்களின் பிரச்சினை தொடர்பில் இந்த உயரிய சபையில் கரிசனையுடன் கேள்வி எழுப்பிய கௌரவ உறுப்பினர் டக்ளஸ் தேவானந்தா அவர்களுக்கு மலையக மக்கள் சார்பில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

## II

## දිවි නැගුම සංවර්ධන නිලධාරින් බඳවා ගැනීම සඳහා වූ තරග විභාගයේදී අපේක්ෂකයන්ට සිදු වූ අසාධාරණය

## திவிநெகும அபிவிருத்தி உத்தியோகத்தர் ஆட்சேர்ப்புக்கான திறந்த போட்டிப் பரீட்சையில் அபேட்சகர்களுக்கு ஏற்பட்ட அநீதி

## INJUSTICE CAUSED TO CANDIDATES AT THE COMPETITIVE EXAMINATION FOR RECRUITMENT OF DIVINEGUMA DEVELOPMENT OFFICERS

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයට අයත් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත, දිවි නැගුම සංවර්ධන නිලධාරි iii වන ශ්‍රේණියේ නිලධාරින් බඳවා ගැනීම සඳහා වූ විවෘත තරග විභාගයට ඉල්ලුම් කර සුදුසුකම් සපුරන ලද එහෙත් විභාගය ලිවීමට නොහැකි වූ අයට සිදු වූ අසාධාරණය පිළිබඳව තමයි මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නේ.

පසු ගිය 18වන ඉරු දින සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයට අයත් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත iii වන ශ්‍රේණියේ දිවි නැගුම සංවර්ධන නිලධාරින් බඳවා ගැනීම සඳහා දීප ව්‍යාප්ත විවෘත තරග විභාගයක් පැවැත්වුවා. එම විවෘත තරග විභාගයට අදාළ ගැසට් නිවේදනය 2016.01.14 වන දින දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රසිද්ධ කරනු ලැබුවා.

මෙම විවෘත තරග විභාගයට ඉල්ලුම් කිරීම සඳහා අධ්‍යාපන සුදුසුකම් ලෙස සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 02කට සම්මාන සාමාර්ථ සහිතව එක වර විෂයයන් 06ක් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත් විය යුතු අතර, අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් එක් විෂයක් සමත්ව තිබිය යුතු බවට අදාළ ගැසට් නිවේදනයේ කොන්දේසි තිබුණා.

ගරු කථානායකතුමනි, මේ සඳහා බඳවා ගන්න අධ්‍යාපන සුදුසුකම් ලෙස තිබුණේ අ.පො.ස. (සා. පෙළ) සම්මාන හතරක් සහිතව විෂයයන් 06ක් සහ උසස් පෙළ එක විෂයක් සමත් වීමයි. මේ සුදුසුකම ගත්තොත් අපේ රටේ අ.පො.ස. (සා. පෙළ) සම්මාන හතරක් සහිතව විෂයයන් 06ක් සහ උසස් පෙළ එක විෂයක් සමත් දරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. [බාධා කිරීමක්] ඔව්, ගණිතය, සිංහල, ඉංග්‍රීසි සමත් අය. තවද මෙම විවෘත තරග විභාගයේ සෑම ඉල්ලුම්කරුවකුම රුපියල් 500ක මුදලක් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුමට බැර කළ යුතුයි. ඒක සාමාන්‍ය දෙයක්. ඒ වාගේ විභාගයක් තිබෙනවා නම් ඒ සඳහා මුදලක් අය කරනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. අදාළ විභාගය පැවැත්වීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් භාර දී තිබුණු අතර, දැනට අපට වාර්තා වෙලා තිබෙන කරුණු අනුව දිවයින පුරා 2,05,000කට ආසන්න ඉල්ලුම්කරුවන් විශාල පිරිසක් මෙම විභාගය සඳහා ඉල්ලුම් කර තිබුණු බව පසු ගිය දා මාධ්‍ය විසින් අනාවරණය කර තිබුණා.

සුදුසුකම් සපුරා තිබූ විභාග ඉල්ලුම්කරුවන් විශාල ප්‍රමාණයකට පසු ගිය 18 වැනි දින විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබී අසාධාරණයට ලක් වූ බවද, අසාධාරණයට ලක් වූවන් එකී මාධ්‍යය වෙත අනාවරණය කර තිබුණා. තවද, දෙමළ මාධ්‍යයෙන් විභාගය ඉල්ලුම් කරන ලද බොහෝ අපේක්ෂකයින් වෙත සිංහල මාධ්‍යයෙන් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කර තිබුණා. ඒ වාගේම සිංහල මාධ්‍යයෙන් විභාගය ඉල්ලුම් කරන ලද දරුවන්ට දෙමළ මාධ්‍යයෙන් ප්‍රවේශ පත්‍ර නිකුත් කර තිබුණා. මෙම කරුණුවලට අමතරව විභාග ප්‍රවේශ පත්‍රයේ නම, ජාතික හැඳුනුම්පත් අංකය විශාල ලෙස වැරදියට සඳහන් වෙලා තිබුණා. සමහර අයගේ නම වැරදියි.

ජාතික හැඳුනුම්පතේ තිබෙන නම නොවෙයි, ප්‍රවේශ පත්‍රයේ තිබුණේ. ජාතික හැඳුනුම්පතේ අංකය නොවෙයි, ප්‍රවේශ පත්‍රයේ ජාතික හැඳුනුම්පත් අංකය හැටියට සඳහන්වෙලා තිබුණේ. මේ වාගේ ගැටලු ගණනාවකට ඔවුන් මුහුණ දුන්නා. මෙම විභාගය දිස්ත්‍රික්ක 25ක පැවැත්වීමට කටයුතු යොදා තිබූ අතර, ඉල්ලුම්කරුවන් වෙත ඔවුන්ගේ පහසුව සඳහා ආසන්නම විභාග මධ්‍යස්ථානයට යොමු කරන බවට ගැසට් නිවේදනයේ අදාළ නගර අංක සඳහන් කර තිබුණත්, විභාග අපේක්ෂකයින් බොහෝ දෙනෙකුට ඒ ආසන්නම මධ්‍යස්ථානය ලැබුණේත් නැහැ. මොකද, ඒගොල්ලන් අදාළ නගර අංකය දාලා තිබුණාට එතැනත් පටලවලා තිබුණා. මෙම විභාගය සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින් 2016 සැප්තැම්බර් මාසයේ 04 වැනි දින සති අන්ත පුවත් පත් කීපයක අදාළ දැන්වීම පළ කර තිබුණා.

ගරු කථානායකතුමනි, සැප්තැම්බර් මාසයේ 04 වැනිදා කිව්වා, මේ විභාගය තිබෙන්නේ සැප්තැම්බර් 18 වැනිදායි කියලා. විභාගය සඳහා සති දෙකක කාලයක් ප්‍රමාණවත්. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. ප්‍රවේශ පත්‍රයක් නොලැබුණු අය www.external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිසෙන ලෙසට දන්වා තිබුණා. ඒ වාගේම තොරතුරු විමසීම සඳහා දුරකථන අංක දෙකක් සඳහන් කර තිබුණා. එම නිවේදනය පළ කළේ සැප්තැම්බර් මාසයේ 04 වැනිදායි. හැබැයි, එම නිවේදනයට අනුව ගැටලු පවතින අයට එම ගැටලු නිරාකරණය කර ගැනීමට අවස්ථාව ලබා දුන්නේ සැප්තැම්බර් මාසයේ 14 වැනිදා ඉඳලා 18 වැනිදා දක්වායි. සැප්තැම්බර් 04 වැනිදා පත්තරේ දැන්වීම දමනවා, ගැටලු තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, ගැටලු ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්නේ සැප්තැම්බර් මාසයේ 14 වැනිදා සිට 18 වැනිදා දක්වායි. එම කාලය තුළ සිකුරාදා දිනය නිවාඩු දිනයක් වූ බව ඔබතුමා දන්නවා, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි. සැප්තැම්බර් මාසයේ 18 වැනිදා විභාගය පැවැත්වෙනවා. ඒ අනුව දින තුනකටත් අඩු කාලයක් තමයි ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවස්ථාව ලබා දුන්නේ, ගරු කථානායකතුමනි. මෙම හේතුව මත දිවයිනේ ඈත පළාත්වල සිටි විභාග ඉල්ලුම්කරුවන් බොහෝ දෙනෙකුට තම ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

වෙත පැමිණීමට සිදු වුණා. එහෙත් ගැටලු නිරාකරණය කර ගැනීමට නොහැකි වූ අය මෙන්ම ඒ සඳහා පැමිණීමට නොහැකි වූ විශාල පිරිසක්ද ඒ අතර සිටියා. සුදුසුකම් තිබියදීත් ඔවුන්ට පසු ගිය 18 වැනි දින විභාගයට සඳහා පෙනී සිටීමට අවස්ථාව අහිමි වීම නිසා ඔවුන් විශාල ලෙස අසාධාරණයට ලක් වුණා. ඒගොල්ලන්ට සුදුසුකම් තිබුණා. නමුත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විභාගය පැවැත්වීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගවල දුබලතාවන් හේතු කොටගෙන විශාල ප්‍රමාණයකට විභාගයට ලියන්න බැරි වුණා. ඒක ඔබතුමාගේ සෘජු මැදිහත්වීමක් නොවෙයි, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි. නමුත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එය නිවැරදි පරිදි කළමනාකරණය කර ගැනීමට අසමත් වූ ගැටලුව තමයි මෙතැන පෙන්නුම් කරලා තිබෙන්නේ. මෙම තත්ත්වය තුළ පැනනඟින පහත ගැටලුවලට ඇමතිතුමා පිළිතුරු දෙනවා ඇතැයි කියා මා බලාපොරොත්තු වෙනවා.

1. මෙම විභාගය සඳහා කොපමණ පිරිසක් අයදුම් කරනු ලැබුවේද?
2. මෙතරම් විශාල පිරිසක් අයදුම් කරන ලද දීපව්‍යාප්ත විභාගයක් පැවැත්වීම විභාග දෙපාර්තමේන්තුව මඟින් නොකළේ ඇයි?

   විභාග දෙපාර්තමේන්තුවෙන් කළොත් සාමාන්‍යයෙන් ඒ සඳහා වැඩි කාලයක් ඉල්ලයි. එච්චර තමයි වෙන්න පුළුවන්. හැබැයි, විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගයක් කෙරෙහි තමයි අපේ රටේ ජනතාව තුළ තවමත් විශ්වාසයක් පවතින්නේ. පසු ගිය කාලයේ පොඩි අවුල් ටිකක් සිද්ධ වුණා. නමුත්, තවමත් විභාග දෙපාර්තමේන්තුව කෙරෙහි අපේ රටේ දරුවන් තුළත්, පොදු ජනතාව තුළත් විශ්වාසයක් තිබෙනවා.
3. විභාගයට අදාළව මෙතරම් ගැටලු සහගත තත්ත්වයක් ඇති වූයේ මන්ද?
4. ගැටලු විසඳීම සඳහා ප්‍රමාණවත් කාලයක් දුන්නේ නැත්තේ ඇයි?
5. සැප්තැම්බර් 18වැනි දින කොපමණ පිරිසක් විභාගයට පෙනී සිටියාද?
6. විභාග දිනයේ විභාගයට පෙනී සිටි අයට පැනනැඟුණු ගැටලු වෙනුවෙන් දෙනු ලබන සහනය කුමක්ද?

   ඒ වාගේම එදින විභාගයට පෙනී සිටීමට නොහැකි වුණු අයට දෙනු ලබන සහනයන් මොනවාද? එක විභාගයක් පවත්වලා, තවත් විභාගයක් පවත්වන්නේ කොහොමද කියන ගැටලුව මෙතැන තිබෙනවා. නමුත්, ඔබතුමන්ලා ඒ සඳහා ලබාදෙන සහනය මොකක්ද?
7. ප්‍රවේශ පත්‍ර නොලැබීම ආදී ගැටලු හේතුවෙන් විභාගයට පෙනී සිටීමට නොහැකිව අසාධාරණයට ලක් වූවන්ට ඒ සහනය ලබා දෙන්න කටයුතු කරන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, මේ සඳහා සුදුසුකම විධියට තිබුණේ අ.පො.ස. (සා. පෙළ) සම්මාන හතරක් සහිතව විෂයයන් 06ක් සහ උසස් පෙළ එක විෂයක් සමත් වීමයි. මේ දෙස බැලුවාම මේ සඳහා ඉල්ලුම් පත්‍ර විශාල ප්‍රමාණයක් එන්න පුළුවන් කියලා දැනෙනවා. එවැනි ඉල්ලුම් පත්‍ර විශාල ප්‍රමාණයක් සහිත විභාගයක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් පැවැත්වීමට ඉඩකඩ සහ හැකියාව නොමැති බවත්, - විශ්වවිද්‍යාලය ඇතුළේ නොවෙයි විභාගය පවත්වන්නේ - එම විභාගය කළමනාකරණය කරගැනීමේදී ගැටලු මතුවීමේ ඉඩකඩ ඇති බවත් පෙනෙනවා. මොකද, බාහිර උපාධිය සඳහා පවත්වන විභාගයේදී 12,000කට අවස්ථාව දෙන්න අමාරුයි කියලා ඊයේ කිව්වා නේ. 12,000ක් සඳහා විභාගයක් පැවැත්වීම අමාරු නම්,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. 90,000යි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, 90,000ක්. [බාධා කිරීමක්] මම අමතර කරුණක් ගැනයි ඒ කිව්වේ. ගරු කථානායකතුමනි, එහෙම එකේ 250,000කට විභාගයක් පවත්වන්න කොහොමත්ම අමාරුයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙවැනි තීරණයක් ගත්තේ ඇයි කියන කරුණ පිළිබඳව ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ පළමුවැනි ප්‍රශ්නයට අදාළ පිළිතුරේ සංඛ්‍යා ලේඛන දැන් හරියටම කියන්න පොඩි අපහසුතාවක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අයදුම් පත්‍ර කීයක් ලැබී තිබුණාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔව්, හරියටම කියන්න අපහසුයි. මොකද, ඒ සංඛ්‍යා ලේඛන විශ්වවිද්‍යාලයෙන් ගන්න ඕනෑ. ඊළඟට, 18වැනි දින කී දෙනෙක් විභාගයට පෙනී සිටියාද කියන කාරණය මට ආසන්න වශයෙන් කියන්න පුළුවන්. හැබැයි, මේ ප්‍රශ්න දෙකට හරියටම පිළිතුරු පසුව ලබාදෙන්නම්. ඒ ප්‍රශ්න දෙක එලෙස තිබියදී ඉතිරි ඒවාට උත්තර දෙන්න මට පුළුවන්. ඔබතුමා ඒකට එකඟයිද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක ඔබතුමා කියන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔව්, ඒක මම ඔබතුමාට කියනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අයදුම් පත්‍ර දාපු ළමයි විභාගය ලියනවා නේ. අයදුම් පත්‍ර ඉදිරිපත් කළත් මෙම ගැටලු නිසා විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සංඛ්‍යාව ඒකෙන් පෙන්නුම් කරනවා. ඒ නිසා එම ප්‍රශ්න දෙකට අදාළ සංඛ්‍යා වැදගත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා ඒ සංඛ්‍යා පසුව ලබා දෙනවාද, නැත්නම් -

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඒ ප්‍රශ්න දෙකට පිළිතුරු මම පසුව කියන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඇත්තටම මේ විභාගය සඳහා 287,000ක් පමණ ඉල්ලුම් පත්‍ර ලැබිලා තිබුණා. ඒ වාගේම ඉල්ලුම් පත්‍ර 45,000 - 50,000 අතර ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වෙලා ඒ අයට විභාගයට ලියන්න බැරිවෙලා තිබෙනවා. මේකට කාරණා කිහිපයක් තිබෙනවා. ඒවා මම පසුව කියන්නම්.

පළමුවැනි කාරණය තමයි, "මේ විභාගය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පවත්වන්න දුන්නේ ඇයි" කියන එක. මේ ගැන විභාග දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසුවාම, මේ විභාගය විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන්න අවුරුදු එකහමාරක විතර කාලයක් යන බව දැනගත්තා, ගරු කථානායකතුමනි. දූෂිත දූප්පත්කම නැති කිරීමේ ව්‍යාපාරය වතුකරයේ සහ උතුරු නැඟෙනහිර ක්‍රියාත්මක නොවීම පිළිබඳ කාරණය LLRC වාර්තාවෙන් සහ ජාත්‍යන්තර මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉදිරිපත් කළ සමහර වාර්තාවලිනුත් මතු කරලා තිබෙනවා. ඒ නිසා මේ සේවකයන් ඉක්මනින් බඳවා ගැනීමේ අවශ්‍යතාව අපට මතු වුණා.

තව කාරණයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, ලෝකයේ අනෙක් හැම රටකම වාගේ මේ ආකාරයට විභාග කටයුතු පැවැත්වීමට අපේ විශ්වවිද්‍යාලවලට අවස්ථාව දෙනවා. එහෙම දුන්නාම විශ්වවිද්‍යාලයේ අවසාන වසරේ, -තුන්වැනි වසරේ- ළමයින් මේ සඳහා සම්බන්ධ කර ගන්නවා. මෙවැනි විභාගයකට රුපියල් මිලියන 100ක් විතර වියදම් වෙනවා. මේ මුදල් මේ ළමයින්ට අමතර ආදායමක් හැටියට දෙනවා. ඇත්තටම රුපියල් 5,000ක වැනි මහපොළ ශිෂ්‍යත්වයෙන් ජීවත් වන දරුවෙකුට, මේ කාලය තුළ රුපියල් 5,000ක, 6,000ක, 7,000ක අමතර ආදායමක් ලබා ගන්න පුළුවන්. ඒක විශ්වවිද්‍යාල දරුවන්ට කරන හොඳ දෙයක්. ඇත්තටම මේ කාර්යයේදී ඔබතුමා කියන විධියට, "මෙච්චර කොහොමද කරන්නේ" කියන අභියෝග සහ ගැටලු සහගත තත්ත්වයන් තිබෙනවා. හැබැයි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මේක භාර ගත්තා, "අපට දෙන්න, මේක අපි කරන්නම්" කියලා. එහෙම වුණත්, මේ විභාගයේදී ගැටලුකාරී තත්ත්වයන් මතු වෙන්න කරුණු කිහිපයක් තිබුණා, ගරු කථානායකතුමනි.

පළමුවැනි දේ තමයි, ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් කාලයක් අපේ රටේ එක්වරක් ගණිතය විෂය අසමත් වූ සිසුන්ට නැවතත් විභාගයට පෙනී සිට ගණිතය විෂය සමත් වීමට ඉඩ ලබා දුන්නා. උදාහරණයක් හැටියට කිව්වොත්, අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේදී එක ළමයෙකුට "ඒ" සාමර්ථ අටක් තිබෙනවා. ඒ ළමයාට සිංහල භාෂාවට "එස්" සාමර්ථයකුයි තිබෙන්නේ. ඒ ළමයා ඊළඟ වතාවේ සිංහල භාෂාව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා ඒකටත් "ඒ" සාමර්ථයක් ගන්නවා. නමුත්, ඒ ළමයාට මේ විභාගයට ඉල්ලුම් කරන්න බැහැ. [බාධා කිරීමක්] පළමුවැනි වතාවේ "ඒ" සාමර්ථ අටක් ගත්ත ළමයාට, සිංහල භාෂාවට "එස්" සාමර්ථයක් තිබෙන්නේ. ඒ ළමයා නැවතත් සිංහල භාෂා ප්‍රශ්න පත්‍රයට ලියලා ඒකටත් "ඒ" සාමර්ථයක් ගන්නවා. දැන් මේ ළමයාගේ සියලු විෂයයන්ට "ඒ" සාමර්ථ තිබෙනවා. හැබැයි, ඒ ළමයාට මේ විභාගයට application දමන්න බැහැ. මේක රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පනවන ලද අලුත් නීතියක්. [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, දරුවන්ගේ ප්‍රශ්නය වැදගත් නිසායි කියන්නේ. සාමාන්‍යයෙන්, විභාගයකට අයදුම් පත් කැඳවන කොට, "දෙවතාවකට නොවැඩි අවස්ථාවකදී" කියන එක ඇතුළත් කරනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඒක මේ වතාවේ තිබුණේ නැහැ නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක තමයි. ඒ අයදුම් පත්‍රයේ ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් අවස්ථා දෙකකදී සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් පිළිගෙන තිබෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඒක තමයි මම මේ කියන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

උසස් පෙළටත් පිළිගෙන තිබෙනවා. එම නිසා දෙවතාවකදී ලබා ගත් සුදුසුකම් පිළිගන්නට තිබුණා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඔව්. නමුත් මෙවර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අවසර දුන්නේ නැහැ. ඒ අවසරය දුන්නේ නැහැ. ගරු කථානායකතුමනි, නමුත් ළමයි පුරුද්දට, පසුව ගණිතයට සම්මානය ලබා ගත්තා. ඒ විධියට එක විෂයක් සඳහා දෙවෙනි වර සම්මානය ලබා ගත්ත ළමයි හිටියා. "ඒ" සාමාර්ථ හතක් අටක් තිබෙන සමහර ළමයින්ට Mathematics වලට තිබෙන්නේ "එස්" එකක් නම් ඒ ළමයි පසුව ඒ සුදුසුකම සපුරා ගන්නවා. ඒ වාගේ අයත් මේ විභාගය සඳහා application දැම්මා. Application දාලා ඒ ළමයා කියනවා, "මේ සඳහා නියමානුකූලව ලියන්නට මට සුදුසුකම් තිබෙනවා. නමුත් මගේ application එක reject වෙලා" කියලා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙතැනදී තවත් බරපතළ ප්‍රශ්නයක් ඇති වුණා. මේක ගැසට් කළ ගමන් මේ සඳහා නොයෙකුත් මුද්‍රණාලවලින් සහ පොත් විකුණන කඩවලින් මේ ඉල්ලුම් පත්‍රය අච්චු ගැහුවා. අපි ගැසට් පත්‍රයේ පළ කර තිබෙන application එක යටින්-පත්තරවලයි හැම එකකම- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි කියන භාෂා තුනෙන්ම ලියලා තිබුණා මේ ඉල්ලුම් පත්‍රයත් සමඟ ඔබගේ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සහතිකවල පිටපත් අමුණන්න කියලා. නමුත් කඩවල්වලින් මුද්‍රණය කළ ඉල්ලුම් පත්‍රයේ හුඟාක් අය මේ කොන්දේසිය මුද්‍රණය කළේ නැහැ. ළමයි කඩෙන් ඉල්ලුම් පත්‍රය අරගෙන පුරවලා එව්වා. නමුත් මේ සහතිකවල පිටපත් ඇමුණුවේ නැහැ. ඒ විධියට එවපු ඉල්ලුම් පත්‍ර 30,000ක් පමණ reject වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා මම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. අපි හෙට නැත්නම් අනිද්දා පත්තරයේ දැන්වීමක් දානවා, සුදුසුකම් තිබිලා සහතිකවල පිටපත් එව්වේ නැති අයට, ඒ බව අපිට දන්වන්න කියලා. ඒ වාගේම සුදුසුකම් තිබෙනවා, සියල්ල සම්පූර්ණයි; නමුත් විභාගය ලියන්නට බැරි වුණු අයටත්, ඒ බව අපට දන්වන්න කියලා. සහතිකවල පිටපත් ඇමුණුවේ නැති අය නම් 30,000ක් පමණ ඉන්නවා. ඔබතුමා හිතන විධියටත්, මම හිතන විධියටත් අමතරව තවත් 7,000ක් 8,000ක් පමණ ඉන්න පුළුවන්. අපි කරන්නට යන්නේ මාස 3ක් ඇතුළත තව විභාගයක් තියලා මේ අයට ඒ අවස්ථාව ලබා දෙන්නයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු අමාත්‍යතුමා, දැන් එක විභාගයක් තියලා අවසන්. නියමිත පුරප්පාඩු සංඛ්‍යාවක් තිබෙන විට මේ විභාගයෙන් ඒ පුරප්පාඩු සංඛ්‍යාවට තෝරා ගන්න වෙනවා. එතකොට විභාග දෙකක් වෙනවා, ප්‍රශ්න පත්‍ර දෙකක් වෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මෙහෙම කරන්නට පුළුවන්. අපි මෙහෙම හිතමු. ගන්නේ 4,000 නම් එයින් සියයට 25ක් දෙනවා නැවත පවත්වන විභාගය සඳහා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අපි හිතමු ඉල්ලුම් පත්‍ර 100,000ක් ලැබුණා කියලා. 25,000කට ලියන්නට බැරි වුණා නම් ඒ කියන්නේ හතරෙන් එකක්. ඒ අනුව බඳවා ගැනීම්වලින් හතරෙන් එකක් වෙන් කරන්නට ඕනෑ අලුතෙන් විභාගය තියන අයට.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

අන්න හරි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එවැනි සාධාරණයක් කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රධාන කටයුතු.

## විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත
## பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம்
## UNIVERSITIES (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.39]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

I move,

"That the Bill be now read a Second time."

ගරු කථානායකතුමනි, මෙය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. විශ්වවිද්‍යාලවල සේවය කරන අනධ්‍යයන සේවකයන්ගේ සංඛ්‍යාව - non-academic staff එක - 13,207ක් පමණ වෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් මේ විශ්වවිද්‍යාලවල සේවය කරමින් සිටිනවා. ඒ අය කාලයක් තිස්සේ මේ ඉල්ලීම කළා. ඔවුන් විශ්‍රාම යන වයස අවුරුදු 57යි. අවුරුදු 57 ඉවර වුණාට පසුව සේවයේ ඉන්න නම් අවුරුද්දක් පාසා ඔවුන් ඉල්ලුම් පත්‍ර දමන්න ඕනෑ. අද මෙම පනත් සංශෝධනයෙන් අප කරන්නේ ඒ අයත් රටේ සිටින අනිකුත් රාජ්‍ය සේවකයන්ගේ මට්ටමටම ගෙනැත්, ඔවුන්ගේ විශ්‍රාම යාමේ වයසත් අවුරුදු 57 සිට 60 දක්වා දීර්ඝ කිරීමයි. විශ්වවිද්‍යාලවල සේවය කරන අනධ්‍යයන සේවකයන් අවුරුදු 10ක්, 15ක් තිස්සේ මේ ඉල්ලීම කර තිබුණා. නමුත්, පසු ගිය රජයෙන්වත් ඊට කලින් තිබුණු රජයෙන්වත් ඊට කිසිම ආයකත්වයක් ලැබුණේ නැහැ. අද මෙම පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව විශ්වවිද්‍යාලවල සේවය කරන අනධ්‍යයන සේවකයන් 13,207කගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ වෙනවා. ගරු කථානායකතුමනි, මම කෙටියෙන් මේ ගැන පැහැදිලි කරන්නම්, for the sake of Hansard.

ශ්‍රී ලංකාවේ සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවය කරනු ලබන 13,207ක් පමණ වන සියලුම අනධ්‍යයන සේවකයන්ට බලපාන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි, අනධ්‍යයන සේවකයන් විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් වන අංක 75 දරන වගන්තිය සංශෝධනය කිරීම පිණිස මෙම යෝජනාව ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ ඇත.

විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල සේවයේ නියුතු සේවකයෙකු තම වයස අවුරුදු 57 සම්පූර්ණ වූ පසු සේවා දිගුවක් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම් දැනට පවතින විධිවිධාන ප්‍රකාරව ඒ සඳහා පූර්වයෙන් අයදුම් කළ යුතුව ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලවල පාලන අධිකාරිය මඟින් සේවා අවශ්‍යතාව සලකා බලා වයස අවුරුදු 57න් ඔබ්බට සේවා දිගුවක් වාර්ෂිකව ලබා දීමට ක්‍රියා කිරීමට සිදුව ඇත. එසේ වුවද, රාජ්‍ය සේවයේ මෙම තත්ත්වය වර්තමානයේදී වෙනස් වී ඇත. ඒ අනුව රාජ්‍ය සේවයේ සියලුම සේවකයන්හට ස්වකීය අභිමතය පරිදි විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඛණ්ඩව රජයේ සේවයේ නිරත වීමට අවස්ථාව සැලසී ඇත.

මෙම වරප්‍රසාදය විශ්වවිද්‍යාලවල සේවය කරනු ලබන සේවකයන්ටද ලබා දෙන ලෙස විශ්වවිද්‍යාල සේවකයන් සහ වෘත්තීය සමිති අවුරුදු 15ක් වැනි දීර්ඝ කාලයක සිට ඉල්ලීම් කරනු ලබයි. එමෙන්ම රාජ්‍ය අංශයේ සේවය කරන සියලුම සේවකයන්ට සම තත්ත්වයේ සේවා ව්‍යුහයක් ලබාදිය යුතුය යන්න රජයේද ප්‍රතිපත්තිය වේ. ඒ අනුව විශ්වවිද්‍යාවල සේවය කරන සේවකයන්හට වයස අවුරුදු 60 දක්වා - විශ්‍රාම යෑමේ වයස දක්වා - නැවත ඉල්ලීමකින් තොරව ස්වකීය අභිමතය පරිදි අඛණ්ඩව සේවය කිරීමට මෙම සංශෝධනය අනුව අවස්ථාව සැලසෙනු ඇත.

තවද, විශ්වවිද්‍යාල පනතට ඉදිරිපත් කරනු ලබන මෙම නව සංශෝධනයේ ස්වභාවය අනුව ඉදිරියේදී රජයේ සේවකයන්ගේ විශ්‍රාම ගැනීමේ වයසේ කිසියම් වෙනසක් සිදුවුවහොත් එම වෙනස්කම්ද නිරායාසයෙන්ම විශ්වවිද්‍යාලවල සේවකයන්ට අදාළ කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ඒ පරිද්දෙන් විශ්වවිද්‍යාල පනතට සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු සිවශක්ති ආනන්දන් මහතා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு,* மாண்புமிகு சபாநாயகர் அவர்கள் *அக்கிராசனத் தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் உங்களுடைய உரையை ஆரம்பியுங்கள்!

[மு.ப. 11.43]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்திலே கலந்துகொண்டு சில விடயங்களைக் குறிப்பிடலாம் என்று நினைக்கின்றேன். குறிப்பாக, வவுனியா வளாகத்தை வன்னிப் பல்கலைக்கழகமாகத் தரம் உயர்த்துவது தொடர்பாகவும் அதற்கான பௌதிக, நிதி வளங்களைப் பெற்றுக்கொள்வது தொடர்பாகவும் அங்கிருக்கக்கூடிய புத்திஜீவிகள், பொதுமக்கள், நலன்விரும்பிகள் உட்படப் பலரும் நீண்ட காலமாக என்னிடம் கோரிக்கை விடுத்து வருகின்றார்கள். அது முழுமையாக நிறைவேற்றப்படவில்லை. ஆகவே, வவுனியா வளாகத்தை வன்னிப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்துவது தொடர்பில் சில விடயங்களை இங்கே முன்வைக்கலாமென்று நினைக்கின்றேன்.

1990களில் அதிகரித்துவந்த உயர் கல்வித் தேவைகளைப் பூர்த்தி செய்வதற்காக மாகாணங்கள் தோறும் 09 இணைந்த பல்கலைக்கழகக் கல்லூரிகள் ஆரம்பிக்கப்பட்டபோது, வட மாகாண இணைந்த பல்கலைக்கழகக் கல்லூரி 1991இல் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்துடன் இணைந்ததாக ஆரம்பிக்கப்பட்டது. பின்னர், அரசினால் சில இணைந்த பல்கலைக்கழகக் கல்லூரிகள் ஒன்றிணைக்கப்பட்டு, 1996இல் ரஜரட்ட, சப்ரகமுவ, தென்கிழக்கு ஆகிய பல்கலைக்கழகங்களும் 1997இல் வயம்ப பல்கலைக்கழகமும் தேசிய பல்கலைக்கழகங்களாகத் தரமுயர்த்தப்பட்டன. 1997இல் வவுனியா மற்றும் திருகோணமலை இணைந்த பல்கலைக்கழகக் கல்லூரிகள் வளாகங்களாகத் தரமுயர்த்தப் பட்டு, இன்றுவரை யாழ்ப்பாணம் மற்றும் கிழக்குப் பல்கலைக்கழகத்துடன் இணைந்த வளாகங்களாகவே இயங்கி வருகின்றன. எனினும், 1997இலிருந்து வவுனியா வளாக மாணவர்கள், ஊழியர்கள், வளாக நலன் விரும்பிகள், உள்ளூர்ப் பிரமுகர்கள், அரசியல்வாதிகள் மற்றும் பொதுமக்கள் பிரதிநிதிகள் ஆகியோர் தொடர்ச்சியாகப் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவிடமும் உயர்கல்வி அமைச்சிடமும் மேதகு ஜனாதிபதி அவர்களிடமும் வவுனியா வளாகத்தைப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்தக் கோரி, சாத்வீகமான தொடர் போராட்டங்களை முன்னெடுத்து வந்திருக்கின்றார்கள். அப்போதெல்லாம், அவர்களது நியாயமான கோரிக்கைகள் ஏற்றுக்கொள்ளப்படுவதாகவும் அவை பரிசீலிக்கப்பட்டு நடவடிக்கை எடுக்கப்படுமென உறுதிமொழிகள் வழங்கப்பட்டும் வந்துள்ளன. எனினும், துரதிருஷ்டமாக அவை எவையும் இன்றுவரை நடைமுறைப் படுத்தப்படவில்லை என்பது வேதனைக்குரிய விடயமாகும்.

எனினும், கௌரவ உயர் கல்வி இராஜாங்க அமைச்சர் மொஹான் லால் கிரேரு அவர்கள், வவுனியா வளாகப் புதிய மாணவர் விடுதியினை 22.11.2015 அன்று வளாக நிரந்தர அமைவிடமான பம்பைமடுவில் திறந்துவைத்து உரையாற்றும் போது, வவுனியா வளாகத்தினைப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்தவேண்டும் என்ற நீண்ட காலக் கோரிக்கையினைத் தான் ஏற்றுக்கொள்வதாகவும் அது தொடர்பான செயல்திட்ட யோசனையை முன்வைக்குமாறும் அதனைத் தரமுயர்த்துவதற்குத் தேவையான நடவடிக்கைகளைத் தான் முன்னெடுப்பதாகவும் குறிப்பிட்டார். அதனைத் தொடர்ந்து செயல்திட்ட யோசனை தயாரித்தல் தொடர்பான விடயங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்றன.

வன்னித் தேர்தல் மாவட்டமானது வவுனியா, மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்டங்களை உள்ளடக்கியுள்ள துடன், மொத்தமாக ஐந்து இலட்சத்துக்கும் மேற்பட்ட சனத்தொகைப் பரம்பலையும் கொண்டுள்ளது. வன்னி மாவட்டமானது, 30 வருடங்களாக யுத்தம் மற்றும் இயற்கைச் சீற்றங்களால் பாதிக்கப்பட்டு வந்தாலும், இறுதிக்கட்ட யுத்த நடவடிக்கைகளால் மிகவும் கடுமையாகப் பாதிக்கப்பட்ட தாகும். இங்குள்ள மக்கள் பெரும்பாலும் மிகக் கடுமையாகப் பாதிப்புக்குள்ளான நிலைமையில் இருப்பதால், தற்போது சகல வளங்களிலும் மீளமைப்பு, புனரமைப்பு, புனர்வாழ்வு என பல்வேறு நடவடிக்கைகளின் தேவைகள் அங்கு அவசியமாகும்.

மனிதவள மேம்பாடு என்பது மிகவும் கவனிக்கப்படவும் வலியுறுத்தப்படவும் வேண்டியதொன்றாகவே கணிக்கப்படு கின்றது. இத்தகைய தேவைகளை நிறைவேற்றுவதற்கு பல்கலைக்கழகமொன்றின் தேவை அதிகம் உணரப்படுகிறது. பல்கலைக்கழகமொன்றினூடாக மனிதவள அபிவிருத்தியும் பிரதேச அபிவிருத்தியும் நாட்டின் அபிவிருத்திக்குப் பங்களிப்பு வழங்க முடியுமாதலால், வவுனியா வளாகத்தை முழுமை பெற்ற ஒரு பல்கலைக்கழகமாக உடனடியாகத் தரமுயர்த்த வேண்டுமென்று வலியுறுத்துகின்றேன். மேலும், வவுனியா வளாகத்தின் நிரந்தர அமைவிடமான பம்மைமடுவில் செயலாற்றுவதற்கென ஒதுக்கப்பட்டுள்ள 160 ஏக்கர் காணியில் தேவையான பௌதிக மற்றும் ஆளணி வளங்கள் கடந்த 30 வருட கால போர் சூழ்நிலைகளால் வளர்ச்சியடைய முடியாத நிலையிலுள்ளன. அவற்றுக்கான துரித நடவடிக்கைத் திட்டங்கள் எவையும் ஆரம்பிக்கப்படவில்லை என்பதைச் சுட்டிக்காட்டுவதோடு, பௌதிக வளங்களை ஏற்படுத்து வதற்குத் தேவையான நிதி வசதிகளை அரசாங்கம் ஒதுக்கீடு செய்து உடனடியாக அதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட

வேண்டுமென்றும் வலியுறுத்துகின்றேன். இதுதொடர்பாக கௌரவ உயர் கல்வி அமைச்சர், கௌரவ உயர் கல்வி இராஜாங்க அமைச்சர், உயர் கல்வி அமைச்சு மற்றும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு ஆகியன ஒன்றிணைந்து உரிய நடவடிக்கைகளை விரைவாக மேற்கொள்ள வேண்டுமென்று இவ்வுயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா வளாகத்திற்கு அவசியமான பௌதிக வளங்களை ஏற்படுத்துவதற்காக 2014ஆம் ஆண்டு முன்வைக்கப்பட்ட பின்வரும் செயற்றிட்ட முன்மொழிவுகள் தேசிய திட்டமிடல் சபையால் திறைசேரிக்குப் பரிந்துரைக்கப் பட்டபோதும் இன்றுவரை நிதி ஒதுக்கீடுகள் அரச நிதியிலிருந்து ஒதுக்கப்படவில்லை. இரு மாடிகள் கொண்ட கட்டிடத்தொகுதிக்கான மதிப்பீடு 333 மில்லியன் ரூபாய்; 1000 பார்வையாளர்கள் அமரக்கூடிய மண்டபம் 198 மில்லியன் ரூபாய்; மூன்று மாடிகள் கொண்ட நூலகக் கட்டிடத் தொகுதி 250 மில்லியன் ரூபாய்; மூன்று மாடிகள் கொண்ட ஊழியர்கள் தங்குமிட கட்டிடத்தொகுதி 178 மில்லியன் ரூபாய்; மூன்று மாடிகள் கொண்ட தகவல் தொடர்பாடல் தொழில்நுட்பக் கட்டிடத் தொகுதி 167 மில்லியன் ரூபாய் என்றவாறு அப்போதைய முன்மொழிவுகள் காணப்பட்டன.

தற்போது பிரயோக விஞ்ஞானம் மற்றும் வியாபாரக் கற்கைகள் ஆகிய இரண்டு பீடங்களினாலும் நடத்தப்பட்டு வரும் 8 பட்டப்படிப்பு பாடநெறிகளில் சுமார் 800 உள்ளக மாணவர்கள் கல்வி கற்று வருகின்றனர். வவுனியா வளாகத்தில் கல்விசார் மற்றும் கல்விசாரா ஊழியர்கள் மொத்தம் 154 பேர் கடமையாற்றி வருகின்றனர். புதிய கல்வியாண்டு 2015/16 முதல் வவுனியா வளாகத்தில் தொழில்நுட்பப் பாடங்களின்கீழ் புதிய பட்டப்படிப்பு பாடநெறி ஆரம்பிக்கப்படவுள்ளதுடன், அதன்மூலம் மூன்றாவது புதிய தொழில்நுட்பப் பீடத்தினை ஆரம்பிக்கவும் நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றது. வியாபாரக் கற்கைகள் பீடத்திற்காக புதிய கட்டிடத்தொகுதி ஒன்றினை அமைப்பதற்காக 895 மில்லியன் ரூபாய்க்கான செயற்றிட்ட முன்மொழிவொன்றும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவினூடாக உயர் கல்வி அமைச்சின் அனுமதிக்காக அனுப்பப்பட்டுள்ளது.

உயர் கல்வி அமைச்சினால் அறிமுகப்படுத்தப்பட்டுள்ள பல்கலைக்கழகப் பிரதேசங்களை நகரமயமாக்கல் மூலம் பல்கலைக்கழகங்களுக்கும் பொதுமக்களுக்குமிடையிலான நல்லுறவை வளர்ப்பதனூடாக அபிவிருத்தித் திட்டங்களை முன்னெடுப்பதற்கான செயற்றிட்ட முன்மொழிவுகள் வவுனியா வளாகத்தினால் ஏற்கெனவே சமர்ப்பிக்கப்பட்டுள்ளன. இவற்றுக்குப் பல்வேறு சிறிய மற்றும் நடுத்தர செயற்றிட்ட முன்மொழிவுகளினூடாக 4,500 மில்லியன் ரூபாய் கோரிக்கை யாக முன்வைக்கப்பட்டுள்ளன. அத்துடன், வவுனியா வளாகத்தின் 25ஆவது வருட பூர்த்தியை இவ்வருடம் நவம்பர் மாதம் கொண்டாடுவதற்கான ஏற்பாடுகளைச் செய்து வருகின்ற அதேவேளையில், மனிதவள மற்றும் பௌதிக வளங்களின் பற்றாக்குறை காரணமாக உயர் கல்வி நிறுவகம் எனும் அந்தஸ்தினைப் பேணிவருவதில் பல சிரமங்களை எதிர்நோக்கி வருகின்றது என்பதையும் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

உலகமயமாக்கல் மற்றும் பல்வேறு துறைகளினதும் துரித அபிவிருத்தி வளர்ச்சிப் பாதையில் பயணிப்பதற்கும் வன்னி மாவட்ட மக்களின் அபிலாசைகளைப் பூர்த்தி செய்யவுமென வவுனியா வளாகத்தினைப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்த வேண்மென வலியுறுத்துகின்றேன். வவுனியா வளாகம் 25ஆவது வருட பூர்த்தியைக் கொண்டாடும் இச்சந்தர்ப்பத்தில் இவ்வருடத்தில் அதனை வன்னிப் பல்கலைக்கழகமாக தரமுயர்த்துவதன்மூலம் வன்னி மாவட்ட மக்களின் நீண்டகால அபிலாசைகளைப் பூர்த்திசெய்து, நல்லாட்சி அரசாங்கத்தின் அதிகாரப் பரவலாக்கலின் நன்மையை வன்னி மாவட்ட மூவின மக்களும் பெற்றுக்கொள்வதற்கு இச்சந்தர்ப்பத்தினைப் பயன்படுத்திக்கொள்ளுமாறு அரசாங்கத்திடம் கேட்டுக்கொள் கிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீண்டகாலமாக மூவின மக்களும் வாழ்கின்ற எங்களுடைய மாவட்டத்தில் இந்தக் கோரிக்கை விடுக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இதனை நீங்கள் கவனத்தில் எடுத்து இதனை வன்னிப் பல்கலைக் கழகமாகத் தரமுயர்த்துவதற்கு தேவையான சகல நிதி ஆதாரங்களையும் ஏனைய விடயங்களையும் செய்து தரும்படி அங்கு பாதிக்கப்பட்டிருக்கின்ற மக்கள், புத்திஜீவிகள், அரசியல் பிரமுகர்கள் சார்பாக உங்களிடம் கோரிக்கை விடுக்கின்றேன்.

இவற்றுக்கு அப்பால், இன்னும் சில முக்கியமான விடயங்களையும் இச்சந்தர்ப்பத்தில் குறிப்பிட நினைக் கின்றேன். அநுராதபுரம் சிறைச்சாலையிலே அரசியல் கைதிகள் 2வது நாளாக உண்ணாவிரதமிருந்து வருகிறார்கள். அவர்கள் தங்களுடைய விடுதலை தொடர்பாகப் பல தடவைகள் இந்த உண்ணாவிரதத்தை மேற்கொண்டிருந் தார்கள். இவர்களுக்கு வாக்குறுதிகள் கொடுக்கப்படுவதும் மீண்டும் அவை மீறப்படுகின்ற நிலைமையும்தான் தொடர்ந்து கொண்டிருக்கின்றது. இந்த விடயம் தொடர்பாக அரசாங்கத்தால் உரிய நடவடிக்கைகள் எடுக்கப்படவில்லை. அவர்கள் ஒரு வழக்கிலிருந்து நீதிமன்றத்தால் விடுவிக்கப் பட்டாலும் இன்னுமொரு நீதிமன்றத்தில் மீண்டும் வழக்குத் தொடரப்படுகின்றது. மேலும், இந்த வழக்குகள் வட மாகாணம் தவிர்ந்த ஏனைய மாட்டங்களில் நடைபெறுவதால் மொழி ரீதியான பிரச்சினைகள் இருக்கின்றன.

இப்படிப் பல்வேறுபட்ட பிரச்சினைகளைப் பற்றிய கோரிக்கைகளை முன்வைத்து அவர்கள் உண்ணாவிரதம் இருக்கிறார்கள். நீண்டகாலம் சிறையிலே வாடுகின்ற இந்த அரசியல் கைதிகளின் உண்ணாவிரதத்தை நீங்கள் ஒரு முடிவுக்குக் கொண்டுவரவேண்டும். இந்த அரசாங்கம் ஓர் உண்மையான நல்லிணக்கத்தை அல்லது நம்பிக்கையைக் கட்டியெழுப்ப நினைத்தால் இந்த அரசியல் கைதிகள் எல்லோருக்கும் நிபந்தனையின்றிப் பொதுமன்னிப்பு வழங்கி விடுதலை செய்யவேண்டும் என்பதைத் தொடர்ச்சியாக நாங்கள் வலியுறுத்தி வருகின்றோம். நல்லிணக்கமும் நம்பிக்கையும் அரசாங்கத்தின் தரப்பிலிருந்து வரவேண்டும். அதைச் செய்வதனூடாகத்தான் இந்த நம்பிக்கையையும் நல்லிணக்கத்தையும் கட்டியெழுப்ப முடியும். வெறுமனே ஒரு தரப்பால் மட்டும் இதனை ஏற்படுத்த முடியாது. இதேபோன்று இன்னும் பல்வேறுபட்ட பிரச்சினைகள்!

நாங்கள் கடந்த வாரம் முல்லைத்தீவு மாவட்டத்தில் புதுக்குடியிருப்பு, ஒட்டுசுட்டான், கரைதுறைப்பற்று போன்ற பிரதேசங்களின் ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களுக்குச் சென்றிருந்தபோது, பிரதேசச் செயலகத்துக்கு முன்பாக நூற்றுக்கணக்கான பொதுமக்கள் கூடி, எதிர்வருகின்ற பருவ மழைக்கு முன்பாகத் தங்களுக்கான வீட்டுத் திட்டங்களைத் தந்துதவும்படி உருக்கமான வேண்டுகோளை விடுத்திருந்தார்கள். யுத்தம் முடிவடைந்து இன்றைக்கு ஏழு வருடங்கள் கடந்திருக்கின்றன. இந்த ஏழு வருட காலத்திற்குள் போரினால் பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கான ஒரு வீட்டுத் திட்டத்தைக்கூட வழங்க முடியவில்லை. அதுமட்டுமல்ல, அவர்களுக்கான ஒரு தற்காலிகமான வீட்டுத்

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

திட்டத்தையாவது வழங்க முடியவில்லை. ஆகவே, இந்த வீட்டுத்திட்டம் தொடர்பாகவேனும் மீள்குடியேற்றம் மற்றும் சிறைச்சாலைகளுக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ சுவாமிநாதன் அவர்கள் கவனம் செலுத்த வேண்டும்.

ஆரம்பத்திலே 65 ஆயிரம் வீட்டுத்திட்டம் பற்றிப் பேசப்பட்டது. அந்தப் பொருத்துவீடு எங்களுடைய பிரதேசத்துக்குப் பொருத்தமில்லை; அவை நிரந்தரமான கல் வீடுகளாக மாற்றப்பட வேண்டும்; அந்த 65 ஆயிரம் வீட்டுத்திட்டம் ஓர் இலட்சத்து முப்பதாயிரமாக அதிகரிக்கப்பட வேண்டும் என்பதைக்கூட நாங்கள் பாராளுமன்றத்தில் பேசியிருக்கின்றோம்; ஜனாதிபதி மற்றும் பிரதமருடனும்கூடப் பேசப்பட்டிருக்கின்றது. எழுத்துமூலமாகவும் தெரிவித்திருக்கின்றோம். ஆனால், இந்த 65 ஆயிரம் பொருத்து வீட்டுத்திட்டம் மாற்றியமைக்கப்பட்டிருக்கின்றதா? அல்லது அது வழங்கப்படுமா, இல்லையா? அது பொருத்து வீட்டுத்திட்டமாக வழங்கப்படுமா? அல்லது நிரந்தரமான கல்வீடாக வழங்கப்படுமா? என்பது பற்றி இற்றைவரைக்கும் எங்கள் யாருக்குமே தெரியாது.

அரசியல் கைதிகளுடைய விடுதலையில் அரசாங்கம் அக்கறை இல்லாமல் இருக்கின்றது; மீள்குடியேற்ற விடயங்களிலே எந்தவிதமான முடிவில்லாமல் இருக்கின்றது; காணாமற்போனவர்கள் தொடர்பாகவும் எதுவுமில்லை. ஆகவே, இப்படியான சூழ்நிலையிலே எப்படி ஒரு நல்லிணக்கத்தை, நம்பிக்கையைக் கட்டியெழுப்ப முடியும்? என்பதை அரசாங்கம் உணர்ந்துகொள்ள வேண்டும். உண்மையிலே இந்த நல்லிணக்கத்தை ஏற்படுத்துவதற்குப் பதிலாக இன்றைக்கும் நீங்கள் என்ன செய்கின்றீர்கள்? ஏற்கெனவே முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவினுடைய ஆட்சிக் காலத்திலே - அந்த அரசாங்கத்திலே பின்பற்றப்பட்ட நிகழ்ச்சிநிரலின்படிதான் இன்றைய அரசாங்கமும் அதாவது நீங்களும் செல்வதாகத் தெரிகின்றது. எங்களுடைய மக்கள் பல வருட காலமாகச் சொந்தக் காணிகளிலே மீளக்குடியேற முடியாத நிலைமை தொடர்ந்தும் நீடிக்கின்றது. கால் நூற்றாண்டு கடந்தும் யாழ்ப்பாணத்தைச் சேர்ந்த மக்கள் அல்லது கிழக்கு மாகாணத்தைச் சேர்ந்த மக்கள் தங்களுடைய நிலங்களைப் பெற்றுக்கொள்ள முடியவில்லை. இராணுவம் தன்னுடைய கட்டுப்பாட்டின்கீழ்தான் இந்தக் காணிகளை வைத்துக் கொண்டிருக்கின்றது. ஜனாதிபதி அங்குபோய் அந்தக் காணிகள் விடுவிக்கப்படும் என்று வாக்குறுதி வழங்குகின்றார். ஆனால், இராணுவத் தளபதி சொல்கின்றார், இராணுவத்தின் பாதுகாப்புத் தேவை கருதி இந்த நிலங்களை விடுவிக்க முடியாதென்று. ஆகவே, இந்த நாட்டிலே ஜனாதிபதிக்குக் கீழே பாதுகாப்புப் படை இருக்கின்றதா? அல்லது பாதுகாப்புப் படைக்குக் கீழே ஜனாதிபதி இருக்கின்றாரா? என்ற கேள்விகள் எழுகின்றன.

நாங்கள் திரும்பத்திரும்பச் சொல்கின்றோம், "சிங்கள மக்கள் - பௌத்த மக்கள் இருக்கின்ற இடங்களிலே பௌத்த கோயில்களை அமைப்பதற்கு நாங்கள் எதிரானவர்கள் இல்லை" என்று. நாங்கள் அந்த மதத்திற்கு எதிரானவர்களும் இல்லை; அதேநேரம் இனத்துக்கு எதிரானவர்களும் இல்லை. ஆனால், வடக்கு மாகாணத்திலே நீங்கள் ஒன்றரை இலட்சம் இராணுவத்தை வைத்துக்கொண்டு அங்கு சகல இடங்களிலும் பௌத்த சிலைகளை நிறுவிக்கொண்டிருக்கிறீர்கள். இவற்றைக் குறைக்கும்படி நாம் பல தடவைகள் கேட்டிருந்தோம். ஆனால், எதுவுமே நடைபெறவில்லை. அதற்கு இராணுவம் பாதுகாப்பாக இருக்கின்றது. தென் பகுதியிலிருந்து வருகின்றவர்களுக்கான குடியேற்றத்துக்கும் இராணுவம் பாதுகாப்பு வழங்குகின்றது. அந்தவகையில், வடக்கிலே இருக்கின்ற இராணுவம் மீள்குடியேற்றத்துக்கும் இன நல்லிணக்கத்தைக் கட்டியெழுப்புவதற்கும் இப்படித் தொடர்ச்சியாக முட்டுக்கட்டையாக இருக்கின்றது.

இன்றைக்கு புதிய அரசியலமைப்புக்கு ஊடாக எங்களுடைய பிரச்சினைக்குத் தீர்வு காணப்போவதாக ஜனாதிபதி கூறுகின்றார்; பிரதமர் கூறுகின்றார். இன்னொரு பக்கத்திலே ஒற்றையாட்சிக்குள்தான் தீர்வு என்றும் கூறப்படுகிறது. ஆகவே சர்வதேச சமூகத்தை ஏமாற்றுவதற்காக நீங்கள் பல்வேறு கதைகளைச் சொல்கின்றீர்கள்! ஜனாதிபதி மற்றும் பிரதமர் உள்நாட்டில் - தெற்கிலே ஒரு பேச்சு! சர்வதேசத்துக்குச் சென்றால் இன்னொரு பேச்சு! வடக்கே சென்றால் அங்கு ஒரு கதையையும் தெற்கிலே சிங்கள மக்களுக்கு ஒரு கதையையும்தான் சொல்லிக்கொண்டிருக்கின்றார்கள். ஆகவே, உண்மையான நல்லிணக்கம் இந்த நாட்டிலே ஏற்படவேண்டுமாக இருந்தால், தமிழ் மக்களுக்கு நாங்கள் வழங்கிய வாக்குறுதிகள் நிறைவேற்றப்பட வேண்டும். எங்களுடைய தேர்தல் விஞ்ஞாபனங்களிலே - அது மாகாண சபைத் தேர்தலாக இருக்கலாம் அல்லது பாராளுமன்றத் தேர்தலாக இருக்கலாம்- நாங்கள் பல வாக்குறுதிகளை முன்வைத்தோம். "நாங்கள் இந்த நல்லாட்சி அரசாங்கத்தோடு பேசி அரசியல் கைதிகளை விடுவிப்போம்; காணாமற்போனவர்கள் தொடர்பில் நாங்கள் நல்லதொரு முடிவை எடுத்துத் தருவோம்; மீள்குடியேற்றம் நடைபெறச் செய்வோம்; எங்களுடைய பிரச்சினைக்கு நிரந்தரமான ஓர் அரசியல் தீர்வை நாங்கள் பெற்றுத்தருவோம்" போன்ற வாக்குறுதிகளை முன்வைத்ததால்தான் மக்கள் எங்களைத் தெரிவுசெய்தார்கள். ஆனால், மக்களிடமிருந்து பெற்ற ஆணையின்மூலம் பதவிக்குவந்த நாங்கள், இன்றைக்கு அந்த வாக்குறுதிகளை நிறைவேற்றிக்கொள்ள முடியாத நிலையிலிருக்கின்றோம்.

தமிழ் மக்களால் ஏற்படுத்தப்பட்ட இந்த ஆட்சி மாற்றத்தில் இந்த அரசாங்கமானது தமிழ் மக்களுடைய கோரிக்கைகளை நிறைவேற்றவேண்டும். ஆனால், அதற்குப்பதிலாக இன்றைக்கு அவற்றுக்கெதிரான செயற்பாடுகளை இராணுவமும் இந்த அரசாங்கமும் தொடர்ச்சியாகச் செய்து கொண்டுவருகின்றன. இதனுடைய ஒரு வெளிப்பாடுதான் எதிர்வரும் 24ஆம் திகதி சனிக்கிழமை யாழ்ப்பாணம் முற்றவெளியிலே நடைபெற இருக்கும் 'எழுக தமிழ்' என்ற மக்கள் பேரணி. பல்லாயிரக்கணக்கான இளைஞர்கள், பொதுமக்கள், பல்கலைக்கழக மாணவர்கள், மாகாண சபை உறுப்பினர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் எனப் பெருந்தொகையானோர் கலந்துகொண்டு, ஜனநாயக வழியிலே, நான் ஏற்கெனவே குறிப்பிட்ட இந்தக் கோரிக்கைகளை முன்வைத்து, அதாவது தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய தேர்தல் விஞ்ஞாபனத்திற்கமைவான இந்தக் கோரிக்கைகளை நிறைவேற்றும்படி இலங்கை அரசாங்கத்திற்கும் சர்வதேச சமூகத்திற்கும் வலியுறுத்துவதற்காக இந்த மக்கள் பேரணி ஓர் அமைதியான முறையில் நடைபெற இருக்கின்றது. ஆகவே, ஜனநாயக ரீதியாக நடைபெற இருக்கின்ற இந்த மக்கள் பேரணியை இராணுவத்தினரோ அல்லது புலனாய்வுத் துறையினரோ அடக்க முற்பட்டால் அல்லது இதை நசுக்க முற்பட்டால் அது ஓர் ஆபத்தான நிலைமைக்குத்தான் இட்டுச்செல்லும். ஏனென்றால், ஆரம்ப காலத்திலே எங்களுடைய மிதவாதத் தலைவர்கள் எங்களுடைய உரிமைகளுக்காக ஜனநாயக

ரீதியான, சாத்வீக ரீதியான போராட்டங்களை நடத்தியபோது இரும்புக் கரங்கள் கொண்டு அடக்கப்பட்டதன் விளைவு, 30 வருட காலம் இந்த நாட்டிலே இடம்பெற்ற விடுதலைப் போராட்டமும் தொடர்ந்து இடம்பெற்ற கொடிய யுத்தமுமாகும். ஆகவே, அப்படியொரு நிலைமைக்கு மீண்டும் எமது மக்களைத் தள்ளாதீர்கள்!

இன்று ஆயுதப்போராட்டம் முடிவுக்குக் கொண்டுவரப் பட்டிருக்கின்றது. யுத்தம் முடிவடைந்து 7 வருடங்கள் கடந்திருக்கின்றன. இந்த 7 வருட காலத்திற்குள்ளே எங்களுடைய மக்களின் அன்றாட வாழ்வாதாரப் பிரச்சினைகள் உட்பட மீள்குடியேற்றம் செய்யப்பட முடியாத நிலைமைகள் எனப் பல்வேறுபட்ட பிரச்சினைகள் காணப்படுகின்றன. சாதாரணமாக எங்களுடைய பிரதேசங்களில் மக்களுக்குத் தேவையான சின்னஞ்சிறு காரியங்களைக்கூட இன்றைக்கு எங்களால் செய்யமுடியாத நிலைமை இருக்கின்றது. ஆகவே, இந்த நிலைமைகள் மாறவேண்டும் என்பதையும் வலியுறுத்தித்தான் எதிர்வரும் சனிக்கிழமை 'எழுக தமிழ்' என்ற மக்கள் பேரணி இடம்பெற இருக்கின்றது. ஆயிரக்கணக்கான மக்கள் கலந்துகொள்கின்ற அந்தப் பேரணியிலே அந்த மக்களுடைய ஜனநாயக ரீதியான கோரிக்கைகள் என்ன? தேவைகள் என்ன? அவர்களின் பிரச்சினைகள் என்ன? என்பதை இந்த அரசாங்கம் கவனத்திலெடுத்து அவற்றைத் தீர்ப்பதற்கான உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டு மென்பது எங்களுடைய கோரிக்கையாகும்.

அந்த மக்களுடைய ஜனநாயக ரீதியான கோரிக்கைகள் மறுதலிக்கப்படுமாக இருந்தால் அடுத்தகட்டம் ஓர் ஆபத்தான நிலைமையை நோக்கி இந்த நாடு செல்லவேண்டிய ஒரு நிலைமை வரும். ஏனென்றால், கடந்தகால வரலாறும் படிப்பினையும் அதைத்தான் தந்திருக்கின்றன. தந்தை செல்வநாயகம் அவர்கள் ஆயுதம் தூக்கிப் போராடாத ஒரு ஜனநாயகவாதி. சாத்வீக ரீதியாக 30 வருடங்கள் தமிழ் மக்களின் உரிமைக்காகக் குரல் கொடுத்தார். ஆனால், அது மறுக்கப்பட்டதன் விளைவு கடந்த 30 வருட கால ஆயுதப் போராட்டம் ஓர் உச்சக்கட்டத்திற்குச் சென்றமையாகும். மீண்டும் நாங்கள் எங்களுடைய கோரிக்கைகளை நிறை வேற்றுவதற்கு ஜனநாயக ரீதியாகப் போராடுவதைத் தவிர வேறு வழியில்லை. இந்த நல்லாட்சி அரசாங்கத்தைக் கொண்டுவந்ததில் தமிழ் மக்களுக்கு ஒரு பெரிய பங்கிருந்தது; பெரிய பொறுப்பிருந்தது. எனவே, அந்த மக்களுடைய கோரிக்கைகளை அரசாங்கம் பரிசீலித்து உரிய தீர்வைக்காண முன்வரவேண்டுமென்று மீண்டும் கேட்டு, விடைபெறு கின்றேன். நன்றி.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, his request to make the Vavuniya Campus a university will be granted in future.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you, Hon. Minister.

ඊළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 12.03]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතනවා, මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවය කරන 13,207ක් පමණ වන අනධ්‍යයන සේවකයන්ට අද සුවිශේෂී දවසක් වනවා කියලා. මොකද , මේ අයට මෙතෙක් කාලයක් තිබුණේ, අවුරුදු 57න් විශ්‍රාම ගිහිල්ලා, ඊට පස්සේ අවුරුදු 60 වන තුරු අවුරුද්දෙන් අවුරුද්ද එකිනෙක්කෙනාගේ මුහුණ දිහා බලලා සේවා කාලය දිගු කරපු අතීතයක්. අපේ යහ පාලන ආණ්ඩුව මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ, මේ 13,207දෙනාගේම වුවමනාව හා අවශ්‍යතාව පරිදි කිසිම බාධාවක් නැතිව අවුරුදු 60 දක්වා සේවය කිරීම සඳහා ඔවුන්ට අවස්ථාව ලබාදීලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, අද ඒ සේවකයන්ට සුවිශේෂී දවසක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමානයේදී වසරකට අපේ රටේ දරුවන් ලක්ෂ 3ක් පමණ දිවයිනේ විවිධ පාසල්වල පළමුවන ශ්‍රේණියට ඇතුළත් වෙනවා. නමුත් මේ පිරිසෙන් A/L විභාගය සමත් වෙන්නේ 1,49,572ක් වාගේ සංඛ්‍යාවක්. එතරම් සංඛ්‍යාවක් පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වුණාට, එයින් සියයට 50ක්වත් A/L විභාගය සමත් වෙන්නේ නැහැ. සමහර ළමයි පහ වසර ශිෂ්‍යත්වයෙන් පහළට වැටෙනවා. සමහර ළමයි O/L විභාගයට පෙනී සිටින්නේ නැහැ. සමහර ළමයි O/L විභාගය කරලා නැවත උසස් අධ්‍යාපනය කරන්නේ නැහැ. සමහර ළමයි A/L පන්තියේ ටික කාලයක් ඉගෙන ගෙන අයින් වෙනවා. සමහර ළමයි A/L කරලා විෂයන් තුනම අසමත් වෙනවා. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. නමුත්, නව රජය විශේෂයෙන්ම තීන්දුවක් ගත්තා, මේ රටට ඕනෑ උගතුන්, මේ රටට ඕනෑ දැනුම තිබෙන පුද්ගලයන් කියලා. ඒ නිසා සියලු දෙනාම 13වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හැදෑරිය යුතුයි කියන තීන්දුව ගත්තා.

අපේ රටේ කොන්ක්‍රීට් ගොඩනැඟිලි හදලා, කොන්ක්‍රීට් වනාන්තර හදලා, පාරවල් කාපට් කළා කියලා රට දියුණු වුණේ නැහැ. අපි දැක්කා, පසු ගිය දවස්වල වෙච්ච දේවල්. නමුත්, වර්තමානය වන විට අපේ රටේ දැනුමෙන් පිරි මිනිස් සම්පතක් නිර්මාණය කිරීම සඳහා මේ රජය ගත්ත තීන්දු තීරණ සුවිශේෂී වෙනවා කියලා මම හිතනවා. ඒ වාගේම අපි පැහැබර ශ්‍රී ලංකාවක් බලාපොරොත්තු වෙනවා. සියලු ළමයින් 13වන ශ්‍රේණිය දක්වා ඉගෙන ගන්නවා කියන්නේ, මේ රටේ හොඳ උගතුන් පිරිසක් බිහි වෙනවා කියන එකයි. මේ රටේ සියලු ළමයින්ට ඒ අවස්ථාව නොමිලයේ ලබා දීලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන්නා වාගේම, බලයට ආව හැම විටම නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කළා. දරුවාට අවශ්‍ය පෙළ පොත් ටික නොමිලේ ලබා දුන්නා. දෙමව්පියන්ට තිබුණු ආර්ථික ප්‍රශ්න නිසා, පෙළ පොත් ටික ගන්න බැරිව දරුවන් පාසල් යවා ගන්න බැරි අවස්ථා අනන්ත අප්‍රමාණ තිබුණා. නමුත්, අපේ ආණ්ඩුවෙන් පෙළ පොත් ටික නොමිලේ ලබා දුන්නා විතරක් නොවෙයි, දරුවාට අවශ්‍ය නිල ඇඳුම් රෙදි දෙන්නත් කටයුතු කළා.

ඒ කාලයේ අපි පාසලකට ගියාම දකින්නට ලැබුණු තත්ත්වය තමයි, දරුවන් විවිධ ඇඳුම් ඇඳගෙන පාසලට පැමිණීම. සමහර දරුවන්, ඉරුණු ඇඳුම් ඇඳගෙන එනවා. සමහර දරුවන්ගේ ඇඳුම් කහ ගැහිලා දුර්වර්ණ වෙලා. තවත් සමහර දරුවන් පාසලට ගැළපෙන්නේ නැති ඇඳුම් ඇඳගෙන එනවා. ඒ විධියට ඇවිල්ලා, සමාජයේ විෂමතාව එම දරුවන් තුළින් පෙනෙන්න පටන් ගත්තා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නමුත්, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සියලු දරුවන්ට එක වාගේ පාසලට එන්න පුළුවන් විධියට නිල ඇඳුම් සපයා දීමට කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. පාසල් දරුවන්ට දිවා ආහාරය ලබා දීම තුළින්, දරුවන් තවත් ශක්තිමත් කළා.

"මහපොළ" වාගේ ශිෂ්‍යාධාර ක්‍රම නිර්මාණය කරලා විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළින් තමයි ශක්තිමත් කළේ. එදා දෙමව්පියන්ට උද්ගත වුණු ප්‍රශ්නයක් තමයි, දරුවා විශ්වවිද්‍යාලයට තේරී තිබුණත්, වියදම් කරන්න සල්ලි නැතිකම. Boarding fees ගෙවා ගන්න විධියක් නැහැ. අවශ්‍ය පොත් පත් හා උපකරණ අරගන්න විධියක් නැහැ. නමුත්, තමන්ගේ දරුවා විශ්වවිද්‍යාලයට යවා උගන්වන්න ආසයි. මොකද, තමන්ගේ පරම්පරාවේ කිසිම කෙනෙක් විශ්වවිද්‍යාලයට ගිහින් නැහැ. අන්තිමට තමුන්ගේ ගේ උගස් කරලා, ඒ දරුවාට උගන්වනවා. ඒ ඉගැන්වීමේ ශාපය නිසාම ගමේ ඉන්න පොලී මුදලාලිට තමුන්ගේ ගේ සින්න වෙලා යන අවස්ථා අනන්ත අප්‍රමාණ තිබුණා. නමුත් එදා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ සංකල්පයක් මත, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩු කාලය තුළ ඒ යුගය අවසන් කරමින් "මහපොළ" ශිෂ්‍යාධාර ක්‍රමය නිර්මාණය වුණා. මම පවා "මහපොළ" විශේෂ කුසලතා ශිෂ්‍යත්වය ලබා ගත් කෙනෙක්.

එදා, අපි දැක්කා මේ සමාජයේ පරිවර්තනය. මහපොළ ශිෂ්‍යත්වය බිහිවීමත් සමඟම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විප්ලවයක් සිදු වුණා. මහපොළ ශිෂ්‍යත්වය කිසිම කෙනෙකුට නැති කරන්න බැරි වුණා. ලලිත් ඇතුලත්මුදලි මහත්මයා මරා දැමුවත් -ඝාතනය කළත්-, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නැතිව ගියත්, මහපොළ ශිෂ්‍යත්වය ඉතාමත්ම ශක්තිමත් වෙමින්, ශක්තිමත් වෙමින් මේ රටේ විශ්වවිද්‍යාල දරුවන් සඳහා, ආර්ථික ප්‍රශ්න තිබෙන දෙමව්පියන් සඳහා විශාල පිටිවහලක් බවට පත් වුණා.

ආණ්ඩු වෙනස් වීමත් සමඟම "ජන සවිය" වැඩසටහනේ නම වෙනස් කරලා "සමෘද්ධිය" යනුවෙන් නම් කළා. මේ අයුරින් එම වැඩසටහන්වල නම් වෙනස් වුණා. රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ "උදාගම් සංකල්පය" එතුමාගේ අභාවයත් එක්කම, ආණ්ඩු වෙනස්වීමත් එක්කම නැති වෙලා ගියා. සජිත් ප්‍රේමදාස මැතිතුමා දැන් නැවතත් උදාගම් සංකල්පය පටන්ගෙන තිබෙනවා.

මේ රජය අවුරුදු එකහමාරක් වැනි සුළු කාලයක් තුළ උසස් අධ්‍යාපනය සඳහා සුවිශේෂ වැඩ කොටසක් කර තිබෙන බව අපි දන්නවා. ගරු මුදල් ඇමතිතුමා 2016 වසරේ අය වැය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළා, "2018 වසර වන විට සියලුම විශ්වවිද්‍යාල සිසුන්ට සිය මුළු විශ්වවිද්‍යාල අධ්‍යාපන කාලය සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දෙනවා" කියලා. අපි ඒ ගැන ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා සමඟ සාකච්ඡා කළාට පසුව, එතුමා මේ අවුරුද්ද තුළ යම් කිසි ප්‍රමාණයකින් එය සාර්ථක කර ගන්න දක්ෂ ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කරලා තිබෙනවා. මේ වනවිට, නේවාසිකාගාර 24ක් නිර්මාණය කර දීලා විශ්වවිද්‍යාල දරුවන්ගේ නේවාසිකාගාර ප්‍රශ්නය විසඳීමට කටයුතු කර තිබෙනවා. 2017 වසර වන විට පුද්ගලික හා රාජ්‍ය ආයෝජනය තුළින් විශ්වවිද්‍යාලවල ඉතුරු දරුවන් වෙනුවෙන් නේවාසිකාගාර නිර්මාණය කිරීමට කටයුතු කිරීම ප්‍රශංසනීය කටයුත්තක් වනවා. අපි දන්නවා, මේ දරුවන් ඉගෙන ගන්න ගියාම බෝඩිම් හොයනවා. අපි පවා විශ්වවිද්‍යාලවලට යන කාලයේ ගෙවල් ගණනේ ගිහිල්ලා බෝඩිම් හොයන කාලයක් තිබුණා. බෝඩිමටත් ලොකු ගණනක් ගෙවන්න ඕනෑ. එපමණ මුදල් ගෙව්වත් එහි නීතිරීති පද්ධතියක් තිබෙනවා. ඒ නීතිරීතිවලට යටත් වෙලා අපට ඉගෙන ගන්න සිදු වුණා. නමුත්, උසස් අධ්‍යාපනය හදාරන කාලයේ තිබුණු ඒ අමිහිරි යුගය ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයාගේ කාලයේ නිමා කරලා, තමුන්ට රිසිසේ නිදහසේ අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් විධියේ නේවාසිකාගාර පද්ධතිය හැදීමට මේ රජය කටයුතු කරලා තිබෙනවා.

විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් විතරක් නොවෙයි -විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් විතරක් නොවෙයි- විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයන් වෙනුවෙනුත් මේ රජය වැඩ කටයුතු කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලවල සේවය කරන සේවකයන්ගේ විශ්‍රාම කාලය තමුන්ගේ අභිමතය පරිදි අවුරුදු 60 දක්වා දීර්ඝ කර ගන්න අවස්ථාව දුන්නා. ඒ වාගේම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය නිවාස සෑදීම සඳහා රුපියල් මිලියන 3,000ක් මේ රජය ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මීට කලින් මහපොළ ශිෂ්‍යත්වය තිබුණේ රුපියල් 2,500යි. එය රුපියල් 5,000 දක්වා දීර්ඝ කළා. ශිෂ්‍යාධාරය තිබුණේ රුපියල් 2,500යි. එය රුපියල් 4,000 දක්වා දීර්ඝ කළා. මෙවැනි කටයුතු කිරීම තුළින් මේ රජය උසස් අධ්‍යාපනය අගය කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ රටේ සිටින අපේ සියලු වැසියන් උසස් අධ්‍යාපනය ලැබිය යුතුයි කියා. ඊට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. තමාට අවශ්‍ය කරන ලැප්ටොප් පරිගණක ගන්න, ලෝකයට විවෘත වෙන්න, ලෝකයත් එක්ක වැඩ කරන්න පුළුවන් අවකාශය විශ්වවිද්‍යාල දරුවන්ට ලබා දෙන්න පොලී රහිතව මාස 36කින් වටිනාකම ගෙවන්න පුළුවන් වන විධියට පරිගණක ලබා දීමේ ක්‍රමයක් අපි ආරම්භ කර තිබෙනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවකුට ලංකා බැංකුව, මහජන බැංකුව ආදි බැංකුවකට ගිහින් එම පරිගණක ලබා ගැනීමට හැකියාව නිර්මාණය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය කියන විශ්වවිද්‍යාල පහෙහිම තාක්ෂණ පීඨ ආරම්භ කරලා අලුත් පෙරළියක් මේ රටේ ඇති කරන්න අපි උත්සාහ කරනවා. මොකද, අපි දන්නවා කලා මාධ්‍යයෙන් විශාල වශයෙන් උපාධි ලබාගැනීමට යෑම නිසා ඒ දරුවන් අතර මං වෙලා ඉන්නවා කියා. කුමන හෝ උපාධියක් ලෙහෙසියෙන්ම ලබාගෙන ඒම සඳහා කලා විෂයය තෝරාගෙන අධ්‍යාපනය ලැබීම නිසා කලා මාධ්‍යයෙන් මේ රටට අවශ්‍ය ප්‍රමාණයට වඩා උපාධිධාරීන් බිහිවී ඉන්නවා. නමුත් තාක්ෂණ විෂයයන් යටතේ අධ්‍යාපනය ලබා දීමට ඉඩ ප්‍රස්තාව ඇති කර දී, තාක්ෂණ උපාධියක් ලබාගෙන මේ රටේ විතරක් නොව ලෝකයේම තිබෙන ශ්‍රම අවශ්‍යතාව පිරිමැසීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා කටයුතු කර, අලුත් පීඨ නිර්මාණය කිරීම වෙනුවෙන් මේ වන කොට රුපියල් මිලියන 3,000ක් වැය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මහා නගර සහ සැලැස්ම යටතේ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයක්ද, තාක්ෂණ විද්‍යා පීඨයක්ද, ඒ වාගේම මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයක්ද පිහිටුවන්න පිටිපන ප්‍රදේශයේ අක්කර 60ක් අද ලබා ගන්නවා. මා හිතන විධියට ගරු අග්‍රාමාත්‍යතුමා, එය ලබා ගැනීමේ අවස්ථාව සඳහා අද සහභාගී වී සිටිනවා. එතුමා ඒ අක්කර 60 ලබා ගෙන විශ්වවිද්‍යාල පුළුල් කිරීමේ වැඩ කටයුත්ත සිදු කරනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාගේ අධීක්ෂණය යටතේ, මෙහෙය වීම යටතේ මේ ටික කාලය තුළ විශ්වවිද්‍යාලවලට බඳවාගත් සිසුන් සංඛ්‍යාව සියයට 10කට වඩා වැඩි කර තිබෙනවා. නමුත් ඉදිරියේදී මේ

සැලැස්ම ක්‍රියාත්මක වන කොට, තවත් අවුරුදු දෙකතුනක් යන විට එම ප්‍රමාණය සියයට සියයක් දක්වා -විශාල ප්‍රමාණයකින්- වැඩි වේවි. මොකද, අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාවගේ උගත්කම, දැනුම වැඩි කරලා මේ රට විශ්වයටම උගතුන් නිර්මාණය කරන කේන්ද්‍රස්ථානය කරන්න පුළුවන් වේවි කියා. ඒ විතරක් නොවෙයි. මේ රජය මේ වූටි කාලය තුළ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවල යටිතල පහසුකම් හදන්න, වැඩි කරන්න විතරක් රුපියල් මිලියන 33,170ක් ලබා දී තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නව රජය විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් සුවිශේෂ කාර්යයක් ඉටු කර තිබෙනවා. ඒ වෙනුවෙන් අපි ගරු අමාත්‍යතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මා මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිය ලබාගත් කාලයේ පවා උපාධි පාඨමාලාව හදාරන අයගේත් තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හදාරන අයගේත් ප්‍රශ්නය තිබුණා. ඒක "නයි - මුගටි ගෝරිය" වාගේ හැම දාම තිබුණා. නමුත් ITUM කියලා ආයතනයක් නව වසරේ විවෘත කිරීමට කටයුතු කරලා, මොරටුව විශ්වවිද්‍යාලයේ ළමයින් අතර තිබුණු "නයි - මුගටි රණ්ඩුව" නැති කරන්නත්, සියලු දරුවන්ට හොඳට ඉගෙන ගන්න පුළුවන් වාතාවරණයක් නිර්මාණය කරන්නත් මේ කෙටි කාලය තුළදී මේ රජය කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපිට පොඩි අඩුවක් තිබෙනවා.

අපි උගතුන් නිර්මාණය කරනවා. මේ උගතුන්ගෙන් සියයට පනහක්වත් ලංකාවේ රැඳෙන්නේ නැහැ. මේ උගතුන් හැසිරෙන ආකාරය ගැන නම් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ පාසල් අධ්‍යාපනය තුළ උගතුන් බිහි කිරීමට ක්‍රමවේදයක් නැහැ. දැනුම තිබෙන අය විතරක් බිහි කරන ක්‍රමය තමයි අපේ රටේ පාසල් අධ්‍යාපනයේ තිබෙන්නේ. විශ්වවිද්‍යාලය යනු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිබිම්බයක්. අද අපි විශ්වවිද්‍යාලය තුළින් දකින්නේ සමස්ත අධ්‍යාපන ක්‍රමයේ තිබෙන තත්ත්වයයි. ඒ නිසා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන්ට තමන්ගේ ආකල්ප සහ කුසලතා ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය සෞන්දර්ය වටපිටාවක් නිර්මාණය කර දීලා, ආගමික වටපිටාවකට නැඹුරු වෙන්න පුළුවන් විධියට විශ්වවිද්‍යාල පද්ධතිය සකස් කළ යුතුයි කියා මම යෝජනා කරනවා. එය එසේ සිදුවිය යුතුයි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ශ්‍රමිකයන් හැම විටම තම ශ්‍රමය උදෙසා වැඩි වැටුපක් හා පහසුකම් අපේක්ෂා කරන බව. මේ තත්ත්වය මත ලංකාවේ බිහි වන කුසලතා පූර්ණ ශ්‍රමික පිරිස් රටින් පිට වී යනවා. වර්ෂයකට දෙලක්ෂ අසූදහසක් පමණ ශ්‍රමික පිරිසක් පිටරට රැකියා සඳහා පිටවී යනවා. නමුත් රටේ ශ්‍රම බලකායට ඇතුළු වන ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව එක්ලක්ෂ තිස්දහසයි. ඒ කියන්නේ දෙගුණයකට වැඩි ප්‍රමාණයක් රට හැරදා යනවා. මෙසේ පිටවී යන උගත් -දැනුම තිබෙන- අය ඒ සල්ලි අරගෙනවත් ආපසු මේ රටට එන්නේ නැහැ. ඔවුන් පවුල් පිටින්ම ඒ රටවල්වල පදිංචි වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මොන බාධක මැද්දේ වුණත්, මේ උගත් ශ්‍රමිකයන් මේ රටේ රඳවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම සිදු කළ යුතුයි. ඒ නිසා වෙළෙඳ ගිවිසුම් සහ විවිධ ගිවිසුම් මධ්‍යයේ ඔවුන් රැක ගැනීම සඳහාත් කටයුතු කරමුය කියා අවසාන වශයෙන් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Akila Viraj Kariyawasam. You have six minutes.

[අ.භා. 12.15]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මටත් මේ අවස්ථාවේදී කථා කිරීමට කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ උසස් අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් මටත් අපේ රටේ අධ්‍යාපනයේ හා උසස් අධ්‍යාපනයේ මෙම වෙනස්කම් ටික ඇති කරන්නට විශාල වුවමනාවක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා අලුත් වෙනස්කම් රාශියක් අපි කළ යුතුව තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනයක් ලබා දීමට සූදානම් වෙමින්, කාලයට ගැළපෙන, නවීන ලෝකයට ගැළපෙන පාඨමාලා හඳුන්වා දෙමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන එන අවස්ථාවකයි අප සිටින්නේ. එවැනි අවස්ථාවක අපේ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේත්, උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේත් මැදිහත්වීමෙන් උසස් අධ්‍යාපනය තුළත්, විශ්වවිද්‍යාල තුළත් මේ වෙනස්කම් ටික කඩිනමින් සිදුවෙයි කියා අප බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ විශ්වවිද්‍යාල අනෙකුත් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ සංසන්දනය කෙරෙන මට්ටමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ සංසන්දය කිරීම තුළ තමයි අපේ ප්‍රමිතිය, අපේ තත්ත්වය ආරක්ෂා වෙන්නේ. මම එහෙම කියන්නේ අපි international benchmarkingවලට යන්න ඕනෑ නිසායි. එහෙම ගියාම තමයි අපේ තත්ත්වය ආරක්ෂා කරන්න පුළුවන්. මේ සඳහා අපි සපුරාලිය යුතු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සඳහා විශේෂයෙන්ම පර්යේෂණවලට - researches - අපි යා යුතුව තිබෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාලවල එතරම්ම නොවෙන්නේත් ඒ දේ තමයි. එය ඉතාම නරක තත්ත්වයක්. අපි වැඩි වැඩියෙන් research කරන්න ඕනෑ. ඒ වාගේම අපේ කථිකාචාර්යවරුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන් international journals වලට ලියන්න ඕනෑ; ලිපි ඉදිරිපත් කරන්න ඕනෑ.

මේ තත්ත්වය බොහොම අවම මට්ටමකයි තිබෙන්නේ. ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා කාර්ය සාධනය මත - performance - වැටුප් වැඩිවීම, දිරිගැන්වීම් වාගේ දේවල් අපි ඉදිරියේදී හඳුන්වා දෙන්න ඕනෑ. මේ තත්ත්වය තිබුණොත් තමයි, මේ අය දිරිගන්වන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම අපේ රටේ විශ්වවිද්‍යාලවලට ජාත්‍යන්තර තත්ත්වය - ranks - ගන්න නම්, අපේ රටේ විශ්වවිද්‍යාලත් ඒ තැනට ඇතුළත් කරන්න නම්, ජාත්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන් අපේ විශ්වවිද්‍යාලවලට එන්න ඕනෑ. ඒ සඳහා පහසුකම් අපි ඇති කරන්න ඕනෑ. දැන් ගරු අමාත්‍යතුමන්ලාත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා ඇතුළු ඒ කණ්ඩායමත් එයට අවශ්‍ය පියවර අරගෙන

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

යනවා. ඒ බව සතුටින් කියන්න ඕනෑ. මේ තත්ත්වය ආරක්ෂා කරන්න ඉතාම විගස අපි කටයුතු කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම, අපි වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනයක් ලබාදෙන කොට, ඒ විභාගවල ප්‍රතිඵල ඉක්මනින් ලබා දෙන්න ඕනෑ. මම මේ වෙන කොට විභාග කොමසාරිස්වරයාට උපදෙස් දීලා තිබෙනවා, අපොස උසස් පෙළ වෙන්න පුළුවන්, අපොස සාමාන්‍ය පෙළ වෙන්න පුළුවන් ඒ විභාගවල ප්‍රතිඵල ඉතාම ඉක්මනින් නිකුත් කරන්න ඕනෑ කියලා. ඒ ප්‍රතිඵල නිකුත් වූ විගස අපේ විශ්වවිද්‍යාලවලට අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගෙන, ඒ උපාධිය හැකි ඉක්මනින් අවසන් කරන්නත්, ඊට පස්සේ පශ්චාත් උපාධිවලට -Master's - යන්න පුළුවන් අවස්ථාව උදා කළ යුතුයි. ජාත්‍යන්තර මට්ටමින් පිළිගත් විශ්වවිද්‍යාලවලින් ලබා දෙනවා වාගේ අපේ රටේ ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි පවා අඩු වයසක් ලබා ගැනීමට හැකි අපි අවස්ථාව ලබා දෙන්න ඕනෑ. අපේ රටත් මෙයට සූදානම් විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. අපි රජයක් විධියට ඒකට අවශ්‍ය පියවර ගනිමින් යනවා. අපි ඉතාම ඉක්මනින් එය කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ UGC එක ක්‍රියාත්මක වෙන පනත් දැන් ගොඩක් යල් පැන ගිහිල්ලා. ඒවා වෙනස් කරන්න ඕනෑ. ඒ වාගේම, විශ්වවිද්‍යාලවලට ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. දියුණු රටවල විශ්වවිද්‍යාලවල කරනවා වාගේ අපේ විශ්වවිද්‍යාලවලටත් ඒ සමහර නීති - රීති, අනපනත් ගෙනැල්ලා වෙනම බඳවා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කරන්න පුළුවන් නම් හොඳයි. අපේ විශ්වවිද්‍යාලවලටත් ස්වාධීනව දියුණු වෙන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම්, අපි විශ්වාස කරනවා ඒ විශ්වවිද්‍යාලවලින් අපට හොඳ තත්ත්වයක් උදා කර දෙයි කියලා.

මට ඉතා කෙටි කාලයක් තිබෙන නිසා මම මේ කාරණය ඉතාම කෙටියෙන් කියන්නම්.

අපි universities, Green Cities බවට පත් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල Green Cities බවට පත් කරන්න ඕනෑ. ඒ විශ්වවිද්‍යාලවල විදුලිය ඉතුරු කිරීම පිළිබඳව වාගේම පරිසර හිතකාමී වටපිටාවක් ඇති කිරීම පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. අධ්‍යාපන මධ්‍යස්ථාන සැකසීමේදී ඒ වටපිටාව -ඒ පරිසරය- ඊට ගැළපෙන, ඊට සරිලන ආකාරයට සිදු වෙන්න ඕනෑ. මම දැක්කා, පසු ගිය කාලයේ ගොඩනැඟිලි හදනවා. ඒවායේ කිසිම ප්‍රමිතියක් නැහැ. නිකිම්ම නිකම් ගොඩනැඟිලි විතරයි. එවැනි තත්ත්වයක් උදා නොකරන්න ඕනෑ කියලා හිතනවා. ඒ වාගේම university villages ඇති කරන්න ඕනෑ. University villages ඇති කළාම ඒ විශ්වවිද්‍යාලය තුළ පාසල්, shopping complex, රෝහල් නිර්මාණය වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණය කියන්න කැමැතියි. මෙවැනි සංකල්ප තුළින්, අධ්‍යාපනයේ ප්‍රගතිය කරා ඉක්මනින් ගමන් කරන්න අපේ නව රජය සූදානම්. ඒ වාගේම ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාටත්, අපේ රාජ්‍ය ඇමතිතුමාටත් මා ස්තුති කරන්න ඕනෑ. කුලියාපිටිය ආසනයේ මේ 12වැනි දා වෛද්‍ය පීඨය - medical faculty එක- සඳහා මුල්ගල තියනවා. අපි වෛද්‍ය පීඨ වැඩියෙන් ඇති කිරීම තුළින් මේ විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරන්න අපේ රජය දැන් කටයුතු කරමින් යනවා. ඒ සඳහා බිලියන තුනක් පමණ -මිලියන 3,000ක් පමණ- ගරු අමාත්‍යතුමා වෙන් කරලා තිබෙනවා. ඒ තුළින් අපේ රටට වෛද්‍යවරු අලුතින් බිහි කිරීමට ඉඩ සැලැස්වීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.21]

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත 2016 යටතේ, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 75වන වගන්තිය සංශෝධනය කිරීම පිළිබඳව ඇති වන මේ කථිකාවතේදී වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා විශේෂයෙන් සතුටු වෙනවා.

ඇත්තටම විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලීන ඉල්ලීමක් වාගේම, ඔවුන් මෑත කාලයේ වෘත්තීය ක්‍රියා මාර්ගවලට අවතීර්ණ වීමට පවා මූලික හේතුවක් වුණා, ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නවලට අමතරව, ඔවුන් විශ්‍රාම ගැන්වීමේ වයස අනෙකුත් රාජ්‍ය නිලධාරින්ගේ මට්ටමට, අවුරුදු 60 දක්වා ගෙන එන්නය කියන එක.

මේ ඉල්ලීමට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ප්‍රධාන අපේ අමාත්‍යාංශයේ සියලු දෙනා ඉතා ඉහළින් ඇහුම්කන් දුන්නා, විශේෂයෙන් අපේ රජය ශ්‍රමිකයන් කෙරෙහි දක්වන විශේෂ උනන්දුවත් එක්ක. අපි හැකි ඉක්මනින් මෙයට කැබිනට් අනුමැතිය අරගෙන, වයස 57 දක්වා තිබුණු විශ්‍රාම යෑමේ කාලය වයස 60 දක්වා එහෙම නැත්නම් දැනට රජයේ නිලධාරින්ට පවතින කාලය දක්වා දීර්ඝ කිරීම සඳහා මේ පනත සංශෝධනය කරනවා.

මේ සංශෝධනයත් එක්ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ලැබෙන වරප්‍රසාද වයස 60 දක්වා සීමා වෙන්නේ නැහැ. අනාගතයේ රාජ්‍ය නිලධාරින්ගේ විශ්‍රාම වයස් සීමාව සංශෝධනය වන්නේ යම් සේද, ඒ අනුව විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේත් විශ්‍රාම යෑමේ වයස් සීමාව ස්වයංක්‍රීයව සංශෝධනය වනවා, මේ පනතේ අලුත් සංශෝධනයට අනුව. ඒක තමයි මේ සංශෝධනයේ තිබෙන සුවිශේෂී වටිනාකම. මේ දක්වා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අයට සිද්ධ වුණා, තමුන්ගේ ආයතනයේ ප්‍රධානියාගෙන් මේ වයස් සීමාව වැඩි කර ගැනීම අවුරුද්දෙන් අවුරුද්ද ලබා ගන්න. අද මේ සංශෝධනය හරහා ඒ සේවකයාගේ ස්වාධීනත්වය ආරක්ෂා වෙලා තිබෙනවා, ඔහුට රජයේ අනෙකුත් නිලධාරින්ට ලැබෙන වරප්‍රසාදය ලබා දීම හරහා. ඒ නිසා මා හිතනවා, මේ යෝජනාව මේ උගත් සභාව විශේෂයෙන් සතුටින් යුක්තව අනුමත කරන පනත් සංශෝධනයක් වේවි කියලා.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල පිළිබඳ ප්‍රවෘත්ති ඉතාම කැලඹිලිකාරී බව අපි දන්නවා. ඒ කැලඹිලිකාරී ප්‍රශ්න අතීතයේ සිට නොකඩවා පැවතුණු, අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය තුළ සංස්කෘතියක් බවට පත් වෙලා තිබුණු ඒවා බවත් අපි දන්නවා. මේ වාතාවරණය තුළ වූ ශිෂ්‍යයන්ගේ විවිධ යෝජනා හා ඔවුන්ගේ විවිධ තර්ක විතර්ක, සටන්වල ගත යුතු දේවල් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත්, මමත් ඔවුන්ගේ ඉල්ලීම් ඉතා සාවධානව විශ්ලේෂණය කර බලනවා. අපට පුළුවන් හැම දෙයක්ම අපි කරනවා. ඔවුන්ගේ මූලික ඉල්ලීමක් වුණා, විශ්වවිද්‍යාලවල ප්‍රවේශය වැඩි කළ යුතුයි කියලා. මේ ප්‍රවේශය වැඩි කරන්න මේ වසර මුල සිටම අපි ලොකු වැඩ පිළිවෙළක් ගෙනාවා. අපි විභාග දෙපාර්තමේන්තුව එක්ක සාකච්ඡා කළා, අපට උසස් පෙළ විභාග ප්‍රතිඵල ඉක්මනින් ලබා ගන්න පුළුවන්ද කියලා. විභාග ප්‍රතිඵල ඉක්මන් කිරීම හරහා පමණක් නොවෙයි, අපි පුළුවන් තරම්

උනන්දු කළා, විභාග ප්‍රතිඵල ලැබුණු අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත්‍ර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කිරීම online ක්‍රමයෙන් කර ගන්න. එතකොට මේ දත්ත පරිගණකගත කිරීමේ කාලය ඉතිරි වෙනවා. ඒ ඉතිරි වීම හරහා අපට පුළුවන් cut -off marks පුළුවන් ඉක්මනට දෙන්නත්, ඒ හරහා විශ්වවිද්‍යාලයට දරුවන් ඇතුළත් කර ගැනීමේ කාලපරිච්ඡේදය අඩු කර ගන්නත්.

ඇත්ත වශයෙන්ම යම් වසරක අගෝස්තු මාසයේ අපොස උසස් පෙළ විභාගයට වාඩි වෙන දරුවෙකුට ඊළඟ වසරේ අන්තිම දක්වා, දෙසැම්බර් පසු වන තුරු, අවුරුද්දකුත් මාස 4කට වැඩි කාලයක් නිකරුණේ ගත කරන්න වෙනවා. ඔහුගේ වටිනා කාලය නාස්ති වෙනවා, විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න ගතවන මේ කාලපරිච්ඡේදය නිසා. අපි මේ කාලය මාස 6කින් අඩු කරන්න සැලසුම් කරලා තිබෙනවා. විශේෂයෙන් ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ, වසරකට මාස දෙක බැගින් මේ කාලය ඉස්සරහට ගන්න අපි වැඩ කර ගෙන ආවා. ඒ වාගේම, ඇතුළත්වන ප්‍රමාණය වසරකට සියයට 10කින් වැඩි කිරීමටත් කටයුතු කළා. වසරකට සියයට 10කින් වැඩි වීම තුළ මේ අවුරුද්දේ දරුවන් 2208ක් වැඩියෙන් ප්‍රවේශ කර ගන්නවා. අලුතින් ආරම්භ කරන ලද විවිධ පාඨමාලා හරහාත් මේ සියයට 10ක පමණ වැඩි ප්‍රවේශය වර්ධනය කර ගන්න අපට පුළුවන් වුණා. ඒක ඉතාම ඵලදායි කටයුත්තක්. ඒ තුළින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අපි දීපු පොරොන්දුව ඉටු කර ගන්න පුළුවන් වුණා.

ඒ විතරක් නොවෙයි. අපි මේ රටාව ඊළඟ වර්ෂයේත්, ඊළඟ වර්ෂයේත් පවත්වා ගෙන යන්න බලාපොරොත්තු වනවා. මේ වසරේ විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමේ cut-off marks ඉදිරිපත් කිරීම පසු ගිය දින දෙකකට පෙර සිදු වුණු බව අපි හැමෝම දන්නවා. මේක ඇත්තටම පසු ගිය වසරට වඩා මාස එක හමාරක පමණ ඉක්මනින් සිදු වුණා. මේක නිකුත් කිරීම මේ මාසයේ 20වැනි දා දක්වා කල් ගියා. ඇත්තටම අපි හිතාගෙන හිටියේ මේ මාසයේ මුල මේ cut-off marks නිකුත් කරන්නයි. මේ දින 20ක ප්‍රමාදයට හේතු වුණේත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වර්ජනයයි. ඒක නොවුණා නම්, සැප්තැම්බර් මාසයේ මුල වෙනකොට cut-off marks දෙන්න තිබුණා. 20 වෙනි දා මේක දුන්නාට පසුව අපට අවස්ථාව ලැබෙනවා, නොවැම්බර් මාසයේ මුල ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට. අපි මේ වසරේ මුල සිටම ඒ සඳහා සම්මන්ත්‍රණ තියලා, රැස්වීම් තියලා ගරු ඇමතිතුමා සහ මම පීඨාධිපතිවරුන්ටත්, උපකුලපතිවරුන්ටත් දැනුම් දුන්නා, ඊළඟ අවුරුද්දේ පාඨමාලාව නොවැම්බර් මාසයේ මුල පටන් ගැනීමට ලැහැස්ති වෙන්න කියලා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අමාත්‍යාංශය පැත්තෙන් කළ යුතු කාර්ය භාරය අපි ඉෂ්ට කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අනුව මේ වසරේ ප්‍රතිඵල මත ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම නොවැම්බර් මාසයේ මුල සිට කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එය මාස දෙකක ඉක්මන් කිරීමක්. මොකද, ගිය වසරේ ප්‍රතිඵල අනුව අපට මේක කරන්න පුළුවන් වුණේ මේ අවුරුද්දේ ජනවාරි මාසයේදීයි. නමුත් මේ නොවැම්බර් මාසයේ මුලදී අනිවාර්යයෙන්ම වෛද්‍ය පීඨ හා ඉංජිනේරු පීඨ ආරම්භ කරන්න අපට පුළුවන් වනවා. ඒ අනුව, පේරාදෙණිය සහ මොරටුව විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨ දෙකත්, වෛද්‍ය පීඨ ගණනාවකුත් නොවැම්බර් මාසයේ ආරම්භ කිරීමේ හැකියාව ලැබෙනවා. පීඨාධිපතිවරුන් හා කුලපතිවරුන් ඔවුන් පොරොන්දු වුණු විධියට මේ කටයුත්ත කරන්න සූදානම් නම්, අපි වේලාසනින් දැනුම් දුන් විධියට නොවැම්බර් මාසය වනකොට අනෙකුත් පාඨමාලාත් පටන් ගන්න අපට පුළුවන් වනවා.

විශ්වවිද්‍යාලවලට 68,000ක පමණ ශිෂ්‍ය පිරිසක් ඉල්ලුම් කරනවා. ඒ ඉල්ලුම් කිරීම ලබන වසරේ සිට අනිවාර්යයෙන් online කළ යුතුයි කියන පදනමට යාමට අපි කටයුතු කර ගෙන යනවා. එහෙම වුණොත්, අපට මේ කාලපරිච්ඡේද හුඟක් අඩු කර ගන්න පුළුවන්. ඒ අනුව අපි ලබන වසරේ සිට තවත් මාස දෙකකින් විශ්වවිද්‍යාල ප්‍රවේශය ඉක්මන් කර ගැනීමට බලාපොරොත්තු වනවා. මේ විධියට අවුරුදු තුනක් පමණ යනකොට අපට මේ විශ්වවිද්‍යාල ප්‍රවේශය මාස 6කින් ඉස්සරහට ගන්න පුළුවන් වනවා. එතකොට විශ්වවිද්‍යාලයට ඇතුළත්වන උසස් පෙළ සමත් දරුවන් මුහුණපාන ප්‍රශ්න ගණනාවක් විසඳන්න අපට පුළුවන්කම ලැබෙනවා. ප්‍රවේශය, ගුණාත්මකභාවය වැඩි කිරීම, රැකියා වෙළඳ පොළට ඇති අදාළත්වය වැඩි කිරීම යන බොහෝ දේවල් මේ සුළු කාලය තුළ අපි කරලා තිබෙනවා.

විශේෂයෙන් ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා පියවර ගෙන තිබෙනවා. ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කිරීම, තත්ත්ව පාලනය කිරීම හා ප්‍රතීතනය කිරීම සඳහා ස්වාධීන කොමිසමක් පිහිටුවීම සඳහා සියලු පනත් කෙටුම්පත් මේ වන විට සකස් කර ගෙන යනවා. මේ ස්වාධීන කොමිසම පිහිටුවීමෙන් පසු ඇත්ත වශයෙන්ම අපේ රටේ පෞද්ගලික අධ්‍යාපන ආයතන මෙන්ම රාජ්‍ය අංශයේ සියලුම උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව පාලනය සඳහාත්, ප්‍රතීතනය සඳහාත් මේ ස්වාධීන කොමිසමට යන්න වෙනවා. ඒ අනුව අපට සියලුම විශ්වවිද්‍යාල තුළ ඉතා හොඳ තත්ත්වයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව බොහෝ දේවල් කථා කරන්න තිබුණත්, කාලය සීමිත බැවින් මට ලබා දුන් කාලය පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended till 1.30 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා]ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.130 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.* பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] *தலைமைவகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *in the Chair..*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

[අ.භා. 1.30]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව යම් අදහස් දැක්වීමක් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

විශ්වවිද්‍යාලවල අනධ්‍යයන සේවකයන් 13,000ක් පමණ නියෝජනය වන අතරේ, ඔවුන් පසු ගිය කාලය පුරාවටම වෘත්තීය ඉල්ලීම් කිහිපයක් සම්බන්ධයෙන් වැඩ වර්ජනයක නිරත වෙලා සිටියා. ඒ ඉල්ලීම් අතර ප්‍රධාන කාරණා තුනක් තිබෙනවා. ඒ තමයි, ඔවුන්ගේ මාසික හිලව් දීමනාව වැඩි කර ගැනීම, ඔවුන්ගේ මූලික

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වැටුප සහ දීමනා සියල්ල EPF එකට, ETF එකට එකතු කර ගැනීම සහ මේ කියන විශ්‍රාම වයස දීර්ඝ කර ගැනීම. අද සංශෝධනය ඉදිරිපත් වෙන්නේ ඒ අතරින් විශ්‍රාම යන වයස වැඩි කිරීම සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොයි කාලයෙත් අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සමාජයේ බලවත් උනන්දුවක් තිබෙනවා. දෙමව්පියන් සිතනවා, - ඒ සිතීම සාධාරණයි.- තමන්ගේ දරුවාට උරුම කරන්න පුළුවන් ඉහළම දායාදය අධ්‍යාපනය කියලා. මොකද, අපේ රටේ දෙමව්පියන්ට පරම්පරාවෙන් එන ඉඩම් අක්කර ගණන්, මහා යානවාහන, මහා පරිමාණ කර්මාන්තශාලා දරුවන්ට උරුම කරන්න බැරි නිසා ඔවුන් කෙසේ හෝ දුක් මහන්සි වෙලා අධ්‍යාපන හිණිමගේ ඉහළටම දරුවන් එගොඩ කරන්න මහන්සි වෙනවා. ඒ නිසා තමයි සමහර ජාවාරම්කරුවන් දෙමව්පියන්ගේ ඒ අභිලාෂය ප්‍රයෝජනයට ගන්නේ.

පසු ගිය දවස්වල අපොස (සාමාන්‍ය පෙළ) අසමත් වුණු දරුවන් පිරිසක් හන්තානේ කඳවුරකට අරගෙන ගිහිල්ලා "සාමාන්‍ය පෙළ සමත් කරවන්නම්" කියලා ඔවුන්ට ලිංගික අතවර කරපු සිදුවීමක් වාර්තා වුණා. ඔබතුමාත් එය මාධ්‍ය තුළින් දකින්න ඇති. දරුවෝ කියලා කියන්නේ දෙමව්පියන් මල් වාගේ බලාගත්, ඇඟේ තියාගෙන හදපු දරුවෝ. ඒ දරුවෝ එක දවසක්වත් ගෙදරින් පිට මං කරන්න දෙමව්පියෝ සූදානම් නැහැ. නමුත්, සාමාන්‍ය පෙළ කඩ ඉම කෙසේ හෝ පහු කර ගන්න දෙමව්පියන්ටත් බලවත් වුවමනාවක් තිබෙන නිසා ඒ දරුවෝ ටික එතැනට යොමු කළා. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් පුද්ගලයෝ කීප දෙනෙක් ඒ දරුවන් අපයෝජනයට ලක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිනවල මහත් ආන්දෝලනයකට තුඩු දීලා තිබෙන රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර තිබෙන ප්‍රශ්නය බලන්න. ඒ දරුවන්ට පාසල් ලබා ගැනීම සඳහා දෙමව්පියන් දරන මහන්සිය, උත්සාහය පිළිබඳව අපි අගය කිරීමක් කරනවා. නමුත්, ඒ ලැයිස්තුව කිසිදු සාධාරණ බවකින් තොරයි කියලාත් පෙනෙනවා. ඒ නිසා මෙහි තිබෙන සාධාරණ ඉල්ලීම් ද ප්‍රතික්ෂේප වෙලා යනවා. නමුත්, අපි එක කරුණක් සලකන්න ඕනෑ. මීට මාස කිහිපයකට පෙර වාර්තා වුණු මීගහතැන්නේ ප්‍රාථමික විද්‍යාලයට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා කරපු උද්ඝෝෂණයට සහභාගි වුණු දෙමව්පියන් පිළිබඳව බලන්න. ඒ පැත්තේ රබර් කිරි කපන, වැලි ගොඩ දමන සාමාන්‍ය කම්කරුවෝ තමයි ඒ දරුවන්ගේ දෙමව්පියන්. ඔවුන්ටත් තිබුණු එකම ඉල්ලීම තමයි, කෙසේ හෝ තමන්ගේ දරුවා රජයේ පාසලකට දමා ගැනීම. මේ සියලු වෘත්තීන්වල, තරාතිරම්වල දෙමව්පියන් අරගළය කරන්න, උද්ඝෝෂණය කරන්නේ, විවිධ දේවල් කරන්නේ රජයේ පාසලකට -රජයේ අධ්‍යාපනයට- දරුවන් ඇතුළත් කරවීම සඳහායි. ඒ උත්සාහය පිළිබඳව අපි හැම දෙනාම සතුටු වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල සඳහා කඩ ඉම් ලකුණු නිකුත් වුණා. කෙසේ හෝ තමන්ගේ දරුවන් විශ්වවිද්‍යාලයකට ඇතුළත් කරලා උසස් අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑම දෙමව්පියෙකුට බලාපොරොත්තුවක් තිබෙනවා. හැබැයි, අපේ රටේ තිබෙන සීමිත විශ්වවිද්‍යාල ප්‍රමාණය නිසා ඒ සඳහා තිබෙන්නේ ඉතාම පටු දොරටුවක්. ඒ නිසා උසස් පෙළ සමතුන්ගෙන් සියයට 17ක් විශ්වවිද්‍යාලයට යනකොට සියයට 83ක් එළියේ. ඒ නිසා සමහර ව්‍යාපාරිකයින්, ජාවාරම්කරුවන්, ඔවුන්ගේ ව්‍යාපාර, එහෙම නැත්නම් ලාභ ලබන ව්‍යාපාර බවට මේවා පත් කර ගන්න මෙන්න මේ අවස්ථාව පාවිච්චි කර ගන්නවා.

ලෝකයේ රාජ්‍ය විශ්වවිද්‍යාල - State universities - වාගේම, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලත් - non-State universities - තිබෙනවා. එහෙම නැත්නම්, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල කියලා කියන්නේ හුදෙක් පෞද්ගලික විශ්වවිද්‍යාලම නොවෙයි. පෞද්ගලික විශ්වවිද්‍යාල විලාසිතා සහ යථාර්ථය සම්බන්ධයෙන් අපේ ගරු චම්පික රණවක ඇමතිතුමාගේත් හිතවතකු වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරුද්ධ ප්‍රදීප් මහතා ලියපු පොතක් දැන් මා ළඟ තිබෙනවා.

එම පොතේ සඳහන් වනවා, "බ්‍රිතාන්‍යයේ ඇත්තේ එක් පෞද්ගලික විශ්වවිද්‍යාලයක් පමණි. ඒ බකින්හැම් විශ්වවිද්‍යාලයයි" කියලා. එහි රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල තිබෙනවා. නමුත්, ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන්න තිබෙන විශ්වවිද්‍යාල සංඛ්‍යාව එකයි. ඒ වාගේම තවත් එහි සඳහන් වනවා, "ඕස්ට්‍රේලියාවේ ඇත්තේ ද දෙකකි. එනම්, 1987දී ආරම්භ කළ "Bond University" සහ 1989දී ආරම්භ කළ "The University of Notre Dame Australia" විශ්වවිද්‍යාලයයි" යනුවෙන්.

ඊළඟට, කියනවා, "සිංගප්පූරුවේ පවතින්නේ එවැනි විශ්වවිද්‍යාල දෙකකි. Singapore Management University and SIM University. මෙයින් පළමුවැන්න වන Singapore Management University, රජය විසින් මුදල් ආයෝජනය කරන ලද්දකි" කියලා.

සමහර තැන්වල ඒ ආකාරයට යම් නියාමනයක් සහිතව රජය මැදිහත් වෙලා තමයි රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ආරම්භ කරලා තිබෙන්නේ.

එම පොතේ තව දුරටත් මෙසේ ද සඳහන් වනවා:

"නිව්යෝර්ක් ප්‍රාන්තයේ පෞද්ගලික විශ්වවිද්‍යාල 188ක් පිහිටා ඇති අතර, එයින් ලාභ ලැබීමේ පරමාර්ථය ඇත්තේ පෞද්ගලික විශ්වවිද්‍යාල 18කට පමණි. එපරිද්දෙන් පෙන්සිල්වේනියාවේ ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල 128න්, ලාභ ලැබීමේ පරමාර්ථය ඇත්තේ පෞද්ගලික විශ්වවිද්‍යාල 9කටද, මැසචුසෙට්හි ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල 88න්, ලාභ ලැබීමේ පරමාර්ථය ඇත්තේ පෞද්ගලික විශ්වවිද්‍යාල 4කටද යනුවෙන් ඉතාමත් අඩු සංඛ්‍යාවක් වේ. සමස්තයක් වශයෙන් ගත්තාම ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි මේ ප්‍රාන්ත තුනේම පෞද්ගලික විශ්වවිද්‍යාල 404ක් පිහිටා ඇතත්, ඒවායෙන් ලාභ අපේක්ෂිත ඒවා ඇත්තේ 31ක් පමණි."

අපේ රටේත් දෙමවුපියන්ට තමන්ගේ දරුවන්ට ඉහළ අධ්‍යාපනයක් ලබා දීම සඳහා තිබෙන කැමැත්ත -අපේක්ෂාව- සමහර උදවිය මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් යොදා ගෙන තිබෙනවා. මේ වෙනකොට අපේ රටේ වෛද්‍ය පීඨවල සිසුන් දින 200කට වැඩි කාලයක් සත්‍යාග්‍රහවල නිරත වෙලා සිටින බව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා දන්නවා. කොහේ ගිහිල්ලා බැලුවත් ඔවුන්ගේ වෛද්‍ය පීඨ ඉදිරිපිට අට්ටාල ගහගෙන සත්‍යාග්‍රහ පවත්වන බව පෙනෙනවා. ඇයි මේ? ඔවුන් කියනවා, මාලඹේ තිබෙන SAITM කියන පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන්න කියලා. අපි පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳ සාකච්ඡාව පැත්තකින් තබමු.

අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂය 1977 විවෘත ආර්ථිකය ආරම්භ කළ දිනයේ සිට ඔවුන් පෞද්ගලික විශ්වවිද්‍යාල වෙනුවෙන් පෙනී සිටි බව. 1980දී උතුරු ලංකා පෞද්ගලික

විශ්වවිද්‍යාලය ආරම්භ කළා. 1982වන කොට උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළා. මේ ආකාරයට එක්සත් ජාතික පක්ෂය තමන්ගේ ප්‍රතිපත්තියක් විධියට පෞද්ගලික විශ්වවිද්‍යාල වෙනුවෙන් පෙනී සිටිනවා. එය අරුමයක් නොවෙයි. ඊට ප්‍රතිපක්ෂව අපි හිතනවා, අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය ලබා දීම රජය සතු විය යුතුයි කියලා. කොයි එක හොඳද, කොයි එක හොඳ නැද්ද කියලා මේ පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව දීර්ඝ සංවාදයක්, සාකච්ඡාවක්, විවාදයක් අපට කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලය පුරාම අපේ රටේ මතයක් ගොඩ නඟා තිබෙනවා, ලෝකයේ රටක් ඉදිරියට යන කොට, ආර්ථිකය ප්‍රසාරණය වන කොට, ඒක පුද්ගල ආදායම වැඩි වන කොට ඒ රටේ නොමිලයේ දෙන අධ්‍යාපනය නැවතිලා, පෞද්ගලික අධ්‍යාපනයට වැඩි ඉඩකඩක් විවෘත වනවාය කියලා. ඒක පට්ටපල් බොරුවක්. ලෝකය ගත්තාම නොමිලයේ අධ්‍යාපනය තිබෙන්නේ කියුබාව වැනි සමාජවාදී රටවල පමණක් නොවෙයි. ලෝකයේ හොඳම අධ්‍යාපනය තිබෙනවාය කියා දැනුත් විශ්වාස කරන පින්ලන්තය වැනි ස්කැන්ඩිනේවියානු රටවල් ගත්තොත්, පින්ලන්තයේ පෙර පාසලේ සිට මූලික උපාධිය දක්වා නොවෙයි, පශ්චාත් උපාධිය දක්වා තවමත් නොමිලයේ අධ්‍යාපනය ලබා දෙනවා. යුරෝපයේ ආර්ථික අර්බුදයක් හමා ගෙන යනවා. මේ ආර්ථික අර්බුදය හමුවේ ඒ ආණ්ඩුව අමාරුවෙන් තීන්දුවක් අරගෙන තිබෙනවා, දේශීය ශිෂ්‍යයින්ගෙන් නොවෙයි, විදේශීය ශිෂ්‍යයින්ගෙන් පමණක් යම් මුදලක් අය කරන්න. එයටත් විරෝධයක් තිබෙනවා. එවැනි රටවල් පෞද්ගලික අධ්‍යාපනයේ සිට නොමිලයේ රාජ්‍ය අධ්‍යාපනය දක්වා ගමන් කරලායි තිබෙන්නේ. චීනය ගත්තත් එහෙමයි. චීනයේ පෞද්ගලික අධ්‍යාපනය තිබෙනවා. හැබැයි ඔවුන්ගේ 2006 - 2011 පස් අවුරුදු සැලැස්මේ චීන මහජන සමූහාණ්ඩුව යෝජනා කරලා, ක්‍රියාත්මක කර ගෙන යනවා, චීනයේ බටහිර පැත්තේ සිට නැඟෙනහිර පැත්තට, දුප්පත්කම වැඩි පැත්තේ සිට අඩු පැත්තට, එහෙම නැත්නම් ග්‍රාමීය ප්‍රදේශවල සිට බීජිං පැත්තට නොමිලයේ සහ අනිවාර්ය අධ්‍යාපනය ලබා දීම. ඒ නිසා ලෝකයේ ආර්ථිකය, රටක ආර්ථිකය ප්‍රසාරණය වන කොට, දළ ජාතික නිෂ්පාදනය වැඩි වන රටවල් ගමන් කරන්නේ, අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට තිබෙන අයිතිය තහවුරු කරන්න රජය අධ්‍යාපනයේ අයිතිය අතට ගැනීමටයි. හැබැයි අපට මතයක් හදමින් යනවා, රටක් දියුණු වන කොට පෞද්ගලික අධ්‍යාපනය තමයි ප්‍රමුඛ වන්නේ කියලා. නැහැ, ඒක වැරැදියි. මේ ඉඩකඩ ඇතුළේ අපේ රටේ වෙලා තිබෙන්නේ මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ SAITM එකේ කාරණාව සම්බන්ධයෙන් පසු ගිය දවස්වල අපි සාකච්ඡා වුණා. උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට කිව්වා, ඒක අහෝසි කරන්නේ නැහැ, වහන්නේ නැහැයි කියලා. ඒක ඒ පැත්තට විශාල ධෛර්යයක් වුණා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේක පසු ගිය ආණ්ඩුව කාලයේ පටන් ගත් දෙයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට ඒක ආපස්සට හරවන්න බැහැ. අපි ඒක වැහුවොත් ඒ ගොල්ලෝ උසාවි යයි. උසාවි ගියාට පස්සේ අපට මේක විවෘත කරන්න වනවා. මා කිව්වේ ඒකයි. පසු ගිය ආණ්ඩුව කාලයේ තමයි මේක පටන් ගත්තේ, අපේ ආණ්ඩුව කාලයේ තමයි පළමුවන කණ්ඩායම - first batch එක - එළියට ආවේ කියලා. අපි මේකට විසඳුමක් දෙන්න ඕනෑ. මා ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. රජයයි, පෞද්ගලික අංශයයි මැදිහත් වෙලා මේක කරනවා නම් ඔබතුමා කැමැතිද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මගේ කථාවේදී මා කියන්නම් කෝ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

රජයයි, පෞද්ගලික අංශයයි දෙගොල්ලන්ම එකතු වෙලා SAITM එක Public-Private Partnership එකකට run කරන එකට ඔබතුමා කැමැතිද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඒක කරන්න බැරි කාරණය මා කියන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

රජයේ නියාමනය යටතේ Public-Private Partnership එකකට SAITM එක ගෙන යන්න ඔබතුමා කැමැතිද? මොකද, මේක හරවන්න බැහැ. මේක ආපස්සට හරවන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හැමදෙනාම උනන්දු වන්නේ විසඳුමක් සොයන්නයි. තමුන්නාන්සේලාටත් විසඳුමක් සොයන්නයි කියන්නේ. නමුත් ඒ විසඳුම සාධාරණ වන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

අපිත් මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා විසඳුමක් සොයන්න තමයි සාකච්ඡා කරමින් ඉන්නේ. මුදල් පොලියට දෙන ආයතන මේ රටේ තිබෙනවා නේ. සමහර ආයතන මහා පරිමාණයෙන් පවත්වා ගෙන යනවා. හැබැයි ඒ ආයතන සියල්ලම ආණ්ඩුවෙන් වටලන්නේ නැහැ නේ. සමහර ආයතන බලපත් ලබා ගෙන මුදල් පොලියට දෙනවා. නමුත් සක්විති රණසිංහ අල්ලා ගත්තා නේ. සක්විති රණසිංහ එවැනි මුදල් ජාවාරමක නිරත වෙලා සිටියදී ඔහුව අල්ලා ගෙන හිරේ දැම්මා. ඇයි, ඒ? එය වංචනික ජාවාරමක් නිසා. ඒ වාගේම තමයි, දැන් මේ SAITM ආයතනයත්. 2008 මාර්තු 31වන දා ශ්‍රී ලංකා ආයෝජනය මණ්ඩලය සහ නෙවිල් ප්‍රනාන්දු මහතා අතර අත්සන් කරපු ගිවිසුමකින් තමයි මේ ආයතනය ආරම්භ කළේ. මේ ගිවිසුම අත්සන් කරන කොට තිබුණු කොන්දේසි මොනවාද?

ඒ වෙලාවේ තිබුණු South Asian Institute of Technology and Management (Pvt.) Limited කියන ඔහුගේ සමාගම විසින් BOI එකෙන් අවසර ඉල්ලනවා, Information Technology, Management and Finance, Engineering, Vocational Studies, Nursing, Languages, Health Science කියන පාඨමාලා ආරම්භ කරන්න.

මේක ඇතුළත "Medicine" කියලා කොහේවත් නැහැ. සෞඛ්‍ය සම්බන්ධයෙන් තිබෙන්නේ "Nursing සහ Health Science" විතරයි. ඒ වාගේම BOI එක මේ පාඨමාලා සඳහා අනුමැතිය දෙන කොටත් කොන්දේසි දෙකක් දමනවා. එකක්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තමයි "This approval was granted subject to the condition that the approval from Ministry of Health and Nutrition be obtained prior to providing training in Health Science" කියන එක. සෞඛ්‍ය විද්‍යාව සම්බන්ධ පුහුණුවක් දීමට කලින් සෞඛ්‍ය, පෝෂණ අමාත්‍යාංශයේ අනුමැතිය -අවසරය- ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවක් වෙලා තිබුණා.

මගේ අතේ තිබෙනවා, 2010.08.09වැනිදා එවකට Sri Lanka Medical Council එකේ සභාපතිනිය වුණු ලලිතා මෙන්ඩිස් මැතිනිය BOI එකේ සභාපතිවරයාගෙන් අහන ප්‍රශ්නවලට එවකට BOI එකේ සභාපති සහ Director General වන ජේ.ඩී. බණ්ඩාරනායක මහතා දෙන පිළිතුර. එතුමිය අහනවා, "Did the application include a proposal to set up a Medical School?" කියා. වෛද්‍ය විද්‍යාලයක් සෑදීම සඳහා ඉල්ලීමක් මෙහි තිබුණාද? නැත. එහෙම නැත්නම් රුසියාවේ Nizhny Novgorod රාජ්‍ය විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ වෙලා විශ්වවිද්‍යාලයක් හදන්න අවසර අරගෙන තිබුණාද? නැත. ඒ කියන්නේ BOI එකේ අනුමැතිය තිබෙන්නේ Nursing සහ Health Science කියන උපාධි දෙක දෙනවා නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුයි කියලායි.

ඊට පස්සේ නෙවිල් ප්‍රනාන්දු මහතා පත්‍රවල දිගින් දිගටම දැන්වීම් දැම්මා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය තිබෙනවා කියලා. 2013.04.05වැනිදා එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් Dr. Nihal Jayathilake නීතිපති දෙපාර්තමේන්තුවට ලියනවා, "I was instructed by the Hon. Minister ...."

එවකට මේ "Hon. Minister" අද ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.

> " ... to inform you that he did not issue any letter in writing or otherwise or grant any approval to the effect of carrying out a Medical Faculty at SAITM and to award Medical Degrees in Sri Lanka."

එවකට සෞඛ්‍ය ඇමතිවරයාගේ උපදෙස් මත නිහාල් ජයතිලක ලේකම්වරයා ලියනවා, මේ SAITM එකට වෛද්‍ය උපාධියක් ප්‍රදානය කිරීම සඳහා කිසිදු ආකාරයක අවසරයක් ලබා දුන්නේ නැහැයි කියලා. මේක ඇත්තද බොරුද කියලා දැන් ජනාධිපතිතුමාගෙන් අහන්න පුළුවන්. හැබැයි, මෙහෙම තිබේදී South Asian Institute of Technology and Management කියන ආයතනයේ නෙවිල් ප්‍රනාන්දු දොස්තර මහත්තයා කඩුවෙල දිසා අධිකරණයට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරනවා, "මා ප්‍රකාශ කර සිටින්නේ විත්තිකරුගේ වෛද්‍ය විද්‍යාලය සම්බන්ධව රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගෙන් ලිඛිතව අනුමැතිය ලබා ගෙන ඇති බවයි" කියා.

මේ තිබෙන්නේ කඩුවෙල උසාවියට ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයයි. ඔහු අවසරය ගත්තේ කොහෙන්ද? සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අවසර අරගෙන නැහැ. ඒක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා කියන්නේ. හැබැයි, ඔහු අවසරයක් අර ගෙන තිබෙනවා. කාගෙන්ද, ඒ කාලයේ පෞද්ගලික සෞඛ්‍ය අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක් හිටියා. ඔහු තමයි වෛද්‍ය හර්ෂ අමල් ද සිල්වා. ඔහුගෙන් එකඟතාවක්, අනුමැතියක් අර ගෙන තිබෙනවා, මාලබේ ප්‍රදේශයේ පෞද්ගලික රෝහලක් ඇති කරන්න. අන්න ඒ ලියුම තමයි Dr. Neville Fernando සාවද්‍ය ලෙස පාවිච්චි කරලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණායි කියලා රටට ඉදිරිපත් කරන්නේ. ඔහු දිගින් දිගටම ප්‍රකාශ කරනවා, "මේ ආයතනය රුසියාවේ Nizhny Novgorod රාජ්‍ය විශ්වවිද්‍යාලයත් එක්ක අනුබද්ධයි, ඒ නිසා ළමයි එවන්න" කියලා. මේ තිබෙන්නේ 2012.12.19 දින Alexey Postnikow, Director of Nizhny Novgorod State Medical Academy ලංකාවෙන් කළ විමසීමක් ගැන කළ ප්‍රකාශයක්.

ඔහු කියනවා, "In response to your previous email inquiry with regard to the status of the Sri Lankan Campus of Nizhny Novgorod State Medical Academy, I would like to inform you that the Database of accredited Higher Education Institutions in the Russian Federation maintained by the National Accreditation Agency does not contain any information about the Sri Lankan Campus of Nizhny Novgorod State Medical Academy." කියා. රුසියාවේ විදේශ විශ්වවිද්‍යාල සම්බන්ධ රාජ්‍ය ආයතනයෙන් කියා තිබෙනවා, මෙහෙම විශ්වවිද්‍යාලයකට අනුබද්ධ ආයතනයක් ලංකාවේ කොහේවත් නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාටද, ඒ උත්තරය එවා තිබෙන්නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒ උත්තරය එවා තිබෙන්නේ Dr. Chanaka De Silvaට.

ඊළඟට මම කියන්නම්, මේ කාරණයටම සම්බන්ධ අනෙක් කාරණය ගැන. මේ තිබෙන්නේ ආන්දෝලනයට තුඩු දීලා තිබෙන කරුණ සම්බන්ධයෙන් එවකට රුසියාවේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් කටයුතු කළ උදයංග වීරතුංග එවපු 2012.11.07 දිනැති ලිපිය. ඔහු කියනවා,"…the Russian Federation have informed in December 2011, that the Russian Federation has not established a branch of any educational institute in the territory of Sri Lanka" කියලා. ඔහු වෙන වෙන අයථා ගනුදෙනුවලට සම්බන්ධයි කියන එක වෙනත් කාරණයක්. හැබැයි නිල වශයෙන් අපේ රට නියෝජනය කළ රාජ්‍ය තාන්ත්‍රිකයා අපේ රටට දැනුම් දීලා තිබෙනවා, SAITM එක රුසියාවේ එවැනි විශ්වවිද්‍යාලයකට අනුබද්ධ නැහැ කියලා. හැබැයි, SAITM එක දිගටම දැන්වීම් පළ කරන්නේ එය රුසියාවේ Nizhny Novgorod විශ්වවිද්‍යාලයට අනුබද්ධයි කියලායි. ඒ විතරක් නොවෙයි, ලංකාවේ දරුවන්ගෙන් එකතු කරන මුදල්වලින් සියයට 22ක් ඒ ආයතනයට යවනවා කියලාත් ඔවුන් දැන්වීම් පළ කරනවා.

"Asian Institute of Technology and Management" කියන නම තමයි ආරම්භක අවස්ථාවේදී තිබුණේ. ඊට පසුව ඒ ගොල්ලන් ඒක ටිකක් වෙනස් කළා, "South Asian Institute of Technology and Management - SAITM"- කියලා. එහෙම කරලා තමයි BOI එකෙන් අනුමැතිය ගත්තේ. හැබැයි, SAITM කියන එක හොරාට වෙනස් කළා, "South Asian Institute of Technology and Medicine" කියලා. "M" අකුරෙන් අදහස් වුණු "Management" කියන එක "Medicine" කියලා කාගෙන්වත් අවසරයක් ගත්තේ නැතුව හොරාට වෙනස් කළා. එහෙමයි වෙනස් කළේ. ඇයි? ඔහුගේ එකම අරමුණ වුණේ ලාභය පමණක් නිසායි. එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාව සිටි රවින්ද්‍ර රුබේරු ඇතුළුව පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා. Dr. Ravindra Ruberu, Chairman, Dr. H.R.U. Indrasiri, Prof. Jayantha Jayawardana, Dr. Palitha Abeykoon and Mrs. A.R. Ahamed යන අය 2012.02.28 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයට

ඉදිරිපත් කළ ඒ කමිටු වාර්තාවේ ඒ කාරණා සියල්ල තිබෙනවා. BOI එකෙන් අවසර අරගෙන තිබෙන්නේ වෙනත් නමකින් කියලා තිබෙනවා. Nursing සහ Health Science Degree එකක් ලබා දෙනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගන්න ඕනෑ, එවැනි අනුමැතියක් ලබා ගෙන නැහැ කියලා තිබෙනවා. අනුමැතියක් අරගෙන තිබෙන්නේ 2009.01.07 වන දින Dr. Amal Harsha De Silvaගෙන්, ඒක වලංගු නැහැ කියලා තිබෙනවා. මේ තමයි මේ ආයතනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා නිකුත් කළ වාර්තාව.

ඊළඟට, තවත් වාර්තාවක් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගිහිල්ලා මෙය පරීක්ෂා කළා. ඒ සඳහා ගියේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වත්මන් සභාපති Prof. Mohan de Silva ඇතුළු පස් දෙනෙක්. අපොස උසස් පෙළ සඳහා ජීව විද්‍යා විෂය ධාරාව හදාරා නැති, අපොස උසස් පෙළ විභාගයෙන් "S" pass තුනක්වත් ලබා ගෙන නැති සිසුන් SAITM එකේ පළමු කණ්ඩායම් හතර තුළ සිටි බව ඔවුන් සොයා ගත්තා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකක්ද, ඒ වාර්තාව?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
2013 පෙබරවාරි 26 දිනැති, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තාව. ඒ Team එකේ ඉඳලා තිබෙනවා, Prof. Mohan de Silva, Prof. Jayantha Jayawardana, Prof. Thilak Weerasooriya, Prof. Colin Peiris, Prof. Malik Goonewardene and Dr. Sunil de Alwis යන අය. ඔවුන්ගේ වාර්තාවේ හතර දෙනෙක් පිළිබඳව පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, "මේ හතර දෙනා විතරයි සොයා ගන්න පුළුවන් වුණේ, ඔවුන් අවශ්‍ය සුදුසුකම් සපුරා නැහැ" කියලා.

ඊළඟට, SAITM එක Sri Lanka Medical Council එකට ආරාධනා කළා, ඔවුන්ගේ ආයතනය පරීක්ෂා කරන්න team එකක් එවන්න කියලා. Sri Lanka Medical Council එක එය පරීක්ෂා කරලා, "The Degree awarded by SAITM should not be recognized for the purpose of registration under the Medical Ordinance." යනුවෙන් වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. Prof. Carlo Fonseka සභාපතිත්වය දරන Sri Lanka Medical Council එක නිකුත් කළ වාර්තාවේ සඳහන් වෙනවා, "මේ දෙන උපාධිය වෛද්‍ය ආඥා පනත යටතේ පිළිගන්න බැහැ" කියලා. Sri Lanka Medical Council එක කියන්නේ

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය නොවන සංවිධානයක් නොවෙයි; ස්වේච්ඡා සංවිධානයක් නොවෙයි; එය ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක්. එහි සභාපතිවරයා පත් කරන්නේ ජනාධිපතිවරයා. සභිකයන් පත් කරන්නේ අදාළ ඇමතිවරයා. ඇත්තටම ගත්තොත් ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් ජනතාවට වග කියන්න තිබෙන, රජයට උදව් කරන්න තිබෙන ආයතනය තමයි Sri Lanka Medical Council එක. ඔවුන් කියනවා, "ඒ උපාධිය පිළිගන්න බැහැ" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ කවදාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
2015 සැප්තැම්බර් 04 වන දා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සියලු ලිපි ලේඛන **සභාගත*** කරනවා.

මේ අතරේ තමයි මෙහි ඉන්න ශිෂ්‍යයින් කීප දෙනෙකු එකතුවෙලා අධිකරණයට යන්නේ. අධිකරණයට ගිහිල්ලා ඔවුන් ඉල්ලා සිටිනවා, "ඔවුනට සායනික පුහුණුව ලබා දීම සඳහා රජයේ රෝහල් ලබා දෙන්න" කියලා. එහෙම නඩුව යනකොට සෞඛ්‍ය අමාත්‍යාංශය අධිකරණයෙන් පිටතදී එකඟතාවකට එනවා, "අපි මේ සායනික පුහුණුව දෙන්නම්" කියලා. හැබැයි, ඒ දෙන්නේ කාටද? ඒ දෙන්නේ මෙහෙමයි. 2014.09.17 එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් හිටපු සුධර්මා කරුණාරත්න විසින් නීතිපතිවරයාට යවපු ලියුම මා ළඟ තිබෙනවා. ඔවුන් එයින් පැහැදිලිව මෙහෙම කියනවා:

"Ultimately, with regard to the facilities required in this case, in principle, Hon. Minister is agreeable to cooperate with the SAITM in order to facilitate the required clinical training at designated state hospital in respect of the petitioners and the batches registrable under the Medical Ordinance."

වෛද්‍ය ආඥාපනත යටතේ ලියා පදිංචි වුණු කණ්ඩායම්වලට පමණක් එහෙම සායනික පුහුණුව දෙන්න අධිකරණයෙන් පිට එකඟතාවකට එනවා. හැබැයි, වෛද්‍ය ආඥාපනත යටතේ recognized එක batch එකක්වත් මේක ඇතුළේ නැහැ. උසාවියෙන් පිටත ආපු මේ එකඟතාව පෙන්නුම් කරලා තමයි, අවිස්සාවේල්ල රෝහලත්, කඩුවෙල MOH එකත් මේ අයට සායනික පුහුණුව සඳහා ලබා දුන්නේ. මේක කොච්චර හොරා ගැහිල්ලක්ද කියලා කියනවා නම්, කඩුවෙල MOH එක සහ අවිස්සාවේල්ල වෛද්‍ය අධිකාරිවරයාට යවපු ලියුම තමයි මේ තිබෙන්නේ. ඒ ලියුමට උසාවියේ වාර්තාවත් අමුණනවා, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්. ඇයි, ඒ? තමන්ගේ තීන්දුව හරියි කියලා කියන්න සෞඛ්‍ය අමාත්‍යාංශය බය නැත්නම් ඔවුන්ට මේ උසාවි නියෝගය අමුණන්න ඕනෑ නැහැ. හැබැයි, මේ උසාවි නියෝගය අමුණන්නේ මොකද? මේ සඳහා අවසරය නොදුන්නොත් උසාවි නියෝගයක් කඩ කරනවා කියලා වෛද්‍ය අධිකාරිවරයා සහ MOH බය කරනවා. උසාවි නියෝගයේ තිබෙන්නේ එහෙම නොවෙයි.

මේක මුල ඉඳලාම බොරුවක්. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල විවෘත කිරීම සඳහා එවපු ආරාධනා පත්‍රය තමයි මේ තිබෙන්නේ. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල විවෘත කරන්න කවුද ගියේ? එවකට අගමැති දි.මු. ජයරත්න මැතිතුමා, එවකට සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, එවකට උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා සහ රුසියාවේ තානාපතිවරයා තමයි මේ රෝහල විවෘත කරන්න ගියේ. මේ එන්න කියන්නේ මොකටද? එහි සඳහන් වෙනවා, මේ විධියට: "To the opening of Dr Neville Fernando Sri Lanka - Russia Friendship proposed Teaching Hospital."

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සියල්ලෝම ගිහිල්ලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
සියල්ලෝම ගිහිල්ලා. ඒක තමයි මා අහන්නේ. ජනාධිපතිතුමා පවා ගිහිල්ලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
එම ප්‍රශ්නය නිවැරැදි කරන්න තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් බලයට පත් කළේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ආණ්ඩුව ආවේ ඊට අවුරුදු හතරකට පස්සේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අවුරුදු අටක්, දහයක් නොවෙයි, කවදා කළත් එම වැරැද්ද හදන්න තමයි ලක්ෂ 62ක් ඡන්දය දීලා තිබෙන්නේ. නැත්නම් මොකටද ඡන්දය ලබා දෙන්නේ? ගිය කෙනාටත් ඡන්දය දුන්නා නේ. පෞද්ගලික අංශයට Teaching Hospital එකක් ආරම්භ කරන්න පුළුවන්ද? බැහැ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා විධියට සිටියදී පාර්ලිමේන්තුවේදී කිව්වා, "එහෙම ශික්ෂණ රෝහලක් ආරම්භ කරලා නැහැ. එහෙම ආරම්භ කරන්න බැහැ" කියලා. හැබැයි, Teaching Hospital එකක් -ශික්ෂණ රෝහලක්- කියලා තමයි invitation එක ගහලා එවලා තිබෙන්නේ. ශික්ෂණ රෝහලක් එහෙම ආරම්භ කරන්න පුළුවන් වෙන්නේ කොහොමද? එහෙම කරන්න බැහැ. බලන්න, දැන් නමත් වෙනස් කරලා තිබෙන්නේ. නමත් හොරාට ගහලායි තිබෙන්නේ. බඳවාගෙන තිබෙන්නේත් හොරාට. ශික්ෂණ රෝහල ආරම්භ කරලා තිබෙන්නේත් හොරාට. සියල්ල හොරාට කරලා, BOI එකත් නොමඟ යවලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයත් නොමඟ යවලා විතරක් නොවෙයි, මේ රටේ දරුවන් 1,200ක් ද රැවටීමටත් ලක් කරලා තිබෙනවා. ඇයි, මේ? ඒ, ඔහුගේ එකම අරමුණ ලාභයම පමණක් නිසයි. යුරෝපයේ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ආරම්භ කරන්නේ ආයතන විසිනුයි

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, නෙවිල් ප්‍රනාන්දු මේ ශික්ෂණ රෝහල ආරම්භ කරනකොට මෙහෙම වෙනසක් කරනවා. BOI එකට ඔහු දැනුම් දෙනවා, Dr. Neville Investment Company (Pvt.) Limited එකෙන් ආරම්භ කරපු ආයතනය, ආයතනයක් විධියට නොවෙයි, Dr. Neville Fernando නමින්ම විතරක් පවත්වාගෙන යන්න කියලා. තනි පුද්ගලයෙකු ආයෝජනයක් කරලා, මෙහෙම වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ, මොකටද? තමුන්නාන්සේලා කියනවා, "උසස් පෙළ සමත් වූ දරුවන්ගෙන් සියයට 83කට විශ්වවිද්‍යාලවලට යන්න බැහැ. ඒ අයට අවස්ථාව දෙන්න තමයි මේ වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළේ" කියලා. නැහැ. ඒ, ලාභය වෙනුවෙනුයි. මෙයින් රුපියල් බිලියන 5ක් පසු ගිය කාලයේ ලාභය විතරක් හොයලා තිබුණා. රුපියල් මිලියන 5000ක්! මේ ලාභ ලබනකොට කොහොමද වෙලා තිබෙන්නේ?

අද පුවත් පත්වල මෙහෙම වාර්තා කරලා තිබෙනවා. මේ සියල්ල හොරෙන් කරගෙන තිබෙන්නේ. "තාප්‍රධීන්ගේ නැති වුණු අස්ථි කොටස් SAITM එකට ගෙනි යන්න නියෝග දුන්නේ කවුද?" එහි උපකුලපතිවරයා හැටියට ඉන්නේ විශේෂඥ වෛද්‍ය ආනන්ද සමරසේකර මැතිතුමායි. හැබැයි, ඊයේ තාප්‍රධීන්ගේ නඩුවේදී හෙළිදරවු වෙනවා, කොළඹ ජාතික රෝහලේ තිබුණු අස්ථි කොටස්, මෘත ශරීර කොටස් බෑග් 15ක, 20ක පටවලා, ලොරිවලින් SAITM එකට අරගෙන ගියාය කියලා. මේ ශිෂ්‍යයින් කාය ව්‍යවච්ඡේදන සඳහා පාවිච්චි කරපු සමහර මෘත ශරීර, මිනිසුන් මරලා ගෙනාපුවාද කියලා හොයා බලන්න වෙනවා. ඇයි? ආන්දෝලනයට තුඩු දුන් මෙවැනි ඝාතනයක ශරීර කොටස් පොහොර මලුවල දමාගෙන SAITM එකට අරගෙන ගියා නම් - අද පුවත් පත් තමයි මේක වාර්තා කරන්නේ. - මෙවැනි ආයතනයක් නීත්‍යනුකූල කරන්න තමුන්නාන්සේලා කටයුතු කරන්නේ කොහොමද?

පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන, පෞද්ගලික අධ්‍යාපනය ගැන අපි වෙනම විවාදයක් කරමු. හැබැයි මම අහන්නේ මේ SAITM ආයතනය වංචනික විධියට ආරම්භ කරලා, වංචනික විධියට පවත්වාගෙන ගිහිල්ලා, දරුවන් අතරමං කරලා මේ ආකාරයට පවත්වාගෙන යන්න තමුන්නාන්සේලා ඉඩ දෙනවාද කියලායි. ඔබතුමන්ලා අහලා ඇති, මහරගම ප්‍රදේශයේ දරුවෙක් පසු ගිය දවස්වල ඩෙංගු රෝගය නිසා මිය ගියා කියලා. ඔහු ජයවර්ධනපුර රෝහලට ඇතුළත් කරලා ඉඳලා, පසුව ඔය කියන ශික්ෂණ රෝහලට ඇතුළත් කරලා තිබුණා. ඒ දරුවා මියගියාට පස්සේ ඒ දරුවාගේ අම්මා කියනවා, "නිලමැස්සෝ වහනවා වාගේ, එහෙම නැත්නම් කපුටෝ රැළක් වහනවා වාගේ තමයි ඒ දරුවා පරීක්ෂා කළේ" කියලා. මියයන්න ඔන්න මෙන්න සිටි දරුවා ඒ රෝහලේ සිටි වෛද්‍ය සිසුන් ඔක්කෝම ඇවිල්ලා ඔබ-ඔබා පරීක්ෂා කළේ කපුටෝ රැළක් වහනවා වාගේ කියලා ඒ අම්මා කියනවා. තමන්ගේ දරුවා මියගියේ ඒ රෝහලට ඇතුළත් කළ නිසා කියලා ඒ අම්මා චෝදනා කරනවා. ඔන්න තත්ත්වය. Teaching Hospital කියලා ගහගෙන බොරුවක් කරනවා කියලා ඇස් පනාපිටම පෙනෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පුන පුනා පත්තරේ දැන්වීම් දාලා කියනවා, "වෛද්‍ය සභාව මෙය පිළිගෙන නැහැ, මේකට දරුවන් ඇතුළත් කරන්න එපා" කියලා. හැබැයි, ඊට පහුවෙනිදා ඔවුන් පත්තරේ පිටු ගණන් දැන්වීම් දානවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය තිබෙනවා කියලා. මොකක්ද මේ කරන්නේ? තමුන්නාන්සේලා අනාථ කරන්නේ අපේ රටේ දරුවන් නේ. කෙසේ හෝ උසස් අධ්‍යාපනය ලබා ගන්න ඒ දරුවන් තුළ කැමැත්තක් තිබෙනවා. ඔය ක්‍රමය වෙනුවට අපි යෝජනා කරන්නේ මොකක්ද? ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ ආරම්භ කරන්න තවමත් ඉඩකඩ තිබෙනවා. ආණ්ඩුව කවදාද ඒ වාගේ දෙයක් කළේ?

පසු ගිය ආණ්ඩුව 2008 යෝජනා කරලා නතර කරපු වැඩසටහනක් තිබෙනවා. සබරගමුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීම සඳහා 2008දී යෝජනාවක් ආවා. ඔවුන්ගේ 2010-2015 පස් අවුරුදු සැලැස්මේ ඒක තිබුණා. ඒ අනුව 2013 වෙනකොට පළමුවැනි කණ්ඩායම බඳවාගන්න තමයි ඔවුන් යෝජනා කරලා තිබුණේ. නමුත් ඒක කළේ නැහැ. රත්නපුර මහ රෝහල ආසන්නයේ වෙරළුපේ කියලා ප්‍රදේශයක් තිබෙනවා. 2012 දී නාගරික සංවර්ධන අධිකාරියට අයත් එම ප්‍රදේශයේ අක්කර 22ක ඉඩමක් වෛද්‍ය පීඨය හදන්න සබරගමුව විශ්වවිද්‍යාලයට භාරදීලා තිබෙනවා. හැබැයි, අද වන තුරු එහි මුල්ගලක්වත් තියලා නැහැ නේ. ඔවුන්ගේ ඊළඟ පස් අවුරුදු සැලැස්මටත් ඒක ඇතුළත් කළා. 2016දී මේ Faculty එක ආරම්භ

කරන්න ඔවුන් බලාපොරොත්තුවෙන් සිටියා. Syllabus එක යවලා තිබෙන්නේ UGC එකට. ඉඩම තිබෙනවා. තමුන්නාන්සේලාට විශ්වවිද්‍යාල වරම් නොලබන දරුවන් ගැන ඔයතරම් අනුකම්පාවක් තිබෙනවා නම්, සිසුන් 150ක් දාන්න පුළුවන් රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයක් රත්නපුරේ ආරම්භ කරන්න. රත්නපුර මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කරලා ඒක පාවිච්චි කරන්න පුළුවන් නේ.

අද කිව්වා, වයඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වෛද්‍ය විද්‍යාලයක් පටන් ගන්නවා කියලා. පෞද්ගලිකව මම කියන්නේ මේකයි. ඒක කුලියාපිටියේ පටන් ගන්න සුදුසුයි කියලා වාර්තාව දුන්නේ කවුද කියලා මම දන්නේ නැහැ. මහ රෝහල තිබෙන්නේ කුරුණෑගල නම්, ඇත්තටම වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළ යුත්තේ කුරුණෑගලයි. අධ්‍යාපන ඇමතිතුමා කුලියාපිටිය ආසනයේ කියලා ඒක එහේ පටන් ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කළ නිසා තමයි දැන් ඇනිලා තිබෙන්නේ. නැඟෙනහිර ප්‍රදේශයේ ඇමතිවරයෙක් වරාය ඇමති හැටියට පත්වෙන කොට ඔලුවිල්වල වරාය හදනවා. එහෙම කරන්න පුළුවන්ද? එහෙම කරලා තමයි රට අනාථ කරලා තිබෙන්නේ. හම්බන්තොටින් ජනාධිපති එනකොට, එහේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණ හදනවා. එහෙම නොවෙයි, කුරුණෑගල නගරය ආශ්‍රිතව ඒ වෛද්‍ය විද්‍යාලය හැදුවා නම් ප්‍රශ්න අඩුයි. අග්නිදිග විශ්වවිද්‍යාලය හදලා ප්‍රශ්න ඇතිවෙලා තිබෙන්නේ ඒකයි. තමුන්නාන්සේලාට පුළුවන් ඒවා නිවැරදිව පටන් ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි.

ඊළඟට මොරටුව විශ්වවිද්‍යාලය තිබෙනවා. මොරටුව විශ්විද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න පුළුවන්. කළුතර, නාගොඩ මහ රෝහල ශික්ෂණ රෝහලක් විධියට හදන්න. රෝගීන් ඉන්නවා, විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා. එතැන වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න පුළුවන්. බදුල්ල මහ රෝහල පාවිච්චි කරලා ඌව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න තමුන්නාන්සේලාට පුළුවන්. එම වෛද්‍ය විද්‍යාල 4ත් ආරම්භ කළාට පසුවත් දොස්තරලා මදියි කියලා කියනවා නම්, ඊට පස්සේ තමුන්නාන්සේලාට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි, තමුන්නාන්සේලා ඒ එකකටවත් අත තියන්නේ නැතුව, රත්නපුරේ ඉඩම වේළෙනවා; ඒවාට අත තියන්නේ නැතුව SAITM එක බදාගෙන නහිනවා. එස්.බී. දිසානායක ඇමතිතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේ ඒ වෙනුවෙන් නැඟුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 සැප්තැම්බර් මාසයේ තමුන්නාන්සේගේ 'ලක්බිම' පත්තරේ තිබෙනවා, "රජයේ පිළිවෙතට පටහැනි තීරණයක් දුන්නොත් -ඒ කියන්නේ SAITM එකට අවසරය දුන්නොත්- වෛද්‍ය සභාව විසුරුවා හරිනවා" කියලා. එතුමා එදා එහෙම කිව්වා. ඕන්න ඔහොමයි කියන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මමද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නැහැ, හිටපු අමාත්‍යතුමා. තමුන්නාන්සේත් දැන් ඒ පාරේ යන බව තමයි පෙනෙන්නේ. ඒ නිසා දැන් කරන්න ඕනෑකම තිබෙන්නේ වෙන දෙයක්. අපේ රටේ දරුවන්ට උගන්වන්න දෙමව්පියන්ට තිබෙන කැමැත්ත, ඒ අභිලාෂය හොඳයි. එය අපේ රටේ සංවර්ධනයට පාවිච්චි කරමින් රාජ්‍ය වෛද්‍ය විද්‍යාල, රාජ්‍ය විශ්වවිද්‍යාල හදන්න. ඒ නිසා මේ වගේ වංචනික ආයතනවලට ඉඩ දෙන්න එපා කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SAITM එක පටන් ගත්ත කාලයේ කවුරුවත් විරුද්ධ වුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා කිව්ව විධියට පටන් අරන් තිබෙන්නේ Management -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
SAITM එක පටන් ගත්ත කාලයේ කිසි කෙනෙක් විරෝධතා ව්‍යාපාර ගෙන ගියේ නැහැ; පාර්ලිමේන්තුව විරුද්ධ වුණේත් නැහැ; විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු විරුද්ධ වුණේත් නැහැ. ඒ වාගේම, මේ ආයතනය අපි පටන් ගත්ත එකක් නොවෙයි; පසු ගිය ආණ්ඩුව කාලයේයි පටන් ගත්තේ. පසු ගිය ආණ්ඩුව කාලයේ Kotelawala Defence Academy එකේත් -ආරක්ෂක පීඨයේත්- වෛද්‍ය පීඨයක් ආරම්භ කළා. ඒ වේලාවේ කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. මොකද, ඒ කාලයේ එහෙම විරුද්ධ වෙන්න ශක්තියක් තිබුණේ නැහැ. SAITM එකේ ළමයි අපේ ආණ්ඩුව කාලයේ තමයි අවසාන විභාගයට පෙනී ඉඳලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ මේකට විසඳුමක් දෙන්න ඕනෑ කියලායි. දෙගොල්ලෝම එක්කාසු වෙලා Public-Private Partnership එකකට මේ ආයතනය පරිවර්තනය කරමු. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඇයි, ඒ කාලයේ විරුද්ධ වුණේ නැත්තේ? [බාධා කිරීමක්] කවුද විරුද්ධ වුණේ? [බාධා කිරීමක්] ඒ කාලයේ කිසි කෙනෙක් විරුද්ධ වුණේ නැහැ. ඒක පටන් ගත්ත කාලයේ භයයි; කට අරින්න භයයි. ඒ නිසා කවුරුවත් විරුද්ධ වුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. අපි දැන් විවාදයට යන්න ඕනෑ. [බාධා කිරීමක්] ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා කථා කරන්න. [බාධා කිරීමක්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
SAITM එක සම්බන්ධ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර විවාද කරන විට අපිත් හිටියා. එහිදී පැහැදිලිව කිව්වා ඒක ඒ

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ආණ්ඩුවේ රාජ්‍ය ප්‍රතිපත්තියක් කියලා. ඒකට කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. ඒ කාලයේ භය නිසා කවුරුවත් කට ඇරියේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා.

[අ.භා. 2.01]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සඳහා විශ්‍රාම වයස වෙනස් කිරීම සම්බන්ධයෙන් තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මෙය එක්තරා ආකාරයකට රටේ ජනගහන ප්‍රවණතාවක්. මොකද, 1960 ගණන්වල අපේ රටේ ජනගහනයේ ශීඝ්‍ර වර්ධනයක් සිදු වුණා. නමුත්, 1980න් පස්සේ ඒ ජනගහන වර්ධන වේගය ශීඝ්‍රයෙන් අඩු වෙලා, සමස්තයක් හැටියට අද වන විට සියයට එකකටත් වඩා අඩු ජනගහන වර්ධනයක් තමයි පවතින්නේ. 2012 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව, එය සියයට දශම 7.4ක් වුණා. ඒ නිසා කරුණු දෙකක් සිද්ධ වෙලා තිබෙනවා. එකක් තමයි, වියපත් ජනගහනය ශීඝ්‍රයෙන් වැඩිවීම. දැනට අවුරුදු 65ට වැඩි ජනගහනය සියයට 14ක් වනවා. 2030 වන විට මේ ප්‍රමාණය සියයට 25ත් ඉක්මවා යන තත්ත්වයක් ඇති වෙනවා. ඒ අනුව වියපත් ජනගහනයේ වර්ධනයක් තිබෙනවා.

මේ අතරේ ජනගහන සෞභාග්‍යය - demographic dividend එක - අරගෙන බැලුවාම අපට පෙනෙනවා, 1992 ඉඳලා ශ්‍රම බලකායේ ජනගහන වර්ධනය උපත් අනුපාතයට වඩා වැඩි වෙලා තිබෙන බව. මෙන්න මේ කාලය 2030 වර්ෂය වනතුරු පවතිනවා. මේ කාලය ඇතුළත තමයි, ලෝකයේ සෑම රටක්ම දුගී තත්ත්වයේ ඉඳලා, මේ ශ්‍රම බල කායේ වේගවත් වර්ධනය පාවිච්චි කරමින් සෞභාග්‍යමත් රටක් බවට පරිවර්තනය වුණේ. අපට තව ඉතාම සුළු කාලයයි තිබෙන්නේ. 1992 ඉඳලා අපි සැලකිය යුතු කාලයක් -දශක දෙකකට අධික කාලයක්- නාස්ති කරලා තිබෙනවා. ඊළඟ දශක එකහමාර ඇතුළත විධිමත් ජනගහන ප්‍රතිපත්තියක් එක්ක අප කටයුතු කළ යුතුයි. ඒ වාගේම, මනුෂ්‍යයෙකුගේ ආයු කාලය දැන් අවුරුදු 79 දක්වා වැඩි වෙලා තිබෙන තත්ත්වය තුළ, අපේ රටේ විශ්‍රාම යන වයස පිළිබඳ තීරණයක් ගැනීමේ අවස්ථාව එළඹිලා තිබෙනවා. ඒ අනුව ඒකට අපේ පක්ෂපාතිත්වය පළ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාලවල පොදුවේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන අපි ඉතාමත් සංවේදී වෙන්නට ඕනෑ. මේ රටේ අතීතයේ ඇති වුණු බොහෝ තරුණ කැරලිවල - 1971, 1988 - 1989 සිදුවීම්වල- ආරම්භය සිද්ධ වුණේත්, උතුරේ ඇති වුණු ත්‍රස්තවාදී ක්‍රියාවලියේ ආරම්භය ඇති වුණේත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළින්ය කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ නිසා මේ විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රශ්නය පිළිබඳව මතුපිටින් පමණක් සාකච්ඡා නොකර, ගැඹුරින් සාකච්ඡා කරලා, ව්‍යුහාත්මක විසඳුම්වලියක් ලබා දීමේ අවස්ථාවට දැන් රට එළඹිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශාල පිරිසක් අවධාරණය කරන දේ තමයි, විශ්වවිද්‍යාල ප්‍රවේශයට තේරුණු 150,000කට අධික පිරිසෙන්, 125,000කට පමණ විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න අවස්ථාව නොලැබෙනවාය කියන තර්කය. ඒ නිසා පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කිරීමට, එහෙම නැත්නම් වෙනත් ආයතන හරහා කටයුතු කිරීමට නොයෙකුත් යෝජනා ලබා දීලා තිබෙනවා. මේ විශ්වවිද්‍යාල ප්‍රවේශයේ අවම කොන්දේසි මොනවාද? අවුරුදු 40ක් තිස්සේ මේ අවම කොන්දේසිය වෙනස් වෙලා නැහැ. ඒක තමයි, සාමාන්‍ය සාමර්ථ තුනක් ලබා ගැනීම. කොටින්ම කිව්වොත් "S" තුන ලබා ගැනීම. "S" තුන ලබා ගන්නවා කියන්නේ ලකුණු 35ට වැඩියෙන් විෂයයන් තුනටම ලබා ගැනීම.1992දී මේ රටේ උසස් පෙළ විභාගයෙන් "A" හතර ලබා ගත්තේ 93 දෙනායි. නමුත් 2015 උසස් පෙළ විභාගයේදී 6,329කට "A" තුන ලැබිලා තිබෙනවා. මෙයින් 140කට අධික පිරිසකට "A" තුන ලබා ගෙනත් විශ්වවිද්‍යාලයට යන්නට බැරි වෙලා තිබෙනවා. පසු ගිය අවුරුද්දට පෙර අවුරුද්දේ වාණිජ අංශයෙන් පමණක් 2,000කට අධික පිරිසකට "A" තුන ලබා ගෙනත් විශ්වවිද්‍යාලයට යන්නට බැරි වුණා. මේ උසස් ප්‍රතිඵල අපට ලැබිලා තිබෙන්නේ සමහරවිට ශිෂ්‍යයින්ගේ දක්ෂතාව නිසා වෙන්නට පුළුවන්; සමහර විට ටියුෂන් ගුරුවරුන්ගේ දක්ෂතාව නිසා වෙන්නට පුළුවන්; සමහර විට මේ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේ කුසලතාවන් වර්ධනය වීම නිසා වෙන්නට පුළුවන්; සමහර විට අක්‍රමිකතා නිසා වෙන්නට පුළුවන්.

මම උදාහරණයක් කියන්නම්. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සමීක්ෂණය කරන කිහිප දෙනෙකු සමඟ මම කථා කළා. බහුවරණ ප්‍රශ්න පත්‍රයට සියයට 75ක් ගන්නා ළමයින්ගෙන් විශාල පිරිසක් රචනා ප්‍රශ්න පත්‍රයට අරන් තිබෙන්නේ බින්දුවයි. එහෙම නම් එතැන පැහැදිලි ප්‍රශ්නයක්, අක්‍රමිකතාව පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ඒවා වාර්තා කිරීම සඳහා උත්තර පත්‍ර පරීක්ෂකයින් හෝ විභාග පරීක්ෂකයින් ඉදිරිපත් වෙන්නේ නැහැ. මොකද, ඉතාම සංකීර්ණ අධිකරණ ක්‍රියාදාමයක් තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ කාරණය ගැන මගේ යෝජනාව මෙන්න මේකයි. මේක ආණ්ඩුවේ යෝජනාවක් නොවෙයි. මගේ යෝජනාව තමයි, අපි මේක වහාම වෙනස් කරන්නට ඕනෑ කියන එක. මේ ලකුණු 35න් විශ්වවිද්‍යාලයට යන ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ. මේ අධ්‍යාපන මට්ටම අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශයට වාඩිවෙන ශිෂ්‍යයින්ගෙන් සියයට 25කට "A" සාමාර්ථ ලැබෙන අවස්ථාවක අපි තවත් "S" තුන සංකල්පයේ සිටිය යුතු නැහැ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් තිබෙන කඩ ඉම් ලකුණු ප්‍රමාණය අනිවාර්යයෙන්ම ඉහළ නංවන්නට ඕනෑ. උසස් පෙළ විභාගය සමත්වීමේ කඩ ඉම දැන් තිබෙන විධියටම පවත්වාගෙන විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ කඩ ඉම් ලකුණු ප්‍රමාණය වැඩි කරන්නට ඕනෑ. ඒක තමයි ජාත්‍යන්තර සම්මතයත්. අඩුම ගණනේ තමන්ගේ විෂයය පද්ධතියට සාමාන්‍යයක් හැටියට ලකුණු 50ක්වත් ගන්නා අයට පමණක් විශ්වවිද්‍යාල ප්‍රවේශ තත්ත්වය ඇති කරන්නට ඕනෑ. මේක රැඩිකල් වෙනසක්. නමුත් මෙය අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුයි කියන එක මම යෝජනා කරනවා.

ඊළඟට, අවුරුදු 40ක් තිස්සේ තවමත් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා ක්‍රියා මාර්ගයේ වෙනසක් සිද්ධ වෙලා නැහැ. මට මතකයි, අපි විශ්වවිද්‍යාලයේ ඉන්නා අවස්ථාවේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කිංස්ලි ද සිල්වා වාර්තාවක් ඉදිරිපත් කළා මේ විශ්වවිද්‍යාලවලට ගන්නා ප්‍රවේශ තත්ත්වය වෙනස් කරන්නට. ඇත්තටම කුසලතා පදනම වෙනුවට භාෂාව මත පදනම් වෙන ප්‍රමිතිකරණයක් මුලින් ආවා. එහි ඇති වුණු ප්‍රශ්න නිසා එය අවුරුදු 2යි ක්‍රියාත්මක වුණේ. ඒක නිසා තමයි දිස්ත්‍රික් පදනම යෝජනා වුණේ. 1976 සිට ඒක ක්‍රියාත්මකයි. දැන් අවුරුදු 40ක්, මොකක්ද තත්ත්වය? කුසලතා පදනමින් සියයට 40යි. දිස්ත්‍රික් පදනමින් සියයට 60යි. ඒකෙනුත් දුෂ්කර දිස්ත්‍රික් පදනම

සියයට 5යි. උදාහරණයක් හැටියට හම්බන්තොට දිස්ත්‍රික්කය දුෂ්කර දිස්ත්‍රික්කයක්. නමුත් පසු ගිය වසරේ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට යන Z-score එක ගම්පහට වඩා හම්බන්තොට වැඩියි. එහෙම නම් මේ දිස්ත්‍රික්ක තවදුරටත් දුෂ්කර දිස්ත්‍රික්ක ලෙස හඳුන්වා දෙමින් මේ quota ක්‍රමය පවත්වාගෙන යාමේ තේරුමක් නැහැ.

අවුරුදු 40ක් තුළ අපේ අධ්‍යාපනයේ විශාල වෙනසක් සිද්ධ වෙලා තිබෙනවා. අධ්‍යාපන මධ්‍යස්ථාන හැම තැනකම ඇති වෙලා තිබෙනවා. ඒක පාසල් අධ්‍යාපනයේ දියුණුව නිසා පමණක් නොවෙයි, ටියුෂන් අධ්‍යාපනයේ දියුණුව නිසා. එම නිසා අනිවාර්යයෙන්ම මේ කුසලතා පදනමේ ප්‍රමාණය අපි වැඩි කරන්නට ඕනෑ. ප්‍රධාන වශයෙන් ඒක 50ට 50 තත්ත්වයටවත් ගේන්නට ඕනෑ. අනාගතයේ 70යි 30 තත්ත්වයට එන විධියට අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණයක් සිදු කළ යුතුයි. මොකද, මේ තුළ තමයි -කුසලතා පදනමේ සහ දිස්ත්‍රික් පදනමේ තිබෙන අනුපාතයේ ගැටලුව නිසා- විශාල පිරිසක් අසාධාරණයට ලක් වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කුසලතා පදනමේ සියයට 40, 70 දක්වා වැඩි කරන්නට ඕනෑ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මුලින් 50 කරන්නට ඕනෑ. ඉන් පසුව ක්‍රමයෙන් වසර ගණනාවක් ඇතුළත 70 දක්වා වැඩි කරන්නට ඕනෑ. ඒ වාගේම මෙතැනදී ඇති වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් කථා කළා SAITM ප්‍රශ්නය ගැන. මීට දශක තුනකට කලින් අපි විශ්වවිද්‍යාලයේ ඉන්න විට මීට සමානම ප්‍රශ්නයක් පැන නැඟුණා. ඒ, උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ ගැටලුව. ඒ අවස්ථාවේදී ඒ වෛද්‍ය විද්‍යාල අරගළය සම්බන්ධ ප්‍රශ්නයේ ප්‍රධාන පාර්ශ්වකාරයෙක් හැටියට සිටි කෙනෙක් හැටියටත්, එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සහ ස්ටැන්ලි කල්පගේ මහාචාර්යතුමා සමඟ සාකච්ඡා මාර්ගයෙන් ඒ ප්‍රශ්නය විසඳීම සඳහා සහභාගි වුණු කෙනෙක් හැටියටත් මම ඉතාම කනගාටු වෙනවා, අවුරුදු 30කට පසුව අපේ දරුවන්ටත් ඒ විධියටම ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවීම ගැන. ඇත්තටම මේ ගැටලුව මේ සමාජය විසින් නැවත ප්‍රශ්න කළ යුතු දෙයක්. අවුරුදු 30කට පසුවත් පැරණි ප්‍රශ්නය ආයෙත් ඒ විධියටම අපේ ඉස්සරහට ඇවිත්, අර විධියටම පෙළපාළි යමින්, අර විධියටම උපවාස කරමින්, අර විධියටම ගැටුම්කාරී තත්ත්වයකට ගමන් කරමින් තිබෙනවා.

මේ ප්‍රශ්නය විසඳන්න මම ඉදිරිපත් කරන යෝජනාව මේකයි. අපි නිදහස් අධ්‍යාපනයේ වරම් ලබාගෙන මෙතැනට පැමිණි අයයි. එය මේ රටේ සිදු වුණු විප්ලවකාරී පරිවර්තනයක්. නමුත්, අද අපේ රට මැදි ආදායම් ලබන රටක් බවට පත් වෙලා තිබෙන තත්ත්වයත්, විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයන් බඳවා ගැනීමේ දිස්ත්‍රික් පදනම නිසා කුසලතාව තිබෙන විශාල පිරිසකට අවස්ථා අහිමිවී තිබෙන තත්ත්වයත් ගැන අප සලකා බලන්න ඕනෑ.

විශේෂයෙන්ම වෛද්‍ය පීඨය සම්බන්ධයෙන් බැලුවොත්, පසු ගිය වසරේ කුසලතා පදනම මත "Z" ලකුණු ප්‍රමාණය වැඩි, විශ්වවිද්‍යාලයට යෑමට නොහැකි වුණු දහසකට ආසන්න පිරිසක් හිටියා. ඒ අයගේ ලකුණු වැඩියි විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට තේරුණු, අවසාන ලකුණ තිබෙන එක්කෙනාට වඩා. එතකොට මේ දහසක පිරිසකගේ ප්‍රශ්නයට විසඳුම මොකක්ද? ඒක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මගේ හැඟීම නම්, දිස්ත්‍රික් පදනම නිසා මේ "Z" ලකුණු ප්‍රමාණය අහිමි වන දරුවන්ට මුදල් ගෙවා රජයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළම අධ්‍යාපනය ලබන්න වහාම ඉඩකඩ සලසා දිය යුතුය කියන එකයි. වෛද්‍ය, ඉංජිනේරු ක්ෂේත්‍රවලට තමයි මේ ප්‍රශ්නය තදින් බලපාන්නේ. වෛද්‍ය පීඨයෙන් වෛද්‍යවරයෙක් බිහි කරන්න අද අවුරුදු පහටම ලක්ෂ 30කට ආසන්න මුදලක් තමයි වැය වන්නේ. හැබැයි, පෞද්ගලික විශ්වවිද්‍යාලයකට ඒ සඳහා රුපියල් ලක්ෂ 120ක් ගෙවන්න ඕනෑ. එහෙම නම්, අපි දරුවන්ට අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒ අනුව, ඒ වෛද්‍ය පීඨය තුළටම තවත් අමතර පිරිසක් බඳවා ගන්න ඕනෑ. ඒ අයට රජයේ රැකියා දෙනවා කියා ස්ථිරතාවක් නැහැ. ඒ අයට මුදල් ගෙවා වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව ලබාදිය යුතුයි කියා මා යෝජනා කරනවා. මේ අලුත් තත්ත්වය මත එහෙම දෙයක් කරන්න වෙනවා. ඒ හරහා උසස් අධ්‍යාපනයට කිසිම බාධාවක් වන්නේ නැහැ. මොකද, මේ විධියට බඳවා ගන්නා පිරිස අනිවාර්යයෙන්ම විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨයට යා යුතු පිරිසක්. නමුත් දිස්ත්‍රික් පදනම නිසා ඒ අයට ඒ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. අපට මේ ප්‍රශ්නය මඟ ඇරලා යන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනයේ පරමාර්ථය මොකක්ද කියන එකත් මේ අවස්ථාවේදී මා කියන්න ඕනෑ. අධ්‍යාපනය නොමිලේ ආචාර්ය උපාධිය දක්වා ලබාදිය යුතුයි කියන අදහස, මතය තමයි නිදහස් අධ්‍යාපනය නමින් ස්ථාපිත වෙලා තිබෙන්නේ. එය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඇතුළු ඒ ප්‍රගතිශීලී පිරිස් විසින් මේ රට ඇතුළේ ගත්ත විප්ලවකාරී පියවරක්. හැබැයි, මධ්‍ය ආදායම් ලබන රටක් බවට අප පරිවර්තනය වෙනවාත් එක්ක, ලෝකයේ ඇති වෙලා තිබෙන අලුත් අධ්‍යාපනික ප්‍රවණතා, විශේෂයෙන්ම නවෝත්පාදනය ඇතුළු ක්‍රියාවලියත් එක්ක, අධ්‍යාපනය ඊට වඩා පුළුල් තාක්ෂණික ක්ෂේත්‍රයකට ගෙන යෑම ගැන අපට දැන් සිතන්න සිද්ධ වෙලා තිබෙනවා. එතැන මූලික ප්‍රතිපත්තිය විය යුත්තේ අධ්‍යාපනය -විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය- ලාභ උපයන ව්‍යාපාරයක් විය යුතු නැහැ කියන එකයි.

ලෝකයේ සියලුම විශ්වවිද්‍යාලවල ප්‍රධාන මට්ටමේ ranking ඊයේ පළ වුණා. එහි පළමුවන ස්ථානයට පත් වෙලා තිබෙන්නේ බ්‍රිතාන්‍යයේ Oxford විශ්වවිද්‍යාලය. එම ලැයිස්තුවේ පළමුවැනි විශ්වවිද්‍යාල විස්ස ගත්තාම, ඒ විස්සම රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලත් එක්ක බැලුවාම ලාභ උපයන විශ්වවිද්‍යාල නොවෙයි. ඒ පළමුවැනි විශ්වවිද්‍යාල විස්සම ලාභ උපයන්නේ නැති, එක්කෝ සමූහ විසින්, නැත්නම් Trust විසින් පවත්වා ගෙන යන ඒවා. ඒ විශ්වවිද්‍යාල විස්සම තිබෙන්නේ බටහිර රටවල. එහෙම නම් අපිත් මේ ආදර්ශය ගන්න ඕනෑ. ලාභ ඉපැයීම සඳහා උසස් අධ්‍යාපනය කැප කළොත් මොකද වන්නේ? එහි ගුණාත්මකභාවය විනාශ වෙනවා විතරක් නොවෙයි, ආර්ථික උපාය මාර්ගයකට අනුකූලව අපට විශ්වවිද්‍යාල පද්ධතිය හැසිරවීමට තිබෙන හැකියාවත් නතර වෙනවා.

ඊළඟ කාරණය, මේ SAITM එකේ ප්‍රශ්නයයි. දැන් මේ ප්‍රශ්නයට තව තවත් දිගු වෙමින් ඉදිරියට යන්න දෙන්න බැහැ. මෙය ශිෂ්‍ය ජීවිත එකක් දෙකක්, තුනක්, හතරක් හෝ ඊට වැඩි ගණනක් බිලිගෙන ඉදිරියට යෑමට ඉඩ දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේ විධියේ ප්‍රශ්නයක් පිළිබඳව අපේ සමාජයේ මීට අවුරුදු 30කට කලිනුත් කතිකාවතක් තිබුණා; දැනුත් කතිකාවතක් ඇති වෙලා තිබෙනවා. මේ විශ්වවිද්‍යාලයේ තවත් පීඨ ගණනාවක් තිබෙනවා. නමුත්, ඒවා පිළිබඳ ප්‍රශ්න පැන නැඟිලා නැහැ. මේ වෛද්‍ය පීඨයේ ප්‍රශ්නයට තමයි වෛද්‍ය සභාව තරයේ විරුද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට සිසුන් බඳවා ගැනීම අපි වහාම නතර කළ යුතුයි. එයයි මගේ යෝජනාව. දැනුත් මෙම පීඨයේ සිසුන් 1,200ක් ඉන්නවා.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

අවුරුද්දක් පතා 100, 150 ගණනින් වැඩි කර කර, ඒ දරුවන්ගේ අනාගතයත් අවුල් කරමින්, මේ ප්‍රශ්නය තවත් සංකීර්ණ කළ යුතු නැහැ. ඒ නිසා අපි මෙම පීඨයට සිසුන් බඳවා ගැනීම වහාම නතර කළ යුතුයි.

දෙවනුව, අපි කිසියම් ආකාරයකට නිශ්චිත විශේෂඥ කණ්ඩායමක්, වෛද්‍ය මණ්ඩලයක් පාවිච්චි කරලා, මේ ඇතුළු වෙලා ඉන්න 1,200ක පිරිස අතරේ සුදුසුකම් විරහිතව ඇතුළු වෙලා ඉන්න පිරිසක් ඉන්නවා නම් -එහෙම චෝදනා තිබෙනවා - ඒ පිරිස් ඉවත් කරන්න ඕනෑ. විදේශ විශ්වවිද්‍යාලවල ඉගෙන ගත්ත අයට ලංකාවේ වෛද්‍යවරයෙකු ලෙස ලියා පදිංචි වීම සඳහා වෛද්‍ය සභාව විසින් අනුමත කර ඇති Act 16 විභාගයට මුහුණ දෙන්න වනවා. -දැන් ඒ විභාගයේ නම වෙනස් කර තිබෙනවා- මේ ශිෂ්‍යයන්ටත් ඒ විභාගයට ඉදිරිපත් වෙන්න සලස්වලා, මේ රටේ වෛද්‍යවරු හැටියට පුහුණුව ලබාගෙන ඉදිරියට යන්න අවස්ථාව ලබා දිය යුතුයි.

සයිටම් ආයතනය මොරටුව විශ්වවිද්‍යාලයට භාර දෙනවාද, එහෙම නැත්නම් ස්වාධීනව කරගෙන යනවාද කියන එක නොවෙයි වැදගත්. අනිවාර්යයෙන්ම මේ ආයතනය රජයේ නියාමනයට යටත් විය යුතුයි. වෛද්‍ය සභාවක් පිහිටුවලා තිබෙන්නේ, වෛද්‍ය ක්ෂේත්‍රයේ නියාමනය සඳහායි. ඒ නියාමනයට අනිවාර්යයෙන්ම මේ ආයතනය යටත් විය යුතුයි. මෙය පමණක් නොවෙයි. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයත් ඒකට අනිවාර්යයෙන්ම නතු විය යුතුයි. එසේ නැතුව සමාජ සාධාරණත්වය විශ්වාසය, මේ සමාජය තුළ අපට ඇති කරන්න බැහැ. අප දන්නවා, කවුරු කැමැති වුණත්, අකැමැති වුණත් අද අධ්‍යාපනයේ පරමාර්ථය, එක්කෝ වෛද්‍යවරයෙක් වීම. නැත්නම් ඉංජිනේරුවෙක් වීම බව. අපට තිබෙන අත්දැකීම ඒකයි. ඒ නිසා මේ ප්‍රශ්නය ඔඩු දුවන්න නොදී වහාම විසඳිය යුතුයි. ඒ සඳහා දිගු කාලීන විසඳුමක් විධියට මා යෝජනා කරනවා, ඒ අවස්ථා අහිමි වන කුසලතා සහිත ශිෂ්‍යයන්ට රාජ්‍ය විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවලට මුදල් ගෙවා අධ්‍යාපන කටයුතු කර ගැනීමට දිස්ත්‍රික් පදනමින් අවස්ථාව දෙන ගමන් මේ ආයතනය සම්බන්ධයෙන් නිශ්චිත තීන්දුවක් අරගෙන මේ ප්‍රශ්නය විසඳීමට කටයුතු කළ යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය එක්ක ඇදිච්ච තවත් ප්‍රශ්නයක් තමයි, ජාත්‍යන්තර පාසල් කියන එක. ඇත්තටම ලෝකයේ ජාත්‍යන්තර පාසල් කියලා දෙයක් තිබෙන එකම රට, මේ රට. ජාත්‍යන්තර පාඨමාලාවක් ඉගෙන ගන්න මේ රටේ දේශීය දරුවෙකුට කිසිම අවශ්‍යතාවක් නැහැ. අපේ 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතට අනුව මේ රටේ පෞද්ගලික පාසල් පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා තමයි සමාගම් පනත යටතේ මේ ජාත්‍යන්තර පාසල් පිහිටුවලා තිබෙන්නේ. අපි වහාම මේ පිළිබඳව කටයුතු කරලා, පළමුව ඒ දරුවන්ට අවස්ථාව දෙන්න ඕනෑ දේශීය විෂය ධාරාව ඉගෙන ගන්න. මොකද, 2014දී මේ සම්බන්ධ ප්‍රශ්නයක් පැන නැඟුණා. ජාත්‍යන්තර පාසල්වලට ඇතුළු කරන දරුවන් විභාග ලියන්න ආණ්ඩුවේ පාසලට ගන්න එපා කියලා, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් නිකුත් කළා. ඒ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයට දොස් කියන්න බැහැ. මොකද, ඒ පනත යටතේ උපකෘත පාසල් අපේ විෂය මාලා හදාරලා නැති නිසා. ඒකෙන් සැහෙන දරුවන් පිරිසක් අපහසුතාවට පත් වුණා. මේ ජාත්‍යන්තර පාසල් කියන්නේ ළමයින් 4 - 5දෙනෙකු හෝ දෙතුන් සියයක් යන ඒවා නොවෙයි.

අද අපේ පාසල් පද්ධතියේ ළමුන් හතළිස්ලක්ෂයක් ඉන්නකොට, කිසිම ප්‍රමිතියකින් තොර ජාත්‍යන්තර පාසල් පද්ධතියේ ළමුන් හාරලක්ෂයක් ඉන්නවා. ඒ නිසා පළමුව මේ පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයට අරගෙන නියාමනය කරලා, ප්‍රමිතිය උසස් කරලා පෞද්ගලික පාසල් හැටියට පවත්වාගෙන ගියාට ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම, කවුරු හෝ එංගලන්තයේ විෂය මාලාව ඉගෙන ගන්නවා නම්, Cambridge curriculum එක කරගෙන යන අය ඉන්නවා නම්, ඒ අය ඒ අනතුර භාරගෙන කටයුතු කළ යුතුයි. ඒ අයට රටේ පාසල්වලට ඇතුළු වෙන්න හෝ රටේ විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න අවස්ථාවක් ලබා දිය යුතු නැහැ. ඒ නිසා ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් විධිමත් නියාමනයක් කරලා, ඒවා පෞද්ගලික පාසල් හැටියට අපේ පාසල් පද්ධතියට ඇතුළු කර ගන්න විප්ලවකාරී පරිවර්තනයක් කළ යුතු අවස්ථාව දැන් එළඹිලා තිබෙන බවත් කියන්න ඕනෑ.

ඊළඟට රාජ්‍ය විශ්වවිද්‍යාලවල මුදල් අය කර ඉගැන්වීමේ ක්‍රියාදාමයත් ඇති කරලා, ඒවාට මේ පෞද්ගලික පාසල්වල දරුවන්ටත්, විදේශීය සිසුන්ටත් ඇතුළු වන්න අවස්ථාව ලබා දිය යුතුයි. මේ රටේ පිහිටීම සහ අවස්ථා අනුව අපට තිබෙන විශාල වෙළෙඳ පොළක් තමයි, අධ්‍යාපනය. ඒ වෙළෙඳ පොළ අපි විවෘත කරන්න ඕනෑ. විශේෂයෙන්ම අප්‍රිකාව වාගේම නැඟෙනහිර ආසියානු රටවල් අතරේ ලංකාවේ අධ්‍යාපනය ගැන, එහි තත්ත්වය ගැන විශාල පිළිගැනීමක් තිබෙනවා. ඒ නිසා ඒ අයට ඒ අවස්ථාව ලබා දිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන විශ්ලේෂණයක් කරපු විද්වතකු වන අපේ අනුරුද්ධ ප්‍රදීප් මැතිතුමාගේ ගණන් හැදීමකට අනුව ශිෂ්‍ය ප්‍රමාණයෙන් සියයට 17ක් පමණක් මුදල් ගෙවා ඇතුළු කළොත්, ඒ මුදලින් මුළු උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේම ප්‍රාග්ධන වියදම පියවා ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ තුළින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුත් පරිවර්තනයක් ඇති කර ගැනීමටත් අපට හැකියාව ලැබෙනවා. ඒ නිසා අපේ පාඨමාලා වෙනස් විය යුතුයි. විශේෂයෙන්ම කලා පාඨමාලාවට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණයේ අඩු කිරීමක් කරලා, ඒවා රැකියා උපදවා ගත හැකි ක්ෂේත්‍ර කරා යොමු කරවිය යුතුයි. කළමනාකරණ විෂයට, ඒ වාගේම තාක්ෂණ විෂයන් වෙතට යොමු කිරීමක් කරලා අධ්‍යාපනයේ පූර්ණ වෙනසක් අපි ඇති කළ යුතුයි. එහෙම නැත්නම්, එදා අවුරුදු 18, 20 තරුණ තරුණියන් අතින් සිදු වුණා වාගේ කැරලිකාරී තත්ත්වයක් නැවත මේ රටේ ඇති වෙලා, නැවත වතාවක් ලේ වැගිරීම්වලට පාර කැපෙන එක විතරයි වෙන්නේ. ඒ නිසා ඒ වියරු, බිහිසුණු අත් දැකීම් සහිත සමාජය යළිත් ඇති නොවෙන්න උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේත්, පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේත් විප්ලවකාරී වෙනසකට අප සියලුම දෙනාම පක්ෂ, පාට භේදයෙන් තොරව එකඟ විය යුතු යුගය එළඹිලා තිබෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

[අ.භා. 2.21]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර ගණනාවක් තිස්සේ අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය කළ ඉල්ලීමක් ඉෂ්ට කරන්නට ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ගෙන එමින් දක්වන ලද උත්සාහය අපි

අගය කරනවා. විශේෂයෙන්ම ඔවුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව දීර්ඝ කිරීම සඳහා දරන උත්සාහය ගැන. ගරු චම්පික රණවක ඇමතිතුමාත් ප්‍රකාශ කළ පරිදිම අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියම සමස්ත දියුණුවක් කරා ගමන් කරන්න අවශ්‍ය ක්‍රමවේදයකට පිවිසීමේ අවශ්‍යතාව වඩ වඩාත් දැනෙනවා. මීට වසර කීපයකට ඉස්සෙල්ලා අධ්‍යයන ක්ෂේත්‍රයේ අලුත් පෙරළියක් ඇති කරමින් උසස් පෙළ විෂය ධාරාවට තාක්ෂණවේදය විෂය හඳුන්වා දුන්නා. දැනට වසර 500කට පෙර අධ්‍යාපනයේ පුනරුදය පිළිබඳව ෆ්‍රැන්සිස් බේකන් කරපු ප්‍රකාශයට ශාස්ත්‍රීය සහ ශිල්පීය සම්ප්‍රදායන් එකතු කරමින් අධ්‍යාපනය අලුත් සංවර්ධනයක් කරා ගමන් ගන්න ඕනෑ කියන චින්තනය ක්‍රියාත්මක කරන්න අපේ රටේ අවුරුදු 500ක් ගතවුණා. ඒ නිසා තමයි තාක්ෂණවේදය හඳුන්වා දුන්නේ. තාක්ෂණවේදය හඳුන්වා දෙද්දී පොරොන්දු වුණා, තාක්ෂණික පීඨ දිස්ත්‍රික්ක මට්ටමින් ඇති කරනවා කියලා. අද අපේ ගරු ඇමතිතුමා වාගේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් ඒකට නිහඬයි. අද දිස්ත්‍රික්ක මට්ටමින් එවැනි තාක්ෂණික පීඨ සඳහා සිසුන් ඇතුළත් කර ගන්නේ නැහැ. ඒ වාගේම විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ප්‍රමාණය ඔබතුමන්ලා භෞතික වශයෙන් වැඩි කරලා තිබෙන බව අපි දන්නවා. ඔබතුමන්ලා ගිය වසරට සාපේක්ෂව මේ වසරේදී විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා වූ සිසුන් ප්‍රමාණය 2,208කින් වැඩි කරලා තිබෙන බව අපි පිළිගන්නවා. නමුත් මේ වැඩි කරපු ප්‍රමාණය සැලකිල්ලට ගත්තොත්, තාක්ෂණවේදය සඳහා අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුත් පුනරුදයක් ඇති කිරීම සඳහා හඳුන්වා දුන් ක්‍රමවේදයට සැලකිය යුතු ප්‍රතිශතයක් වැඩි කරලා නැහැයි කියන එකයි ප්‍රකාශ කරන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ අවුරුද්දේ තාක්ෂණික පීඨ 5ක් ආරම්භ කරලා අපි ළමයින් 1,800ක් බඳවා ගන්නවා, ගරු මන්ත්‍රීතුමා. අපි පළමුවැනි වතාවට මේ අවුරුද්දේ තාක්ෂණික පීඨ 5ක් ආරම්භ කරලා, ළමයින් 1,800ක් බඳවා ගන්නවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

තාක්ෂණික පීඨ 24ක් ගොඩනැඟීම සඳහා ක්‍රමවේදයක් පසු ගිය රජය ආරම්භ කළා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

තාක්ෂණික පීඨ 5ක් ආරම්භ කරලා අපි ඒක ඉස්සරහට කරගෙන යනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

හොඳයි. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. බොහෝම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ-පෙරේදා ගරු අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශ කළා, සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල උසස් පෙළ අධ්‍යයනය සඳහා අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. මේක අපේ රටේ විශාල අවිනිශ්චිතතාවක් ඇති කරන ප්‍රශ්නයක්. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උසස් පෙළ සාමාර්ථය වාගේම සාමාන්‍ය පෙළ ප්‍රතිඵලත් අත්‍යවශ්‍යයි. ඒ නිසා මේ නිර්දේශයත් එක්ක එක පැත්තකින් උසස් පෙළ විභාගයට මුහුණ දෙන ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ඉල්ලුම්කරණය සම්බන්ධයෙන් ගැටලු මතු වෙනවා. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය, විශේෂයෙන්ම රජයේ රැකියා සම්බන්ධයෙන් චක්‍රලේඛයක් තිබෙන බව අපි දන්නවා. රජයේ රැකියාවන් ලබා දීමේදී අපොස සාමාන්‍ය පෙළ සමත්වීම අවශ්‍යයි කියලා නියම කරලා තිබෙනවා. ඒ අනුව සාමාන්‍ය පෙළ විභාගය සමත් නොවී උසස් පෙළ අධ්‍යයනය කරන බොහෝ පිරිසකට මතු ආත්මෙකටවත් රජයේ රැකියාවක් ලබාගැනීමේ අවස්ථාව අහිමි කරනවා. එක පැත්තකින් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප කප්පාදු කරනවා. තව පැත්තකින් සාමාන්‍ය පෙළ අධ්‍යාපනය ලබන දරුවාගේ මනසට වෙන දෙයක් යොමු කරලා, ඔවුන්ව රාජ්‍ය සේවයට එක්වීම සඳහා තිබෙන පහසුකම අවම කරනවා. ඉදිරි කාලයේ දී රාජ්‍ය සේවයේ කරන්න හදන කප්පාදුව සඳහා ගෙන යන්නා වූ වැඩ පිළිවෙළෙහි එක් අංගයක් විධියටයි අපි එය දකින්නේ. ඉන්දියාවේ ගුණාත්මකභාවයෙන් තොර උපාධි ලබා ගත් ඕනෑ තරම් පිරිස් ඉන්නවා. නමුත් අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබපු පිරිස් ගුණාත්මකභාවයකින් යුතු උපාධි ලබා ගත්, ඒ වාගේම අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ කාර්යක් ඉෂ්ට කරන අය බව අප දන්නවා. ඒ නිසා ගුණාත්මකභාවයෙන් තොර කණ්ඩායමක් බිහි කිරීමේ කටයුත්ත තමයි මේ සිදු කරන්න යන්නේ කියන කාරණය අපට ඉතාම හොඳින් පැහැදිලි වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු කෙරෙහි මගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් බිහිවන වෛද්‍යවරුන් වැනි අය රට හැර යාම පිළිබඳව එතුමා සඳහන් කළා. ඒ වාගේම, ගරු අධ්‍යාපන ඇමතිතුමා පසු ගිය දවස් දෙක තුළ ඉතා දැඩි ලෙස රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයට බරපතළ ලෙස නින්දා-අපහාස කළා. පෞද්ගලිකවම එම සංගමයේ සාමාජිකයන්ව අපහාසයට-උපහාසයට ලක් කළා. ගෞරවාන්විතව විවිධ වෘත්තීන්වල යෙදෙන අය ඉන්න බව අප දන්නවා. විනිශ්චයකාරවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, එහෙමත් නැත්නම් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආචාර්ය, මහාචාර්ය, කථිකාචාර්යවරුන්ට විශේෂ ක්‍රමවේදයක් සකසා තිබෙන්නේ, ඔවුන්ගේ දරුවා උසස් යැයි සම්මත පාසලකට දැමීම පමණක්ම අරමුණු කරගෙන නොවෙයි.

විශේෂයෙන්ම ඒ අය පිට රටවල රැකියාවලට යන එක වැළැක්වීමේ පියවරක් විධියට තමයි මේ කටයුත්ත සිදු කරන්නේ. එම නිසා වෛද්‍යවරුන්ගේ දරුවන්ට නිසි පාසලක් ලැබුණේ නැත්නම්, "අපට හොඳ රස්සාවක් තිබෙනවා. පිට රට රැකියාවකට ගියොත් මීටත් වඩා වැටුප් ලැබෙනවා. ඒ නිසා පවුල පිටින්ම පිට රට යමු" කියන අදහසක් මනසෙහි ඇති වෙනවා. ඒ නිසා අධ්‍යාපන ඇමතිවරයා මේ විධියට පෞද්ගලික වශයෙන් ඔවුන්ට බැණ වැදීම වෛද්‍යවරුන්ට බරපතළ ගැටලුවක්. තව පැත්තකින්, ඉන්දියාව සමඟ අත්සන් කරන්නට යන ETCA ගිවිසුමට විරුද්ධව රජයේ වෛද්‍යවරු අරගළයක් ගෙන යන බව අපි දන්නවා. මාලබේ වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙනුත් ඔවුන්ගේ උද්ඝෝෂණයක් තිබෙනවා. ඉතින්, මෙවැනි ප්‍රශ්න තිබියදී තමයි අධ්‍යාපන ඇමතිවරයා වෛද්‍යවරුන් එක්ක පැටලෙන්න උත්සාහ කරන්නේ. එම නිසා අපේ විශ්වවිද්‍යාල පද්ධතියෙන් ගුණාත්මක උසස් අධ්‍යාපනයක් ලබපු පුද්ගලයන්ට මෙවැනි ආකාරයෙන් මඩ ගැසීම පිළිබඳව අපි බරපතළ ලෙස කනගාටුවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මතු කරන්නට ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මෑත කාලයේ දී අපේ රටේ නොයෙකුත් ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලබපු, ගෞරවාන්විතව ජීවත් වුණු බොහෝ පිරිසක් අද හොරු, මංකොල්ලකාරයන් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. එම නිසා අද අපේ විශ්වවිද්‍යාලවලින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබන තැනැත්තකු ඉදිරි කාල පරිච්ඡේදයේ දී රජයේ තනතුරක් හෝ රජයේ පරිපාලන සේවයේ තනතුරක් හෝ ලබා ගනියි කියලා මම හිතන්නේ නැහැ. අද අපේ රට ඒ තත්ත්වයට පරිවර්තනය වෙලා තිබෙනවා.

[ගරු සිසිර ජයකොඩි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිව යුතුම කාරණයක් තිබෙනවා. සෑම වෘත්තියකම ගැටලු ඇති කරලා තිබෙන්නේ, වෘත්තීය වශයෙන් සුදුසුකම්ලාභී තැනැත්තන්. මේ කාරණය පිළිබඳව ඊයේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ගැනීමට නියමිතව තිබුණා. ජ්‍යෙෂ්ඨ නිලධාරින්, පරිපාලන විභාගය කරපු අය සිටිනවා. බොහෝ දෙනෙක් උපාධිධාරින්. අද ඒ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් ඇමතිවරයාගේ ඇතැම් අත්තනෝමතික ක්‍රියාමාර්ග නිසා අද දේශීය ආදායම් බදු නිලධාරින්, විගණන නිලධාරින් උද්ඝෝෂණය කරන්න පටන් ගෙන තිබෙනවා. ඉංජිනේරු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ලැබූ අයට පනවන්නට යන ආචාර්ය ධර්ම යැයි කියා ගන්නා ඇතැම් දේවල්, මෙවැනි තත්ත්වයන් නිසා මේ රටේ වෘත්තිකයන් බරපතළ අපහසුතාවකට පත් කරපු අවස්ථාවක් බවට පත් වෙලා තිබෙනවා.

අපේ විශ්වවිද්‍යාල පද්ධතිය අපේ රටට ලබා දුන් දායාදයි. විශ්වවිද්‍යාල පද්ධතිය ලබා දුන් ඒ දායාදවලට අද කර තිබෙන දේ බලන්න. විගණකවරුන් වේවා, ඉංජිනේරුවන් වේවා, වෛද්‍යවරුන් වේවා, ඒ සියලු වෘත්තිකයෝ -ඒ සියලු ක්ෂේත්‍රවල අය- අද රජයත් එක්ක පඹ ගාලක පැටලිලායි ඉන්නේ. ඇතැම් විට, මුදල් ඇමතිවරයා ගන්නා අත්තනෝමතික ක්‍රියා මාර්ගවලට විරුද්ධව ඒ සෑම ක්ෂේත්‍රයකම පිරිස් උද්ඝෝෂණ ව්‍යාපාරවල පැටලිලායි ඉන්නේ. ඒ නිසා අවුල් ජාලයක් රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ තිබෙන මේ ප්‍රශ්න සම්බන්ධයෙන් මධ්‍යස්ථ මතයක් දරන්න විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මැදිහත් වන්න ඕනෑ කියන කාරණය අපි මේ ගරු සභාවේ අවධානයට යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා බොහොම අකමැති කාරණයක් තිබෙනවා. අකමැති වුණත් එය කිව යුතු කාරණයක්ය කියා මම විශ්වාස කරනවා. ඒ තමයි, විශ්වවිද්‍යාල පරිපාලකයන් ප්‍රදේශ වශයෙන්, ගෝත්‍ර වශයෙන් වෙනස්ව කටයුතු කිරීම. ඒ ගැන බොහොම කනගාටුයි. නවක වදය හා සම්බන්ධ සිද්ධියක් කැලණිය විශ්වවිද්‍යාලයේ සිදු වුණු බව අපි දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහිදී නවක වදය තහනම් කිරීමට අදාළ පනත යටතේ ගොනු කරපු නඩුවෙහි ශිෂ්‍යයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයකු විධියට මා ඉතා වගකීමෙනුයි මේ කාරණය කියන්නේ.

නවක වදය තහනම් කිරීමට අදාළ පනත යටතේ ශිෂ්‍යාවන් දෙදෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණා, තවත් ශිෂ්‍යයන් ගණනාවක් එක්ක. "නංගි, ඔය ඇඳුම ඇඳගෙන එන්න එපා" කියා දුරකථන ඇමතුමක් දුන්න එක විතරයි ඒ අය කරලා තිබෙන්නේ. ඒ අය මාස තුනක් මහර රිමාන්ඩ් බන්ධනාගාරගතව සිට තිබුණා. එය, දුරකථන ඇමතුමක් නිසා වූ දෙයක්. ඒ විශ්වවිද්‍යාල පරිපාලනය පොලීසියට සෘජු බලපෑම් කළා. විශ්වවිද්‍යාල පරිපාලනය ඒ ශිෂ්‍යයන් සම්බන්ධයෙන් කටයුතු කරපු විධිය එහෙමයි. නමුත් යාපනය විශ්වවිද්‍යාලයේදී සංස්කෘතික අංගයක් නිරූපණය කරපු ශිෂ්‍යයන්ට එහි දෙමළ ශිෂ්‍යයන් විසින් පහර දීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පරිපාලනය කටයුතු කළේ කොහොමද කියා අපි දන්නවා. ඒ නිසා විශ්වවිද්‍යාල පරිපාලනය ශිෂ්‍යයන් සමඟ කරන ගනුදෙනුවලදී -ශිෂ්‍යයන් සම්බන්ධ ප්‍රශ්නවලදී- ඊට වඩා ප්‍රවේසම් වන්න ඕනෑ, බොහොම මධ්‍යස්ථව මැදිහත් වන්න ඕනෑ කියන කාරණය පෙන්වා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාල වරම් නොලබන ශිෂ්‍යයන් අතිවිශාල ප්‍රමාණයක් ඉන්නවා. එසේ වුවත්, අද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව චක්‍රලේඛනයක් නිකුත් කර තිබෙනවා, බාහිර උපාධි සඳහා බඳවාගන්නා ශිෂ්‍ය ප්‍රමාණය අඩු කරන්න කියා. මේ තිබෙන්නේ ඒ චක්‍රලේඛනයයි. එක් පැත්තකින් පෙන්වනවා, විශ්වවිද්‍යාලවලට ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය 2,000කින් වැඩි කරනවා කියා. එසේ කියන ගමන්, බාහිර උපාධිවලට ලියා පදිංචි වන ශිෂ්‍ය ප්‍රමාණය අඩු කිරීම සඳහා වූ චක්‍ර ලේඛනයක් නිකුත් කරනවා. ඒ නිසා අපොස (උසස් පෙළ) සමත් වන, උපාධි සිහිනයක් තිබෙන, රජයේ රැකියාවකට -යම් වෘත්තියකට- පිවිසීමේ ඉලක්කයක් තිබෙන විශාල පිරිසකට - අතිමහත් පිරිසකට- මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වන්න බැරි වෙනවා, ඒ සඳහා වූ බලාපොරොත්තු අහිමි වනවා. ඒ නිසා මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරන්න ඕනෑ. ඒ සඳහා ප්‍රායෝගික ගැටලු තිබෙන බව අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් අලුත් ක්‍රමවේදයක් ගොඩ නඟන්න ඕනෑ. 'ඒ ඔස්සේ අපේ රටේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා කැප වෙමු.' කියන ආයාචනය මා කරනවා. ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

[අ.භා. 2.35]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සාකච්ඡාව පැවැත්වෙන අද දිනය ඉතාම වැදගත්. විශ්වවිද්‍යාලවල වැඩ කරන උදවියට වයස අවුරුදු 60 දක්වා-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTYSPEAKER *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදය සිදු කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ඒ යටතේ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින්ගේ සේවා කාලය වසර 60 දක්වා දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව, ඉතාම වැදගත් යෝජනාවක් කියා මා සඳහන් කරනවා. ඒ සම්බන්ධයෙන් අපි ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. මොකද, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල සේවකයන්ගේ වයස අවුරුදු පනස්පහ වුණාම වසරෙන්, වසර ඒ අයගේ සේවා කාලය දිගු කිරීමේ අවශ්‍යතාවක් මේ වනතෙක් තිබුණා. නමුත් ඔවුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාවත් අවුරුදු හැට දක්වා කෙළින්ම දිගු කිරීම තුළින් එම සේවකයන්ට තිබුණු එම අපහසුතාව මඟ හැරී යාම ඉතාම හොඳ දෙයක් කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙනකොට අපේ රටේ ජනතාවගේ ආයු කාලය වසර හැත්තෑනවය දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා සේවකයෙකුට, විශේෂයෙන්ම විශ්වවිද්‍යාලයක් වාගේ ආයතනයක සේවය කරන සේවකයෙකුට වයස අවුරුදු හැටක් වනතෙක් තම සේවාව ඉටු කිරීම එතරම් අපහසු කාර්යයක් නොවන බව විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල ගැන කථා කිරීමේදී අපට කරුණු-කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. අද වනවිට උසස් පෙළ විභාගය සඳහා වසරකට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දෙලක්ෂ ගණනක් ඉදිරිපත් වෙනවා. එයින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා එක්ලක්ෂ පනස්දහසකට ආසන්න ප්‍රමාණයක් සුදුසුකම් ලබනවා. නමුත් අපේ රටේ තිබෙන විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත්වීමට අවස්ථාව ලැබෙන්නේ එයින් විසිපන්දහසක් වාගේ ප්‍රමාණයකටයි. ප්‍රතිශතයක් වශයෙන් බැලුවොත්, සියයට පහළොවකට වඩා පොඩ්ඩක් වැඩි ප්‍රමාණයක් තමයි ඒ අවස්ථාව උදා කර ගන්නේ. මෙතැනදී අපි කල්පනා කළ යුතු දෙයක් තිබෙනවා. අද වනවිට එසේ සුදුසුකම් ලබා විශ්වවිද්‍යාලයකට ඇතුළත් වෙන්න බැරුව, එම බලාපොරොත්තු තබා ගෙන සිටින සියයට අසූවකට වැඩි ප්‍රමාණයක් වන දරුවන් -ශිෂ්‍යයන්- එතැනින් එහාට යන මාර්ගය මොකක්ද කියන එක ගැන අපි විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ.

අද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ගණනාවක් ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. පෞද්ගලික අංශය එසේ කටයුතු කිරීම වරදක් හැටියට අපි සලකන්නේ නැහැ. නමුත් මෙම ආයතන නියමානුකූල ප්‍රමිතියකින් යුතුව කටයුතු කරනවාද කියන එක ගැන සොයා බලන්න ඕනෑ. මොකද, එවැනි ආයතන ගණනාවක් විශාල වශයෙන් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා එම ආයතන නියම ප්‍රමිතියකට අනුව එම කටයුතු ඉටු කරනවාද කියා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉතාම උනන්දුවෙන් සොයා බැලිය යුතු කාලය හොඳටම ඇවිත් තිබෙනවා කියන එක මම මතක් කරන්න ඕනෑ. අද රජයේ විශ්වවිද්‍යාලවලට යන්න බැරි වෙන ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සිටින බව අප දන්නවා. ඒ වාගේම පෞද්ගලික අංශයෙන් නොයෙක් ආයතන ගණනාවක් උපාධි ලබා දීම සඳහා ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් වෛද්‍ය විද්‍යාලයට ඇතුළත්වීමට නොහැකි වෙන දරුවන්ට තමයි විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙන්නේ කියා මා හිතනවා. මෙහිදී SAITM එකද එහෙම නැත්නම් වෙනත් ආයතනයක්ද කියන එක නොවෙයි, ප්‍රශ්නය වන්නේ. අපි ඒ අයටත් අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ. මොකද, අද එවැනි දරුවන් විශාල ප්‍රමාණයක් හා එම දරුවන්ගේ දෙමව්පියන් අසරණභාවයට පත් වෙලා තිබෙනවා. එසේ සුදුසුකම් ලබා ගෙන තිබෙන උදවිය අපේ අල්ලපු රට වන ඉන්දියාව වාගේ රටවලට ගිහිල්ලා වෛද්‍ය උපාධිය ගන්නවා; චීනය වාගේ රටවලට ගිහිල්ලා වෛද්‍ය උපාධිය ගන්නවා; බංග්ලාදේශය වාගේ රටවලට ගිහිල්ලා සමහර අය අපහසුතා ගණනාවකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම අපේ රට තුළ රජයේ වෛද්‍ය විද්‍යාලවලට බඳවා ගන්නා ප්‍රමාණය වැඩි කර ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්නත්, ඒ වාගේම පෞද්ගලික අංශයට එවැනි අවස්ථාවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නත් කටයුතු කරනවා නම් එය ඉතාම වැදගත් වෙනවා කියා මා හිතනවා. මොකද, අපේ දරුවන් එසේ විදේශ රටකට ගිහිල්ලා අධ්‍යාපනය ලබනකොට, අපේ රටේ මුදල්- අපේ විදේශ විනිමය- ඒ සඳහා යොදවන්න අපට සිදු වෙනවා.

මෙවැනි කරුණු-කාරණා දිහා බැලුවාම, අපේ රටේ පවතින උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ඉස්සරහට ගෙනැල්ලා විශේෂයෙන්ම අපේ රටට හොඳ ලාභයක් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හැටියට එම විශ්වවිද්‍යාල පද්ධතිය ක්‍රියාත්මක කරනවා නම් එය ඉතාම වැදගත් දෙයක් ලෙස මා සලකනවා. ඒ වාගේම මම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමාත් මතක් කළා වාගේ රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට සුදුසුකම් තිබෙන දරුවන්ට මුදල් ගෙවා එසේ ඇතුළු වීමේ අවස්ථාව අපි සියයට ප්‍රමාණයකින් හෝ ලබා දුන්නොත්, ඒක ඉතාම වැදගත් වෙනවා කියා මා හිතනවා. රජයේ විශ්වවිද්‍යාල පවත්වා ගෙන යෑමේදී බලපාන මුදල් ප්‍රශ්න එහෙම නැත්නම් ආර්ථික ප්‍රශ්නවලටත් ඒකෙන් විසඳුම් ලැබෙනවා කියන එකත් මම ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේදී මතක් කරනවා.

වයඹ පළාතට වෛද්‍ය විද්‍යාලයක් ලබා ගැනීම සම්බන්ධ කාරණයත් අපි මේ අවස්ථාවේදී උසස් අධ්‍යාපන ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. දැනට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා මම පළාත් සභා නියෝජනය කරන කාලයේදීත් මෙම ඉල්ලීම කර තිබෙනවා. විශේෂයෙන්ම ඒක ඉතාමත් සුදුසු දෙයක්. වයඹ පළාත කියන්නේ, අධ්‍යාපනය අතින් අද ඉතාම ඉහළට ඇවිල්ලා තිබෙන ප්‍රදේශයක්. මේ වෙලාව, වෛද්‍ය විද්‍යාලයක අවශ්‍යතාව වයඹට දැනෙන වෙලාවක්. පේරාදෙණිය වෛද්‍ය විද්‍යාලයේ ඉඳලා මහාචාර්යවරුන් ඇතුළු ඒ සියලු දෙනාට කුරුණෑගලට පහසුවෙන් පැමිණෙන්න පුළුවන්. කුරුණෑගල ශික්ෂණ රෝහල තිබෙනවා. ඔවුන්ට, එන්න ගත වෙන්නේ විනාඩි 45ක්, පැයක් වාගේ කෙටි කාලයක්. සමහර පළාත්වල වෛද්‍ය විද්‍යාල ඇති කරලා තිබුණත්, ඒවාට අවශ්‍ය මහාචාර්යවරුන්ගේ, ආචාර්යවරුන්ගේ අඩුපාඩුකම් අපි දැකලා තිබෙනවා. නමුත් වයඹ පළාතේ, කුරුණෑගල ප්‍රදේශයට මෙවැනි අවස්ථාවක් ලබා දුන්නොත්, එවැනි ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. මොකද, ඒ හැම දෙයකටම අවශ්‍ය වටාපිටාව ඒ ප්‍රදේශයේ තිබෙන නිසා. විශේෂයෙන්ම පේරාදෙණියේ ඉඳලා එන්න යන වෙලාවත් එක්ක, ඒ මහාචාර්යවරුන්ට කුරුණෑගල වෛද්‍ය විද්‍යාලයේ ඉගැන්වීම් කරන්න ඉතාමත් පහසු වෙනවා කියන එක මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

අමාත්‍යතුමාගේ ප්‍රයත්නය අපි අගය කරමින් එතුමාට අපේ රටේ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන ගැටලු සාකච්ඡා කරලා විසඳා ගන්න හැකියාව ලැබේවා! කියලා ප්‍රාර්ථනා කරනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමේදී අපේ දරුවන් කිසිම කෙනෙකුට අසාධාරණයක් නොවන විධියට අපි කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලයට ඇතුළු වීමට සුදුසුකම් ලබා තිබෙන අයට, විශ්වවිද්‍යාලය තුළ තිබෙන පහසුකම් ප්‍රමාණවත් නොවෙන නිසා, එයට ඇතුළු වීම සඳහා තිබෙන හැකියාව අඩු වෙලා තිබෙනවා. පෞද්ගලික අංශයත් එකතු කරගෙන ඒ අයටත් අවස්ථාවක් ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරනවා නම්, ඉතාමත් වැදගත් කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Seeniththamby Yoheswaran, you have fifteen minutes.

[பி.ப. 2.43]

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பல்லைக்கழக கல்விசாரா ஊழியர்களுக்கான 57 வயது எல்லையை அறுபதாக உயர்த்துவதற்கு மேற்கொள்ளும் இத்திருத்தச் சட்டமூலத்தை நான் வரவேற்கின்றேன். மகிழ்ச்சியான விடயம் என்னவென்றால், எமது நாட்டிலே 13,207 கல்விசாரா ஊழியர்கள் இதன்மூலம் பயனடைய இருக்கின்றார்களென்பதுதான். இந்த நல்ல விடயத்தை வரவேற்கும் அதேவேளை, எங்களது கௌரவ உயர் கல்வி, மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சர் அவர்கள் இங்கு தொடர்ச்சியாக அமர்ந்திருந்து அத்தனை பேச்சுக்களையும் அவதானித்துக்கொண்டிருப்பதையிட்டு அவருக்கு நன்றியையும் தெரிவித்துக் கொள்கின்றேன். பெரும்பாலும் இவ்வாறான நிகழ்வுகள் நடைபெறும்போது அது சார்ந்த அமைச்சர்கள் கவனம் செலுத்துவது மிகக் குறைவு! ஆனால், அவர் பூரண கவனத்துடன் சபையில் இருக்கின்றார்.

பல்லைக்கழக அனுமதியை நாங்கள் பார்க்கும்போது, அண்ணளவாக 84 சதவீதமான சிங்கள மாணவர்களும் 8.5 சதவீதமான தமிழ் மாணவர்களும் ஒரு சதவீத தோட்ட மாணவர்களும் 7 சதவீதமான முஸ்லிம் மாணவர்களும் அதற்கான அனுமதியினைப் பெற்றுக்கொண்டிருப்பதைக் காணலாம். இதில் மாற்றம் வேண்டும். இந்த நாட்டின் தேசிய இனங்களாகிய ஏனைய இரண்டு இனங்களின் பல்கலைக்கழக அனுமதிகள் அதிகரிக்கப்பட வேண்டும். அதில் அமைச்சர் கவனம் செலுத்தவேண்டுமென்று அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். 2014ஆம் 2015ஆம் ஆண்டுகளில் 1,49,572 பேர் பல்கலைக்கழகப் பிரவேசத்துக்குத் தகுதி பெற்றபோதும் 25,643 பேரே பல்கலைக்கழக அனுமதியைப் பெற்றுள்ளார்கள். குறிப்பாக, 17.14 சதவீதமான மாணவர்கள் தான் பல்கலைக்கழகத்துக்குத் தெரிவாகின்றனர். மிகுதி யானவர்கள் என்ன செய்வதென்று தெரியாத நிலையில் தடுமாறிக்கொண்டிருக்கின்றார்கள். ஆகவே, அவர்களுக்கான ஒரு மாற்றுத்திட்டக் கல்வி முறை ஏற்படுத்தப்பட வேண்டும். அது தொழில்சார் கல்விமுறையாக ஏற்படுத்தப்படுமாக இருந்தால் வரவேற்கத்தக்கது. இந்த வருடம் 27,000 பேர் பல்கலைக்கழகத்துக்கு உள்வாங்கப்படவிருப்பதாக நான் அறிகின்றேன். அவ்வாறு உள்வாங்குகின்ற தன்மையைக் கூட்டிச்சென்றால் நல்லது. அதேநேரத்தில், பல்கலைக் கழகங்களில் பட்டங்களைப் பெற்று வெளியேறும்போது அவர்களுக்கு அதற்கேற்ப தொழில்வாய்ப்புக்கள் கிடைக்க வசதிகள் செய்வதும் வரவேற்கத்தக்கது.

இன்று எமது நாட்டில் 30 க்கும் மேற்பட்ட தனியார் பல்கலைக்கழகங்கள் இருக்கின்றன. ஆனால், எந்தவொரு தனியார் பல்கலைக்கழகமும் வடக்கு, கிழக்கில் இல்லை. அந்த வகையில் வடக்கு, கிழக்குப் பகுதிகளிலும் தனியார் பல்கலைக் கழகங்களை நிறுவவேண்டிய அவசியம் இருக்கின்றது. வெளிநாடுகளில் புலம்பெயர்ந்த உறவுகள் அங்கு தனியார் பல்கலைக்கழகங்களை நிறுவ முன்வந்தால், கௌரவ அமைச்சர் அவர்கள் அதற்கேற்ற ஏற்பாடுகளைச் செய்து தரவேண்டுமென்று இந்த சபையிலே அன்பாக வேண்டிக்கொள்கின்றேன்.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon, Member, if there are any people who want to invest in the North for private higher education, you come and see me and I will support you.

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

நன்றி.

இன்று பல்கலைக்கழக கல்விசார் ஆசிரியர்களுக்கு ஓரிலட்சம் ரூபாய்வரை சம்பளம் வழங்கப்படுகின்றது; சிலவேளைகளில் அதற்கு மேலாகவும் கிடைக்கின்றது. ஆனால், கல்விசாரா ஊழியர்களின் சம்பளம் அவர்களின் சம்பளத்தில் கிட்டத்தட்ட ஐந்திலொரு பங்காகத்தான் இருக்கின்றது. ஆகவே, கல்விசாரா ஊழியர்களின் சம்பளமும் அதிகரிக்கப்பட வேண்டுமென்று இந்த சபையில் நான் வேண்டிக்கொள்கின்றேன். ஏனைய அரச ஊழியர்களுக்கு வழங்கப்படும் ஓய்வூதியத்தைவிடப் பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களுக்கு ஓய்வூதியம் குறைவாகவே வழங்கப்படு கின்றது. எனவே, ஏனைய அரச ஊழியர்களுக்குச் சமமான வகையில் அவர்களது ஓய்வூதியங்களும் அதிகரிக்கப் படுவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். ஏனைய அரச ஊழியர்களுக்கு வழங்கப்படுவதுபோன்று பல்கலைக்கழக ஊழியர்களுக்கும் காப்புறுதித் திட்ட வசதிகள் ஏற்படுத்தப்பட வேண்டும்.

இந்த வேளையிலே எங்களுடைய கௌரவ அமைச்சர் அவர்கள் இருப்பதனால் நான் ஒரு விடயத்தை முக்கியமாக இங்கு கூற விரும்புகின்றேன். கிழக்குப் பல்கலைக்கழகத்தில் கடந்த பல வருட காலமாக ஒரு குறைபாடு நிலவிக் கொண்டிருக்கின்றது. அந்தக் குறைபாடு பூர்த்திசெய்யப்பட வேண்டிய ஒன்றாக இருக்கின்றது. குறிப்பாக அங்கு இந்து நாகரிக பீடம் இல்லாத ஒரு குறை இருந்து கொண்டிருக்கின்றது. இலங்கையின் அரசியல் யாப்பில் சமயங்களுக்கு சம உரிமை வழங்கப்பட வேண்டுமென்று உள்ளது. இலங்கை ஒரு பூர்வீக இந்து நாடு. இந்த நாட்டிலே ஓர் இந்துப் பல்கலைக்கழகமும் இல்லை; அதேநேரத்தில், எந்த பல்கலைக்கழகத்திலும் இந்து சமய பீடமும் இல்லை. இன்று கனடா கொங்கோடியா பல்கலைக்கழகம், தென்னாபிரிக்கா பல்கலைக்கழகம், லண்டன் 'ஒக்ஸ்போட்' பல்கலைக்கழகம் போன்றவற்றில் இந்து சமய பீடம் இருக்கின்றது. விசேடமாக கிறிஸ்தவ நாடு என்று சொல்லப்படுகின்ற, 76 சதவீதம் கிறிஸ்தவ மக்களைக் கொண்ட அமெரிக்காவில் ஓர் இந்துப் பல்கலைக்கழகம் இருக்கின்றது. ஆனால், எமது நாட்டிலே தமிழ் மக்கள் வாழ்கின்ற பகுதிகளில் இருக்கின்ற பல்கலைக் கழகங்களில்கூட இந்துசமய பீடம் இல்லை.

கிழக்குப் பல்கலைக்கழகத்திலே 400க்கு மேற்பட்ட மாணவர்கள் இந்துசமயத் துறையில் கல்வி கற்கிறார்கள். இத்துறையில் தொழில் சார்பான பல பாடத்திட்டங்கள் இணைக்கப்பட்டிருக்கின்றன. ஆனால், இதுவரை இந்துசமய பீடமாக அது உருவாக்கப்படவில்லை. முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க அவர்களின் காலம் தொடக்கம் இதற்கான நடவடிக்கைகைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. நாங்களும் அதுசம்பந்தமான பல விடயங்களை இந்தச் சபையிலும் முன்வைத்திருக்கின்றோம். ஆனால்,

இதுவரை அப்பீடம் அங்கு உருவாக்கப்படவில்லை. இச்சந்தர்ப்பத்தில் விசேடமாக நான் ஒன்றைக் குறிப்பிட விரும்புகின்றேன். கிழக்கு பல்கலைக்கழகத்தின் இந்துநாகரிகத் துறையில் கற்கைநெறியை மேற்கொண்ட மாணவன் ஒருவனால் அத்துறையின் தலைவர் திருமதி சாந்தி கேசவனின் வழிகாட்டலில் எழுதப்பட்ட ஆராய்ச்சிக் கட்டுரையானது அமெரிக்காவிலுள்ள ஹவாய் இந்து ஆதீனத்தால் நூலாக வெளியிடப்பட்டுள்ளது. அந்தளவுக்கு இந்து மாணவர்களின் பெருமை அங்கு அமைந்திருக்கின்றது. ஆகவே, கிழக்குப் பல்கலைக்கழகத்தில் இந்துசமய பீடத்தை விரைவாக ஆரம்பிப்பதற்கு முன்வரவேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களிடம் அன்பாக இந்த சபையில் கேட்டுக்கொள் கின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் சகலரையும் மதித்து நடப்பவர் என்ற வகையிலே இதில் கவனம் செலுத்துவார் என்ற முழு நம்பிக்கை எனக்கு இருக்கிறது.

கிழக்குப் பல்கலைக்கழகத்தில் இன்னுமொரு பிரச்சினை நிலவிக்கொண்டிருக்கின்றது. அங்கு இந்த வருடத்தில் கற்கைநெறிகளுக்காக உள்வாங்கப்பட்ட மாணவர்களில் தமிழ் மாணவர்கள் 1,515 பேரும் முஸ்லிம் மாணவர்கள் 705 பேரும் சிங்கள மாணவர்கள் 1,489 பேரும் அடங்குகிறார்கள். குறிப்பாக, 2009ஆம் ஆண்டுக்குப் பின் திட்டமிட்ட வகையிலே அங்கு சிங்கள மாணவர்களின் தொகை அதிகரிக்கப் பட்டுள்ளது. உண்மையிலே பல்கலைக்கழகம் இனரீதியானது அல்ல. ஆனாலும் அந்தப் பகுதி மாணவர்களுக்கு முக்கியத்துவம் அளிக்கப்பட்டதாக அது அமைய வேண்டும். அங்கு கூடிய வீதம் சிங்கள மாணவர்கள் தற்போது இருப்பதனாலும் அவர்களில் பலர் போதைப் பொருட்களைப் பாவிப்பதாலும் அங்கு தொடர்ச்சியாகப் பிரச்சினைகள் வருகின்றன. இது இன முரண்பாட்டை ஏற்படுத்திவிடும். நாங்கள் இந்த நாட்டிலே நல்லிணக்கத்தை விரும்புகின்றோம். இந்த அரசு நல்லாட்சியைத் தாபிப்பதற்கு நடவடிக்கை யெடுத்து அதில் வெற்றிகண்டு வருகின்றது. இந்த நிலைமையில், அங்கு உள்வாங்கப்படும் பெரும்பான்மைச் சிங்கள மாணவர்கள், தமிழ் மாணவர்களின் நடவடிக்கைகளில் தலையிடுவதால் பிரச்சினைகள் உருவாகின்றன.

அண்மையில் கிழக்குப் பல்கலைக்கழகத்திலும் யாழ். பல்கலைக்கழகத்திலும் இவ்வாறான பிரச்சினைகள் ஏற்பட்டன. பேராதனைப் பல்கலைக்கழகத்திலும் வித்தியாசமான முறையிலே அது ஆரம்பித்து பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. ஆகவே, கிழக்குப் பல்கலைக்கழகத்தில் சிங்கள மாணவர்களின் தொகை குறைக்கப்பட்டு தமிழ் பேசும் மாணவர்களின் தொகை அதிகரிக்கப்பட வேண்டும். குறிப்பாக விஞ்ஞானம், விவசாயம், வர்த்தகம் ஆகிய பீடங்களில் தமிழ்பேசும் மாணவர்களின் தொகையை அதிகரிப்பதற்கு அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும். பிரச்சினைகள் ஏற்படாமல் ஏனைய நாடுகளில் சுமுகமாக இயங்குவது போன்று இங்கும் இந்தப் பீடங்கள் சுமுகமாக இயங்க வேண்டும். அதற்கு கௌரவ அமைச்சர் அவர்களுடைய ஒத்துழைப்பு அவசியம் என்பதனைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதுமாத்திரமின்றி, கிழக்கு பல்கலைக்கழகத்தில் சில பாடநெறிகள் இதுவரை உருவாக்கப்படாத நிலைமை இருக்கின்றது. அதற்கான பீடங்களும் இல்லை. குறிப்பாக, சட்டபீடம் தேவையாக இருக்கின்றது. ஏனென்றால், அங்கு கூடிய வீதமான மாணவர்கள் சட்டம் கற்பதற்கும் அத்துறையில் ஈடுபடுவதற்கும் ஆயத்தமாக இருக்கிறார்கள். ஆகவே, அங்கு சட்டபீடம் ஒன்றை உருவாக்குவதற்கு மாண்புமிகு அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டும். மேலும், வடக்கு, கிழக்கு பகுதிகள் கடல் சார்ந்திருப்பதனால் அங்கு கடற்றொழில்சார் பீடம் உருவாக்கப்படுவதோடு, பொறியியற் பீடமும் ஆரம்பிக்கப்பட வேண்டும்; விளையாட்டுத்துறையில் 'வித்தாண்மை நெறி' என்று சொல்லப்படுகின்ற 'டிப்ளோமா' நெறியும் அத்துறையிலான பட்டப்படிப்பு நெறியும் அங்கு உருவாக்கப்பட வேண்டும். எனவே, இவை சார்பாகவும் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்தவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

மேலும், அங்குள்ள நூலகம் நவீனமயமாக்கப்பட வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் அண்மையிலே அங்கு சென்றுவந்தவர் என்பதால், அங்குள்ள நிலைமைகளைப் பார்வையிட்டிருப்பார் என்று நான் நினைக்கின்றேன். அச்சந்தர்ப்பத்தில் நான் வெளிநாடு சென்றிருந்ததனால், அந்த நிகழ்வில் கலந்துகொள்ளாமையையிட்டு மனம் வருந்து கின்றேன். ஆனாலும், அங்கிருக்கின்ற தேவைகளை நீங்கள் நிறைவேற்றி வைப்பீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. அந்த வகையிலே, நூலகத்தை நவீனமயமாக்கு வதுடன் அதன் ஆளணித் தேவைகளையும் நிறைவேற்று வதற்கு நீங்கள் முன்வரவேண்டும்.

எனக்குத் தெரிந்த வரையில், பொதுவாக பல்கலைக் கழகங்களிலே bursar பதவிக்கு நியமனங்கள் வழங்கப்படுவது குறைவாக இருக்கின்றது. சில பல்கலைக்கழகங்களில் அப்பதவிக்கு எவரும் இதுவரை நியமிக்கப்படவில்லை. குறிப்பாக, யாழ். பல்கலைக்கழகத்தில் கடந்த நான்கு - ஐந்து வருடங்களாக பதில் கடமைபுரிபவர்களே இருக்கின்றார்கள். ஆகவே, அங்குள்ள bursar பதவிக்கு உரியவரை விரைவாக நியமனம் செய்யுமாறு நான் இந்தவேளையில் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கிறேன். மேலும், இந்தப் பல்கலைக்கழகத்தின் தேவைகளை நிறைவேற்று வதற்கு அனைத்து நடவடிக்கைகளையும் மேற்கொண்டு, வடக்கு, கிழக்கிலே இருக்கின்ற எங்களுடைய மாணவர்களின் கல்வி வளர்ச்சிக்கு உங்களாலான ஆதரவினைத் தருவீர்கள் என்று எதிர்பார்க்கின்றேன்.

இச்சந்தர்ப்பத்தில் இந்தச் சபையிலே இன்னுமொரு விடயத்தையும் கூறிவைக்க விரும்புகின்றேன். பொதுவாக எங்களுடைய வடக்கு, கிழக்குப் பகுதிகளிலே கடந்த சில காலமாக இந்த நல்லாட்சியைக் குழப்பும் வகையிலே, திட்டமிட்ட பெரும்பான்மையினக் குடியேற்றங்களும் பௌத்த விகாரை தாபிப்புக்களும் நடைபெறுகின்றன. அதில் ஒன்றாக, கிளிநொச்சியிலே இரணைமடுப் பகுதியிலுள்ள கனகாம் பிகைக்குளத்துக்கு அருகாமையில் பிரமாண்டமானதொரு பௌத்த விகாரை தாபிக்கப்படுகின்றது. அதுபோல், மட்டக்களப்பு மாவட்டத்திலுள்ள வாகரைப் பிரதேச செயலாளர் பிரிவிலே காயாங்கேணி என்ற பிரதேசத்தில் முன்பு முகாமிட்டிருந்த இராணுவத்தினரால் புத்தபெருமானின் சிறிய சிலை வைக்கப்பட்டு வழிபடப்பட்டிருக்கின்றது. பின்பு அந்த இடத்துக்கு இரண்டு பௌத்த பிக்குகள் வருகைதந்து, அங்கு விகாரை கட்டவேண்டுமென்று அமர்ந்துவிட்டார்கள். உண்மையிலே அங்கு சிங்கள மக்கள் பெரும்பான்மையாக இருப்பார்களாக இருந்தால், விகாரை அமைப்பதற்கு நாங்களும் உதவி செய்யத் தயாராக இருக்கின்றோம். அவர்களுக்கு வழிபாட்டு உரிமை வழங்கப்படவேண்டும். அதிலே, நாங்கள் கவனமாக இருக்கின்றோம். ஆனால், அந்தப் பகுதியிலே சிங்கள மக்கள் இல்லை. கடந்த காலங்களிலே மீன்பிடிப்பதற்காக ஒருசிலர் வருகைதந்தாலும் அவர்களும் கிறிஸ்தவர்களாக இருக்கின்றார்கள். அதிலிருந்து இரண்டு கிலோமீற்றருக்கு அப்பால், தியாவெட்டுவான் என்ற பகுதியில் பிரமாண்டமான பௌத்த விகாரையொன்று இருக்கின்றது.

[ගරු සිනිතම්බි යෝගේස්වරන් මහතා]

ஆகவே, ஒரு சிலர் இருந்தால்கூட, அந்த விகாரைக்குச் செல்லலாம். ஆனால், அந்த பௌத்த பிக்குகள் இருவரும் அங்கிருந்தார்கள். இக்காணி கடைத்தொகுதி அமைப்பதற்காக வாகரைப் பிரதேச செயலாளர் பிரிவின் பிரதேச செயலகத்துக்கு ஒதுக்கப்பட்டிருந்தது. ஆகையால், அது சார்பாக வாகரைப் பிரதேச செயலாளர் நீதிமன்றிலே வழக்குத் தாக்கல் செய்திருந்தார். எனினும் நடந்தது என்னவென்றால், கிழக்கு மாகாண சபையின் காணி அமைச்சர், காணி அமைச்சின் செயலாளர், கிழக்கு மாகாண சபையின் காணி ஆணையாளர், ஆகிய மூவரும் அங்கு வருகைதந்து நீதிமன்றில் வழக்கு இருக்கும் நிலையில்கூட, பிரதேச செயலாளரைக் கட்டாயப்படுத்தி அந்தக் காணியைப் பௌத்த விகாரை அமைப்பதற்கு வழங்கவேண்டுமென்று வலியுறுத்தியிருக் கின்றார்கள். அத்தோடு, அங்கு 168 குடும்பங்களைச் சேர்ந்த பெரும்பான்மை இன மக்களைத் திட்டமிட்டுக் குடியேற்ற வேண்டுமென்றும் வலியுறுத்தியிருக்கின்றார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த அரசாங்கத்திலே முக்கிய பிரதிநிதியாக இருப்பதனால், அந்தப் பகுதியிலே திட்டமிட்டு மேற்கொள்ளப்படுகின்ற பௌத்த விகாரைத் தாபிப்பு, சிங்கள மக்களின் குடியேற்றம் என்பவற்றைத் தடுத்துநிறுத்துவதற்கு நடவடிக்கை எடுக்கவேண்டும். அங்கு சிங்கள மக்கள் முன்பு வாழ்ந்திருந்தால் கட்டாயம் குடியேற்றவேண்டும்; அதற்கு நாங்கள் துணைசெய்வோம். ஆனால், அவர்கள் வாழாத பகுதியில் குடியேற்றுவதன்மூலம் இனமுறுகல் தோன்றும் வாய்ப்பிருப்பதைக் கவனத்திற் கொண்டு அதனைத் தடுக்க உதவுமாறு கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. A. Aravindh Kumar. You have eight minutes.

[பி.ப. 2.57]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Sir, thank you for giving me this opportunity.

இன்று இச்சபையிலே நடைபெறுகின்ற பல்கலைக் கழகங்கள் தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு, என்னுடைய கருத்துக்களையும் முன்வைக்க வாய்ப்பளித் தமைக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். இன்று எமது நாட்டிலே இலவசக் கல்வி முறையானது, நாட்டிலுள்ள அனைவரும் நன்மையடையக்கூடிய வகையில் அறிமுகப்படுத்தப்பட்டிருக்கின்றது. இதன்மூலம் எமது நாட்டின் கல்வித்தரம் உயர்வடைந்திருக்கின்றது. எமது நாட்டிலே சுமார் 95 வீதமான மக்கள் எழுதப் படிக்கத் தெரிந்தவர்களாக இருப்பதை இன்னுமொரு நல்ல அம்சமாக நான் பார்க்கின்றேன். எமது நாடு சுதந்திரமடைந்த பின் இந்த நாட்டிலே வாழும் மக்களுக்குக் கிடைத்த ஒரு பெரும் வரப்பிரசாதமாக இலவசக் கல்வியை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. முன்பெல்லாம் தனவந்தர்களின், வசதி படைத்தவர்களின் பிள்ளைகள் மாத்திரமே கல்வியைக் கற்கக்கூடிய ஒரு நிலைமை இந்த நாட்டிலே இருந்தது. ஆனால், இலவசக் கல்வி முறையின்கீழ் அந்நிலைமை மாறி, அனைவருக்கும் வாய்ப்புக்கள் கிட்டிய நல்ல நிலைமை ஏற்பட்டது. இருந்தபோதிலும், நான் இந்த இடத்திலே இன்னுமொரு விடயத்தை விசனத்தோடு கூறிக்கொள்ள விரும்புகின்றேன். அதாவது, இவ்வாறான இலவசக் கல்வி முறைமை ஏற்படுத்தப்பட்டு அதனூடாக ஆரம்பம் முதல் பல்கலைக்கழகம் வரை எமது பிள்ளைகளுக்குக் கற்கக்கூடிய வாய்ப்பு இருந்தாலும் மலையகத்தைப் பொறுத்தளவிலே அந்த நிலைமையில் இருக்கின்ற ஒரு பாரிய பின்னடைவை இந்த உயரிய சபையிலே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

ஆங்கிலேயர்களால் தோட்டங்களிலே பாடசாலைகள் ஏற்படுத்தப்பட்டன. அங்கு சிறிய கொட்டில்களிலும் பாழடைந்த கட்டிடங்களிலும் தரம் 5 வரையான கல்வி நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன. ஆனால், 1970களிலே தோட்டப் பாடசாலைகள் தேசியமயமாக்கப்பட்டதன் பின்பு அங்கே ஒரு மாற்றம் ஏற்பட்டது. இருந்தாலும், கடந்த காலங்களில் பல தசாப்தங்களாக மலையகத்திலே கல்வியில் ஏற்பட்டிருந்த பின்னடைவு தேசியமயமாக்கலுக்குப் பிறகாவது துரித வேகத்தில் சீரான நிலைக்கு வரவில்லை. அதாவது மலையகக் கல்வி வளர்ச்சி மிக மந்தமான நிலையிலேயே சென்றுகொண்டிருக்கிறது. அதன் காரணமாக நாங்கள் இன்னும் பல மைல்கற்களைத் தாண்டவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. இந்த நிலைமையை நிவர்த்தி செய்வதற்காக இன்று கல்வி அமைச்சும் உயர் கல்வி அமைச்சும் தகுந்த நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றன என்பதை நான் இந்தச் சபையிலே கூறினாலும்கூட, இன்னும் எமக்கான தேவைகள் மிக அதிகமாக இருக்கின்றன.

எமது மக்களின் விகிதாசாரத்துக்கு ஏற்ப ஒரு வருடத்துக்குச் சுமார் 1,500 மாணவர்களாவது பல்கலைக்கழக அனுமதியைப் பெற வேண்டும். ஆனால், துரதிருஷ்டவசமாக ஒரு வருடத்துக்கு 200 க்கும் குறைவான மலையக மாணவர்களே பலகலைக்கழக அனுமதியைப் பெறுகின்றார்கள். ஆகவே, இதனை ஒரு சாதகமான நிலைமையாக நான் பார்க்கவில்லை. எனினும், எதிர்காலத்தில் இந்த நிலைமையில் முன்னேற்றம் ஏற்படும் என்று நான் நம்புகின்றேன். ஏனெனில் இப்பொழுது இந்த நாட்டிலே நல்லாட்சி ஏற்படுத்தப்பட்டிருக்கின்றது; மலையகக் கல்வி வளர்ச்சிக்காக எமது மாண்புமிகு பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்கள் பல்வேறு முன்னெடுப்புக்களையும் பல்வேறு யோசனைகளையும் முன்வைத்திருக்கின்றார். அதேநேரத்தில் கல்வி அமைச்சராக கௌரவ அக்கில விராஜ் காரியவசமும் கல்வி இராஜாங்க அமைச்சராக கௌரவ இராதாகிருஷ்ணனும் இருந்து செயற்படுகின்றார்கள். உயர் கல்வி அமைச்சராக கௌரவ லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள் செயற்படுகின்றார். அவர் ஒரு சிறந்த அனுபவசாலி; அனைவரையும் அரவணைத்துப்போகும் தன்மையைக் கொண்டவர். இன்று அவரின் தலைமையிலே பலகலைக்கழகங்கள் இயங்கிக்கொண்டு வருகின்றன.

மலையகத்தைப் பொறுத்தளவிலே ஒரு பல்கலைக்கழகம் தேவை என்பது ஒரு நீண்டகாலக் கனவாக இருக்கின்றது. ஆனால், மலையகத்துக்கு ஒரு பல்கலைக்கழகம் தேவை என்ற விடயம் பல வருடங்களாக முன்வைக்கப்பட்டிருந்தாலும் அது சம்பந்தமாக ஆக்கபூர்வமான நடவடிக்கைகள் மேற்கொள்ளப் படாத காரணத்தினால் அந்த விடயம் தள்ளிப்போய்க் கொண்டே இருக்கின்றது. இன்று மலையகத்துக்கென ஒரு பல்கலைக்கழகம் என்பது காலத்தின் ஒரு தேவையாக மாறிப்போயிருக்கின்றது. ஆகவே, நாம் அனைவரும் ஒன்றாக இணைந்து ஏற்படுத்திய இந்த நல்லாட்சியின்கீழ் மலையகத்திற்கென ஒரு தனியான பல்கலைக்கழகத்தை எவ்வளவு விரைவாக ஏற்படுத்தி நடைமுறைப்படுத்த முடியுமோ, அவ்வளவு விரைவாக அதனைச் செய்ய வேண்டும்

என்று நான் இந்த உயரிய சபையிலே விநயமாகக் கேட்டுக்கொள்கின்றேன். மலையகத்தின் கல்வி வளர்ச்சிக்கென நாங்கள் கரிசனையோடு செயற்படு வோமேயானால் மலையகத்திலே இருந்தும்கூட ஆயிரக்கணக்கான பட்டதாரிகளை உருவாக்கக்கூடிய நல்ல நிலைமை ஏற்படும். ஆகவே, அதனை இந்த நல்லாட்சி அரசாங்கம் தாமதமில்லாமல் மேற்கொள்ள வேண்டும் என்பதை இந்த உயரிய சபையிலே வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

அதேநேரத்தில் இன்று நடைபெறும் இந்த விவாதத்திற்குப் பொருத்தமற்றதாக இருந்தாலும் ஒரு விடயத்தை இங்கு குறிப்பிட வேண்டும். அதாவது, அண்மையிலே புசல்லாவையில் நடந்த ஒரு துன்பகரமான சம்பவம் பற்றி நான் இந்தச் சபையிலே முன்வைக்க விரும்புகின்றேன். சில தினங்களுக்கு முன்பு புசல்லாவைப் பகுதியிலுள்ள தோட்ட இளைஞர் ஒருவர் புசல்லாவைப் பொலிஸாரினால் கைதுசெய்யப்பட்டு காவல் நிலையத்துக்கு கொண்டு செல்லப்பட்டிருந்தார். அவ்வாறு கைதுசெய்யப்பட்ட அவர், பின்னர் அந்தக் காவல் நிலையத்திலேயே மரணமடைந்தார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

இந்த மரணத்திற்குக் கூறப்பட்ட காரணம், அவர் காவல் நிலையத்திலே தற்கொலை செய்துகொண்டார் என்பதுதான். சிறு பிள்ளைகூட இதை நம்புவதற்குத் தயாராக இல்லை. ஏனெனில், காவல் நிலையத்திலே தற்கொலை செய்துகொள்ள முடியாது. விளக்கமறியலில் இருப்பவர்கள் தூக்கிட்டுத் தற்கொலை செய்துகொள்வதற்கான கொக்கிகள் காவல் நிலையச் சிறைக்கூண்டுகளுக்குள்ளே பொருத்தப் பட்டிருப்பதில்லை. அங்கே தற்கொலை செய்வதற்கான வசதிகள் கிடையாது. தற்கொலை செய்வதற்கான சூழலைக் காவல் நிலையத்தில் உள்ளவர்கள் ஏற்படுத்துவதில்லை. எனவே, இவ்வாறான நிலையில் "புசல்லாவை காவல் நிலையத்திலே மலையக இளைஞன் ஒருவன் தற்கொலை செய்து மரணமடைந்தான்" என்று கூறுவது, உண்மையிலேயே கேலிக்கூத்தான ஒரு கூற்றாக இருக்கின்றது. ஓர் அப்பாவி இளைஞனின் உயிர் அங்கே பறிக்கப்பட்டிருக்கின்றது. இந்தச் சம்பவத்துடன் சம்பந்தப்பட்டவர்களை இடமாற்றம் செய்வதனூடாக மட்டும் இதற்கு நாங்கள் பரிகாரம் தேட முடியாது. குற்றமிழைத்தவர்கள் சரியாக அடையாளங் காணப்பட்டு அவர்களுக்குத் தண்டனை வழங்கப் படவேண்டும். இன்று இந்த நாட்டிலே கொலைகாரனுக்கு மரண தண்டனைதான் உச்ச தண்டனை. ஆகவே, இவ்வாறு தற்கொலையென்று கூறுவதை நானும்கூட நம்புவதற்குத் தயாராக இல்லை. தற்கொலையென்ற போர்வையிலே அங்கே ஒரு இளைஞன் கொல்லப்பட்டிருப்பதாகவே இறந்தவரின் உறவினர்கள் உட்பட அனைவரும் சொல்கின்றார்கள். அங்கேயுள்ள பொதுமக்கள் பொலிசாருக்கெதிராக ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருந்தார்கள். ஆகவே, இதன் உண்மைத்தன்மை வெளிப்படுத்தப்பட வேண்டும்;

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

Please give me one more minute, Sir.

நீதி நிலைநாட்டப்படவேண்டும். தப்புச் செய்தவர்கள் தண்டனைக்குள்ளாக்கப்பட வேண்டும் என்பதே நியதி. எனவே, அரசாங்கம் எவ்வித பாரபட்சமுமின்றி இவ்விடயத்தில் தகுந்த நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொண்டு, சந்தர்ப்பமளித்த அவைத்தலைவருக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[பி.ப. 3.06]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. இன்று கௌரவ அமைச்சர் அவர்களால் கொண்டுவரப்பட்ட பல்கலைக்கழகங்களின் ஊழியர்களின் ஓய்வூதிய வயதெல்லையை அதிகரிப்பது தொடர்பான இந்தத் திருத்தச் சட்டமூலத்தை ஆதரித்தவனாக இந்த விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகிறேன். இன்றுள்ள அமைச்சர்களில் மிகவும் மதிக்கத்தக்க மனிதர்களில் ஒருவராக எங்களுடைய உயர் கல்வி அமைச்சர் அவர்களை நான் பார்க்கின்றேன். நான் பாராளுமன்றத்திற்கு வந்த ஆரம்ப காலங்களில் அவர் தமிழ் மக்களுக்கு உண்மையாகப் பிரச்சினை இருக்கின்றதென்ற ஒரு விடயத்தை இந்த அவையிலே சொல்லியிருந்தார். அதனை நான் வரவேற்கின்றேன்.

அதேநேரத்தில், இன்று கௌரவ அமைச்சர் சுவாமிநாதன் அவர்கள் புனர்வாழ்வளிக்கப்படவுள்ள தமிழ் அரசியல் கைதிகள் தொடர்பாக 23 பேரின் பெயர் விபரங்களை என்னிடம் தந்துள்ளார். இதற்கான முயற்சியை எடுத்து அந்த 23 பேரும் 6 மாதங்கள் புனர்வாழ்வுக்குச் செல்வதற்கு நடவடிக்கை எடுத்தமைக்காக முதலில் நான் இந்த அரசாங்கத்திற்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அதேநேரத்தில் அதிலுள்ள ஒரு சில குறைபாடுகளையும் நான் தெரிவிக்கவேண்டும். கௌரவ அமைச்சர் சுவாமிநாதன் அவர்கள் இதனைத் தெளிவுபடுத்தினால் நன்றாக இருக்குமென நினைக்கின்றேன். அதாவது, என்னிடம் தரப்பட்டுள்ள பெயர் விபரங்களில் உள்ள 2 - 3 பேருக்கு ஒரு வழக்கில் புனர்வாழ்வளிக்கப்பட்டுள்ளது. ஆனால், அவர்களுக்கு இன்னும் 2 - 3 வழக்குகள் இருக்கின்றன. ஆகவே, இந்தப் பட்டியலில் பெயரிடப்பட்டவர்களில் வேறு வழக்குகள் உள்ளவர்களுக்கு அந்த வழக்குகளையும் உள்ளடக்கிப் புனர்வாழ்வை அளிக்க வேண்டுமென்று தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாக அரசாங்கத்தைக் கேட்டுக்கொள்கின்றேன்.

பல்கலைக்கழகம் என்பது பல்கலைகளையும் கற்பிக்கின்ற ஒரு கல்விக் கழகமாகும். ஒரு நாட்டின் கல்வி வளர்ச்சிக்கும் பொருளாதார வளர்ச்சிக்கும் மிகமிக முக்கியமான நிறுவனமாக அது இயங்கிவருகின்றது. அந்தவகையில், யாழ்ப்பாணப் பல்கலைக்கழகம் இந்த நாட்டிலுள்ள இளைஞர் யுவதிகளை நல்ல மனிதர்களாக உருவாக்குவதற்குத் தொடர்ந்தும் அதனுடைய சேவையை வழங்கிக்கொண்டிருக்கின்றது. அங்கு கௌரவ அமைச்சர் அவர்கள் பல தடவைகள் விஜயம் செய்திருக்கின்றார். அதற்காகவும் எனது நன்றியைத் தெரிவித்துக்கொண்டு, அவரிடம் ஒரு பணிவான வேண்டு

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

கோளை விடுக்கின்றேன். வட மாகாணத்தில் 5 மாவட்டங்கள் இருக்கின்றன. அவற்றுள் யாழ்ப்பாண மாவட்டத்தில் பல்கலைக்கழகம் இருக்கின்றது. வவுனியா மாவட்டத்திலும் கிளிநொச்சி மாவட்டத்திலும் அதனுடைய வளாகங்கள் ஆரம்பிக்கப்பட்டுள்ளன. முல்லைத்தீவிலும் அவ்வாறு ஆரம்பிக்கப்படுவதற்குரிய நடவடிக்கைகள் அண்மையில் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. ஆனால், மன்னார் மாவட்டத்தில் அந்தப் பல்கலைக்கழகத்தின் ஒரு வளாகமேனும் இன்னும் ஆரம்பிக்கப்படவில்லை. National College of Education போன்ற உயர் கல்விக் கலாசாலைகள் எதுவுமே அங்கு இல்லை. அவற்றை ஆரம்பிப்பதற்கான எந்தவிதமான நடவடிக்கையும் இதுவரை எடுத்ததாகவும் தெரியவில்லை. நான் மன்னார் மாவட்டத்தைப் பிரதிநிதித்து வப்படுத்துகின்ற வன்னி தேர்தல் மாவட்ட பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் யாழ். பல்கலைக்கழகத்திற்கு கடிதமொன்றை அனுப்பியிருக் கின்றேன். எனவே, எதிர்வரும் காலங்களில் மன்னாரில் யாழ். பல்கலைக்கழகத்தின் ஏதாவதொரு வளாகத்தையோ அல்லது உயர்கல்வி வழங்குகின்ற ஒரு நிறுவனத்தையோ நிறுவுவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அதுசம்பந்தமாக இன்று உறுதிமொழி தந்தால் மன்னார் மாவட்ட மக்கள் மிகவும் சந்தோஷப்படுவார்கள் என்பதையும் இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். මන්නාරමේ විතරයි තවම නැත්තේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

If you can tell us what faculty you need, whether it is fisheries or management, I do not know what is required there, we can consider that.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

Okay, thank you. கௌரவ அமைச்சர் அவர்களே! நன்றி.

இச்சந்தர்ப்பத்தில், பத்திரிகையில் வெளியான ஒரு செய்தியையும் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதாவது, "யாழ். பல்கலைக்கழகத்தில் முகாமைத்துவப் பிரிவில் கல்வி கற்கும் கிளிநொச்சி, திருநகரைச் சேர்ந்த விஜயகுமார் வசந்தகுமார் என்ற மாணவன் அங்கு நடைபெற்ற ragging காரணமாக, அதற்குப் பயந்து பல்கலைக்கழகம் செல்லாமல் கிளிநொச்சியில் தேங்காய் வியாபாரம் செய்துகொண்டிருக்கின்றார்" என்று பத்திரிகையில் ஒரு செய்தி வந்திருந்தது. அந்த விடயம் தொடர்பாக அவருடைய உறவினர்களிடம் கேட்டபோது, அவர் பல்கலைக்கழகம் செல்வதற்குப் பயப்படுவதாக அவர்கள் தெரிவித்தார்கள். இது உண்மையில் மனவேதனையான ஒரு விடயம். ஏனென்றால், பல்கலைக்கழகத்திற்கு அனுமதி கிடைப்பதை மிகப்பெரிய பாக்கியமாகவே பெற்றோர் கருதுவர்; அக்கிராமத்து மக்களும் அது தொடர்பாகச் சந்தோஷப்படுவார்கள். இந்நிலையில், அந்த மாணவன் இரண்டு மாதங்களே பல்கலைக்கழகத்துக்குச் சென்றுவிட்டு மீண்டும் வந்து தேங்காய் வியாபாரத்தில் ஈடுபடுகின்ற ஒரு துன்பகரமான செய்தி உண்மையிலே மனவேதனையளிக்கின்றது. புதிதாகச் செல்கின்ற மாணவர்களை நோகடிக்கும் விதத்தில் ragging செய்வதென்பது அவர்களின் எதிர்காலத்தையும் பெற்றோருடைய கனவையும் வீணாக்குகின்ற ஒரு நடவடிக்கையாக அமைகின்றது. எனவே, இந்த ragging சம்பந்தமாக, கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, குறிப்பாக யாழ். பல்கலைக்கழகத்தில் அதனை முற்றுமுழுதாக நிறுத்த முடியாவிட்டாலும் எவ்வளவுக்கு குறைக்க முடியுமோ அவ்வளவுக்குக் குறைப்பதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்கிறேன்.

பல்கலைக்கழகத்தில் படிப்பை முடித்த பின்பு பட்டங்களைப் பெற்ற பலபேர் அரச நியமனங்கள் கிடைக்காமல் 2 - 3 வருடங்களிலோ அல்லது ஏதோவொரு காலத்தில் தங்களுக்கு வேலை கிடைக்கும் என்ற நம்பிக்கையில் வியாபாரம் போன்ற தொழில்களைச் செய்கிறார்கள். அது வேறு விடயம். ஆனால், பல்கலைக் கழகத்துக்குத் தெரிவாகி கல்வி கற்பதற்குச் சென்ற இந்த விஜயகுமார் வசந்தகுமார் என்ற மாணவன் ragging ஆல் தனது கல்வியைத் தொடரமுடியாத நிலையில் இருப்பது உண்மையில் வேதனைக்குரிய விடயமாகும். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இதனைக் கவனத்திலெடுத்து அந்த மாணவன் மீண்டும் பல்கலைக்கழகத்தில் அவரது உயர் கல்வியைத் தொடர்வதற்கு நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

யாழ். பல்கலைக்கழகத்தில் National Water Supply and Drainage Boardஇன் கீழ் ஒரு வேலைத்திட்டம் நடைபெறுகின்றது. அந்த வேலைத்திட்டத்திற்கு - Navy - கடற்படையினர்தான் ஒப்பந்தக்காரர்களாக நியமிக்கப் பட்டிருக்கின்றார்கள். உண்மையில், இலங்கைக் கடற்படையும் இராணுவமும் எங்களுடைய தேசிய பாதுகாப்பில் கவனம் செலுத்துவதுதான் முறையாகும். அதைவிடுத்து பல்கலைக் கழகத்தில் தற்பொழுது நடைபெறுகின்ற நீர்த்தாங்கி நிர்மாண வேலைக்கான contract இனை Navy எடுத்திருக்கின்றது. அதை எடுத்தது எடுத்ததாகவே இருக்கட்டும்! இனிவரும் காலங்களில் பல்கலைக்கழக வளாகத்தில் பொதுவான வேலைகள் - கட்டிட ஒப்பந்த வேலையாக இருந்தாலும் சரி, அல்லது வேறெந்த வேலையாக இருந்தாலும் சரி - உங்களுடைய அமைச்சின் மேற்பார்வையின்கீழ் நடைபெற வேண்டும். அத்தோடு, சிவில் சமூகத்தை, பொது அமைப்புக்களைச் சார்ந்தவர்களைக்கொண்டு மற்றும் முற்போக்குவாதிகளை, சிந்தனையாளர்களை, கல்விமான் களைக் கொண்டு தீர்மானிக்கப்படுகின்ற விடயமாக அது இருக்க வேண்டும். தொடர்ந்தும் அப்படி நடைபெறக் கூடாதென்பதற்காகத்தான் இதைச் சொல்கின்றேன். அந்த contract இனை அவர்கள் எடுத்ததைப் பற்றி நான் ஒன்றும் குறையாகச் சொல்லவில்லை; கௌரவ அமைச்சர் அவர்களே, இனிவரும் காலங்களில் இப்படியான நிகழ்வுகளை ஏற்படுத்தாமல் இருந்தால் அது எங்களுடைய மக்கள் மத்தியில் நம்பிக்கையைத் தோற்றுவிப்பதாக அமையும். ஏனென்றால், எங்களுடைய மக்களும் நாங்களும் மனவிரக்திக்கு உள்ளாகின்ற சூழ்நிலையை சிற்சில சம்பவங்கள்தான் உருவாக்குகின்றன. அப்படியான சம்பவங்களைத் தவிர்த்துக் கொண்டால் மக்கள் மத்தியில் நல்லெண்ணம் அல்லது நல்ல சிந்தனை உருவாகக்கூடிய வாய்ப்புக்கள் இருக்கின்றன. அது முற்போக்குச் சிந்தனையாகவும் அமையும்.

மேலும், மன்னார் மாவட்டத்திற்கு என்ன கற்கைத்துறை வேண்டுமென்பதைத் தீர்மானித்துச் சொன்னால் அதற்குத் தன்னாலான முயற்சியை எடுப்பதாகக் கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதற்கு அவருக்கு மீண்டும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். யாழ்ப்பாணப் பல்கலைக்கழக விரிவுரையாளர்களுடன் கலந்தாலோசித்து அதை உங்களுக்கு

மிக விரைவில் தெரியப்படுத்துவேனென்று சொல்லிக் கொண்டு, கௌரவ அமைச்சர் அவர்களால் சமர்ப்பிக்கப் பட்டிருக்கின்ற இந்த திருத்தச் சட்டமூலத்திற்கு ஆதரவு தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, the Hon. Member referred to contracts being handled by the Navy. The problem is, there are no contractors in Jaffna. Because of the war, the entire network has collapsed. Therefore, there are no contractors and workers.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
That is true.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We are trying to build them up. In the future, we will give the contracts to those contractors.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, අපේ පැත්තේ කට්ටිය ඉන්නවා. එහෙම නැත්නම් කොළඹ පැත්තේ අය දැම්මත් කමක් නැහැ. Army, Navy එකේ අය නැතිව දැම්මා නම් හොඳයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We will look into that.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 3.17]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් මේ අවස්ථාවේදී සතුටු වෙනවා, අපේ පුරාණ කල්‍යාන මිත්‍ර ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අවස්ථාවේදී යම්කිසි වෙනස් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න ලැබීම ගැන. උගත් නීතිඥයකු වන එතුමා කන්ද උඩරට - මහනුවර - ප්‍රදේශය නියෝජනය කරමින් 1989දී අපිත් සමඟ පාර්ලිමේන්තුවට පැමිණිලා දීර්ඝ කාලයක් විපක්ෂයේ කාර්ය භාරය කළා. ඊට පසුව එක්සත් ජාතික පක්ෂයට ගිහිල්ලා, අපි එම පක්ෂයෙන් ආපසු එනකොට එතුමා එන්නේ නැතිව එහිම රැඳී ඉඳලා, අද උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිවරයා වශයෙන් කටයුතු කරනවා. මේ අවස්ථාවේ දී මා ප්‍රථමයෙන්ම එතුමාට මගේ ස්තුතිය පළකර සිටිනවා. මොකද, අපේ විද්‍යෝදයට ඉංජිනේරු පීඨයක් තිබුණේ නැහැ. ඒ නිසා හිටපු උසස් අධ්‍යාපන ඇමති එස්.බී. දිසානායක මැතිතුමා සහ මමත්, උපකුලපතිතුමාත් ගිහිල්ලා ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මුණ ගැසුණු අවස්ථාවේදී එතුමා එයට එකඟ වුණා. විද්‍යෝදයට ඉංජිනේරු පීඨයක් ලබා දීමේ ගෞරවය එතුමාට හිමි වෙනවා. [බාධා කිරීමක්] විද්‍යෝදය තමයි දැන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. ලංකාවේ අධ්‍යාපනයේ පියා බිහි කළේ විද්‍යෝදයෙන්.

1815 කන්ද උඩරට ගිවිසුමෙන් අපේ රට බ්‍රිතාන්‍යයන්ට යටත් වුණාට පසුව 1848 කැරැල්ලෙන් පසුව සුද්දන්ට විරුද්ධව කැරලි ගැහුවේ නැහැ. එතකොට මේ උපන් බිමේ මිනිස්සුන්ට අධ්‍යාපනය අතින් ඓතිහාසික අසාධාරණයක් සිද්ධ වුණා. බ්‍රිතාන්‍යයන් විසින් අපට හඳුන්වා දුන්නේ මිනිසුන් හදන අධ්‍යාපන ක්‍රමයක් නොවෙයි. ඔවුන් අපට හඳුන්වා දුන්නේ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක්. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් නොවෙයි. විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ බටහිර අනුකරණවාදී මානසිකත්වයෙන් යුත් ඇඟ ඇතුළෙන් බටහිරට ගැතිවෙන අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දෙනකොට අපේ සම්ප්‍රදායික මහා දැනුම් සම්භාරය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගියා. මොකද, මහින්දාගමනයෙන් පසු මහාවිහාරයෙන්, අභයගිරියෙන් ඇති වෙච්ච අධ්‍යාපනය තමයි ලෝකයේ විස්මිත දේවල් කළේ. අර ලෝක පුදුමයක් ලෙස සැලකෙන සීගිරිය ගත්තත්, හැතැප්මට අඟලක් දිය බෑස්මට නිර්මාණය කළ යෝධ ඇළ ගත්තත්, රුවන්වැලි මහාසෑය වැනි සෑයවල් ගත්තත්, මහාසමුද්‍ර පරයන මහා වැව් තටාක ගත්තත්, වාරි සංස්කෘතිය ගත්තත්, යකඩ සොයා ගැනීම ගත්තත්, විද්‍යාව තාක්ෂණය අතින් අපට මහා සම්ප්‍රදායික ආසියාතික දැනුම් සම්භාරයක් තිබුණා. ඒ සියල්ල බ්‍රිතාන්‍යයන් විනාශ කළා.

අපේ රටේ ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කරන මිනිසුන් බිහි කරන්නේ දකුණෙන් නේ. ඒ අනුව, හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවෝ විද්‍යෝදයට පැමිණියා. ඒ ජාතික විමුක්ති අරගළය පටන් ගන්නකොට කොටහේන දීපදුත්තාරාමයේ හිටපු මිගෙට්ටුවත්තේ ගුණානන්ද නායක හාමුදුරුවන්ට පානදුරා වාදයට උදවු කළා වාගේම, හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ලංකාවට පැමිණි අවස්ථාවේදී භාෂාව පරිවර්තනය කිරීම සඳහා කටයුතු කළ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා "බෞද්ධ අධ්‍යාපන අරමුදල" නමින් ලංකාවේ පළමු අධ්‍යාපන අරමුදල ඇති කළා. ඒ අරමුදලේ කළමනාකරු ලෙස කටයුතු කළේ අනගාරික ධර්මපාලතුමායි. ඒ අරමුදලට අනුව වඩා කාර්යක්ෂම ලෙස මුදල් එකතු කර හදපු පාසල් තමයි කොළඹ ආනන්ද විද්‍යාලය, ගාල්ලේ මහින්ද විද්‍යාලය, මහනුවර ධර්ම රාජ විද්‍යාලය යන පාසල්. මහනුවර ධර්මරාජ විද්‍යාලය අක්කර 58කින් යුක්ත වන බව තමුන්නාන්සේත් දන්නවා ඇති. එම අරමුදලින් පාසල් පද්ධතිය හැදීම ආරම්භ කරමින් අනගාරික ධර්මපාලතුමා පාසල් 122ක් හැදුවා. ලංකාවේ අධ්‍යාපනය පිළිබඳව තුන්කල් දැක්මක් තිබුණු ජාතික නායකයා එතුමායි.

ලංකාවේ අධ්‍යාපනය පිළිබඳව අදටත් වලංගු වන අදහස් කිහිපයක් ඇතුළත් එතුමාගේ සටහනක් කියවන්න මම කැමැතියි. එතුමා කියා තිබෙනවා, "අපේ ජාතිය ගලවා ගැනීමේ ඒකායන මාර්ගය අධ්‍යාපනයයි. ලංකාවේ ඇත්තේ අවජාතක අධ්‍යාපන ක්‍රමයකි. සිංහල තරුණයන්ට ශිෂ්‍යත්ව ලබා දී ඇමෙරිකාව, ජපානය, ජර්මනිය, ඉන්දියාව, හොංකොං, ප්‍රංශය, එංගලන්තය

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

වැනි රටවලට යවා, තාක්ෂණය, විද්‍යාත්මක කෘෂිකර්මය, වාරි කර්මාන්තය ආදී නව විෂයයන් ගැන දැනුමක් ලබා ගත්තාට පසුව ඔවුන් ආපසු ලංකාවට ගෙන්වා, ජාතිය ගොඩ නැඟීමේ කාර්යය ආරම්භ කළ යුතුය. දියුණු වීමට නම්, ස්වයංපෝෂිත වීමට නම් විදේශීය භාණ්ඩ පරිහරණයෙන්, පරිභෝජනයෙන් වැළකී සිටිය යුතුය. රට තුළ නිෂ්පාදනය කළ හැකි සෑම භාණ්ඩයක්ම නිපදවිය යුතුය, පරිහරණය කළ යුතුය. විදේශ භාෂා ඥානය ලබා ගැනීම ජාතික අවශ්‍යතාවක් වන බැවින් එම භාෂා පිළිබඳ දැනුමක් ලබා ගැනීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතුය" කියලා. පාසල් හදන අතරම අපේ රටේ නිපුණතා අධ්‍යාපනයක් ඇති කරන්න ඕනෑය කියලා එතුමා විසින් පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

එතුමා ළඟ සිටි දොළපිහිල්ල කියලා මහත්මයෙකුව ජපානයට යවලා, ජපානයෙන් අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය පුහුණු කරවා ලංකාවට ගෙන්වා ගත්තා. පසුව රාජගිරියේ ඔබේසේකර වලව්ව පිහිටි ස්ථානයේ පෞද්ගලික ඉඩමක තමයි ලංකාවේ පළමුවන අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු පාසල ඇති කළේ. ලංකාවේ තිබෙන විශාලම මිශ්‍ර පාසලක් වන පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ මුළු දේපොළම එතුමාගේ පෞද්ගලික දේපොළ. ඒ නිසා එතුමා තමයි ජාතික අධ්‍යාපනයේ පියා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය ඇති කළා. නමුත් ඒ සඳහා අවශ්‍ය දර්ශනය මුළුමනින්ම සැපයුවේ අනගාරික ධර්මපාලතුමා. අනගාරික ධර්මපාලතුමාගේ අවමංගල්‍ය උත්සවයෙන් පසුව ලංකාවට ගෙනාපු භස්මාවශේෂ මිහිදන් කිරීමේ උත්සවයේදී ස්තුති කථාව කළේ, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර මැතිතුමා. ඒ නිසා ලංකාවේ ජාතික අධ්‍යාපනයේ පියා වන්නේ අනගාරික ධර්මපාලතුමා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර මැතිතුමා මධ්‍ය විද්‍යාල 54ක් හැදුවා. වඩු වැඩ, ලෝහ වැඩ, මැටි වැඩ, මෝටර් රථ කාර්මික ශිල්පය, ක්‍රීඩා, සෞන්දර්යය ආදී සියල්ලටම අවශ්‍ය දේවල් ඇතුළත්ව තමයි එතුමා මධ්‍ය විද්‍යාල 54ක් බිහි කළේ. එදායින් පස්සේ අපට ඒ තත්ත්වය ආපසු හරවන්න බැරි වුණා. විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් විභාගය සමත්, ජීවිතය අසමත් දරුවෝ බිහි වන නිසා, අපොස සාමාන්‍ය පෙළ, උසස් පෙළ සහතිකය අර ගෙන පාසලෙන් පිට වන දහතුන්ලක්ෂයකට වැඩි පිරිසකට ජීවනෝපායක් සකසා ගන්න බැරි නිසා තමයි මම ඒ තත්ත්වය ආපසු හැරවීම සඳහා ධර්මපාල ආදර්ශය අනුව කටයුතු කළේ. මේ නරා වළෙන් ගොඩ එන්න ඕනෑ නම් වෙන රටකට යන්න ඕනෑය කියලා හිතලා සමහර අය වෙනත් රටවලට ගිහිල්ලා අන්ත දුක් විඳින්නේ, අපි නිපුණතා අධ්‍යාපනයක් හදපු නැති නිසයි; ධර්මපාලතුමා කියපු ආකාරයට මේ රටේ අධ්‍යාපනය වෙනස් කළේ නැති නිසයි.

අපි බ්‍රිතාන්‍යයේ තිබෙන London Ordinary Level විභාගයට සමානව GCE Ordinary Level විභාගය ඇති කළා. London Advanced Level විභාගයට සමානව GCE Advanced Level විභාගය ඇති කළා. නමුත් ඒවාත් ඒ රටවල පවතින තත්ත්වයට නොවෙයි ඇති කළේ. මේ තත්ත්වය තුළ අපි 1971 කැරැල්ලට මුහුණ දුන්නා. 1980 ගණන්වල මහා භීෂණයකට මුහුණ දුන්නා. අසහනයට පත් වුණු තරුණ පරම්පරාව අප සියලු දෙනාට වෛර කරමින් ආයුධ අතට අරගෙන, නිරායුධ අවිහිංසක මිනිසුන් දහස් ගණනක් බල්ලෝ-බළල්ලු වාගේ මැරුවා. ගෝලයා තමන්ට උගන්වපු ගුරුවරයාගේ ගෙදරට ගිහිල්ලා, විදුහල්පතිගේ ගෙදරට ගිහිල්ලා "දණ ගහපං" කියා කිව්වා. විදුහල්පති දණ ගැහුවාට පස්සේ ගෙනියලා පාරේ ගහක ගැට ගහලා මැරුවා. මැරුවාට පස්සේ දණිසෙන් ඉහළට ඔසවන්නේ නැතිව පාරේ ගෙනියලා වළලන්න කියලා කිව්වා. ඒක තමයි අපේ රටේ ඇත්ත කතන්දරය. පාසලෙන් එළියට දමන අය බද්ද වෛරයෙන් පෙළෙන පිරිසක් බවට මේ සමාජය විසින් පරිවර්තනය කළා. එය වෙනස් කිරීම සඳහා අඩුම තරමේ අපොස උසස් පෙළ පන්තියේදීවත් -තරුණ වයසේදීවත්- දරුවන්ට නිපුණතාව ලබා දෙන්න ඕනෑය කියලා අපි කල්පනා කළා. අපේ ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත්, මමත් එකතු වෙලා ඒ කටයුත්ත කළා. තමුන්නාන්සේගේ රාජ්‍ය ඇමතිතුමා වන මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමාත් එයට සහාය වුණා. අපි ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, තාක්ෂණය සඳහා විද්‍යාව යන තාක්ෂණික විෂය ධාරාවන් හඳුන්වා දුන්නා. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා වාගේ ඉගෙන ගත්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාම මේ වෙනසට කැමැති වුණා. නමුත් අවාසනාවකට ජනතා විමුක්ති පෙරමුණත්, හිතනවාට වඩා පළල්ව දකින්න බැරි මිනිස්සුත් ඒක කඩාකප්පල් කරන්න පුළුවන් හැම දෙයක්ම කළා. කෙසේ නමුත්, අද වෙන කොට උසස් පෙළ විෂය ධාරාවලින් ඉතාම වැඩි ඉල්ලුමක් තිබෙන්නේ කෙටි කාලයක් තුළදී ඇති වුණු තාක්ෂණ විෂය ධාරාවටයි. මොකද, වෙළෙඳ පොළ පිළිබඳව දරුවන්ට ඉවක් තිබෙනවා.

ඒ දරුවෝ දන්නවා, ජර්මන් ටෙක් එකට ගිය අයගේ ජීවිතය කොහොමද තීන්දු වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා වනපොත් අධ්‍යාපනය ක්‍රමය හා කට පාඩම් අධ්‍යාපන ක්‍රමය වෙනුවට ප්‍රායෝගිකව නිපුණතාවක් දෙන අධ්‍යාපනයක් ඇති කිරීම තමයි උසස් අධ්‍යාපනයේ පරමාර්ථය විය යුත්තේ. අපි බලාපොරොත්තු වුණේ, තාක්ෂණ විෂය ධාරාවෙන් සිසුන් 3,000ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නයි. නමුත් තමුන්නාන්සේ අඩු තරමින් 2,000කට ආසන්න පිරිසක් ඇතුළු කර ගත්තා. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේ ඉතිහාසයට එකතු වෙනවා. මොකද, තිබුණු දේම නැතුව වෙනස් දෙයක් තමුන්නාන්සේගේ කාලයේ ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. තාක්ෂණවේදය ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට අරගෙන ආපු -ආරම්භ කරපු- ඇමතිවරයා ලෙස තමුන්නාන්සේ ඉතිහාසයේ සටහනක් තබනවා. හැබැයි, ඒ සටහනේ යට කොටසේ ඉන්නේ, මමයි. එම විෂය ධාරාව හදපු මම, ඩලස් අලහප්පෙරුම හිටපු ඇමතිතුමා, ඒකට අනුමැතිය දුන්නු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, අපි සියලු දෙනා ගැනත් සටහන් වෙන්න ඕනෑ, ඒ පොත ලියනකොට; චූල වංශය ලියන කොට.

එය එසේ වන්නේ වී නමුත් අද තාක්ෂණයට අවශ්‍ය ලොකුම ප්‍රශ්නය අපට තාක්ෂණය පුහුණු කරන්න අවශ්‍ය තාක්ෂණික දැනුම තිබෙන විශ්වවිද්‍යාල ආචාර්යවර, මහාචාර්යවරු, කථිකාචාර්යවරු, ගුරුවරු නැතිකමයි. මම කොරියාවට ගිහිල්ලා "KOICA" ආයතනයේ සභාපතිවරයා මුණ ගැහිලා, වෙනම සාකච්ඡා වට ගණනාවක් පවත්වලා, එතුමාට ලංකාවට එන්න කියලා ආරාධනා කළා. ඔවුන් පැමිණි අවස්ථාවේදී අපි "KOICA" එකට කිව්වා, "කාර්මික අතින් සංවර්ධනය වෙලා ඉන්න තමුන්නාන්සේලා මේ රටේ මනුෂ්‍ය සම්පත ගොඩනඟන්න තාක්ෂණික ඥානය දුන්නොත්, ඒ සඳහා උදවු කළොත් කොරියාව සදාකාලිකව ලංකාවේ මිනිස්සුන්ගේ හිත ඇතුළේ අනිවාර්යයෙන් නොමැකෙන සටහනක් විධියට සටහන් වේවි" කියලා. KOICA සභාපතිතුමා ඒ වාර්තාව සපයා Samsung, GM, Kia Motors වාගේ ආයතනවල ආධාරත් ඇතිව වර්ෂයකට ලංකාවේ ගුරුවරු 400ක් පුහුණු කළ හැකි තාක්ෂණ විද්‍යාපීඨයක් හදලා දුන්නා. ඒ සඳහා අනුමත මුදල සියයට සියයක් ණයක් නොවන ප්‍රදානයක් - grant එකක් - විධියට ඩොලර් මිලියන 1.3ක් - ලක්ෂ 2,000ක් - දුන්නා. ඒ නිලධාරි විදේශ කටයුතු අමාත්‍යාංශයට ආවා. මම නිවාඩු දමා ගෙන මෙරටට පැමිණි නිලධාරි සමඟ ඒ සඳහා වෙන් කර තිබෙන හෝමාගම පුරවරයට ගියා. ඒ පුරවරයේ මහින්ද රාජපක්ෂ විද්‍යාලය තිබෙනවා, එහා පැත්තේ හරිත සරසවිය තිබෙනවා, ඊට එහා පැත්තේ විද්‍යෝදය ඉන්ජිනේරු පීඨය හැදෙනවා, ඊට එහා පැත්තේ ජාත්‍යන්තර කිරුම් මිනුම් පර්යේෂණ මධ්‍යස්ථානය තිබෙනවා, ඊට එහා පැත්තේ අක්කර 58ක නැනෝ තාක්ෂණික උද්‍යානය හා පර්යේෂණ මධ්‍යස්ථානය තිබෙනවා, ඊට

එහා පැත්තෙන් පෙළ පොත් ගබඩා සංකීර්ණය තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ දේවල් තමුන්නාන්සේත් දන්නවා. ඒක "ප්‍රඥා බන්දු පුරවරයක්". ඒ කියන්නේ මේ පුරවරය ප්‍රඥාව හා බැඳුණු පුරවරයක්. මේ තාක්ෂණ විද්‍යාපීඨයත් ඒ ප්‍රදේශයේ ඉදි කරන්නයි හැදුවේ. ඒ තාක්ෂණ විද්‍යාපීඨය දැන් කුලියාපිටියට ගෙන යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2015 වර්ෂයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන්න තිබුණු එක අද වෙනකම් ආරම්භ කර නැහැ. ඒවා සිල්ලර වැඩ. ජාතික වැඩසටහනක් කරන කොට ඒ වැඩසටහන කවුරු කළත්, ඒක හොඳ නම් ඉදිරියට ගෙන යන්න ඕනෑ. මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ ඒකයි.

ග්‍රේරු මන්ත්‍රීතුමා දේශපාලනයට අරගෙන ආවේ මමයි. නැත්නම් "මොහාන් ලාල් ග්‍රේරු" කියන්නේ ගුරු වෘත්තියේ යෙදී සිටි කෙනෙක්. මම තාප්පයකින් පැනලා එතුමාගේ ගෙදරට ගිහිල්ලා බොහොම අමාරුවෙන් එතුමා දේශපාලනයට ඇදගෙන ආවේ. අපේ මිත්‍රයා බුලත් කොළය ලකුණෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඇවිල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක මැදිහත් වෙලා, තමුන්නාන්සේටත් මේ පිළිබඳ යථාර්ථය කියා දීලා මේ තාක්ෂණික විෂය ධාරාවට මීට වඩා ලොකු වෙනසක් කරයි කියලා මම විශ්වාස කළා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම අදත් ඉල්ලා සිටින්නේ ඔබතුමාගේ කාලයේදී රටේ උසස් අධ්‍යාපන ඇමතිවරයා ලෙස උසස් අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් කරන්න නම්, විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතියේ ප්‍රමාණාත්මක නොවෙයි, ගුණාත්මක වෙනසක් කරන්න කියලායි. දැන් කර තිබෙන ප්‍රමාණාත්මක වෙනස හොඳයි. මෙවර විශ්වවිද්‍යාලවලට ගන්නා දරුවන් සංඛ්‍යාව සියයට 10කින් වැඩි කරලා තිබෙනවා. එලෙස ගන්න පුළුවන් වුණේ තාක්ෂණික විෂය ධාරාවට පමණක් 2,000කට ආසන්න පිරිසක් ඇතුළත් කර ගැනීම නිසායි. ඒ නිසා ඒක හොඳයි. නමුත්, මේ ගරු සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට අපි හෘදයංගමව -හෘදය සාක්ෂියට එකඟව- ඇත්තම ඇත්ත කථා කළොත්, අපට ඡන්දය දෙන සමස්ත අන්ත අසරණ, ප්‍රාග්ධනය නැති දෙමව්පියන්ගේ දරුවන් ගැන; ඔවුන්ගේ ජීවිත ගැන කල්පනා කරලා තිබෙන විධිය, ප්‍රමාණය හරිද, වැරදිද කියන එක පිළිබඳව මේ ගරු සභාවේ සංවාදයක් ඇති වන්න ඕනෑ. හේතුව, එක් එක් කෙනා තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා බැලුවොත් තමන්ගේ දරුවෝ - තමන්ට දරුවෝ ඉන්නවා නම් - උසස් පෙළට එනකොට සාමාන්‍ය පෙළ, උසස් පෙළ සමත් වුණත්, නොවුණත් කොහොම හරි කරලා උපාධිය හදාරන්න වෙන රටක විශ්වවිද්‍යාලයකට යවනවා.

මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු, ඊළඟට ව්‍යාපාරික ප්‍රජාව, මධ්‍යම පන්තිය කියන ඒ සියලු තරාතිරම්වල දෙමව්පියන්ගේ දරුවන් සල්ලි දීලා විශ්වවිද්‍යාලයට යවනවා. ඒ සඳහා අද ඕනෑ කරන්නේ මොනවාද? London (O/L) නැත්නම්, GCE (O/L) - සාමාන්‍ය පෙළ- පමණයි. අද අධ්‍යාපනය වෙනස් වෙලා තිබෙන ප්‍රමාණයට අපි ගමේ දරුවාට කියනවා, "උඹ සාමාන්‍ය පෙළ සමත් වන්න ඕනෑ, උසස් පෙළ හොඳට සමත් වන්න ඕනෑ" ය කියලා. උදේ සිට රෑ වන තෙක් නිදි මරාගෙන වෙන වැඩ ඔක්කෝම නතර කරලා අම්මායි, තාත්තායි උසස් පෙළ මහා තරගයට තමන්ගේ දරුවා යවලා තමයි මේ විභාගය සමත් කරවන්නේ. හැබැයි, සල්ලි තිබෙනවා නම්, ඒ සඳහා වුවමනා කරන්නේ සාමාන්‍ය පෙළ පමණයි. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල එන දවස්වලට "The Sunday Times" පුවත් පත කියවන්න. O/L resultsවලින් ඕනෑම විශ්වවිද්‍යාල විද්‍යායතනයකට යන්න පුළුවන්. අවුරුදු තුනක් මෙපිටින්, නැත්නම් අවුරුදු හතරක් මෙපිටින් සල්ලිකාරයාගේ දරුවාට උපාධිය ගන්න. වෙන රටකට යන්න සල්ලි ටික යවන්න විතරයි ඕනෑ. ඒ මුදල රුපියල් ලක්ෂ 50ක් වෙන්න පුළුවන්, 100ක් වෙන්න පුළුවන්, 150ක් වෙන්න පුළුවන්, 200ක් වෙන්න පුළුවන්. වැඩිම වුණොත් රුපියල් ලක්ෂ 200යි නේ? රුපියල් ලක්ෂ 200 ගණනේ දරුවෝ හතර නම්, රුපියල් ලක්ෂ 800ක් ලැස්ති කළාම ඒ ගොල්ලන්ගේ දරුවන්ගේ ප්‍රශ්නය විසඳනවා.

විශ්වවිද්‍යාල විද්‍යායතනයක - University College එකක - අවුරුද්දක් ඉගෙන ගන්නවා. ඊට පස්සේ අවුරුදු තුනක් University එකට යනවා. ඒකේ හොඳ විධියට පාස් වුණොත් Master's Degree එක කරන්න ඕනෑ නැහැ. අවුරුදු 25-26 වෙන කොට PhD එකක් කරලා ආචාර්ය උපාධිය ගන්නවා. නමුත් එන්නේ නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. අපි තේරුම් ගන්න ඕනෑ අවුරුද්දකට දරුවෝ 15,000ක් උසස් අධ්‍යාපනය සඳහා පිට රට යනවා කියන එක. මේ යන දරුවෝ ගැන මගේ මිත්‍ර මහාචාර්යවරයෙක් research එකක් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, 2,000යි ආපසු ඇවිල්ලා තිබෙන්නේ. 13,000ක් ආපසු ඇවිල්ලා නැහැ. මොකටද එන්නේ? මෙහේ ඇවිල්ලා ඒ දරපු වියදමට සරිලන වැටුපක් ලබන්නත් බැහැ. ඒ කාලයේ ඒ රටට පුරුදු වෙන කොට ඒ දරුවෝ ආවාහ-විවාහ වන වයස. එතකොට ඒ රටේ දරුවෙක් එක්ක හරි මෙහේ දරුවෙක් හරි එක්ක විවාහ වෙනවා. ආරිය කුල සිරිත් අනුව විවාහ වෙලා, විවාහ ජීවිතය ගත කළාම දරුවෝ ලැබෙනවා. ඒ දරුවන්ට සිංහලත් බැහැ; දෙමළත් බැහැ; මෙහේ එන්නෙත් නැහැ; ආවාට මෙහේ ඉන්න මේ පරිසරයට පුරුදුත් නැහැ; ජාතියත් නැහැ; රටත් නැහැ.

අන්තිමට අම්මලාට, තාත්තලාට ලියුමක් එවනවා, - එතකොට අම්මයි තාත්තයි වයසට ගිහිල්ලා.- "පුතා, දුව ලැබිලා ඉන්නවා, අම්මත් පොඩ්ඩක් ලන්ඩන්වලට එන්න, මේ දවස්වල උදව්වටත් එක්ක" කියලා. සල්ලි දීලා ගන්න ගියොත් විශාල වියදමක් යන නිසා අර අම්මත් ගිහිල්ලා වැඩ ටිකක් කරලා දීලා ඇවිල්ලා, මෙහේ සිල් ගන්න ගිය වෙලාවට අනෙක් උපාසක අම්මලා එක්ක කියනවා, "දුව ඉන්නේ ලන්ඩන්වල, ෂෝක් කොළු පැටියෙක් හම්බ වෙලා ඉන්නවා, මමත් හුරතල් කර කර ඉඳලා ආවා" කියලා. අන්තිමට ඒ දෙමව්පියෝ මැරුණ දවසට ඒ මරණය පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරලා ලිපියක් විතරයි එන්නේ. මේක තමයි මධ්‍යම පන්තියේ ඛේදවාචකය. පිට රටවල ඉගෙන ගත්ත සමහර දරුවෝ මෙහේ ඇවිල්ලා විවාහ වෙලා යනවා. එවැනි විවාහ මංගල්‍ය උත්සවයක් තිබුණොත් හුඟාක් මන්ත්‍රීවරුන්ට ආරාධනා ලැබෙනවා. ඒවායේදී ආරිය කුල සිරිත් අනුව කථා පවත්වන්නේ කොහොමද? ආර්ය කුල සිරිත් අනුව පවත්වන සිංහල මඟුල් ගෙදර මනමාලයාගේ යහළුවෙක්, මනමාලියගේ යහළුවෙක් කථා කරලා, මනාල යුවළත් ඉංග්‍රීසි භාෂාවෙන් කථා පවත්වනවා. මේක තමයි අපේ රටට වෙලා තිබෙන්නේ. අපි කවුරුවත් මේ ඇත්ත කථා කරන්නේ නැහැ. තමන්ගේ දරුවා පිට රට විශ්වවිද්‍යාලයට යවලා; උගන්වලා; ඒ රටවල නතර වෙලා; එහේදී දරුවෝ ලැබිලා; මේ රටට එන්නේ නැති වෙලා; ටික ටික කථා කරලා; ඊට පස්සේ කථා කරන්නේම නැති වෙනවා. ඒ වේදනාව විඳ ගෙන තනිවම බුදුන් වැඳ ගෙන, සිල් අර ගෙන ඉන්න කට්ටිය ඉන්නවා. කවුරුවත් කියන්නේ නැහැ, අනෙක් දරුවන්ට ඇති වන ප්‍රශ්නය ගැන. මේක ඛේදවාචකයක්. ඒ නිසා මම ඔබතුමාට කියන්නේ මේ සඳහා තේරීම් කාරක සභාවක් දමන්න කියලායි. ඒක ලොකු පින්කමක්. කොහොමද, අපේ දරුවෝ මේ විධියට විදේශවලට යන එක වෙනුවට විකල්පයක් ලෙස පෞද්ගලික විශ්වවිද්‍යාලවලට හෝ පෞද්ගලික ආයතනවලට එන්න දෙන්න ඕනෑද; දේශීය අයටත් පෞද්ගලික අංශයේ ඉඩ දෙන්න ඕනෑද; එහෙම නම් රජයේ පාලනය යටතේ ඒක කරන්නේ කොහොමද; ඒකට ගාස්තු අය කරන්නේ කොහොමද; ඒකට කැමැතිද, නැද්ද කියලා ඇත්ත කථා කරන තේරීම් කාරක සභාවක් පත් කරන්න. අපට සටන් පාඨ කියලා වාසි ගන්න පුළුවන්. එක පරම්පරාවක් මේ විධියට සටන් පාඨ කියමින් වාසි ගත්තාම අපි ඒ විධියට නැති කරන්නේ මේ රටේ අනාගත මහා සම්පතයි; දරුවන්ගේ ජීවිතයි. අපි මනුස්ස ජීවිත එක්කයි මේ සෙල්ලම කරන්නේ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ගරු ඇමතිතුමනි, අද මොනවා කරන්නද? මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නේ. අපොස සාමාන්‍ය පෙළ විභාගය කරනවා. දරුවෝ කලා අංශයෙන් අපොස උසස් පෙළ විභාගය කරනවා. බහුතරය කරන්නේ කලා අංශයෙන් නේ. සිංහල භාෂාව කරනවා; දේශපාලන විද්‍යාව කරනවා; තර්ක ශාස්ත්‍රය කරනවා. ඒකෙන් උපාධියක් ලබනවා. බහුතරයට තිබෙන්නේ ඒ උපාධියයි. යම් කිසි පිරිසකට සිංහල භාෂාව පිළිබඳ උපාධිය, පශ්චාත් උපාධිය තියෙන්න ඕනෑ. මේ සිංහල භාෂා උපාධිය ලබා ගත් දරුවා පාසලක ගුරුවරයෙක් වෙනවා. මින් ඉදිරියට පාසල් ගුරුවරයෙක් වෙන්නේත් නැහැ. මොකද, පාසල් ගුරුවරුන්ට විශ්‍රාම වැටුපක් තිබුණා. දැන් විශ්‍රාම වැටුපත් නැති වුණු නිසා පාසල් ගුරුවරයකු වෙන්නත් බැහැ. එතකොට ඒ අයට කරන්න පුළුවන් මොකක්ද? ඒ පිරිස වෙනුවෙන් අපි පාර්ලිමේන්තුවෙන් සම්පත් වෙන් කරලා; සාමාන්‍ය පෙළට උගන්වලා; උසස් පෙළට උගන්වලා විශ්වවිද්‍යාලයට යවලා විශ්වවිද්‍යාලයෙන් එළියට එන දරුවාටත් දෙන්න රක්ෂාවක් නැහැ. තිබෙන සුදුසුකමට දෙන්න රක්ෂාවක් නැහැ. තිබෙන රක්ෂාවලට අවශ්‍ය උගතුන් බිහි වන්නේ නැහැ. තිබෙන රක්ෂාවලට අවශ්‍ය උගතුන් බිහි වන්නේ නැත්නම්, ඉන්න උගතුන්ට දෙන්න රක්ෂා නැත්නම් ඒකට කියනවා විරැකියාවේ ව්‍යුහගත අසමතුලිතතාවක් කියලා.

මේ ප්‍රශ්නයට පාර්ලිමේන්තුව විසඳුමක් හොයන්න ඕනෑ. අපි බොරු කතන්දර කියලා හරි යන්නේ නැහැ. වෛද්‍යවරුන්ගේ දරුවන් ගැන පැය ගණනක් කථා කරනවා, ඊළඟට ඉස්කෝලේ වතුර පයිප්ප කැඩිලායි කියනවා. සම්පූර්ණ බොරුව නේ කරන්නේ. මහියංගනය, අටකලන්පන්න, ආනමඩුව ඒ වාගේම වතුකරයේ ඉන්න දරුවන්ට Advanced Levelවලට කොහේ උගන්වන්නද? ඔවුන් වෛද්‍ය පීඨයට එනවාද, ඉංජිනේරු පීඨයට එනවාද, කළමනාකරණ පීඨයට එනවාද? ගරු ඇමතිතුමනි, රුපියල් 25,000ක 30,000ක පඩියකට Chemistry, Physics, Computer උගන්වන්න රක්ෂාවට යන්නේ කවුද? Accountancy උගන්වන්න එහෙම නැත්නම් Engineering Technology උගන්වන්න කවුද යන්නේ? මොකටද යන්නේ? අනුරාධපුරය, ආනමඩුව, මීමුරේ, අටකලන්පන්න "ළඟම පාසල, හොඳම පාසල" කියලා කිව්වාට එනවාද? බොරු නේ.

ඇත්ත තත්ත්වය තේරෙන්නේ නැතිව අධ්‍යාපනය සම්බන්ධයෙන් ජනප්‍රිය සටන් පාඨ කියන්න හොඳ නැහැ. අනගාරික ධර්මපාලතුමා කිව්වා වාගේ අපට මේ දේ වුණේ අපි නිපුණතා, දක්ෂතා තිබෙන මිනිස්සු හදන්නේ නැතිව කටයුතු කරපු නිසයි. ඒ මනුෂ්‍යයෝ එදා කරපු දේ නිසානේ යුද්ධයට හරි ගිහිල්ලා මේ රට නිදහස් කර ගන්න කටයුතු කළේ. ඉංජිනේරුවරු, විද්‍යාඥයින්, හමුදාවල ඉන්න අය කොච්චර ප්‍රමාණයක් ආනන්ද විද්‍යාලයෙන් බිහි කරලා තිබෙනවාද? ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ ආසනයේ ධර්මරාජ විදුහල එවැනි අය කොච්චර නම් බිහි කරලා තිබෙනවාද? කොච්චර නම් ගාල්ලේ මහින්ද විද්‍යාලයෙන් බිහි වෙලා තිබෙනවාද? එදා තුන්කල් දක්නා මිනිස්සු කිව්වේ, "වෙන රටකට ගිහිල්ලා එනම්, ඇමෙරිකාවට, එංගලන්තයට, ප්‍රංශයට ගිහිල්ලා ඉගෙන ගෙන ඇවිල්ලා උගන්වන්න" කියලායි. දැන් අපි ඒකද කරන්නේ? නැහැ. අපි ඒක කරන්නේ නැති බැරි අය ඔක්කෝම ආගාධයට යන්න ඉඩ දීලා පුළුවන් අයගේ ළමයින් ටික එහාට යවනවා. ඒ ළමයා දෙමළ වෙන්න පුළුවන්; සිංහල වෙන්න පුළුවන්. ඒ ළමයාගේ තුන්වැනි පරම්පරාව දෙමළත් නොවෙයි, සිංහලත් නොවෙයි, ලංකාවේ කෙනෙකුත් නොවෙයි, විශ්වයේ වෙන රටක පුරවැසියන් බවට පත් වෙනවා.

මේ තත්ත්වය වෙනස් කරන්න මෙහෙම බැහැ. ගරු ඇමතිතුමනි, අපට ප්‍රශ්නයක් තිබෙනවානේ, අනෙක් රටවල දරුවන් සාමාන්‍ය පෙළින් උපාධිය අරගෙන එනවා නම්, අවුරුදු 25 වන කොට පශ්චාත් උපාධිය අරගෙන, Doctorate එකක් කරලා එනවා නම් අපේ අයට ඒක බැරි වෙන්නේ ඇයි කියා. මේක හොයන්න එපායැ, අහන්න එපායැ. ළිං මැඩියෝ වාගේ ඉඳගෙන මේක කරන්න බැහැනේ.

ඊළඟට අහන්න ඕනෑ නේ, ඒ ළමයින්ට සාමාන්‍ය පෙළින් උපාධියක් ගන්න පුළුවන් නම් අපේ ළමයින්ට බැරි ඇයි කියලා. ඊයේ පෙරේදා කියනවා ඇහුණා, සාමාන්‍ය පෙළ නැතිවත් උසස් පෙළ කරන්න දෙනවා කියලා. මෙහෙම හිතෙන හිතෙන ඒවා කියලා හරි යනවාද? ගරු ටී.බී. ඒකනායක රාජ්‍ය ඇමතිතුමා ඒ කාලයේ මගේ අමාත්‍යාංශය භාර නියෝජ්‍ය ඇමතිවරයා ලෙස හිටියා. අපි එදා අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හදනකොට ජාතික අධ්‍යාපන කොමිසම එක්ක කථා කරනවා. ඊළඟට, NIE එක එක්ක කථා කරනවා. ඊට අතිරේකව ඒ විෂය සම්බන්ධව මහාචාර්යවරුන්ගෙන්, ආචාර්යවරුන්ගෙන් සමන්විත වෙනම කමිටුවක් පත් කරනවා. එක් අවස්ථාවක අපි එවැනි කමිටුවක් පත් කළාම ඒකෙදි කිව්වා, "ගණිතය අසමත් දරුවන් අවුරුදු 16දී පාරට දමනවා" කියලා. මා ඒ නිසා චක්‍රලේඛයක් නිකුත් කළා, ගණිතය අසමත් වුණත් නැටුම්, සංගීත, චිත්‍ර ඇතුළු කලා අංශවලින්, කෘෂිකර්මය, තාක්ෂණය වාගේ අංශවලින් උසස් පෙළ කරන්න පුළුවන්. හැබැයි, අවුරුදු දෙකක් ඇතුළතදී ගණිතය සමත් වෙන්න ඕනෑ කියලා. අවුරුදු දෙකක් යනතුරු ගණිතය සමත් නැහැ කියලා පාසලේ දොර වහන්නේ නැහැ. අවුරුදු 16 ළමයා ත්‍රිවීලර් එකක් එළවන්න තල්ලු කරන්නේ නැහැ. එහෙම නැත්නම් කුලී වැඩක් කරන්න තල්ලු කරන්නේ නැහැ. පාසලේ තියා ගන්නවා. හැබැයි, අවුරුදු දෙකක් තුළ ගණිතය සමත් වෙන්න ඕනෑ. එහෙමයි කිව්වේ. මේ අධ්‍යාපන ඇමතිතුමා ඊයේ පෙරේදා කියනවා, "සාමාන්‍ය පෙළ මොනවත් ඕනෑ නැහැ, උසස් පෙළ කරන්න පුළුවන්" කියලා. මට තේරෙන්නේ නැහැ, ඉස්කෝලෙකට ගිය කෙනකුට මෙහෙම කියන්න පුළුවන්ද කියලා. කවුද මෙහෙම කියන්නේ? රටක ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති එහෙම තීන්දු කරනවාද? අපට වෙලා තිබෙන දේ මදිවට, අර London (O/L), London (A/L) ගෙනැල්ලා ඒක කරලා ලක්ෂ ගණන් මිනිස්සු අසරණ වෙලා. අද ආණ්ඩුවක් විධියට හිතන්න ඕනෑ, මන්ත්‍රීවරුන්ගේ දරුවා, ඇමතිවරුන්ගේ දරුවා ගැන නොවෙයි, මේ රටේ අපට ඡන්දය දෙන කිරි කපන මනුෂ්‍යයාගේ, කළු ගල් කඩන කෙනාගේ, ගොවියෙකුගේ, එහෙම නැත්නම් කම්කරුවෙකුගේ දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබා දෙනවා කියලා අපි කරන්නේ බොරුවක් නොවෙයිද කියන එක.

අපි හිතමු 15,000ක් පිට රට ගිහිල්ලා උපාධි, පශ්චාත් උපාධි අරගෙන 2,000ක් එනවා කියලා. ඒ අයට පුළුවන් ඉංග්‍රීසියෙන් කථා කරන්න, කොම්පියුටර් එකෙන් වැඩ කරන්න. ඉංග්‍රීසියෙන් කථා කරන්න පුළුවන්, කොම්පියුටර් එකෙන් වැඩ කරන්න පුළුවන් විෂය දන්නා කෙනා ගිහිල්ලා ඉහළ මට්ටමේ රැකියාවට ඇතුළු වන කොටම වැටුප රුපියල් 80,000යි, 90,000යි, 100,000යි, 150,000යි. එතකොට ඒ රැකියා අවස්ථා ටික ලබා ගන්නෙත් පිට රට ගිහිල්ලා එන අය. මේ සටන් පාඨ කියන චූටි මල්ලිලාට කියලා දෙන්න ඕනෑ, ළිං මැඩි මානසිකත්වයේ ඉඳගෙන මේ කරන්නේ, අපරාධයක්, පිස්සුවක් කියන එක. මේ ඔක්කොම ටික අයිති කර ගන්නේ ඇති හැකි අයගේ ළමයින් ටික බේරා ගන්නයි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, තව ටිකක් කල් යන කොට 1971, 1989 වාගේම ආයෙත් දවසක මේ අය සියලුම විදුහල්පතිවරුන්ගේ, ගුරුවරුන්ගේ බෙල්ල කපා වැටේ ගහන්න පටන් ගන්න එකයි. ඒක තමයි වෙන්නේ. මේ ප්‍රශ්නයට ඇත්තටම මැදිහත් වුණේ නැත්නම් මේ අය සටන් පාඨ කියනවා, පෙළපාළි යනවා. ලෝකයේ සිද්ධ වන දේවල් දන්නේ නැහැ. ඒ අතරේ ඇති හැකි අය මේ විශ්වවිද්‍යාලයට යවන්නේත් නැහැ. ඇයි? Ranking එක අනුව ගත්තාම ලෝකයේ තිබෙන විශ්වවිද්‍යාලවලින් පළමුවන

විස්සම එංගලන්තය ඇතුළු අනික් බටහිර රටවල තිබෙන විශ්වවිද්‍යාලයි. ලෝකයේ විශ්වවිද්‍යාල වර්ගීකරණය ගත්තාම අපේ විශ්වවිද්‍යාල තිබෙන්නේ අන්තිම 18ටත් පහළිනුයි. ඒක එහෙම තිබියදී අපි ඒකට රණ්ඩු වෙවී ඉන්නවා. උතුරු නැඟෙනහිරට පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පටන් ගන්න දෙනවාය කියලා දැන් කිව්වොත්, කිසිම කරදරයක් නැතුව ඉතාම කෙටි කාලයක් තුළදී ඒ ප්‍රදේශයේ වැඩිම පිරිසක් කැප වීමෙන් ඒක කරනවා. මොකද, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

යාපනයේ මන්ත්‍රීවරුන්ගෙන් විශාල ඉල්ලීමක් තිබෙනවා, පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටු වන්නය කියලා. අපේ අය තමයි මේවා එපාය කියන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, ඒකයි මා කියන්නේ අපි මේ කරන්නේ අසත්‍යයක් කියලා. හෘදය සාක්ෂියට එකඟව අපි ඇත්ත දේ නොවෙයි මේ කරන්නේ. ඒ වෙලාවට අපි කථා කරලා මොකක් හෝ කරලා යනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා කිව්වා නේ, 15,000ක් පමණ පිට රට යනවාය කියලා. මා ඔබතුමාට කියන්න කැමැතියි, අපි දෙගොල්ලන්ම එකතු වෙලා, යම්කිසි එකඟතාවකට ඇවිල්ලා මේ SAITM එකේ ප්‍රශ්නය විසඳුවොත් හොඳයි කියලා. රජයයි, පෞද්ගලික අංශයයි එකතු වෙලා රජයේ නියාමනය යටතේ විශ්වවිද්‍යාල පවත්වා ගෙන යන ක්‍රමයක් සකස් කරනවා නම් හොඳයි. ලෝකයේ තිබෙන ඉතාමත් හොඳ විශ්වවිද්‍යාල 5ක්, 10ක් මේ රටට එන්න බලා ගෙන ඉන්නවා. SAITM එක උදාහරණයකට ගෙන ඔබතුමන්ලා අපට සහයෝගය දෙනවා නම්, අපට සාකච්ඡා කරලා Public-Private Partnership එකකට යන්න පුළුවන් නම් ඔබතුමා කියන සංකල්පය ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

හොඳයි. ඒකට කරන්න ඕනෑ ක්‍රියාව මොකක්ද? අපි එකිනෙකා දේශපාලන වශයෙන් තුට්ටු දෙකේ වාසියට නේ, මේ සෙල්ලම් කරන්නේ; කොළේ වහලා ගහන්නේ; වෙන කෙනකුගේ එකක් ඇදලා ගහන්නේ; බාල්දු කොළේ ඉස්මතු කරලා පෙන්වන්නේ. මේ political game එක නතර කරලා මේ පිළිබඳ තීන්දුවක් ගන්න පුළුවන් වන්නේ තේරීම් කාරක සභාවක් පත් කිරීමෙන් පමණයි. තේරීම් කාරක සභාවට ජනතා විමුක්ති පෙරමුණටත් එන්න කියනවා; අපටත් එන්න කියනවා; ඔබතුමන්ලාත් එනවා; ගරු මනෝ ගනේෂන් ඇමතිතුමාත් එනවා; උතුරු නැඟෙනහිර මන්ත්‍රීතුමන්ලාත් එනවා. ඉහළ අධ්‍යාපනය සඳහා හැම අවුරුද්දේම 15,000ක් පමණ සිසුන් පිරිසක් පිට රටට යනවා නම්, ඒ යන අය ආපසු මෙරටට එන්නේත් නැත්නම්, ඒ මානව සම්පතත් නැති වනවා නම් -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපේ දරුවන් පිට රට ගිහින් ඉගෙන ගන්න ලංකාවේ විදේශ විනිමය රුපියල් මිලියන 7,000ක් වැය වනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔව්, මා දන්නවා. ඔවුන් ඒ රටවල ඉගෙන ගන්න විඳින දුක මා දැක්කා. Medicine සඳහා බංගලාදේශයේ University of Chittagong එකට ගිය දරුවන් මට මුණ ගැසුණා, කේස ධාතු වඩම්මවාගෙන එන්න ගිය වෙලාවේ. ඒ දරුවෝ නර දුකක් විඳින්නේ. ඒ රටේ සතුන් කපන ආගමික සම්ප්‍රදායක් තිබෙනවා. ඒ කාලයට බංගලාදේශයේ ඒ ප්‍රදේශයේ ඉන්න බැහැ. ඒ දරුවන් සියලුම දුක් විඳගෙන තමයි ඒ ප්‍රදේශයේ ඉන්නේ. මුදල් තිබෙන අයගේ දරුවන් නොවෙයි, ඒ විශ්වවිද්‍යාලවලට යන්නේ. සමහර දෙමවුපියෝ තමන්ගේ දෙමවුපියන්ගෙන් පාරම්පරිකව තමන්ට ලැබුණු ගෙයයි, ඉඩමයි විකුණලා, අම්මායි, තාත්තායි කුලී ගෙදරකට ගිහින් තමයි මේ දරුවන් පිට රටවලට යවන්නේ. ඉස්සර කාලයේ දරුවන් වාගේ නොවෙයි, අද ඉන්න දරුවන්.

අද ඉන්න තරුණ දරුවෝ අම්මාලාට, තාත්තාලාට කියනවා, "අනික් දරුවන් ගිහින් මේ විධියට ඉගෙන ගෙන එනවා නම්, මේ තිබෙන දේපොළ විකුණා හෝ අපව වෙන රටකට යවන්න."යි කියලා. ඒක තමයි අද දරුවන්ගේ ඉල්ලීම වෙලා තිබෙන්නේ. ඒකට දෙමවුපියන්ට කරන්න දෙයක් නැහැ, දෙමවුපියන් අසරණ වනවා. මෙතැන ඉන්න අය මෙහේ පෙළපාළි යව-යවා ඉන්න අතරේ, එක කොටසක් විතරක් ගොඩ යන්න යන කොට, ඒක දකින දරුවෝ කියනවා, "කෙසේ හෝ අපත් පිට රටවලට යවන්න"යි කියලා. එතකොට දෙමවුපියන් කරන්නේ, තමන්ගේ ගෙය විකුණා, ඉඩම විකුණා, පරම්පරාවේ තිබෙන දේවල් විකුණා, ඔවුන් කුලී ගෙදරකට ගිහින් දරුවන් සිය ගණනක් විදේශවලට යවන එකයි. රුපියල් ලක්ෂ 30කට, රුපියල් ලක්ෂ 40කට හෝ ඊට අඩු මුදලකට ඉගෙන ගන්න පුළුවන් ආයතන මේ රටේ තිබියදී, බැංකුවලට රුපියල් ලක්ෂ 150ක්, රුපියල් ලක්ෂ 200ක් ණය වෙලා, පොලී ගෙවලා තමයි තමන්ගේ දරුවන් පිට රටවලට යවන්නේ. NSBM එක -හරිත සරසවිය- කරන්නේත් මේකමයි. විදේශ ප්‍රමිතියට අනුව විදේශයක් එක්ක collaborate කරලා ලංකාවේ උපාධියක් දෙනවා. ඒ දරුවෝත් මේකේ ඉන්නවා. ඔවුන් උපාධි අරගෙන ලංකාවේ ඉන්නවා. එතකොට ඒ අයටත් ඉංග්‍රීසියෙන් වැඩ කරන්න පුළුවන් වෙනවා; පරිගණක කටයුතු ඉගෙන ගන්නත් පුළුවන් වෙනවා. අධ්‍යාපන මට්ටමත් ඒ මට්ටමටම දියුණු වෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා )**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய சகவாழ்வு, கலந்துரையாடல் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Co-existence, Dialogue and Official Languages)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමා දැන් හොඳ යෝජනා ඉදිරිපත් කළා. SAITM ප්‍රශ්නයයි, දැන් අතේ තිබෙන ප්‍රශ්නය. ඔබතුමා කියනවා, මේ සඳහා තේරීම් කාරක සභාවක් පත් කරන්න ඕනෑය කියලා. ඒක හොඳයි. අපි ඒ කටයුත්ත කරමු. නමුත් දැන් අතේ ප්‍රශ්නයක් තිබෙනවා නේ. ඒ ප්‍රශ්නය විසඳන්න සහාය ලබා දෙන්න. අපි එතැනින් මේ කටයුත්ත පටන් ගනිමු.

වැදගත් ප්‍රශ්නයක් ගැන ඔබතුමා කියනවා. ඒ නිසා මා ඔබතුමාගේ කථාව අගය කරනවා. ඇමතිතුමා යෝජනා කරලා තිබෙන දෙයට ඔබතුමා කැමැති වෙන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අතේ තිබෙන ප්‍රශ්නය විසඳන්න ඕනෑ කොහොමද? ඒ, රට ගිනි ගන්නේ නැති වෙන්නයි. එක කට්ටියක් දේශපාලන වශයෙන් එකඟ වුණොත්, ඊට එකඟ නොවුණු කට්ටිය ගින්දර පත්තු කරනවා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මේ SAITM එක පටන් ගත්තේ ඔබතුමන්ලාගේ කාලයේදීයි. අපේ කාලයේදී තමයි පළමුවැනි කණ්ඩායම අවසාන විභාගය සමත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි දෙගොල්ලන් එකතුවෙලා මේ ප්‍රශ්නය විසඳමු.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අප මේ කාරණයට එකඟවෙලා හරි යන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලයේ ඉන්න ඇමතිතුමෙක්ම කියනවා මා අහගෙන හිටියා, "මගේ අදහස SAITM එකට ගැනීම වහාම නතර කිරීමයි" කියලා. [බාධා කිරීමක්] මා එතුමාගේ කථාව අහගෙන හිටියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා ඉදිරිපත් කළේ එතුමාගේ මතය. මේක පාර්ලිමේන්තුව නේ. ඕනෑම කෙනෙකුට මත ඉදිරිපත් කරන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා. නමුත් මේ SAITM එක පටන් ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පැවති කාලයේදීයි. අපේ ආණ්ඩු කාලයේ තමයි මේ first batch එක අවසාන විභාගය සමත් වුණේ. අපි දෙගොල්ලන් එක්කහුවෙලා මේ ප්‍රශ්නය විසඳුවොත් හොඳයි.

ඔබතුමා කියනවා, "අවුරුද්දකට 15,000ක්දෙනා අධ්‍යාපනය සඳහා පිට රට යනවා. ඒ අය ආපසු අපේ රටට එන්නේ නැහැ. ඊට පස්සේ ඒ අයට ජාතියක් නැහැ; ජන්මයක් නැහැ" කියලා. ලංකාවේ මේ SAITM model එක ක්‍රියාත්මක කළොත්, පිට රට විශ්වවිද්‍යාල 5ක්, 10ක් ලංකාවට එන්න බලාගෙන ඉන්න බව මා ඔබතුමාට කියන්න ඕනෑ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්, එනවා. මම ඒ කාරණය ගැන දන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උදාහරණයක් වශයෙන් ගත්තොත් මනිපාල් විශ්වවිද්‍යාලය ලංකාවට එන්න බලාගෙන ඉන්නවා. ඒගොල්ලන් අහනවා, "SAITM එකට මොකක්ද වෙන්නේ?" කියලා. අපි එකට වැඩ කරමු.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මා ඔබතුමාට යෝජනා කරන්නේ, ඔබතුමා දැන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා මේ තිබෙන ප්‍රශ්නය විසඳන්න ඕනෑ කියන එකයි. පාර්ලිමේන්තුව, ජාතියක ප්‍රතිපත්ති තීන්දු කරන්න එපායැ. පාර්ලිමේන්තුව දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් රැස්වෙනවා වාගේම, උසස් අධ්‍යාපනයේ මේ තිබෙන ප්‍රශ්නය විසඳා ගන්නත් රැස්වෙන්න ඕනෑ. ලංකාවේ දරුවන් රුපියල් ලක්ෂ ගණන් ගෙවලා, විදේශ රටවලට ගිහිල්ලා, උපාධි අරගෙන නොපැමිණීම පිළිබඳව තිබෙන ජාතික ගැටලුව විසඳීම සඳහා වූ ප්‍රතිපත්ති තීන්දුව ගන්න තේරීම් කාරක සභාවක් පත් කරන්න. ඒ වෙනුවෙන් කැබිනට් පත්‍රිකාවක් ගෙනෙන්න; තේරීම් කාරක සභාවක් පත් කරන්න. නිශ්චිත කාලයක් දෙන්න, "මාස තුනක් ඇතුළත වාර්තාවක් දෙන්න ඕනෑ" කියලා. උසස් අධ්‍යාපන ඇමති හැටියට ඒ කාලයේ හිටපු ඒ.සී.එස්. හමීඩ් මැතිතුමා quota systems එක එහෙම හඳනකොට තේරීම් කාරක සභාවලින් තමයි ඒ ප්‍රතිපත්ති අරගෙන තිබෙන්නේ. එතකොට වෙන කට්ටියකට ගිනි තියන්න බැහැ. ඔක්කොම එක මතයකට ආවාම කාටවත් ගිනි තියන්න බැහැ. ඒ නිසා අධ්‍යාපනයේදී සරල, ජනප්‍රියවාදී ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ නැතිව, ගමේ අන්ත අසරණ දරුවන්ටත් මේ අවස්ථා ලබා දෙන ආකාරයට ඇත්ත අධ්‍යාපනයේ වෙනසක් කරන්න මේ සඳහා තේරීම් කාරක සභාවක් පත් කරලා එයට තමුන්නාන්සේ සක්‍රිය ලෙස මැදිහත් වෙන්නට කියන ආරාධනය මා කරනවා. ඒ සඳහා වඩාම යෝග්‍ය දේ වෙන්නේ විශ්වවිද්‍යාල කටයුතු සම්බන්ධයෙන් වැඩි නිදහසක් ඒ ආයතනයට ලබා දීලා, ප්‍රශ්න ටික එතැනින් විසඳා ගන්න අවස්ථාව දීලා, ඔබතුමා ප්‍රතිපත්ති තීරණය කිරීමේ කටයුත්තට මැදිහත් වීමයි. එලෙස මේ විශ්වවිද්‍යාල පද්ධතිය ඉහළට ගෙනැල්ලා, වඩාත් තෘප්තිමත් පිරිසක් සහිතව අපේ රටේ විශ්වවිද්‍යාලත් ජාත්‍යන්තර වශයෙන් ආඩම්බර වන විශ්වවිද්‍යාල බවට පත් කර ගන්න කටයුතු කරන්න ඔබතුමාට පුළුවන් වේවා! කියා පතමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු මුජිබුර් රහුමාන් මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මුජිබුර් රහුමාන් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஷெஹான் சேமசிங்க அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

[பி.ப. 3.54]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறும் பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பம் தந்ததற்காக உங்களுக்கும், அண்மையில் திருகோணமலை மாவட்டத்திற்கு விஜயஞ்செய்து அங்குள்ள பல்கலைக்கழக வளாகத்தில் புதிய கட்டிடத்தைத் திறந்து வைத்தமைக்காக

கௌரவ அமைச்சர் அவர்களுக்கும் முதற்கண் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே! தற்பொழுது திருகோணமலை வளாகத்திலுள்ள இரண்டு பீடங்களில் சித்த மருத்துவப் பிரிவு மட்டுமே இயங்கிவருகின்றது. எனவே, இங்கு இன்னும் பீடங்களை அதிகரித்து, இதனைத் தனிப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்தி அபிவிருத்தி செய்ய வேண்டும் என்று நான் இந்த இடத்திலே உங்களிடம் வேண்டுகின்றேன்.

1977ஆம் ஆண்டு ஆட்சிக்கு வந்த ஐக்கிய தேசியக் கட்சிதான் இலங்கையில் பல்கலைக்கழகங்களின் எண்ணிக்கையை அதிகரிக்கின்ற பணியை முன்னெடுத்தது. அதன்பின் ஆட்சிக்கு வந்த தலைவர்கள் காலத்திலும் பல்கலைக்கழகங்கள் பல உருவாக்கப்பட்டன. இந்த வரிசையில் மைத்திரி - ரணில் நல்லாட்சிக் காலத்திலும் பல்கலைக்கக்கழகங்கள் உருவாக்கப்பட வேண்டும் என்பது என்னுடைய விருப்பமாக இருக்கின்றது. அதன் முன்னோடியாகத் திருகோணமலை பல்கலைக்கழக வளாகத்தை தனிப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்தினால் அந்தச் செயற்பாடு வரலாற்றில் ஒரு மைல் கல்லாக அமையும் என்பதையும் நான் இந்த நேரத்திலே கௌரவ அமைச்சர் அவர்களிடம் கூறிக்கொள்கின்றேன்.

இலங்கையர்கள் அதிகமானோர் மத்திய கிழக்கு நாடுகளிலே பணிபுரிந்து வருகின்றார்கள். இது நாட்டுக்கு மிகவும் அதிகமான வருமானமீட்டுகின்ற ஒரு வழியாக இருந்துகொண்டிருக்கின்றது. இருந்தபோதிலும் இவர்களிலே அதிகமானோர் அரபுமொழி தெரியாமல் அங்கு தொழிலுக்குச் செல்கின்ற ஒரு நிலைமையை நாங்கள் பார்க்கின்றோம். அந்த மொழி தெரியாமல் அங்கு செல்கின்றவர்கள் நல்ல தொழில்களைப் பெற்றுக் கொள்வதிலே கஷ்டப்பட வேண்டியிருக்கின்றது. ஆகையால் அவர்கள் சாதாரண அல்லது மிகவும் குறைந்த தரத்திலுள்ள வேலைகளிலேயே அமர்த்தப்படுகின்றார்கள். இந்த நிலையை நாம் மாற்றியமைக்க வேண்டும். அந்த வகையில் இங்கிருந்து தொழிலுக்குச் செல்கின்றவர்களுக்கு அரபு மொழியைக் கற்பித்து அனுப்புகின்ற செயற்பாடுகளை கௌரவ அமைச்சர் அவர்கள் உடன் எடுக்க வேண்டும். அதன்மூலம் எமது நாட்டவர்களை அங்கு முக்கிய தொழில்களிலே அமர்த்தக்கூடியதாக இருக்கும். 1990ஆம் ஆண்டு உயர் கல்வி அமைச்சராக இருந்த மர்ஹூம் ஏ.சீ.எஸ். ஹமீத் அவர்கள் இதற்காகக் குழுவொன்றை நியமித்து குறித்த ஆய்வுகளை மேற்கொண்டதாக நான் அறிகின்றேன். அன்று ஆரம்பிக்கப் பட்ட அந்தச் செயற்பாடுகளை, அந்தப் பணியை இன்று எங்களுடைய உயர் கல்வி அமைச்சர் அவர்கள் தொடர்ந்து வெற்றிகரமாகச் செய்தால், அது எங்களுடைய நாட்டுக்குக் கிடைக்கின்ற வருமானத்தை அதிகரிப்பதில் பாரிய பங்களிப்பைச் செலுத்தும் என்பதில் எந்தவோர் ஐயப்பாடும் இல்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டத்தைச் சேர்ந்த அதிகமான மாணவர்கள் தற்போது ஒலுவிலிலுள்ள தென்கிழக்குப் பல்கலைக்கழகம், செங்கலடியிலுள்ள கிழக்குப் பல்கலைக் கழகம், யாழ்ப்பாணப் பல்கலைக்கழகம் போன்றவற்றிலே கல்வி கற்று வருகின்றார்கள். இருந்தபோதிலும் இப்பல்கலைக் கழகங்களில் இருக்கின்ற கவுன்சில்களில் திருகோணமலை மாவட்டத்தைச் சேர்ந்தவர்கள் இணைக்கப்படவில்லை என்பது ஒரு வேதனையான விடயமாக இருக்கின்றது. ஆகையால் எமது மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்து கின்றவர்களையும் அந்தக் கவுன்சிலிலே இணைத்து அதன் செயற்பாடுகளில் அவர்களைப் பங்குகொள்ளச் செய்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் வழிசமைக்க வேண்டும் என்று நான் இந்த இடத்திலே கூறிக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உயர் கல்வி என்ற விடயத்தில் ஏதோ ஒரு குறைபாடு இருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது. திருகோணமலை மாவட்டம் மட்டுமல்ல, நாடளாவிய ரீதியிலே பார்த்தால் க.பொ.த. ( சாதாரண) தரம் மற்றும் க.பொ.த. உயர் தரப் பரீட்சைகளிலே பெரும்பாலான மாணவர்கள் சித்தியெய்து கின்றபோதிலும் அவர்களுடைய திறமைகள் முடக்கப்படு கின்ற அல்லது அவர்களுடைய திறமைகளை வெளிக்கொண்டு வர முடியாத அல்லது அவர்களுடைய கல்வி நடவடிக்கைகள் அத்துடன் முற்றுப்பெறுகின்ற ஒரு நிலையே காணப்படு கின்றது. அம்மாணவர்கள் எந்தெந்தத் துறைகளிலே அறிவுபூர்வமாக இருக்கின்றார்களோ அல்லது எந்தத் துறையை விரும்புகின்றார்களோ, அவர்களுடைய அந்தக் கல்வி நடவடிக்கையைச் சாதாரண, உயர்தரப் பரீட்சைப் பெறுபேறுகளின் அடிப்படையிலே மேற்கொள்ளும் வகையில் உயர்கல்விச் செயற்பாடுகள் அமையவேண்டும்.

இன்று இந்த விவாதத்திலே பேசியவர்கள் பல்வேறு விடயங்களை முன்வைத்தார்கள். அந்த வகையில், நாங்கள் இந்தப் பாராளுமன்ற அமர்விலே முன்வைக்கின்ற விடயங்கள் பேச்சளவில் மட்டும் நின்றுவிடாமல் செயற்படுத்தப்பட வேண்டும். இந்த நல்லாட்சிக் காலத்திலே நாங்கள் செய்கின்ற செயற்பாடுகள் பின்னைய காலத்திலே பேசப்படுகின்ற அளவுக்கு இருக்க வேண்டும். அதற்கான ஏற்பாடுகளை எங்களுடைய கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென்பதை இந்த இடத்தில் கூறிக்கொள்வதோடு, இந்த விவாதத்தில் பேசுவதற்கு எனக்கும் ஒரு குறுகிய நேரத்தைத் தந்தமையையிட்டு நன்றி கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். வஸ்ஸலாம்.

[பி.ப. 4.00]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூல விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்றைய விவாதத்தின்போது இத்துறைக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள் சபையில் அமர்ந்திருந்து அனைத்துப் பாராளுமன்ற உறுப்பினர் களினதும் அமைச்சர்களினதும் உரைகளைச் செவிமடுத்து, அவ்வப்போது அவர்கள் முன்வைக்கும் கோரிக்கைகளுக்கும் உரிய பதில்களை அளிப்பது மிகுந்த மகிழ்ச்சியளிக்கின்றது. குறிப்பாக, எதிர்க்கட்சி வரிசையில் இருக்கின்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் உரையாற்றியபோது, தங்களது பிரதேசம் சார்ந்திருக்கின்ற உயர் கல்வி நிறுவனங்களில் ஏற்படுத்தக்கூடிய மாற்றங்கள், செய்யப்பட வேண்டிய அபிவிருத்திகள் குறித்த கோரிக்கைகளை முன்வைத்தார்கள். அதற்கு கௌரவ அமைச்சர் அவர்கள் உடனடியாகவும் அவர்களது உரையின் இறுதியிலும் சாதகமான பதில்களை வழங்கியது மகிழ்ச்சியளிக் கின்றது. கௌரவ உறுப்பினர் சிவசக்தி ஆனந்தன் அவர்களின் உரையின்போதாக இருக்கட்டும், அல்லது கௌரவ உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களின் உரையின் போதாக இருக்கட்டும் எங்களால் அதனை அவதானிக்கக் கூடியதாக இருந்தது. உண்மையிலே, இந்தக் கலாசாரம் போற்றத்தக்கது.

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

சற்றுநேரத்துக்கு முன்பு இந்தச் சபையிலே உரையாற்றிய பதுளை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ அரவிந்த் குமார் அவர்கள் சில கோரிக்கைகளை முன்வைத்தார். இந்த மலையகப் பல்கலைக்கழகம் குறித்த கோரிக்கையானது இன்று நேற்றல்ல, பல வருட காலமாக இந்தச் சபையிலும் சபைக்கு வெளியிலும் முன்வைக்கப்பட்டு வருகின்றது. 2004ஆம் ஆண்டு என்று நினைக்கின்றேன், பதுளை மாவட்டப் பாராளுமன்ற உறுப்பினராக இருந்த கௌரவ டிலான் பெரேரா அவர்கள், குறுகிய காலம் தோட்ட உட்கட்டமைப்பு அபிவிருத்தி அமைச்சராக இருந்த காலத்தில், மலையகப் பல்கலைக்கழகம் குறித்த ஓர் அமைச்சரவைப் பத்திரத்தைத் தயாரிசெய்து, அதனை அமைச்சரவைக்குச் சமர்ப்பிக்கவிருந்த நிலையில் ஆட்சி நிறைவுற்றதன் காரணமாக - 2005ஆம் ஆண்டில் தேர்தல் வந்ததன் காரணமாக - அது கிடப்பில் போடப்பட்ட விடயமாக மாறிவிட்டது. இப்போதுகூட, மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர்களால் தொடர்ச்சியாக இக்கோரிக்கை விடுக்கப்பட்டு வருகின்றபோதும், அது ஒரு முறையான திட்டத்தின் அடிப்படையில் முன்வைக்கப்படாத காரணத்தினால், இது தொடர்ந்தும் நிறைவேறாத ஒரு கோரிக்கையாக இருந்துவருகின்ற துரதிருஷ்ட நிலை காணப்படுகின்றது. இதுகுறித்து நாங்கள், இந்தப் பாராளுமன்றத்துக்கு வெளியே அமைச்சருடன் அமைச்சு மட்டத்திலே ஒரு கலந்துரையாடலை எதிர்பார்க்கின்றோம். அதற்கான வாய்ப்பினை கௌரவ அமைச்சர் அவர்கள் ஏற்படுத்தித் தருவாரென நான் எதிர்பார்க்கின்றேன்.

ஏற்கெனவே தங்களது மாவட்டங்களில் இருக்கின்ற பல்கலைக்கழகங்களில் மேலதிக வளாகங்களை நிறுவது சம்பந்தமாகக் கௌரவ உறுப்பினர்கள் கோரிக்கை விடுக்கின்ற இச்சந்தர்ப்பத்தில், நாங்கள் மலையக கலை, கலாசாரங்களைத் தழுவியதாக, அங்கு ஏற்பட்டிருக்கின்ற கல்விசார் மாற்றங்களை உள்வாங்கக்கூடிய, ஆய்வுகளுக்கும் பயன்படக்கூடிய, ஒரு பல்கலைக்கழகக் கல்லூரியையேனும் முதலில் ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டும் என்பதையும் பின்னாளில் அதனை ஒரு பல்கலைக்கழகமாக மாற்றுகின்ற ஏற்பாட்டுக்கு இது உதவும் என்பதையும் நான் இங்கு வலுவாக முன்வைக்கிறேன். கடந்த காலங்களில் கௌரவ லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள் பெருந்தோட்ட அமைச்சராக இருந்தபோது, கொத்மலைப் பிரதேசத்துக்கு உட்பட்ட பகுதியில் இதற்குத் தகுந்த நிலத்தை தற்போதைய கல்வி இராஜாங்க அமைச்சர் இராதாகிருஷ்ணன் அவர்கள் பெற்றுக்கொண்டார். எனவே, இச்சந்தர்ப்பத்தில் அங்கு எத்தகைய பீடமொன்றை உருவாக்கலாம் என்ற கேள்வி எழுகின்றது. இப்போதைய நிலையில், திறந்த பல்கலைக்கழகத்தினூடாகவும் ஏனைய முறைசார்ந்த பல்கலைக்கழகங்களில் வெளிவாரியாகவும் இந்தியாவைத் தளமாகக் கொண்டு இயங்குகின்ற பல்வேறு தனியார் பல்கலைக்கழகங்களில் தொலைத்தொடர்பு ஊடாகவும் அல்லது பிரத்தியேகக் கல்வி நிலையங்களின் ஊடாகவும் மலையகத்தைச் சேர்ந்த பல நூற்றுக்கணக்கான மாணவர்கள் கலைத்துறையைச் சார்ந்து பயின்றுகொண்டிருக்கின்றார்கள். அந்த வகையில் ஆரம்பக்கட்டத்தில் கலைத்துறை சார்ந்த, கலாசாரம் சார்ந்த, பாரம்பரிய கலைகள் சம்பந்தமான பீடமொன்றை அமைக்க முடியும், அல்லது பெருந்தோட்டக் கைத்தொழிலைத் தளமாகக் கொண்டிருக்கின்ற மலையகப் பகுதியில் அந்தப் பிரதேசத்துக்குப் பொருத்தமான கற்கை நெறிகளைக் கொண்டதான ஒரு பீடத்தை அமைக்க முடியும். ஏற்கெனவே பெருந்தோட்ட முகாமைத்துவம் சம்பந்தப்பட்ட கற்கைநெறிகள் சப்ரகமுவ பல்கலைக்கழகத்திலும் இருக்கின்றன. எனவே, இதனை அமைப்பது கௌரவ அமைச்சர் அவர்களுக்கு நல்லதொரு வாய்ப்பாகவும் இருக்கும். அந்தவகையில், மலையகத்தைத் தளமாகக்கொண்டு அமையப்போகும் அந்தப் பீடமானது எதிர்வரும் காலத்தில் மலையகப் பல்கலைக்கழகமாக மாறுவதற்கான வாய்ப்பு இருக்கின்றது என்பதை நான் இவ்விடத்திலே கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதே சந்தர்ப்பத்தில் இன்னுமொரு முக்கியமான கோரிக்கையை நான் அமைச்சர் அவர்களிடத்தில் முன்வைக்கலாம் என்று நினைக்கின்றேன். அதாவது, நுவரெலியா மாவட்டத்தை மையமாகக்கொண்ட - தளமாகக்கொண்ட - பல்கலைக்கழகக் கோரிக்கை தொடர்ச்சியாக விடுக்கப்பட்டும் அது கிடைக்கப் பெறாதபட்சத்தில், நான் ஏற்கெனவே இந்தச் சபையில் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை மூலமாக ஹற்றன் நகரத்தை மையமாகக்கொண்டு இயங்கிவருகின்ற இலங்கை திறந்த பல்கலைக்கழகத்தின் கிளையில் கற்கைநெறி நடத்துவதற்கான கட்டிடம் ஒன்றைப் பெற்றுத்தருமாறு கோரியிருந்தேன். அக்கோரிக்கையை உயர் கல்வி இராஜாங்க அமைச்சர் கௌரவ மொஹான் லால் கிரேரு அவர்கள் ஏற்றுக் கொண்டார். அதுவும் குறிப்பிட்ட இடம் சம்பந்தமாகப் பிரச்சினையில் இருக்கின்றது. அந்த இடப்பிரச்சினையைத் தீர்த்துவைக்கின்ற பட்சத்திலே இலங்கைத் திறந்த பல்கலைக்கழகத்தின் ஹற்றன் கற்கை நிலையத்திற்கான கட்டிடம் அமைத்துக் கொடுப்பதற்குத் தான் உடன்படுவதாகக் கூறியிருந்தார். எனினும், மலையக மக்கள் முன்னணியின் தலைவரும் முன்னாள் அமைச்சருமான கௌரவ சந்திரசேகரன் அவர்களின் காலத்தில் ஹற்றன் மல்லிகைப்பூ நகரிலே பெற்றுக்கொள்ளப்பட்ட காணியானது, வெளியாரின் அபகரிப்பிற்கு உள்ளாகாதபோதிலும் அந்தக் காணிக்குச் செல்கின்ற பாதை அபகரிப்பிற்குட்பட்டுள்ளதன் காரணமாகச் சுமார் 10 வருட காலமாக இந்தக் கற்கை நெறிக்கான நிலையத்தை அமைப்பதில் பல்வேறு தடங்கல்கள் இருக்கின்றன. இந்தப் பாதைப் பிரச்சினை தொடர்பாகத் தொடர்ச்சியாகப் பேசப்பட்டு வருகிறது. இதேவேளை ஹற்றனுக்கும் கொட்டக்கலைக்கும் இடைப்பட்ட ஒரு பகுதியிலே நெடுஞ்சாலைகள் அமைச்சுக்குச் சொந்தமான கட்டிடத்தோடுகூடிய ஓர் இடம் காணப்படுகின்றது. நான் தனிப்பட்ட முறையிலே கௌரவ உயர் கல்வி அமைச்சர் அவர்களை நேற்றுச் சந்தித்து இதுகுறித்து உரையாடியிருந்தேன். நெடுஞ்சாலைகள் துறைக்கும் பொறுப்பாக இருக்கின்ற கௌரவ அமைச்சர் அவர்கள் அந்த இடத்தைத் தற்காலிகமாகத் திறந்த பல்கலைக்கழகத்தின் கற்கைநெறிக்கான நிலையத்துக்கு வழங்கினால், அது எதிர்காலத்திலே திறந்த பல்கலைக்கழகத்தின் கற்கை நெறிக்குரிய கட்டிடமாக மாறுவதற்கு வாய்ப்பாக அமையுமென நான் எதிர்பார்க்கின்றேன்.

கடந்த இரண்டு தினங்களுக்கு முன்பாகப் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவின் தலைவர் மொகான் டி சில்வா அவர்கள் மரபு சார்ந்த பல்கலைக்கழகங்களில் வெளிவாரி மாணவர்களைக் குறைத்து அவர்களையும் திறந்த பல்கலைக்கழகத்தினூடாக இணைத்து அவற்றினூடாகவே இனி வெளிவாரிக் கற்கைநெறிகளும் மேற்கொள்ளப்பட வேண்டுமென்ற தீர்மானத்தை எடுத்திருக்கின்றார். இப்போதைய நிலையில் பெருந்தோட்டப் பாடசாலைகளில் ஆசிரியர்களாக இருக்கின்ற பலர் வெளிவாரியாக இந்தப் பல்கலைக்கழகங்களினூடாக முதற்பட்டத்தையோ அல்லது முதுமாணிப் பட்டத்தையோ பெற்றுக்கொள்கின்ற மரபுதான்

காணப்படுகின்றது. எனவே, இந்தத் திறந்த பல்கலைக் கழகத்தின் கற்கைநெறிக்கான கட்டிடத்தையாவது அமைத்துக் கொடுக்கின்ற பட்சத்தில், குறைந்தபட்சம் அவர்களுக்கான ஒரு கற்கைநெறி நிலையமாவது அந்தப் பிரதேசத்தை மையப்படுத்தி அமைவதாக இருக்குமென்று கூறுகின்றேன். இந்தச் சந்தர்ப்பத்திலே எனது கோரிக்கைக்குச் சாதகமான பதிலை கௌரவ அமைச்சர் அவர்கள் எனது உரையின் பின்னர் வழங்குவாரென நான் நினைக்கின்றேன். இந்தக் கட்டிடம் தொடர்பில் போதுமான தகவல்களையும் திறந்த பல்கலைக்கழகத்தின் ஆலோசனைகளையும் பெற்றுக் கொடுப்பதற்கு மாவட்டத்தின் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையிலே நான் தயாராக இருக்கின்றேன் எனக்கூறிக் கொண்டு, இந்த விவாதத்திற்குச் சம்பந்தமில்லாத இன்னொரு விடயத்தையும் இந்தச் சந்தர்ப்பத்திலே முன்வைக்கலாமென்று நினைக்கின்றேன்.

கடந்த இரு நாட்களாகப் பத்திரிகைகளிலே பிரபல்யமாகக் குறிப்பிடப்படுகின்ற விடயம் என்னவெனில், புசல்லாவை இளைஞனின் மரணம் தொடர்பாக மலையகப் பாராளுமன்ற உறுப்பினர்கள் மௌனமாக இருக்கின்றார்கள் என்பதாகும். உண்மையிலே அன்றைய நாளில் அந்தச் சம்பவம் இடம்பெற்ற காலைப்பொழுதில் உடனேயே, எமது தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் மனோ கணேசன் அவர்களின் அறிவுறுத்தலுக்கமைய அமைச்சர் திகாம்பரம் அவர்களும் கண்டி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் வேலு குமார் அவர்களும் ஸ்தலத்திற்கே சென்று அந்தப் பிரச்சினை தொடர்பாக உரிய அதிகாரிகளுடன் கலந்துரையாடி, அங்கே ஏற்படவிருந்த பெரும் கலவரத்தை நிறுத்திச் சுமுகமான ஒரு சூழ்நிலையை உருவாக்கினர். அதனை ஊடகங்கள் பரவலாகப் பேசியிருந்தன. அதேநேரம் அடுத்த தினத்தில், அதாவது நேற்று முன்தினம், இந்தப் பாராளுமன்றத்திலே நிலையியற் கட்டளைகளின் கீழுள்ள அதிகாரங்களின் அடிப்படையில் சிரேஷ்ட பாராளுமன்ற உறுப்பினர் கௌரவ தினேஷ் குணவர்தன அவர்கள் முன்வைத்த கேள்வியை அடுத்து, சட்டமும் ஒழுங்கும் அமைச்சர் கௌரவ சாகல ரத்நாயக்க அவர்கள் உரிய நடவடிக்கை மேற்கொள்ளப் படுமெனப் பதிலளித்திருந்தார். இதுபோன்ற பல கேள்விகளை மலையக மக்கள் குறித்து முன்வைத்து எமக்கு ஆதரவாகக் குரல் கொடுத்துக்கொண்டிருக்கும் சிரேஷ்ட பாராளுமன்ற உறுப்பினர் கௌரவ தினேஷ் குணவர்தன அவர்களுக்கு நான் இந்த நேரத்திலே நன்றி கூறக் கடமைப்பட்டுள்ளேன். நான் பாராளுமன்ற உறுப்பினராக இங்கு வருவதற்கு முன்பு அல்லது பாராளுமன்ற உறுப்பினராகிய பின்பு பிரதேச சபைகள் சட்டம் பெருந்தோட்டப் பகுதிகளுக்குச் சேவையாற்ற முடியாத நிலைமையில் இருக்கின்றது என்பதை நாங்கள் பிரேரணையாக முன்வைப்பதற்கு முதல் கடந்த ஆட்சிக்காலத்தில்கூட ஒரு தெரிவுக்குழு அமைக்கப் பட்டிருந்தது. அந்த நேரத்தில் அந்தத் தெரிவுக்குழுவினூடாக பிரதேச சபைகள் சட்டத்தைத் திருத்துவதற்குக் கௌரவ தினேஷ் குணவர்தன அவர்கள் முன்னின்று செயற்பட்டதை நான் இந்தச் சந்தர்ப்பத்தில் ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

அதேபோல் நாங்கள் ஆளுங்கட்சி உறுப்பினர்களாக இருப்பதால் எங்களுக்கு உரையாற்ற மிகக் குறைந்தளவு நேரம் கிடைக்கின்ற சந்தர்ப்பத்தில், நாங்கள் எழுப்பவேண்டிய கேள்விகளை அவரூடாக முன்வைக்கக் கோரி அவரை அணுகுகின்றபோது அவற்றை இந்தச் சபையில் முன்வைக்கின்ற பெருந்தன்மையைக் கௌரவ தினேஷ் குணவர்தன அவர்கள் கொண்டிருக்கின்றார். அத்தகைய ஒரு முன்மொழிவை தினேஷ் குணவர்தன போன்ற சிரேஷ்ட பாராளுமன்ற உறுப்பினர்கள் முன்வைக்கின்றபோது அதனைப் பெரிதாகப் பேசுகின்ற இதே ஊடக நண்பர்கள், மலையகம் சார்ந்த விடயங்கள் மலையகம் சார்ந்த பாராளுமன்ற உறுப்பினர்களால் பேசப்படுகின்றபோது அதற்கும் முக்கியத்துவம் கொடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். இவ்வாறான சந்தர்ப்பங்களில் மலையக விடயங்களும் தேசிய விடயங்கள் என்ற அடிப்படையில், இத்தகைய உயிரிழப்புக்கள், கலவரங்கள் என்பவற்றுக்கு முக்கியத்துவம் கொடுப்பதுபோல் மலையக மக்கள் சார்ந்து அவர்களின் உரிமை சார்ந்ததாக முன்வைக்கப்படுகின்ற பிரச்சினைகள் இந்தப் பாராளுமன்றத்தில் எழுப்பப்படும்போதும் ஊடகங்கள் இத்தகைய அக்கறையைச் செலுத்தவேண்டுமென விநயமாகக் கேட்டுக்கொண்டு வாய்ப்புக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 4.11]

**ගරු ෂෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන අවස්ථාවේ මටත් අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. ඒ එක්කම, ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විශ්‍රාම යැමේ සීමාව සම්බන්ධයෙන් තිබුණු ගැටලුව නිරාකරණය කරන්න අවශ්‍ය කටයුතු කිරීම ගැන.

අපි අද මේ අවස්ථාව ගත්තොත්, විශ්වවිද්‍යාල පද්ධතිය දැවැන්ත අර්බුද රාශියකට මුහුණ පා තිබෙන අවස්ථාවක්. විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්න අපේ සහෝදර සහෝදරියන්ගේ ගැටලු නිරාකරණය කරගන්න සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියම පාරට ඇවිල්ලා රජයත් එක්ක විශාල අරගළ කරන යුගයක් තමයි මේ. හැම විශ්වවිද්‍යාලයකම වාගේ අට්ටාල ගහගෙන, කොළඹ කොටුව ආදී ප්‍රදේශවල අට්ටාල ගහගෙන ඔවුන් අරගළ කරනවා. අනෙකුත් සෑම ගැටලුවකටම වාගේ මේ ආණ්ඩුව විශ්වවිද්‍යාල සිසුන්ගේ ප්‍රශ්නවලටත් ඇහුම්කන් නොදෙන තත්ත්වයකට අද මේ රට තල්ලු කරගෙන ගිහිල්ලා තිබෙනවා. මේක අපේ රටේ අනාගතයේ දරුණු ගැටලුවක් බවට පත්වෙන්න පුළුවන් කියලා අපි හිතනවා. ඒ නිසා රජයක් හැටියට මේ ප්‍රශ්නවලට වහාම මැදිහත් වෙලා, මේ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න ටික විසඳලා, අපේ රටේ අනාගතය, අධ්‍යාපනය, විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය ආරක්ෂා කරගෙන ඉදිරියට යන්න ඕනෑ. එහෙම කරන්න නම්, මේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා උත්තර ලබාදීම රජයේ වග කීමක් කියලා මා සලකනවා.

විශේෂයෙන්ම මහාමාර්ග ක්ෂේත්‍රයත්, උසස් අධ්‍යාපනය කියන පුළුල් ක්ෂේත්‍රයත් යන ක්ෂේත්‍ර දෙකම ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාට භාරදීම නිසා, උසස් අධ්‍යාපනයේ තිබෙන ගැටලු විසඳීමට අවධානය යොමු කරන්න එතුමාට කාලය නැතුව ඇති. ඒ නිසා මෙවැනි අමාත්‍යාංශ එකට ගෙනයනවාට වඩා වෙන වෙනම ගෙනයනවා නම් වඩාත් සුදුසුයි කියන යෝජනාව අපි කරනවා. අනාගතයේදී රජය මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

අද අපි දන්නවා, අපේ රටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සියයට 18ක ප්‍රමාණයක් තමයි විශ්වවිද්‍යාල වරම් ලබන්නේ. සිසුන් 150,000ක් ගත්තාම, පසු ගිය අවුරුද්ද වෙනකල් 25,000යි වාර්ෂිකව විශ්වවිද්‍යාල වරම් ලැබුවේ. එම ප්‍රමාණය 25,000 දක්වා වැඩි වුණේ කොහොමද කියලා අපි සියලු දෙනාම දන්නවා. 13,500ක්

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

හැටියට තිබුණු වාර්ෂිකව විශ්වවිද්‍යාල වරම් හිමිවන ශිෂ්‍ය සංඛ්‍යාව, පසු ගිය රජයේ කාර්ය භාරය තුළ 25,000 දක්වා වැඩි වුණා. ඒ එක්කම මේ අවුරුද්දේ ඒ සංඛ්‍යාව තව 2,200කින් වැඩිවෙලා තිබෙනවා. රජයට එම වැඩිවීම කරන්න පුළුවන් වුණේ විශේෂයෙන්ම අපේ පසු ගිය රජය විසින් තාක්ෂණික විෂය ධාරාව හඳුන්වාදීම නිසායි. අපි තාක්ෂණික විෂය ධාරාව අලුතින් හඳුන්වා දුන්නා. 2013 ජූලි මාසයේ 15 වන දා තමයි තාක්ෂණික විෂය ධාරාව හඳුවා දුන්නේ. එය හඳුන්වා දීමේ දිනය ඓතිහාසික දිනයක්. මොකද, එවකට ජනාධිපතිවරයා වශයෙන් සිටි මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, විෂය භාරව හිටපු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් කරපු ඉල්ලීමට අනුව - ඒ යෝජනාවට අනුව - එක්සත් ජාතීන්ගේ සංවිධානය සෑම වර්ෂයකම ජූලි 15 "World Youth Skills Day" හැටියට ඔවුන්ගේ කැලැන්ඩරයට ඇතුළු කරගත්තා. "World Youth Skills Day" හැටියට ඔවුන් අපේ රටේ යෝජනාවක් ඇතුළත් කරගෙන, බැන් කී මූන් මහතා මේ අවුරුද්දේ ජූලි මාසයේ 15වන දා එම දිනය සමරද්දී, මහා අභිමානයෙන් ඒ ගැන කථා කරද්දී, මේ ලෝකය අනාගතයට ගමන් කිරීම පිළිබඳව කථා කරද්දී, අවාසනාවකට ඒ දිනය ලබා දුන් අපේ රට නිහඬව සිටියා. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

මේ තාක්ෂණික විෂය ධාරාව හඳුන්වා දීමත් එක්කම අපේ රටේ අධ්‍යාපනයේ පරිවර්තනයක් සිදුවුණා. ඒ මඟින් අපේ රටේ අධ්‍යාපනය අලුත් දිසාවකට ගමන් කළා. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් රටේ නිර්මාණය වෙමින් පැවතුණා. ඒ යටතේ මුලින්ම පාසල් දාහක් තෝරා ගෙන, ඒ පාසල් දාහේ තාක්ෂණික විද්‍යාගාර පිහිටුවන්න අවශ්‍ය කටයුතු කළා. පසු ගිය රජය එවැනි විද්‍යාගාර 330කට ආසන්න ප්‍රමාණයක් ඉදි කළා. අවාසනාවකට, මේ රජය බලයට පත්වීමත් සමඟම ඒ ව්‍යාපෘතිය අතරමඟ නැවතිලා තිබෙනවා. ඒ නිසා රජයෙන් අපි ඉල්ලීමක් කරනවා, ඒ ආධාර දීපු රටවල් එක්ක කථා කරලා, ඒ ආධාර දීපු කණ්ඩායම් එක්ක කථා කරලා, නැවත මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා තාක්ෂණික විෂය ධාරාව ප්‍රචලිත කිරීමට කටයුතු කරන්න කියලා. දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ආරම්භ කළ ඒ වැඩසටහනට අනුව ඉතිරි විද්‍යාගාරවලත් පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියට 27,000ක් පමණ පිරිසක් වර්ෂයකට ඇතුළත් වෙනවා. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගන්න නොහැකි වූ කණ්ඩායමෙන් 15,000ක පමණ පිරිසක් උසස් අධ්‍යාපනය ලැබීම සඳහා විදේශගත වෙනවා. ඉතිරිවන දරුවන් සඳහා අපේ පසු ගිය රජය විසඳුමක් යෙදුවා. ඒ අනුව, මේ රටේ එක දිස්ත්‍රික්කයකට එක බැගින් "විශ්වවිද්‍යාල විද්‍යායතන" 25ක් හඳුන්වා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. එහිදී මුලින්ම විශ්වවිද්‍යාල විද්‍යායතන 5ක් මේ රටේ ක්‍රියාත්මක වුණා. පසු ගිය අවුරුද්දේ ඉඳලා කෑගල්ලේ පිහිටි විශ්වවිද්‍යාල විද්‍යායතනයත් ක්‍රියාත්මක වෙනවා. මේ වන විට ඒ විශ්වවිද්‍යාල විද්‍යායතන 6ක් ක්‍රියාත්මක තත්ත්වයේ තිබෙනවා. අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරන කොට කිව්වා, ඉතිරි විශ්වවිද්‍යාල විද්‍යායතන 19ත් සම්පූර්ණ කරන්න අවශ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කරනවාය කියලා. හැබැයි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිදු වැඩසටහනක මේ විශ්වවිද්‍යාල විද්‍යායතන සම්බන්ධයෙන් සඳහන් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ විද්‍යායතන ක්‍රියාත්මකවීම නැවතිලායි තිබෙන්නේ. අපි ඒ විද්‍යායතන සඳහා 6,000ක් දක්වා බඳවා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලායි තිබුණේ. ඒ නිසා, මෙන්න මේ ක්‍රියාදාමයට රජය අවධානය යොමු කරන්න ඕනෑ. එහෙම නැතිව, වම්පික රණවක ඇමතිතුමා යෝජනා කරපු දේ ක්‍රියාත්මක කළොත් [බාධා කිරීමක්] නැහැ, මම දන්නේ නැහැ. ඔබතුමා රජය නියෝජනය කරන්නේ. පාඨලී චම්පික රණවක ඇමතිතුමා වග කිවයුතු ඇමතිවරයකු හැටියටත්, ඒ වාගේම මේ රටේ නිදහස් අධ්‍යාපනය බුක්ති විඳපු කෙනකු හැටියටත් කරපු යෝජනාව හරහා මේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල පෞද්ගලීකරණය කිරීමේ පළමුවැනි වෙඩි මුරයද මේ තියන්න යන්නේ කියන සැකය අප තුළ තිබෙනවා. මොකද, තමුන්නාන්සේලාගේ රජයට පෞද්ගලීකරණය පිළිබඳව තිබෙන්නේ මහා ලොකු විශ්වාසයක්. අපේ රටේ ඉතිහාසයේ රාජ්‍ය දේපොළ පෞද්ගලීකරණය කරලා තිබෙනවා නම්, වැඩියෙන්ම එය කළේ එක්සත් ජාතික පක්ෂ රජයයි. අද තිබෙන්නේත් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයක්. ඒ නිසා අපි ඉතාම ඕනෑකමින් ඉල්ලනවා, මුදල් ගෙවලා අපේ සහෝදර සහෝදරියන් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයක් ගැන හිතන්නවත් එපා කියලා. එසේ නොකර දැනට තිබෙන විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරන්න. අවශ්‍ය නම් පෞද්ගලික විශ්වවිද්‍යාල මේ රටට අරගෙන එන්න. ඒවා නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදන්න. ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳ පරීක්ෂණ කරලා, ඒ සඳහා නිවැරදි ක්‍රමවේදයක් නිර්මාණය කරන්න. එවැනි ක්‍රමවේදයක් නිර්මාණය නොකර, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට මුදල් ගෙවා දරුවන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයක් යෝජනා කිරීම පිළිබඳව චම්පික රණවක ඇමතිතුමාට අපගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ එක්කම එතුමා ප්‍රකාශ කළා, විශ්වවිද්‍යාලයට ඇතුළුවන සුදුසුකම් ගැන නැවත සලකා බැලීමක් කළ යුතුයි කියලා. ඒකේ ගැටලුවක් නැහැ, සුදුසුකම් ගැන නැවත සලකා බැලීමක් කරන්න. හැබැයි, ඒ කියන යෝජනාව පිළි ගත්තොත්, ඒ කියන ආකාරයට සුදුසුකම් නැවත සලකා බැලීමක් කළොත්, දැනට ඇතුළත් වන 27,000දෙනාටවත් යන්න තිබෙන විශ්වවිද්‍යාල පද්ධතිය වැහෙනවා. එහෙම වුණොත්, අර අවුරුදු දහයකට කලින් තිබුණා වාගේ 13,000ක්, 14,000ක් වාගේ කණ්ඩායමක් විතරක් විශ්වවිද්‍යාල වරම් ලබනවා. මම දන්නේ නැහැ, මොන පදනම උඩ එතුමා මේ කාරණය කිව්වාද කියලා. හැබැයි, ඒ ප්‍රකාශය කළේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළයි. ඒ සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම අවධානය යොමු කරනවා. මේ කාරණය මම නැවත නැවතත් කියනවා. මේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය පෞද්ගලීකරණය කරන්න මාන බලමින් ඉන්න ආණ්ඩුවක්ද කියන සැකය අප තුළ තිබෙනවා. අද උසස් අධ්‍යාපන ඇමතිතුමා ඉදිරියේ පාඨලී චම්පික රණවක ඇමතිතුමා මෙවැනි යෝජනාවක් කිරීම තුළින් ඒ සැකය තවත් තීව්‍ර වෙනවා.

ඒ ක්‍රියාදාමය කිසිසේත්ම මේ රටේ ක්‍රියාත්මක කරන්න බැරි බව අප විශ්වාස කරනවා. තමුන්නාන්සේලා පෞද්ගලික විශ්වවිද්‍යාල කෙරෙහි අවධානය යොමු කරලා, කාටත් පිළිගන්න පුළුවන් ආකාරයේ විශ්වවිද්‍යාල පද්ධතියක් මේ රටේ නිර්මාණය කරන්න. ඒක තමයි රජයක් තුළින් රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ. එහෙම නැතිව, තමන්ගේ වියදම ආවරණය කරගන්න තිබෙන සම්පත් පෞද්ගලීකරණය කිරීම නොවෙයි ජනතාව බලාපොරොත්තු වන්නේ. තමන්ගේ දූෂණය, නාස්තිය වහගන්න රටේ සම්පත් පෞද්ගලීකරණය කිරීම නොවෙයි ඔවුන් බලාපොරොත්තු වන්නේ. රජයේ සම්පත් රජය විසින් ආරක්ෂා කරගෙන ඉදිරියට යන ගමන්, අලුතින් ආයෝජන ඕනෑ නම් ඒ අය කැඳවලා අලුතින් යමක් කළාට කමක් නැහැ. පසු ගිය මැතිවරණ කාලයේදී කිව්වා නේ, මේ රටට ඕනෑ තරම් ආයෝජකයන් එන්න ඉන්නවා කියා. හැබැයි, මාස 18ක් ගත වුණා. මේ රටට ආපු ආයෝජකයෙක් නැහැ. මේ රටට ඇවිල්ලා අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කරන්න ඉදිරිපත් වුණු ආයෝජකයෙක් නැහැ. මේ මාන බලන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල ටික පෞද්ගලික අංශයට ලබාදෙන්නද කියන සැකය අපට මතු වන්නේ ඒ නිසායි.

විශේෂයෙන්ම මහපොළ ශිෂ්‍යත්ව පිළිබඳව නැවතත් සොයා බැලීමක් කරන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ චෝදනා තිබෙනවා. දැනට මහපොළ ශිෂ්‍යාධාර ලබන සියයට 30ක පමණ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව එය ලබාගත යුතුම පිරිසක්ද කියන එක ගැන එම විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුළේ කථා වෙනවා. ඒ ගැන නැවත සොයා බැලීමක් කරලා, නුසුදුසු අයට එම ශිෂ්‍යත්ව ලැබෙනවා නම්, ඒවා සුදුසු කණ්ඩායමකට ලබා දෙන්න කටයුතු කරන්න. පුළුවන් නම් මේ මහපොළ ශිෂ්‍යාධාරය ලබා දෙන සංඛ්‍යාව ඉදිරියේදී තව වැඩි කරන්න කටයුතු කරන්න කියලා අප ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

විශ්වවිද්‍යාලවල සිටින සිසුන් අද මහ පාරට ඇවිත් සිටින්නේ මහාමාර්ග අමාත්‍යාංශයත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක අමාත්‍යවරයකු යටතට පත්වීම නිසාද කියා මා දන්නේ නැහැ. අද ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කියපු ආකාරයට විශ්වවිද්‍යාල සිසුන් සමඟ එතුමා සාකච්ඡා කරන්නේ නැහැ. ඒ ඇතිවුණු සිද්ධීන් පිළිබඳව එතුමා ඉතාම දරදඬු ආකාරයට තමයි පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශ නිකුත් කළේ. තරුණ කණ්ඩායම් කියන්නේ අලුත් ජවයක්, අලුත් සිතුම් පැතුම් එක්ක යන කණ්ඩායමක්. ඒ නිසා ඒ තරුණ ජීවිතත් එක්ක සෙල්ලම් කරන්න එපා කියලා අපි රජයට කියනවා. ඔවුන්ට අවශ්‍ය කාලය වෙන් කරන්න. ඔවුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න. රටේ ජනතාව බලය දීලා තිබෙන්නේ තමන්ට ඕනෑ දෙය කරන්න නොවෙයි. ජනතාව බලය දීලා තිබෙන්නේ මේ රටට ගැළපෙන දෙයක්, මේ රටට හරි යන දෙයක් නිර්මාණය කරලා ඒ ක්‍රමවේදය ඉදිරියට ගෙන යන්නයි. ඒ නිසා මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය අනිවාර්යයෙන්ම පුළුල් වෙන්න ඕනෑ. ඒ පුළුල් වීම හරහා එක පැත්තකින් විදේශ රටවලට අපේ මුදල් ප්‍රමාණයන් ගලා යාම නවතිනවා.

අනෙක් පැත්තෙන් මේ රට තුළම අපේ බුද්ධිමතුන් නිර්මාණය වෙනවා. හැබැයි, ඒ සඳහා අවශ්‍ය නිවැරදි පසු බිම මේ රටේ නිර්මාණය වුණොත් විතරයි එහෙම වන්නේ. රජය ඒ සඳහා අවධානය යොමු කරයි කියලා අප බලාපොරොත්තු වෙනවා. විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරද්දී, එය නිවැරදි තැන්වල පුළුල් කරන්න කියලා අප ඉල්ලීමක් කරනවා. කුලියාපිටිය වෛද්‍ය පීඨය සම්බන්ධයෙන් මත ප්‍රකාශ වුණා. එම නිසා නිවැරදි තැන්වල ඒ පුළුල් කිරීම සිදුකරන්න. පෞද්ගලිකව, එක එක්කෙනාට ඕනෑ ආකාරයට ඒ දේවල් සිදු නොකර, පොදුවේ මහ ජනතාවගේ යහපත සඳහා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[பி.ப. 4.25]

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பல்கலைக்கழகம் தொடர்பான இன்றைய விவாதத்திலே பேசுவதற்கு வாய்ப்புக் கொடுத்தமைக்காக நன்றி. இந்த 21ஆம் நூற்றாண்டில் பல்கலைக்கழகங்கள் உருவாக்கும் பட்டதாரிகள் நிச்சயமாக உலகத் தரத்திற்கேற்றவர்களாகவும் தொழிற் சந்தையிலே தொழில் வாய்ப்பைப் பெற்றுக்கொள்வதற்குத் தகுதியுடையவர்களாகவும் இருக்கவேண்டிய ஒரு சூழ்நிலையி ருக்கின்றது. இந்த நிலையிலே எமது பல்கலைக்கழகங்கள் எந்தளவுக்கு உலகத் தரத்திற்கும் தொழில் வாய்ப்பிற்கும் ஏற்ற வகையிலே பட்டதாரிகளை தயார் செய்கின்றன என்பது உண்மையில் கேள்விக்குறியாகத்தான் இருக்கின்றது.

இந்த நேரத்திலே மூன்றாம்நிலைக் கல்வி, அதாவது NVQ என்று சொல்லப்படுகின்ற National Vocational Qualification என்ற அந்தக் கற்கைநெறி மிகவும் சிறப்பாக இந்த நாட்டிலே தற்பொழுது நடைபெற்றுக்கொண்டிருக்கின்றது என்பதை இந்த இடத்திலே நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். இந்த NVQ என்பது 7 தரங்களைக் கொண்டிருக்கின்றது. NVQ Levels 1, 2, 3, 4 என்பன certificate level ஆகவும் NVQ Level 5 என்பது diploma level ஆகவும் NVQ Level 6 என்பது higher diploma ஆகவும் NVQ Level 7 என்பது equivalent to degree ஆகவும் கருதப்படுகின்றது. இவ்வாறு ஒரு சிறந்த கட்ட மைப்பை உருவாக்கித் தொழிற்றுறை சார்ந்ததான கற்கைகளை திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில் பயிற்சி அமைச்சு வழங்கிக்கொண்டிருக்கின்றது. இவ்வாறு உலகத்தரத்திற்கு ஏற்றவாறும் உள்நாட்டிலும் சரி, வெளிநாட்டிலும் சரி, இலகுவாகத் தொழில் வாய்ப்பைப் பெற்றுக்கொள்ளக் கூடியளவுக்கும் நாளைய உலகின் பட்டதாரிகளை உருவாக்க வேண்டிய மிக முக்கியமான பொறுப்பில் இன்று பல்கலைக் கழகங்கள் இருக்கின்றன.

இன்று பல்கலைக்கழகங்களில் உள்வாரியாக special degree - விசேட பட்டம், general degree, மற்றும் வெளிவாரி யாக general degree என்பன வழங்கப்படுகின்றன. அதே போன்று வெளிநாட்டுப் பல்கலைக்கழகங்கள் வழங்குகின்ற பட்டப்படிப்புக்களும் இருக்கின்றன. இலங்கையிலே வருடாந்தம் இரண்டு இலட்சத்திற்கு மேற்பட்ட மாணவர்கள் க.பொ.த. உயர்தரப் பரீட்சைக்குத் தோற்றுகின்றார்கள். அதிலே ஏறக்குறைய 25,000 மாணவர்கள்தான் உள்வாரியாகப் பல்கலைக்கழகங்களுக்குத் தெரிவாகின்றார் கள். அவர்கள் இரவு பகலாகக் கஷ்டப்பட்டுப் படித்துத் திறமைச் சித்தி, விசேட சித்தி, அதிவிசேட சித்திகளைப் பெற்று அதனடிப் படையில் உள்வாங்கப்பட்டு, அங்கே ஒரு வருடம் 3 பாடங்களைப் படித்து பொதுவான ஒரு கற்கையை மேற் கொண்டு, பின்பு ஒரு பாடத்தை special degree - விசேட பட்டக் கற்கையாக - 3 வருடங்கள் கற்று, மொத்தத்தில் 4 வருடங்கள் விசேட கற்கைகளுக்காக செலவழித்து அதன் இறுதியில் ஓர் ஆய்வையும் மேற்கொள்கிறார்கள். ஆனால், அவ்வாறு விசேட கற்கையைப் பூர்த்திசெய்து வெளியேறுகின்ற விசேட பட்டதாரிகள் உண்மையிலே இந்த நாட்டில் அந்தக் குறிப்பிட்ட துறை சார்ந்து வேலைவாய்ப்பு களில் உள்வாங்கப் படுவதில்லை. உதாரணமாக, தமிழ், புவியியல், பொருளியல் போன்ற துறைகளில் விசேட கற்கையை மேற்கொண்டவர்கள் இன்று அந்தத் துறை சார்ந்ததாக அல்லாமல் பிரதேச செயலகங்களிலும் பிரதேச சபைகளிலும் மற்றும் இதர சேவைகளிலும் ஈடுபட்டுச் சம்பந்தமில்லாத வேலைகளைச் செய்துகொண்டிருக்கின்ற ஓர் அவல நிலைதான் இங்கு இருக்கின்றது.

அண்மையில் கிழக்கு மாகாண சபையினால் சங்கீதம், நடனம், சித்திரம், நாடகமும் அரங்கியலும் போன்ற பாடங் களுக்கான ஆசிரியர் தேர்வுக்கு நுண்கலைப் பட்டதாரிகளிடம் விண்ணப்பங்கள் கோரப்பட்டிருந்தன. ஆனால், தமிழ்மொழி மூலப் பட்டதாரிகளுக்கான விண்ணப்பங்கள் கோரப் படவில்லை. 2012ஆம் ஆண்டிலிருந்து இற்றைவரை

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

இத்துறைகளிலே 4 வருட விசேட கற்கைகளை மேற்கொண்ட பட்டதாரிகள் கிட்டத்தட்ட 282 பேர் இருக்கிறார்கள். ஆனால், அந்தத் துறைசார்ந்த ஆசிரியர் சேவைக்கு அவர்களுக்கான விண்ணப்பங்கள் கோரப்படவில்லை. எனவே, அவர்களுடைய நிலை என்ன? இத்துறைகளில் விசேட கற்கையை மேற்கொண்டவர்கள் இன்று வீதியில் நிற்கவேண்டியிருக்கின்றது; அல்லது அவர்களுடைய துறையோடு சம்பந்தமில்லாமல் பிரதேச செயலகங்கள் போன்றவற்றில் ஓர் எழுதுவினைஞராகவோ அல்லது அந்தத் துறைக்குச் சம்பந்தமில்லாத இன்னொரு வேலையையோ செய்ய வேண்டிய நிலையிருக்கின்றது. அதாவது, அவர்களின் படிப்புடன் சம்பந்தமில்லாத வேறொரு துறையில் தொழில் செய்யவேண்டிய நிலைமை. ஆகவே, பல்கலைக்கழகத்தில் விசேட கற்கைகளை மேற்கொள்கின்ற மாணவர்களுக்கு அவர்களுடைய துறைசார்ந்து அவர்களை மேலும் வளர்த்துக் கொள்ளக்கூடிய முறையில் வேலைவாய்ப்பைக் கொடுக்கின்ற சூழலை இந்த அரசு நிச்சயமாக உருவாக்க வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், க.பொ.த. உயர்தர - GCE A/L - பரீட்சை முடிவுகள் வெளிவந்து 1 - 1½ வருடங்களாக பல்கலைக்கழக அனுமதிக்காகவும் கல்வியியற் கல்லூரி அனுமதிக்காகவும் அதிகளவு மாணவர்கள் காத்திருக்கவேண்டிய சூழ்நிலையிருக்கின்றது. இங்கு பேசிய கௌரவ உறுப்பினர் பந்துல குணவர்தன அவர்கள், "வெளிநாட்டுப் பல்கலைக்கழகங்களில் 25 வயதில் அவர்கள் PhD பட்டம் பெறுகிறார்கள்; ஆனால், எமது பல்கலைக்கழகங்களிலே 25 வயதிலே அவர்கள் முதலாவது பட்டத்தைப் பெறுவதுகூட மிகவும் கஷ்டமான சூழ்நிலையாக இருக்கின்றது" என்று கூறினார். ஆகவே, கால இழுத்தடிப்புகளைக் குறைத்து GCE A/L பெறுபேறுகள் வெளியானவுடன் குறிப்பிட்ட ஒருசில மாதங்களுக்குள் விரைவாக அவர்கள் பல்கலைக்கழகம் செல்லக்கூடிய சூழ்நிலை உருவாக்கப்பட வேண்டும்.

அதுமாத்திரமல்ல, இந்தப் பாராளுமன்ற வளாகத்தை எடுத்துக்கொண்டால் மொழிபெயர்ப்புத்துறையில், குறிப்பாக தமிழ்மொழி சார்ந்து இத்துறையில் ஈடுபடுபவர்கள் மிகவும் குறைவாகத்தான் இருக்கிறார்கள். அவர்கள் பாராளுமன்ற அமர்வு நடைபெறும்போது உரைபெயர்ப்பில் ஈடுபட வேண்டும்; குழுக் கூட்டங்களிலும் அவர்கள் தங்களை ஈடுபடுத்த வேண்டியதாக இருக்கின்றது. ஆகவே, இவ்வாறான பற்றாக்குறைகளை நிவர்த்தி செய்யும் வகையில் நிச்சயமாகப் பல்கலைக்கழகங்களில் மொழிபெயர்ப்புத் துறைசார்ந்து விசேட கற்கைநெறிகளை ஆரம்பித்து, அத்துறையில் அதிகளவான மாணவர்களை உள்வாங்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அத்துடன், இன்று பாடசாலை மட்டத்தில் தொழில்நுட்பப் பாடங்கள் கொண்டுவரப்பட்டிருக்கின்றன. அது பாராட்டுக்குரியது. ஆனால், அந்த மாணவர்களுக்கு கற்பிக்கக்கூடிய வளவாளர்கள் - அந்தத் துறையில் பட்டம் பெற்ற ஆசிரியர்கள் - போதிய அளவில் இல்லை. அதனால் பாதிக்கப்படுபவர்கள் மாணவர்கள்தான். அவர்கள் 3-4 பிரிவு - batch களுக்குப் படிப்பித்துத்தான் தாங்கள் கற்றுக்கொள்ள வேண்டிய சூழ்நிலையிருக்கின்றது. ஆகவே, முதலாவதாக இந்த நாட்டில் இல்லாவிட்டாலும் அயல் நாடுகளிலிருந்தாவது கொண்டுவந்து இந்த தொழில்நுட்பத்துறை சார்ந்த வளவாளர்களை நிச்சயமாக நாங்கள் ஈடுபடுத்த வேண்டும். அப்பொழுதுதான் இந்த நாட்டில் தொழில்நுட்பத்துறை சார்ந்த சிறந்த மாணவர்களை உருவாக்க முடியும்.

இன்று பல்கலைக்கழகங்களிலே அநேகமான கற்கைகள் ஆங்கில மொழியில் நடைபெறுகின்றன. ஆனால் கிராம மட்டத்திலிருந்து பல்கலைக்கழகங்களுக்குத் தெரிவாகின்ற பெருந்தொகையான மாணவர்கள் போதிய ஆங்கில அறிவில்லாமல் வருகிறார்கள். அவர்கள் ஆங்கில மொழியிலே தங்களுடைய பட்டப் படிப்பை - பட்ட மேற்படிப்பை தொடரவேண்டிய சூழல் இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
Please, give me one minute more.

போதிய ஆங்கில அறிவில்லாமல் பல்கலைக்கழகம் நுழைகின்ற அவர்களுக்குச் சிலவேளைகளில் தங்களுடைய கற்கையை இடைநடுவில் நிறுத்தவேண்டிய நிலைகூட ஏற்படுகின்றது. ஏன், சிலர் தற்கொலைகூடச் செய்துகொண்டிருக்கிறார்கள். ஆகவே, சிறந்த முறையில் ஆங்கிலத்தையும் தகவல் தொழில்நுட்பத்தையும் பாடசாலை மட்டத்திலிருந்தே வழங்க வேண்டும். குறிப்பாக, கிராம மட்டங்களில் வழங்க வேண்டும். கிராமப்புறங்களில் 40 – 45 வருடங்களாக ஆங்கில ஆசிரியர்கள் இல்லாமல் இயங்குகின்ற பாடசாலைகள் இன்றும் இருக்கின்றன. பாடசாலை மட்டங்களிலிருந்து இதைச் சரியாகச் செய்யும்பொழுதுதான் பல்லைக்கழகங்களில் ஒரு மாற்றத்தை நிச்சயமாகக் கொண்டுவர முடியுமென்பதனைம் இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன்.

கிழக்கு மாகாணம் சுற்றுலாத்துறைக்குப் பிரபல்யமான ஒரு மாகாணமாகும். அந்த வகையில், எமது கிழக்குப் பல்கலைக் கழத்தில் சுற்றுலாத்துறை மற்றும் சட்டத்துறை சார்ந்த கற்கைகளை ஆரம்பிக்க வேண்டும். அத்தோடு இந்து நாகரிகத்தை ஒரு தனிப்பீடமாகக் கொண்டு வருவதற்கான நடவடிக்கைகளையும் நிச்சயமாக உயர்கல்வி அமைச்சு எடுக்கவேண்டும். மேலும், எமது கிழக்கு மாகாணம் விளையாட்டுத்துறையிலும் மிகவும் முக்கியமான ஒரு மாகாணமாகும். எனவே, விளையாட்டுத்துறை சார்ந்த டிப்புளோமா பட்ட மேற்படிப்புக்களையும் கிழக்கு பல்கலைக் கழகத்தில் உருவாக்கித் தர வேண்டும். 1981ஆம் ஆண்டு உருவாக்கபட்ட அப்பல்கலைக்கழகம் புகழ்பூத்த ஒரு பல்கலைக்கழகமாகும். 35 வருடமாக கிழக்கு மாகாணத்திலே இயங்குகின்ற அந்த பல்கலைக்கழகத்திலே இவ்வாறான கற்கைநெறிகளை நிச்சயமாக உயர் கல்வி அமைச்சு - இந்த நல்லாட்சி அரசு - கொண்டுவரவேண்டுமென்பதையும் கூறிக்கொண்டு, வாய்ப்புக்கு நன்றி கூறி, அமர்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මුජිබූර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயில்வாகனம் திலகராஜா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON. MYLVAGANAM THILAKARAJAH *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මැතිතුමා, කථාව කරන්න.

[අ.භා. 4.35]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මමත් එක්කම උපාධිය ලබා ගත් ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ උසස් අධ්‍යාපනය ගැන කථා කරන්න ලැබීම වාසනාවක් කොට මා සලකනවා. අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පත මඟින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විශාල සේවයක් වනවා. මෙය සෑහෙන කාලයක් තිස්සේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය බලාගෙන හිටපු දෙයක්. අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ලබා දුන් මේ ජයග්‍රහණය වෙනුවෙන්, විශේෂයෙන් මේ වෙලාවේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාට අප ඉතාමත් ස්තුතිවන්ත වනවා. මොකද, එතුමා දුර දැකලා මේ අවස්ථාව ඔවුන්ට ලබා දීම ගැන.

විශ්වවිද්‍යාල ගැන කථා කරන කොට මුලින්ම කිව යුතුයි, මීට දවස් දෙකකට කලින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ "Z" අගයන් නිකුත් කළා. 2015 වර්ෂයේ උසස් පෙළ විභාගයට ලක්ෂ 3ක් පමණ පෙනී සිටියා. ඒ "Z" අගයන් අනුව, 155,550ක් -සියයට 50ක්- පමණ පිරිසක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මූලික සුදුසුකම් සපුරනවා. ඊට කලින් අවුරුද්දේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා 149,572ක් සුදුසුකම් ලබා ගත්තා. ඒ අනුව මෙවර විශ්වවිද්‍යාල වරම් ලබා ගන්නා පිරිස 27,603ක් වනවා. එය පසු ගිය අවුරුද්දට වඩා 2,208ක වැඩි වීමක්. නොමිලේ අධ්‍යාපනය ලබන විශ්වවිද්‍යාල දරුවන් සඳහා අධ්‍යාපන අයිතිය රැක ගැනීම වෙනුවෙන් කරන අරගළවලදී, එක්සත් ජාතික පක්ෂය කවදත් ඉදිරියෙන්ම හිටියා. ඒ සඳහා ලැබුණු වරප්‍රසාදයක් හැටියට තමයි අපි මෙය සලකන්නේ.

උසස් අධ්‍යාපන ආයතන ගැන කථා කරන කොට අද හුඟ දෙනෙක් කථා කරන මාතෘකාවක් ගැන මමත් මුලින් කථා කරන්න බලාපොරොත්තු වනවා. ඒ පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන. විශේෂයෙන් SAITM ආයතනය ගැන. SAITM ආයතනය ගැන වැරදි මත ගොඩක් අදත් ප්‍රකාශ වුණා. ඒ මතවලට ඇහුම් කන් දෙන කොට මමත් SAITM ආයතනය ගැන මුලින්ම හිතුවේ, "ඇත්තටම මේ ආයතනය අධ්‍යාපනය හරියට ලබා නොදෙන ආයතනයක් දෝ?" කියලා. ඒ සැකය මට තිබුණා. නමුත්, මට ලැබුණා SAITM ආයතනයට ඇතුළත් වෙලා ඉන්න සියලුම ළමයින්ගේ -ළමයින් 900- ලිපිලේඛන අධ්‍යයනය කළාට පස්සේ දැක්කා, ඒ අයගේ උසස් පෙළ ප්‍රතිඵල. ආයතනය පටන් ගන්න කොට තත්ත්වය ගැන නොවෙයි මම කථා කරන්නේ. වත්මන් තත්ත්වය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ උසස් පෙළ ප්‍රතිඵල අතරේ ජීව විද්‍යාව හදාරා නැති එකම ළමයෙක්වත් නැහැ. ඒ කියන්නේ, මෙන්න මේක තමයි SAITM ආයතනයේ වත්මන් තත්ත්වය. SAITM ආයතනයේ අතීතයේ ගැටලු තිබෙන්න ඇති. අතීතයේදී අපිත් දැක්කා සුදුසුකම් සපුරා නැති ළමයින් දෙදෙනෙක්ද, තුන්දෙනෙක්ද හිටියා. ඒ ළමයින් දැන් SAITM ආයතනයේ නැහැ. දැන් ඉන්නේ, නියමිත සුදුසුකම් තිබෙන ළමයි.

මේ නියමිත සුදුසුකම් කියන එකෙන් අවම වශයෙන් නිර්ණායකයක් වශයෙන් උසස් පෙළ විභාගය සමත්, "S" 3ක් ලබාගෙන තිබිය යුතුයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති අපි පසු ගිය දවස්වල දැක්කා, එක්තරා රූපවාහිනී නාලිකාවකදී රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ලේකම්වරයෙක් වන නලින්ද හේරත් කියලා කෙනෙකුගෙන් ඇහුවා, ඔබතුමාගේ GCE (A/L) ප්‍රතිඵල මොකක්ද කියලා ඇසූ බව. මට මතකයි, එතුමා කිව්වේ, "GCE (A/L) ප්‍රතිඵල මතක නැහැ" කියලායි. මම කලින් වතාවකත් පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධයෙන් කථා කළා. GCE (A/L) ප්‍රතිඵල මතක නැහැ කියපු මේ වෛද්‍යවරයා ගැන ලොකු සැකයක් අපිට මතු වෙනවා. අපි එතුමා ගැන විස්තර හෙව්වා. හොයන කොට දැනගන්න ලැබුණා, එතුමා අපොස සාමාන්‍ය පෙළ සමත් වෙලා තිබෙන්නේ කුරුණෑගල මලියදේව විද්‍යාලයෙන් කියා. ඒකත් අපි හරියටම දන්නේ නැහැ. අපිට ලැබුණු ආරංචිය අනුවයි අපි මේ කියන්නේ. අපි මේ අභියෝගය ඒ දොස්තර මහත්මයාට දෙනවා. නමුත් එතුමා උසස් පෙළ හදාරලා තිබෙන්නේ බදුල්ල දිස්ත්‍රික්කයෙන් කියලයි ආරංචිය. ඒ අනුව එතුමාගේ ප්‍රතිඵල "C" 2යි, "S" 2යි කියලා දැනගන්න ලැබුණා. කමක් නැහැ. "C" 2යි, "S" 2යි කියන්නේත් ප්‍රතිඵලයක්.

විශ්වවිද්‍යාල නිර්ණායක අනුව මේ ප්‍රතිඵලයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත් විය හැකියි. එතුමාට ඒ අයිතිය තිබෙනවා. ඒ වාගේම එතුමාට ඒ අයිතිය නිර්භයව ප්‍රකාශ කළ හැකියි. මට මතකයි, අපේ තිබෙන ක්‍රමවේදය අනුව ඒ දවස්වල අපිත් එක්ක GCE O/L කරපු ළමයෙක් නුවරඑළියෙන් university ආ බව. ඒක කෙනෙකුගේ අයිතිය. ඇයි අයිතිය ගැන කියන්න භය වෙන්නේ? ඇත්ත කියන්න භය වෙන්නේ ඇයි? එතුමාට දැන් වුණත් පුළුවන්, එතුමාට අමතක වෙච්ච උසස් පෙළ ප්‍රතිඵල මතක් කරලා කියන්න. නැත්නම්, දැන් අපේ රටේ තොරතුරු දැනගැනීමේ පනතක් තිබෙන නිසා එතුමාගේ විභාග අංකය හරි, National Identity Card number එක හරි අපිට දුන්නොත්, අපිට පුළුවන් විභාග දෙපාර්තමේන්තුවෙන් ඒ තොරතුරු හොයලා ඉදිරිපත් කරන්න. මම මේ කාරණයට ආවේ SAITM ආයතනයේ ඉන්න ළමයින්ගේ ප්‍රතිඵල පිළිබඳව කියන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනයේ ළමයින් අතර ලෝකයෙන්ම 6වැනියා වෙච්ච ළමයෙකුත් ඉන්නවා. ලංකාවෙන් නොවෙයි, ලෝකයෙන්ම 6වැනියා. ඒ වාගේම "A" 3 ගත්ත ළමයි රාශියක් ඉන්නවා.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

මීට කලින් ගරු චම්පික රණවක ඇමතිතුමා කථා කළා. මම හිතනවා, මේක චම්පික රණවක ඇමතිතුමාගේ පෞද්ගලික මතය වෙන්න ඇති කියලා. මේක රජයේ මතය නොවිය යුතුයි. මොකද, එවැනි ළමයින් නැවත බලලා මේ බඳවා ගැනීම් නවත්වන්න කියලා දෙයක් අපිට කරන්න බැහැ. විශ්වවිද්‍යාලයක එහෙම දෙයක් කොහොමද කරන්නේ? මේ විශ්වවිද්‍යාලය පසු ගිය රජයෙන් අනුමත කරලා තිබෙනවා. පසු ගිය රජයෙන් අනුමත කරපු විශ්වවිද්‍යාල ආයතනයක් -institute එකක්- අපිට බැහැ නවත්වන්න.

පසු ගිය රජයේ වැරැද්දක් තිබෙනවා නම්, ඒ වැරැද්ද හදන එකයි අපි කරන්නේ. උසස් අධ්‍යාපන ගරු ඇමතිතුමනි, මම හිතන විධියට ඒක තමයි අපි කළ යුත්තේ. ඔබතුමා කිව්වා වාගේ අපි SAITM ආයතනය දිගටම පවත්වා ගන්න නම්, Public-Private Partnership විධියට, PPP model එකක් විධියට මේක මේ රටේ හරියාකාරව ස්ථාපිත කළ යුතුයි. හැබැයි මතක තියාගන්න, අපි සියලු දෙනාම quality එක වෙනුවෙන් පෙනී සිටින බව. Quality education එක මේ ආයතනයේ නැත්නම්, අපි ඒක ලබා දිය යුතුයි. ඒක තමයි අපි මේ වන විට අධ්‍යයනය කරමින් ඉන්නේ. අපි SAITM ආයතනයේ ශිෂ්‍යයන් හමුවුණා. ඒ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් හමුවුණා. SAITM ආයතනය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට අපි කැඳෙව්වා. ඒ ගොල්ලොත් එක්ක අපි මේ ගැන කථා කළා. අපි ඇත්ත තත්ත්වය දැක්කා. ඒ නිසා මේ ගැන හරියාකාරව දැනුවත් වී කථා කළ යුතු වෙනවා. විශේෂයෙන්ම මේ රටට පෞද්ගලික විශ්වවිද්‍යාල අවශ්‍යයි. හේතුව, අපේ Z-score එකට අනුව විශ්වවිද්‍යාලයට වරම් ලබපු ශිෂ්‍යයන්ගෙන් සියයට 18යි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නේ. එතකොට සියයට 82ක පිරිසක් එළියේ ඉන්නේ. මේ සියයට 82ට අපි මොකක්ද කරන්නේ? ඒ ළමයි උසස් අධ්‍යාපන වරම් නැති අයද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ ප්‍රශ්නය විසඳීම සඳහා ක්‍රමවේදයක් අවශ්‍යයි. විශේෂයෙන්ම ඇති වී තිබෙන වෛද්‍ය විද්‍යාල ප්‍රශ්නය දෙස බැලුවොත්, GMOA එකේ ඉන්න වෛද්‍යවරුන්ගෙන් සියයට එකක විතර වෛද්‍යවරුන්ගේ කුහකකම නිසා තමයි, අද ගොඩාක් අයට වෛද්‍ය වෘත්තියට එන්න තිබෙන ඉඩ ඇහිරිලා තිබෙන්නේ. පසු ගිය වර්ෂයේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වුණේ 1,255දෙනෙක් විතරයි. මට දැනගන්න ලැබුණු ආකාරයට අලුත් ප්‍රතිඵල අනුව තවත් 16දෙනෙක් වැඩි වෙලා තිබෙනවා. ඒක ඉතාමත් හොඳ තත්ත්වයක්. එතකොට මේ රටට වර්ෂයකට වෛද්‍යවරු ඕනෑ 1,255ක් විතරද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට මේ ඉන්න වෛද්‍යවරු පිළිබඳව කොහේවත් දත්ත නැහැ. අදටත් ඇහුවොත් කොළඹ මහ රෝහලේ වෛද්‍යවරු කී දෙනෙක් ඉන්නවාද කියලා, කාටවත් උත්තරයක් දෙන්න බැහැ. ඇත්ත කථාව මේකයි. වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පුළුවන් තරම් ඒ ගොල්ලන්ගේ අය එතැනට පුරවලා මේ දත්ත හංගලායි තිබෙන්නේ. ලංකාවේ දැනට දළ වශයෙන් ඉන්නේ වෛද්‍යවරු 17,000ක් විතරයි. 17,000ක් කියලා ගණන් හැදුවොත් මේ රටේ ජනගහනයෙන් 1,386 දෙනෙකුට එක වෛද්‍යවරයයි ඉන්නේ. මේ වෛද්‍යවරුන් ගණන ප්‍රමාණවත්ද? ඒ වාගේම, අපි ලෝකයේ අනෙක් රටවල් දිහා බලමු. ලිතුවේනියාව වාගේ රටක ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 4 දෙනෙකු ඉන්නවා. ලැට්වියාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 4.6ක් ඉන්නවා, රුසියාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 4.1ක් ඉන්නවා, කසකස්තානයේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.4ක් ඉන්නවා, ඊශ්‍රායලයේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.2ක් ඉන්නවා. ඒ වාගේම ග්‍රීසියේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.4ක් ඉන්නවා. ප්‍රංශයේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.1ක් ඉන්නවා. කියුබාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.6ක් ඉන්නවා. බල්ගේරියාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.1ක් ඉන්නවා. Czech Republicවල ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.6ක් ඉන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අපේ ආර්ථිකයට සමාන රටවල ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3 දෙනෙකු ඉන්නවා. ඒ කියන්නේ ජනගහනයෙන් 300කට එක වෛද්‍යවරයෙක් ඉන්නවා. අපිත් මේ ගණනට වෛද්‍යවරුන් හදන්නේ නැද්ද? මේ 17,000 තියාගෙනම ඉන්නවාද?

ඔබ දන්නවාද අද වන විට ලංකාවේ රෝහල් 37ක් වැහිලා තිබෙන බව. මේක කියන්නේ සෞඛ්‍ය ඇමතිවරයා. වැහිලා තිබෙන රෝහල් 37 ගැන කථා කරන්නේ නැද්ද? ඇයි අපි වහගෙන ඉන්නේ? අර රෝහල් 1,255 විතරමද තිබෙන්නට ඕනෑ?

ඒ වාගේම අද වෛද්‍යවරුන් කණ්ඩායම එකතු වෙලා ඉන්න ප්‍රදේශය දිහා බලමු. කොළඹ ප්‍රදේශයේම පෞද්ගලික රෝහල් 12ක් පමණ තිබෙනවා. මේ රෝහල්වල ඇඳන් ගණන 4,500ක් පමණ වෙනවා. ඒ අනුව දින ගණනත් සමඟ බැලුවාම මසකට මුදල් ගෙවන නේවාසික රෝගීන් ගණන 135,000ක් වෙනවා. විශේෂඥ වෛද්‍යවරුන් 2,000ක් පමණ මේ ප්‍රදේශය තුළ ඒකරාශී වෙලා ඉන්නවා. අනුරාධපුරයෙන්, පුත්තලමින්, මොනරාගල වාගේ පළාත්වලින් උදේ පාන්දර මේ විශේෂඥ වෛද්‍යවරුන් channel කර ගන්නට රෝගීන් එනවා. මේ ක්‍රමය වෙනස් කළ යුතුයි. අර වැහිලා ගිය රෝහල් 37 සඳහාත් අපි දොස්තරවරුන් නිර්මාණය කළ යුතුයි. මම හිතනවා, අපිට මේ සඳහා වැඩිපුර වෛද්‍ය විද්‍යාල අවශ්‍යයි කියලා.

අපි ලෝකයේ තිබෙන වෛද්‍ය විද්‍යාල ගැන බලමු. වෛද්‍ය විද්‍යාල ඉන්දියාවේ 219ක් තිබෙනවා, ඇමෙරිකාවේ 147ක් තිබෙනවා, චීනයේ 130ක් තිබෙනවා, බ්‍රසීලයේ 84ක් තිබෙනවා, ජපානයේ 80ක් තිබෙනවා, මෙක්සිකෝවේ 65ක් තිබෙනවා, රුසියාවේ 60ක් තිබෙනවා, අපි වාගේ දෙගුණයක් පමණ ඉන්න දකුණු කොරියාවේ 52ක් තිබෙනවා. ඒ වාගේම, ඉරානයේ 48ක් තිබෙනවා, පාකිස්තානයේ 34ක් තිබෙනවා, පිලිපීනයේ 34ක් තිබෙනවා. මේ ආදී වශයෙන් වෛද්‍ය විද්‍යාල තිබෙනවා. නමුත් පෞද්ගලික වෛද්‍ය පීඨ දෙකත් ඇතුළත්ව අපේ රටේ තිබෙන්නේ 10යි. අපි විශ්වාස කරනවා අඩුම තරමින් 24ක්වත්,-දකුණු කොරියාවේ වාගේ භාගයක්වත්- අපේ රටට වෛද්‍ය විද්‍යාල අවශ්‍යයි කියලා.

රජයේ සියලුම වෛද්‍ය පීඨවල පීඨාධිපතිවරු ඇතුළු සියලු දෙනා සමඟ රජයේ වෛද්‍ය පීඨවල තිබෙන ප්‍රශ්න ගැන අපි පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කථා කළා. එතැනදී අපි දැක්කා සමහර වෛද්‍ය පීඨවල තිබෙන ප්‍රශ්න. විශේෂයෙන්ම නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ ඉන්න සම්පූර්ණ ආචාර්ය මණ්ඩලය 27ක වාගේ ප්‍රමාණයක්. ඒ ratio එක අනුව ළමයින් 13 දෙනෙකුට එක ආචාර්යවරයයි. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්ය මණ්ඩලය 110ක් ඉන්නවා. මේකේ ratio එක ළමයි 9 දෙනෙකුට එක ආචාර්යවරයෙක් වෙනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්යවරුන් 116ක් ඉන්නවා. Ratio එක ළමයින් 9.5කට එක ආචාර්යවරයායි. ඒ වාගේම රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ තත්ත්වය දිහා බැලුවොත් නියමිත ප්‍රමාණයෙන් සියයට 40යි ආචාර්යවරුන් ඉන්නේ. මේක තමයි ප්‍රශ්නය

වන්නේ. හිටපු අධ්‍යාපන ඇමති ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාට සහ ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාට මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, විපක්ෂයේ හිටියත් හොඳ යෝජනාවක් ගෙනැල්ලා මේ ප්‍රශ්න පිළිබඳව කථා කිරීම ගැන. මෙතුමන්ලා බොහොම හොඳ යෝජනා ඉදිරිපත් කළා. අපි බොහොම සාදරයෙන් එවැනි යෝජනා පිළිගන්නවා. අපි විශේෂයෙන් රජරට විශ්වවිද්‍යාලයේ සහ නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨවලට විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. අපිට නැඟෙනහිර විශ්වවිද්‍යාලය ගැන ඉල්ලීම් කිහිපයකුත් ලැබුණා. ඒ ඉල්ලීම්වල තිබෙන්නේ, මේ වෛද්‍ය පීඨ සඳහා ආචාර්යවරුන් හැටියට විශේෂඥ වෛද්‍යවරුන් තෝරාගෙන තිබෙන බවයි. නමුත් ඒ අයව release කරන්නේ නැති ප්‍රශ්න තිබෙනවා. මේ ආදී වශයෙන් අපිට ඉතාම සරල ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. අපිට එවැනි ප්‍රශ්න විසඳා ගැනීමට සෞඛ්‍ය ඇමතිතුමා මැදිහත් වෙනවා නම් හොඳයි. එහෙම වුණොත්, අපට නැඟෙනහිර විශ්වවිද්‍යාලයෙත්, රජරට විශ්වවිද්‍යාලයෙත් තිබෙන ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාවේදී මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ -Medical Faculty එකේ - Dean ඉතාමත් හොඳ යෝජනාවක් කළා. විශේෂයෙන්ම එවැනි යෝජනා අගය කරන්න ඕනෑ. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය කියන්නේ, ලෝකයේ ප්‍රධාන පෙළේ තිබෙන Medical Faculty එකක්. පේරාදෙණියේ වෛද්‍ය පීඨයත් ඒ වාගේයි. මොකද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා ගන්න විදේශීය සිසුන්ගෙන් -foreign studentsලාගෙන්- ලොකු ඉල්ලීමක් තිබෙනවා. එතුමිය අපට යෝජනා කළා, කොළඹ විශ්වවිද්‍යාලයේ වෙනම අංශයක්, International Medical School එකක් හදන්න. උදාහරණයක් හැටියට කියනවා නම්, "University of Colombo, International School of Medicine" කියලා එකක් අපට හදන්න පුළුවන්. ඒ හරහා foreign studentsලා 100කට මුදල් ගෙවලා ඉගෙන ගන්න අවස්ථාව හදනවා වාගේම, තව local ළමයි 100 දෙනෙකුට නොමිලේ අධ්‍යාපනය ලබා දිය හැකියි. මෙවැනි යෝජනා ආවා. මේවා බොහොම සාධණීය, සාධාරණ යෝජනා. අපට එවැනි අංශයක් Peradeniya Medical Faculty එකෙත් හදන්න පුළුවන්. ඒත් එක්කම අපි යෝජනා කරලා තිබෙන, ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා පවා කථා කරන, විශ්වවිද්‍යාලවලට ස්වාධීනත්වය මේ හරහා ලැබිය යුතුයි.

අපි විශ්වවිද්‍යාලවල ranking ගැන කථා කරනවා. දැන් කිහිප දෙනෙක්ම ඒ ගැන කථා කළා. ලෝකයේ පළමු පෙළේ විශ්වවිද්‍යාල 20ම තිබෙන්නේ යුරෝපා රටවල. හැබැයි, මේ විශ්වවිද්‍යාල 20ම Public-Private Partnerships එහෙම නැත්නම් private universities. මේ පෞද්ගලික විශ්වවිද්‍යාල Public-Private Partnership එහෙමත් නැත්නම් සමූහ මඟින් පාලනය වන විශ්වවිද්‍යාල ඉදිරියට ආවේ ඇයි? ඒ, එම විශ්වවිද්‍යාලවල ඇති මේ ස්වාධීනත්වය නිසායි. මේ අවස්ථාවේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් මෙතැන නිලධාරි කුටියේ ඉන්නවා. අපි ඔවුන්ව විවිධ කමිටුවලදී හමුවුණා.

අපේ විශ්වවිද්‍යාල පද්ධතියට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, අලුතෙන් පාඨමාලා පටන් ගන්නා විට, Management Services Department -MSD- එකෙන් cadre approval එකක් ගන්න තිබෙන අමාරුව. මොකද, ඒ ගොල්ලන්ට අපේ තිබෙන මෙම ක්‍රමවේදය සමහර වෙලාවට තේරෙන්නේ නැහැ. අපි ඊයේ-පෙරේදා සෞන්දර්ය විශ්වවිද්‍යාලයත් එක්ක කථා කළා. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ඩිජිටල් සිනමාකරණය ගැන උපාධි පාඨමාලාවක් අලුතෙන් යෝජනා වුණා. ඉතාමත් හොඳයි. මේ රටට එවැනි අලුත් පාඨමාලාවන් අවශ්‍යයි. ඩිජිටල් සිනමාකරණය ගැන පාඨමාලාව ආරම්භ කරන්න අවශ්‍යයි. නමුත්, cadre approve කරන Management Services Department එක හිතන්නේ, "තවම පාඨමාලා ආරම්භ කරන්න බැහැ. මොකද, approve කරන්න තව කල් යනවා. ඒ නිසා විශ්වවිද්‍යාල පාඨමාලා පටන් ගන්න approve කරනතෙක් ඉන්න" කියලායි. මේ සංකල්ප වෙනස් විය යුතුයි. අපි මේ රාජ්‍ය පද්ධතිය තුළ තිබෙන සමහර නීති රීති එක්ක ක්‍රියා කරද්දී සමහර විට කාලයක් ගත වෙනවා ඇති. එහෙමනම්, විශ්වවිද්‍යාල ස්වාධීන කළ යුතුයි. අද, ලෝකයේ පවතින විශ්වවිද්‍යාල එහෙමයි ගමන් කරන්නේ. විශ්වවිද්‍යාල ස්වාධීන වුණොත් පමණයි එම විශ්වවිද්‍යාලවලට හැකි වන්නේ, තමන්ම උපයා ගෙන තමන්ටම වියදම් කරන්නට. එහෙම කළොත් මෙම විශ්වවිද්‍යාල පද්ධතිය ඉහළ ස්ථානයකට ගෙන යන්න අපට පුළුවන් වනවා. එතකොට, ලෝකයේ අනෙක් විශ්වවිද්‍යාල පද්ධති සමඟ යම් තරගකාරී තත්ත්වයකට පත් වෙනවා. මෙයින් කියන්නේ, දැනට ලබා දෙන නොමිලේ අධ්‍යාපනය නවත්වන්න කියලා නොවෙයි. වැරැදි අර්ථ නිරූපණයක් කර ගන්න එපා. දැනට ලබා දෙන නොමිලේ අධ්‍යාපනය, විශ්වවිද්‍යාල මේ සියල්ල අපි රැක ගත යුතුයි. අප සියලු දෙනාම නොමිලේ අධ්‍යාපනය තුළින් බිහි වුණු අය. හැබැයි, නොමිලේ අධ්‍යාපනයයි, නිදහස් අධ්‍යාපනයයි කියන්නේ දෙකක්. විශ්වවිද්‍යාල තුළ නිදහස් අධ්‍යාපනය ඇති කළ යුතුයි; නිදහස් පාඨමාලා ඇති කළ යුතුයි.

සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ යෝජනා කරන ඩිජිටල් සිනමාකරණ පාඨමාලාව delay වෙන්නේ ඇයි? එම පාඨමාලාව පටන් ගන්න ඒ අයට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. දැන්, විශ්වවිද්‍යාල වරම් ලබන ශිෂ්‍යයන්ට වඩා ඩිජිටල් සිනමාකරණය ඉගෙන ගන්න විශාල ශිෂ්‍යයන් පිරිසක් ඉන්නවා. ඒ අනුව, මෙම ඩිජිටල් සිනමාකරණය ඉගෙන ගන්න අවශ්‍යතාව ඇති වෙලා තිබෙන්නේ, සිනමාකරණය තුළ ඉන්න කැමැති පිරිසකට. එහෙමනම්, මෙවැනි අයට පාඨමාලා හදන්නේ කොහොමද? ඒ සඳහා විශ්වවිද්‍යාලවලට ස්වාධීනත්වය ලබා දිය යුතුයි. ඒ විශ්වවිද්‍යාල තනියම හිතලා, තනියම පාඨමාලා හදලා උපයා ගන්නා ආදායම විශ්වවිද්‍යාල දියුණු කරන්න යොදා ගත්තොත්, විශ්වවිද්‍යාලවල තත්ත්වය තවත් ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වෙයි කියා මම හිතනවා.

මෙවැනි අලුත් අලුත් දේවල් අපි හිතන්න ඕනෑ. ඒ වාගේම, මේ රටකට පෞද්ගලික විශ්වවිද්‍යාලත් පැහැදිලිවම අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නැවත එන්නම්, අප SAITM එකේ ප්‍රශ්නයට විසඳුම ලබා දිය යුත්තේ කොහොමද කියන කාරණයට. අපි හිතනවා, SAITM එකේ ප්‍රශ්නයට විසඳුම ලබා දිය යුත්තේ Public-Private Partnership model එකකින්ය කියා. SAITM එකේ ප්‍රශ්නය තිබෙන්නේ සායනික පුහුණුවෙහි නම් -clinical training එකේ නම්- සායනික පුහුණුව නියමිත ප්‍රමිතියට අනුව ලබා දුන්නොත් අපට පුළුවන්, ඒ ප්‍රමිතිය හදා දෙන්න. Medical Council එක පැහැදිලිවම කියනවා, "සායනික පුහුණුව හරියාකාරව දෙනවා නම්, එහි තත්ත්වය හදා දෙනවා නම් අපට මෙහි ප්‍රශ්නයක් නැහැ" කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කරන්න තිබෙන හොඳම දේ තමයි රජය යම් කොටසක් අරගෙන පෞද්ගලික හා රජයේ ආයතනයක් විධියට ඒ රෝහල පවත්වාගෙන යමින් මේ අවස්ථාව අපට සාදා ගැනීම. රෝහලේ සේවාව නොමිලේ ලබා ගැනීමට එන රෝගීන් වෙනුවෙන් වෙනම section එකක් හදන්න, ඒත් එක්කම professorial wards ආදි ඒවා හදා දෙන්න පුළුවන්, SAITM එකට තියා ගන්න. ඒවායේ අයිතිය සියයට 50: 50 ද, එහෙමත් නැත්නම් වෙනත් ප්‍රමාණයකින්ද කියන එක ගැන පසුව කථා කරන්න අපට පුළුවන්. අපි එවැනි තැනක ඉඳගෙන මේ ගැන කල්පනා කළ යුතුයි.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා කිව්වා, "එයට ළමයි ඇතුළත් කරන එක වහාම නතර කළ යුතුයි" කියා. මා නැවතත් කියනවා, ඒ කථාව වැරැදියි කියා. එහෙම කොහොමද කියන්නේ? රජයක් හැටියට කියන්නේ කොහොමද, "ළමයින් ඇතුළත් කරන එක වහාම නවත්වන්න" කියා. එහෙම ප්‍රතිපත්තිමය තීරණ ගන්න අපට බැහැ. මොකද, එය පසු ගිය රජය හෝ අනුමත කරපු උසස් අධ්‍යාපන ආයතනයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මතක තබාගත යුතු තවත් කාරණයක් තිබෙනවා. අපි පසු ගිය දවස්වල දැක්කා, උසස් අධ්‍යාපන ආයතන අනුමත කිරීමේ ප්‍රශ්නත් තිබෙන බව. පසු ගිය දවස්වල gazette එකක් ආවා, KAATSU නම් වූ ආයතනයේ උපාධි පාඨමාලා අනුමත කරන්න. ඒ KAATSU කියන ආයතනය ගෙන බැලුවාම, එහිත් තිබෙන්නේ Bachelor of Science Honours Medical Science, Psychology, Human Resources, Marketing, Accounting ආදියයි. අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් එතැන තිබෙනවා. කොහොමද ඒ දේවල් කළේ කියන එක අපි පැහැදිලිව සොයා බැලිය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි, ඒ විශ්වවිද්‍යාල ආයතනයේ උපාධි පාඨමාලා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන්නේ 2015 ජනවාරි 07වන දායි. 2015 ජනවාරි 07වන දා කියන්නේ, ජනාධිපතිවරණයට දිනකට කලිනුයි. මා බැලුවා KAATSU කියන ආයතනයේ ඉන්නේ කවුද කියා. එහි පාලක සභාවේ -University Court එකේ- Chairman හැටියට ඉන්නේ, හිටපු ජනාධිපතිවරයාගේ ලේකම් ලලිත් වීරතුංග මහත්මයායි. එහෙම නම්, ඒ ආකාරයට කඩි මුඩියේ පෞද්ගලික විශ්වවිද්‍යාල අනුමත කිරීම දැඩි ප්‍රශ්නයක්. මේ සම්බන්ධව නිවැරැදි නියාමනයක් මේ රටට අවශ්‍යයි. නිවැරැදි නියාමනයක් තිබුණොත් විතරයි, ලෝකයේ තරගකාරිත්වයෙන් ඉහළ තැනක තිබෙන ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල ලංකාවට එන්නේ. එහෙම නැති වුණොත් වෙන්නේ, දේශපාලන අවශ්‍යතා නිසා ජනාධිපතිවරණයට කලින් දවසේ 'ටක්' ගාලා approval එක ගත් ඒවා වාගේ විශ්වවිද්‍යාල ආවොත් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. එහෙම වුණොත් ඒක වැරැදියි. අපි ඒ ගැන සොයා බැලිය යුතුයි. නමුත් රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කරන්න අපට බැහැ. යම් රජයකින් එවැන්නක් අනුමත කළා නම් අපේ රජයට බැහැ, ඒක නවත්වන්න. රජයක් ගැසට් එකක් නිකුත් කරලා පාර්ලිමේන්තුවේ අනුමත කරවා ගත්තා නම්, එය ක්‍රියාත්මක කරගෙන යන්න අපි - මේ රජය - බැඳී සිටිනවා. මෙන්න මේ වාගේ කාරණා ගැන අපි බොහොම සාවධානව සොයා බැලිය යුතුයි. ඒ සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක්, නියාමනයක් අවශ්‍ය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා යෝජනා කළා, තේරීම් කාරක සභාවකින් මෙය කළ යුතුයි කියා. දැනටමත් ආංශික අධීක්ෂණ කාරක සභා හරහා මෙය සිදු වනවා. අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යටතේ, උසස් අධ්‍යාපනය සඳහා වූ අනුකාරක සභාවක් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සියල්ල කැඳවා අප මේ සම්බන්ධයෙන් දැනටමත් සාකච්ඡා කර තිබෙනවා. එහිදී අපි ඒ අයගේ ප්‍රශ්න ගැනත් කථා කළා. ඒ වාගේම පසු ගිය දවස්වල වෛද්‍ය, සෞන්දර්ය ආදි පීඨ සමඟත් අපි කථා කළා. මේ වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන නියාමනය කරන්නේ කොහොමද කියන එක ගැන පළමුවන draft එක වෙනුවෙන් කථා කරනවා. ඒවායෙහි හරියාකාර නියාමනයක් මේ රටට අවශ්‍යයි. එහෙම වුණොත් විතරයි, තරගකාරිත්වයෙන් වැඩි උසස් අධ්‍යාපන ආයතන ලංකාවට එන්නේ. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ සඳහා දැඩි මහන්සියක් දරන බව අප දන්නවා. අපේ රජයේ ප්‍රතිපත්තිය හැටියට ලෝකයේ තිබෙන ප්‍රධාන විශ්වවිද්‍යාලවලට අපේ රටට එන්නය කියා අපි ආරාධනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවුරුදු දහයක් විතර ජපානයේ විශ්වවිද්‍යාලයක මහාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කළා. මම දැක්කා, ලංකාවෙන් යන අපේ දරුවන් තමයි එම විශ්වවිද්‍යාලවලදී පළමුවැනි තැන ලබා ගන්නේ. අපේ විශ්වවිද්‍යාලවල ඉන්නා දරුවන්ගේ දැනුම ලෝකයේ ඉහළම තැනක, ඉහළම ප්‍රමිතියක තිබෙනවා. ඒ නිසා ඔවුන්ට මෙවැනි අවස්ථා වැඩි වැඩියෙන් ලබා දිය යුතුයි. ඒ සඳහා දැන් වයඹ විශ්වවිද්‍යාලයට අලුතින් වෛද්‍ය පීඨයක් හැදෙනවා; මොරටුව විශ්වවිද්‍යාලයටත් අලුතින් වෛද්‍ය පීඨයක් යෝජනා කරනවා. ඊළඟට, සබරගමුව විශ්වවිද්‍යාලයටත් වෛද්‍ය පීඨයක් යෝජනා කර තිබෙනවා. ඒ සඳහා ඉඩමකුත් බලා තිබෙනවා. මේ විධියට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන විශ්වවිද්‍යාලවලින් වෛද්‍ය පීඨ නැති තැන්වලට වෛද්‍ය පීඨත්, ඉංජිනේරු පීඨ නැති තැන්වලට ඉංජිනේරු පීඨත් ලබා දිය යුතුයි. එසේ ලබා දීම තුළින් තමයි විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමට වරම් නොමැතිව අතරමං වන සියයට අසූදෙකක් පමණ වන පිරිසකට වැඩි වැඩියෙන් අවස්ථාව -වරම්- ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, රාජ්‍ය මැදිහත්වීම තුළින් විතරක් මේ ප්‍රශ්න විසඳා ගන්නා බැහැ. එහෙම නම් පෞද්ගලික විශ්වවිද්‍යාල සඳහා ආයතන ලබාදීම සඳහා යම් උනන්දු කිරීමක්, ප්‍රමුඛතාවක් ලබා දිය යුතුයි. [බාධා කිරීමක්] ඉන්න, මම එතැනට එන්නම්. ආචාර්යවරුන් සොයා ගන්නා එකට හොඳ විසඳුමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මෙම ආචාර්යවරුන් සොයා ගන්නා කාරණයට මමත් මැදිහත් වෙලා සිටිනවා. අපි ජපානයේ විශ්වවිද්‍යාල දහහතක සංසදයක් එක්ක විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමට කටයුතු කරනවා. අපිට ඒ සඳහා Cabinet approval එකත් ලැබී තිබෙනවා. ජපානයේ විශ්වවිද්‍යාල සංසදයක් එක්ක "Asian Institute of Science and Technology" කියා විශ්වවිද්‍යාලයක් අපි ආරම්භ කරනවා. ඇත්තටම අපි අතීතය ගත්තොත්, AIT එක ලංකාවට ලැබෙන්නයි නියමිතව තිබුණේ. නමුත් ඒ වේලාවේ ගත් තීරණ නිසා ඒක ලංකාවට ලැබුණේ නැහැ. ලෝකයේ ප්‍රමුඛතාවක් තිබෙන මෙවැනි විශ්වවිද්‍යාලත් එක්ක අපි විශ්වවිද්‍යාල පටන් ගන්නා කොට, ආචාර්ය උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් බිහි කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, ජපානයේ විශ්වවිද්‍යාල සංසදය එක්ක එකතු වෙලා අපි අද වනවිට ආචාර්ය උපාධිධාරීන් හැත්තෑතුන්දෙනෙකු බිහි කරමින් ඉන්නවා. එය 2011 වර්ෂයේ සිට පටන් ගත් project එකක්. [බාධා කිරීමක්] ජපානයේ ආචාර්යවරුන් තුනෙන් එකක් එනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ජපන් ජාතිකයන්ද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඔව්, ජපන් ජාතිකයන්. මෙවැනි විශ්වවිද්‍යාල ලෝකයේ හැදුවා; මැලේසියාවේ හැදුවා; ඊජිප්තුවේ හැදුවා. ඔවුන්ට වැටුප් ලබා දෙන්නේ ජපානයෙන්. මේක තමයි මේ වෙනස. විශ්වවිද්‍යාල සංසදයෙන් තමයි වැටුප් ලබා දෙන්නේ. විශ්වවිද්‍යාල දහහත හරහා අපේ විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමට ආචාර්යවරුන් එවනවා. එහෙම සහයෝගය ලබා දෙන රටවල් ලෝකයේ තිබෙනවා. ජපානය එහෙම රටක්. මමත් ඒ projects දෙකේම සිටියා. මට

මතකයි, Malaysia-Japan International Institute of Technology - MJIIT - කියා එකක් හැදුවා. ඊළඟට, Egypt-Japan University of Science and Technology - EJUST - කියා ඊජිප්තුවේ එකක් හැදුවා. මේ දෙකටම ජපානයේ මහාචාර්යවරුන් ගිහිල්ලා උගන්වනවා. අපි මේ වාගේ අවස්ථා පුළුල් කළොත් තමයි ලෝකයේ තිබෙන දැනුමත් අපට එන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මෙගා පොලිස්" සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ කොළඹ, මාලබේ ප්‍රදේශයේ Science City එකක් ආරම්භ කිරීම ගැන අපි කථා කරනවා. ඒ වාගේම ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ මූලිකත්වයෙන් අපට නුවර ප්‍රදේශයේත් Kandy Science City එකක් හදන්න පුළුවන් කියා මම යෝජනා කරනවා. පේරාදෙණිය ආශ්‍රිතව විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතන ගොඩාක් තිබෙනවා. පේරාදෙණිය, කුණ්ඩසාලේ හා පාතදුම්බර වාගේ මැතිවරණ කොට්ඨාස ටිකක් සම්බන්ධ කරගෙන, ඒවායේ තිබෙන සම්පත් ටික ලබා ගත්තොත් Kandy Science City එකක් පටන් ගන්න අපට හැකියාවක් ලැබෙනවා. මේ සඳහා රජයේ විශ්වවිද්‍යාල වාගේම පෞද්ගලික විශ්වවිද්‍යාලත් සම්බන්ධ කර ගන්න අපට පුළුවන්. ලෝකයේ අනෙක් රටවල තිබෙන විශ්වවිද්‍යාලවලටත් ආරාධනා කළ හැකි වෙනවා. විශේෂයෙන්ම ජපානයේ විශ්වවිද්‍යාල සංසදය වාගේ ලෝකයේ මේ සඳහා කැමැත්තක් තිබෙන විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ වෙලා Public-Private Partnership modelsවලට යන්න අපට පුළුවන්කම ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන් ගත්තොත් දැනට ලංකාවේ teaching hospitals හැටියට convert කරන්න පුළුවන් hospitals 45ක් තිබෙනවා. මේ රෝහල් 45 teaching hospitals විධියට convert කරන්න අපිට පුළුවන් වුණොත්, වෛද්‍ය පීඨ සිසුන්ට වැඩි වැඩියෙන් අවස්ථාව ලබා දෙන්නත් අපට හැකියාව ලැබෙනවා. ඒ වාගේම රුහුණ විශ්වවිද්‍යාලයෙන් තව යෝජනාවක් ඇවිල්ලා තිබුණා, ළමයින් සඳහා වන teaching hospital එකක් හදන්න කියලා. ළමයින් සඳහා වන teaching hospital එකක් හැදීම තුළින් වෛද්‍ය සිසුන්ට තව තවත් අවස්ථාව ලබා දෙන්න පුළුවන්. මේ ආදී වශයෙන් අපේ ආණ්ඩුව උසස් අධ්‍යාපන කටයුතුවල පැහැදිලි වෙනසක් කරන්න, පැහැදිලි ප්‍රතිපත්තියක් ඇතුව පැහැදිලි දැක්මකින් යුතුව කටයුතු කරනවා. අද අපි අනුමත කරන මේ පනත් කෙටුම්පත මඟින් අපේ ශිෂ්‍යයන් වැඩි ප්‍රමාණයකට විශ්වවිද්‍යාල වරම් ලැබෙනවා.

අවසාන වශයෙන් තව එක් කාරණයක් මතක් කරන්න ඕනෑ. අපේ විශ්වවිද්‍යාල ස්වාධීන වුණොත් ඒ විශ්වවිද්‍යාලවලට හැකියාවක් ලැබෙනවා, පැය 24 පුරා වැඩ කරන විශ්වවිද්‍යාල බවට පරිවර්තනය වෙන්න. පැය 24 පුරා වැඩ කරන විශ්වවිද්‍යාලයි අද ලෝකයේ තිබෙන්නේ. අපට පුළුවන්, රාත්‍රී පාඨමාලා පටන් ගන්න; පර්යේෂණ පටන් ගන්න. පර්යේෂණ සංස්කෘතියක් අපේ විශ්වවිද්‍යාල තුළට ඇතුළත් විය යුතුයි. එහෙම වුණොත් තමයි රටේ අනාගතයට ගැළපෙන පර්යේෂකයන් -නවෝත්පාදන ආර්ථිකයට යන පර්යේෂකයන්- නිර්මාණය කර ගත හැකි වෙන්නේ. ඔබට ස්තුතියි.

[අ.භා. 5.05]

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත විවාදයට ගන්න වෙලාවේ මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව තමුන්නාන්සේට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා. ගරු අමාත්‍යතුමනි, මට කථාව පටන් ගන්න ප්‍රස්තුත කාරණාව හැදුවේ අපේ මහාචාර්යතුමා කථා කරද්දී කියපු කාරණයක්. එතුමා බිම බලාගෙන කිව්වේ, "එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පැමිණි හැම වෙලාවකම අපි උසස් අධ්‍යාපනය වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම දේ කළා" කියලා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

බිම බලාගෙන නොවෙයි, උඩ බලා ගෙනයි කිව්වේ.

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

බිම බලාගෙන නොවෙයි ලු, උඩ බලාගෙන ලු කිව්වේ. මම තමුන්නාන්සේට ඒ ගැන එක් කාරණයක් විතරක් මතක් කරනවා. මම ඒ ගැන වැඩිය කථා කරන්නේ නැහැ. මම අතීතයට ගරහන මිනිහෙක් නොවෙයි. මාතර, එළියකන්දේ තිබෙනවා, සරසවි ශිෂ්‍යයෝ ගෙනැල්ලා පතුරු ගහපු තැන; ත්‍රිමාලා ගෙනැල්ලා පතුරු ගහපු තැන. ශරීරය ඇතුළට බට දාලා කටු කම්බිවලින් ඇදපු තැන, මාතර, එළියකන්දේ -අපේ විශ්වවිද්‍යාලයේ hostel එක තිබුණු තැනට එහා පැත්තේ- තිබෙනවා. අපි තවමත් ඒ පැත්ත බල බලා යනවා. ඒ, එක තැනක් විතරයි.

ගරු ඇමතිතුමනි, මම අතිශය සතුටට පත් වෙනවා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශයක් ගැන විවාද කෙරෙන වෙලාවේ මුළු පාර්ලිමේන්තුවම ඔළු ගෙඩිවලින් පිරිලා තිබීම ගැන. මම අතිශය සතුටට පත් වෙනවා, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ගැන විවාද කරන වෙලාවේ මුළු පාර්ලිමේන්තුවම පිරිලා සිටීම ගැන. මේ රටේ මාධ්‍යයත් මම හිතන්නේ-

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ඒකාබද්ධ විපක්ෂයේ අය කෝ?

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මම කියන්නේ කවුරුත් ගැනයි. තමුන්නාන්සේලා හැමදාම - [බාධා කිරීමක්] එක පැත්තකට බරව කථා කරන්න ඕනෑ නම්, තමුන්නාන්සේලා කැමැති නම් ඒ පැත්තට බරව මට කථා කරන්න පුළුවන්. මධ්‍යස්ථව ඉඳන් කථා කරන්න ඕනෑ නම්, මම මධ්‍යස්ථව ඉඳන් කථා කරන්නම්. මම තමුන්නාන්සේට ඒ ගැන මතක් කරනවා, ගරු අමාත්‍යතුමනි. ගරු අමාත්‍යතුමනි, වෛද්‍යවරයා මේ රටේ ජාතිය සුවපත් කරනවා. ගොවියා ජාතියට බත සපයනවා. කසළ ශෝධකයාගේ ඉඳලා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන්නන් මේ රටට දායකත්වය ලබා දෙනවා. ඒ හැම මිනිහෙකුගේම පසුවට තට්ටු කරලා ඇහුවොත්, "උඹේ පුතා, උඹේ දුව කවුරු වෙනවාටද කැමති?" කියලා, අතිබහුතරයක් දෙනා කියාවි, "මගේ දරුවා මෙන්න මෙතැනට එනවාටයි මම කැමැති. මගේ දරුවා ගෙන යන්න කැමැති මෙතැනටයි" කියලා. හැබැයි, දෙමව්පියන්ගේ තිබෙන අසීමිත බලාපොරොත්තුවලට පණ දෙන්නේ, ඒ දෙමව්පියන්ගේ අරමුණුවලට දරුවන් මෙහෙයවන්න මඟ පාදන්න උදවු කරන්නේ, කුමන පක්ෂයක හෝ බලපැවැත්වෙන ආණ්ඩුවක්. ඒ ආණ්ඩුවට තමයි ඒ බලය තිබෙන්නේ. ඒ මිනිසුන්ගේ අරමුණු වෙනුවෙන් අධ්‍යාපනය මෙහෙයවලා රට ඉදිරියට ගෙන යාමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවකටයි.

ගරු අමාත්‍යතුමනි, මම මුලින්ම මේ කාරණය මතක් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයන් සඳහා අවුරුදු තුනක

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

කාලයක් තව වැඩි කරලා ඔවුන්ට විශ්‍රාම යන වයස වැඩි කරලා තිබෙනවා. මේක කාලයක් තිස්සේ තිබුණු ඉල්ලීමක්. අවුරුද්දකට සැරයක් ආයතන ප්‍රධානියා ඉදිරියට ගිහිල්ලා ඔහුට විවිධාකාරයෙන් සැලකිලි දක්වලා නැත්නම් විවිධ විධියට පිංසෙණ්ඩු වෙලා තමන්ගේ සේවා දිගුව අවුරුද්ද, අවුරුද්ද වැඩි කර ගන්න පුළුවන්කම ලැබුණා. අවුරුදු 60 දක්වා විශ්‍රාම යාමේ වයස දික් කරලා, තමුන්නාන්සේලා ඒකට නීත්‍යානුකූල වටිනාකමක් දුන්නා.

ගරු අමාත්‍යතුමනි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු කීර්තිමත්ම දේශපාලනඥයෙක් වන රෝනී ද මැල් මැතිතුමාට. එතුමා රුහුණ විශ්වවිද්‍යාලය ආරම්භ කරන කොට හුඟක් දෙනෙක් ඒකට විරුද්ධ වුණා. පරණ හැන්සාඩ් කියෙව්වොතින් ඒක තේරුම් ගන්න පුළුවන්. අති බහුතරයක් දෙනා රුහුණ විශ්වවිද්‍යාලය හදනවාට විරුද්ධ වුණා. ඒක හරියට, මහින්ද රාජපක්ෂ මහත්තයා හම්බන්තොට වරාය හදන්න යන කොට විරුද්ධ වුණා වාගෙයි. අද වන කොට රුහුණු විශ්වවිද්‍යාලය කීර්තිමත් තැනක තිබෙනවා. හම්බන්තොට වරායත් එහෙමයි. "මෙන්න, අපි පුළුල් වරායක් හදලා තිබෙනවා, නැව් මාර්ගයට ආසන්නයේ වරායක් හදලා තිබෙනවා" කියලා චීනයට පෙන්වන්න පුළුවන්කම තිබෙන්නේත්, "අපේ රටට ආයෝජන කරන්න එන්න" කියන ආරාධනය කරන්න පුළුවන්කම ලැබුණේත් හම්බන්තොට වරායක් හදාපු නිසායි.

ගරු අමාත්‍යතුමනි, මගේ මුල්ම පාර්ලිමේන්තු කථාවේදීත් මා කිව්වා රටක් විධියට අපි බලන්න ඕනෑ සීමා ටික. ගරු අමාත්‍යතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශ හරහා තමයි රටක් ගොඩ නඟන මිනිස්සු බිහි වෙන්නේ. රට හදන මිනිස්සු බිහි වෙන්නේ එතැනින්, රටට දැනුම දෙන මනුෂ්‍යයා බිහි වෙන්නේ එතැනින්, රටට වීරත්වය ගොඩ නඟන පොලිස්පතිවරයා බිහි වෙන්නේ එතැනින්, හමුදාපතිවරයා බිහි වෙන්නේ එතැනින්. හැබැයි, ගරු අමාත්‍යතුමනි, විදේශීය සමාගමක් ඇවිල්ලා මේ රටේ යම් සමාගමක් ආරම්භ කරන්න බදු සහන දීපන්, ඉඩම් ටික දීපන්, යටිතල පහසුකම් දීපන් කිව්වාම, අපි ඒ සමාගම ආරම්භ කරන්න, ඒ factory එක ආරම්භ කරන්න අපට දෙන්න පුළුවන් උපරිම දේවල් ටික දීලා ඒ සමාගම පටන් ගන්න ඉඩ දෙනවා. හැබැයි, අපට අමතක වෙනවා, අපේ රටේ තිබෙන ලොකුම දායාදය, ලොකුම අනාගත ආයෝජනය හතළිස්හතර ලක්ෂයක් වන මේ රටේ මහා ශිෂ්‍ය පරම්පරාවයි කියන එක. ඒ නිසා තමයි ගරු අමාත්‍යතුමනි, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ ඉල්ලීම් කරමින්, "මට hostel එකක් දෙන්න, දේශන ශාලාවට අවශ්‍ය පහසුකම් ටික දෙන්න" කියලා ඉල්ලීම් කරගෙන පාර දිගේ එනකොට, අධිආරක්ෂක කලාපය ළං වෙන කොට පොලිසියේ නිලධාරින් ටික එකතු වෙලා රබර් උණ්ඩ ටිකයි, කඳුළු ගෑස් ප්‍රහාරයි එල්ල කරන්නේ. එතකොට අපි කාටත් අමතක වෙනවා, මේ රටේ අනාගත නායකත්වය ගන්න මිනිස්සු ටික, මේ රට ගොඩ නඟන මිනිස්සු ටික ඉන්නේ එතැනයි කියන එක.

ගරු අමාත්‍යතුමනි, රුහුණු විශ්වවිද්‍යාලයේ තිබෙනවා, "කැටපත් පවුර" කියලා එකක්. කැටපත් පවුරේ ලියන්නේ කුරුටු ගී. එක සහෝදරයෙක් ලියලා තිබුණු කුරුටු ගීයක් මට මතක් වෙනවා. මට මතක නැහැ, ඒ සහෝදරයා ඒ කුරුටු ගීය කොයි කාලයේද ලියලා තිබුණේ කියලා. එහි සඳහන් වුණේ මෙහෙමයි.

"ආදරණීය ලොකු මල්ලී,

විශ්වවිද්‍යාලයට ඇවිල්ලා අවුරුදු තුනක් ඉවරයි

Degree එක පෙනෙන තෙක් මානයකවත් නැහැ

උඹ විශ්වවිද්‍යාලයට එන්න එපා

මට ඇවිල්ලා කොටන්න

උකස් තියන්නේ නැතිව අන්තිම ලියද්ද ඉතිරි කරපන්"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඹුර උකස් තියලා විශ්වවිද්‍යාලයට ආපු දරුවන් තමයි විශ්වවිද්‍යාලයේ වැඩිපුරම ඉන්නේ. මට මතකයි, මා විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ මිත්‍රයෙක් හිටියා. ඔහුට හම්බ රුපියල් 2,500ක මහපොළ ශිෂ්‍යාධාරය හම්බ වුණා. ඒ 2,50,00න් රුපියල් 2,000කින් මුළු මාසයක්ම ජීවත් වෙලා රුපියල් 500ක් ගෙදරට යැව්වා. සමහර ශිෂ්‍යයෝ මහපොළ හම්බ වෙන දවසට තමයි එළියට ගිහිල්ලා fried rice එකක් කාලා ආවේ. මමත් රුහුණු විශ්වවිද්‍යාලයේ උඩ කැන්ටිමේ රුපියල් තුනට "අඩුව" කාපු දරුවෙක්. වෙන ශිෂ්‍යයකු කාලා පිඟාන පැත්තකින් තිබ්බාට පස්සේ, රුපියල් 3ක් දුන්නාම කැන්ටිමෙන් ඒ "අඩුවට" බත් භාගයක් දෙනවා. මමත් රුහුණු විශ්වවිද්‍යාලයේ ඒ අඩුව කාපු දරුවෙක්.

ගරු අමාත්‍යතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මේ වාගේ අමාත්‍යාංශයක් අපි කොයි දිශාවකට ද යොමු කරන්න ඕනෑ කියන ප්‍රශ්නයයි. අහස කඩා ගෙන වැටුණත් කමක් නැහැ වාගේ තමුන්නාන්සේ ඕනෑම දෙයකට හිනා වෙලා බොහොම සැහැල්ලුවෙන් ඉන්න අමාත්‍යවරයෙක්. හැබැයි, මේ අමාත්‍යාංශයේ තිබෙන බර මේ රටටවත් දැනිලා තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. එක පැත්තකින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට මහ ලොකු අසාධාරණයක් වෙනවා. අනෙක් පැත්තෙන් ආචාර්යවරයාට අසාධාරණයක් වෙනවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල පද්ධතියේ, අධ්‍යාපන ක්‍රමයේ යාවත්කාලීන නොවීම, විෂයයන් සංශෝධනය නොවීම මහා ගැටලුවක් වෙලා තිබෙනවා.

තමුන්නාන්සේට අමාත්‍යාංශ දෙකක් භාර දීලා තිබෙනවා. ඒ මහාමාර්ග සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශ දෙක අතරවත්, මහාමාර්ග අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය අතරේවත් අඩුම තරමින් අවබෝධතා ගිවිසුමක් හැදිලා තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාලයෙන් ගන්න පුළුවන් විශේෂඥ සහාය. එක පැත්තකින් විශ්වවිද්‍යාලයෙන් විශේෂඥ සහාය ගන්න MoU එකක් අත්සන් කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අමාත්‍යාංශයට අවශ්‍ය සහාය ශිෂ්‍යයන්ගෙන් සහ දේශකයන්ගෙන්, ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් ලබා ගන්න පුළුවන්. අද ඒ අවස්ථාව කොයි තරම් දුරට ලබා ගෙන තිබෙනවාද කියලා මා දන්නේ නැහැ.

අද තිබෙන පළමුවැනි බේදවාචකය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයෝ එනවා; ශිෂ්‍යයෝ පුරවනවා. අද මේ සභාවේත් කියැවුණා, ගිය අවුරුද්දට වඩා දරුවන් දෙදහස් ගණනක් වැඩිපුර ඇතුළත් කරගන්න කටයුතු කර තිබෙනවා කියලා. මා අහනවා, නිදහස් අධ්‍යාපනය කියලා කියන්නේ මේකටද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශිෂ්‍යයෙකුට hostel එකක් දෙන්නේ පළමුවැනි අවුරුද්දේයි, අන්තිම අවුරුද්දේයි විතරයි. අනෙක් අවුරුදු දෙකේ ඒ ළමයා ලගින්නේ පාරේද? කැබිතිගොල්ලෑවෙන්, මොනරාගලින්, බණ්ඩාරවෙලින්, හල්දුම්මුල්ලෙන් එන ශිෂ්‍යයා පාරේද ලගින්නේ? නිදහස් අධ්‍යාපනය කියලා මහ ලොකුවට වර්ණ කරලා, හැඩ කරලා, උඹලාගේ ආණ්ඩුවට වඩා මෙන්න අපේ ආණ්ඩුව කරනවායි කියලා අපි කියන්නේ මේකටද? නමුත් අපි බලාපොරොත්තු වන්නේ මේක නොවෙයි.

ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමන්ලාට මතක් කරනවා ඊළඟ ප්‍රශ්නය. පාරේ එන විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට බැටන් පොලු ප්‍රහාර

එල්ල කරන පොලිස් නිලධාරින්ට අමතක වෙනවා, එල්ලය බලා ගැස් උණ්ඩය එල්ල කරන පොලිස් නිලධාරියාට අමතක වනවා, මේ රටේ අනාගත නායකත්වය ගන්න ඉන්නේ මේ දරුවන් බව. කුඩු ගහලා, මිනිහෙක් මරලා, පාරේ පැනලා යන හොරාට උණ්ඩය කෙළින් එල්ල වෙන්නේ නැති පොලිස් නිලධාරියාගේ බැටන් පොලු ප්‍රහාරය එල්ල වෙනවා විශ්වවිද්‍යාල ශිෂ්‍යයා වෙනුවෙන්. හැබැයි, මට තිබෙන කනගාටුව මේකයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාගෙන් එක් කෙනෙකුගේවත් දරුවෝ ඒ විශ්වවිද්‍යාල ඇතුළේ නැහැ. ඒ බැටන් පොලු ප්‍රහාර කන්නේ අපේ දරුවෝ නොවෙයි; අපි - තමුන්නාන්සේලාගේ දරුවෝ නොවෙයි. ඒ බැටන් පොලු ප්‍රහාර එල්ලවන දරුවන් අතරේ තමුන්නාන්සේලාගේ දරුවන් හිටියා නම්, තමුන්නාන්සේලා පොලීසියට කථා කරලා  කියනවා ගහන්න එපා කියලා. එහෙම වුණා නම්, පූජිත් ජයසුන්දර මහත්තයාගේ උඩ අග්ගිස්සේ ඉඳලා මුලටම නැවිලා, ආයෙත් මැදිනුත් පුළුවන් නම් නවා ගන්න හදනවා. ඒකයි ඇත්ත. හැබැයි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත් පූජිත් ජයසුන්දර මහත්තයා පොලිස්පති විධියට කටයුතු කරන මේ කාලයත් දරුවන්ගේ ඔළු පළා අමු කුණුහරුපයෙන් බැනලා එළවන කාලයක් බවට පත් වෙලා තිබීම පිළිබඳව මම කනගාටුවට පත් වනවා. මම ජනාධිපතිවරයා, මේ පාර්ලිමේන්තුවේ අගමැතිවරයා හෝ මූලාසනයේ ඉන්න මන්ත්‍රීවරයා සිටින පුටුවට තව අවුරුදු 30ක් පමණ යනකොට දැන් අධ්‍යාපනය ලබන හතළිස් ලක්ෂයෙන් කෙනෙක් නේද එන්නේ කියලා මම තමුන්නාන්සේලාගෙන් අහනවා. ඒක තමයි ඇත්ත. ඒක තමයි අපි හිතන්න ඕනෑ දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරු කීප දෙනෙක්  කළ කථා  මම අහගෙන සිටියා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, "අපි ඉදිරි දිනයකදී අපේ ඉල්ලීම් දිනා ගන්න පාරට බහිනවා. එහේ ඉන්න වෘත්තිකයෝ, බුද්ධිමතුන් සියලු දෙනා එක්ක පාරට බහිනවා, පුළුවන් නම් නවත්වා පෙන්වන්න, නවත්වා බලමු" කියලා.  මට තිබෙන ප්‍රශ්නය මේකයි. මම තෘෂ්ණාව තිබෙන මිනිහෙක් නොවයි. මේ රට කැඩෙනවා, මේ අපේ කෑල්ල, ඒ නිසා මේක නවත්වා ගන්න ඕනෑය කියන හැඟීමක් නොවෙයි මට තිබෙන්නේ. මම කියන්නේ සිංහල, මුස්ලිම්, දෙමළ කියන ජන වර්ග තුනටම එකට අත්වැල් බැඳගෙන, කරට අත දමාගෙන ඉන්න පුළුවන් කියලායි. ඒ විධියට මේ පාර්ලිමේන්තුවේ අපට ඉන්න පුළුවන් නම්, මේ රටේත් එහෙම ඉන්න පුළුවන් වන්න ඕනෑ. ඒක පමණයි ප්‍රශ්නයක් විධියට මට තිබෙන්නේ.

අද උතුරෙන් ආපු බහුතර දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ කථා කළේ උතුරේ ප්‍රශ්න ටික පමණයි. ප්‍රධාන විපක්ෂයේ ප්‍රශ්නය වුණේ උතුර පමණයි. සම්පන්දන් මැතිතුමාගේ ප්‍රධාන විපක්ෂයේ පළවෙනි කාරණය වුණේ උතුරේ ප්‍රශ්න  විතරයි. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමා විනාඩි 30ක් කථා කළා. ඒ විනාඩි 30 ඇතුළේම කථා කළේ SAITM ප්‍රශ්නය පමණයි. මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් මම අහනවා, අතීතයේ විශ්වවිද්‍යාලයේ සිටි මේ රටේ බුද්ධිමතුන්ගෙන් මම අහනවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පාරට බැස්සේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් විතරද කියලා. නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමාජයේ ප්‍රශ්න එනකොට, සමාජයේ විකෘතිභාව  එනකොට, රට අනික් පැත්තට යනකොට විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පෙරමුණ ගත්තා. නමුත්, අද එක්තරා දේශපාලන කණ්ඩායම් විසින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයා කොහේ හෝ කණුවක බැඳ තබා සීමාවක් ඇතුළේ පමණක් ඔවුන් හසුරුවමින් ඉන්නවා. හැබැයි, මට තිබෙන ප්‍රශ්නය මෙයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ විශ්වවිද්‍යාලවල ඉන්න දහස් ගණනක් වන සහෝදර ශිෂ්‍යයින්ගෙන් මම මෙහෙම අහනවා.

"නුඹලා නිදහස් අධ්‍යාපනය රැක ගෙන, උපාධි ලෝගුව දමා ගෙන, උපාධි සහතිකය අරගෙන පාරට බහින කොට කෝ නුඹලාට රටක්." නුඹලාට රටක් නැහැ. නුඹලා නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් පාරට බැහැ බැහැ හිටපල්ලා. නුඹලා පාරට බැස්සාට නුඹලාට රටක් නැහැ. අර කිරිබණ්ඩාගේ පුතා කුරුටු ගීය ලිව්වා වාගේ ආපහු සැරයක් කුඹුර කොටන්න විතරයි නුඹලාට ඉතිරි වෙලා තිබෙන්නේ. හැබැයි, මේ වෙනකොට අපේ රටේ කෘෂිකර්මයත් විනාශ කරලා අවසන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ අපේ තාත්තලා කුඹුරට බහින කොට උදැල්ලට වැන්දා, ගරු ඇමතිතුමනි. වී ටික කුරුණියට දමන කොට කුරුණියට වැන්දා. වී ටික ගෝනියට දමනකොට ගෝනියට වැන්දා. වී ටික කොටා ගෙන හාල් ටික ගෙදරට ගෙනැල්ලා ළිපේ තියන කොට අපේ අම්මා ළිපටත් වැන්දා.  ඒවා අපට මතකයි. එදා කෘෂිකර්මයට එහෙමයි ආදරය කළේ. හැබැයි, අද අපේ රටේ ගොවියෝ කුඹුරට ගිනි තියනවා. ගොවියා කුඹුරට ගිනි තියද්දී අනික් පැත්තෙන් රුපියල් කෝටි දෙකකට ආසන්න මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශ ගොඩනැඟිල්ලට වෙන් කර ගන්නවා. ගරු අමාත්‍යතුමනි, මේකද යහ පාලනය? තමුන්නාන්සේගේ හෘදය සාක්ෂියට කථා කරන්න. මේකද යහ පාලනය?

මගේ වයස අවුරුදු 35යි. ඕනෑ නම්, මිනිසෙකු විධියට මම තව අවුරුදු 30ක් මේ රටේ ජීවත් වෙයි. තව අවුරුදු 30කින් හෝ ඊට කලින් මම මැරිලා යයි. වෙසක් පෝය හැටියට ගත්තොත් මට තිබෙන්නේ තව වෙසක් පෝය  30යි. හැම වෙසක් පෝයටම සිල් ගත්තොත්, මට වෙසක් පෝය  30යි -දවස් 30යි- සිල් ගන්න පුළුවවන්කම තිබෙන්නේ. අපි මේ රටට ඉතිරි කරලා යන්න ඕනෑ මොනවාද? අපි මේ රටට අතහැරලා යන්න ඕනෑ මොනවාද? ගරු ඇමතිතුමනි, මේ දේවල් මම තමුන්නාන්සේ කෙරෙහි ද්වේශසහගතව කියනවා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේදී මම තමුන්නාන්සේගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරන්න කැමැතියි. තමුන්නාන්සේ යටතේ අමාත්‍යාංශ දෙකක් තිබෙනවා. මම තමුන්නාන්සේගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, තමුන්නාන්සේ එක අමාත්‍යාංශයක වැඩ කරන්න කියලා. තමුන්නාන්සේට අමාත්‍යාංශ හයක්-හතක් තිබුණා කියලා තමුන්නාන්සේගේ ගෞරවය වැඩි වන්නේ නැහැ. තමුන්නාන්සේගේ කාර්ය සාධනය වැඩි වීම මත තමයි තමුන්නාන්සේට මේ රටේ ගෞරවයක් හිමිවන්නේ. උසස් අධ්‍යාපනය කියන්නේ මහා බලගතු අමාත්‍යාංශයක්. මේ රටේ හැඩය තීරණය කරන අමාත්‍යාංශය, "උසස් අධ්‍යාපන අමාත්‍යාංශය"යි.

ගරු ඇමතිතුමනි, මම මේ වෙලාවේ තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. අපි විශ්වවිද්‍යාලය තුළ සිටින ශිෂ්‍යයන්ගේ භෞතික පහසුකම් පමණක් නොවෙයි සම්පූර්ණ කරන්න ඕනෑ. මම ගියේ රුහුණු විශ්වවිද්‍යාලයට. මම මේ කරුණ නොබියව කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ආචාර්යවරු ඇවිල්ලා උගන්වද්දී මෙ ලෝ දෙයක් තේරෙන්නේ නැහැ.  මේ ලෝ හසරක් තේරෙන්නේ නැහැ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් තමුන්නාන්සේ අහන්න. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ  ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලයෙන් අහන්න. UGC එකෙන් අහන්න. සමහර කථිකාචාර්යවරු, ආචාර්යවරු ඇවිල්ලා උගන්වනවා, මෙලෝ හසරක් තේරේනේ නැහැ. ආචාර්යතුමා උගන්වනවා, අර කොළයේ අත්සන තියන්න ඕනෑ නිසා ශිෂ්‍යයන් ගිහිල්ලා වාඩි වෙලා ඉන්නවා. ඇයි? ඒකට ආචාර්යවරයාට බැණලා හරි යන්නේ නැහැ, ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි. ආචාර්යවරයකු විධියට තෝරා ගන්නකොට ඒ විශ්වවිද්‍යාලය ඇතුළේ හොඳම ප්‍රතිඵලය ගත්තු මිනිහා විතරක් ඒකට අරගන්න ඕනෑ කියන  නිර්ණායකය විතරක් හරි යන්නේ නැහැ. Interview එකේ අන්තිම විනාඩි 10 තුළ presentation එකක් කරලා, ඒ presentation එක හොඳට කළා කියන නිර්ණායකය  ආචාර්යවරයෙක් විධියට කටයුතු කිරීම සඳහා සුදුසුකමක් වන්නේ නැහැ.

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

ගරු ඇමතිතුමනි, මම එක දෙයක් තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. ආචාර්යවරයකු විධියට කෙනෙකු බඳවා ගන්නවා නම්, ඒ කෙනාට ආයතනික පරිසරයක් ඇතුළත පුහුණුව ලබා දෙන්න. ඒකයි පළමු වැනි කාරණය. ආචාර්යවරයෙක් ඇවිල්ලා, කළමනාකරණය ගැන උගන්වනවා. හැබැයි, ආයතනයක් තුළ කළමනාකරණය වෙන්නේ කොහොමද කියන කාරණය ගැන දන්නේ නැහැ. ආයතනයක් ඇතුළේ කළමනාකරණය වෙන ආකාරය ගැන දැන ගත්තොත් තමයි විශ්වවිද්‍යාලයට ඇවිල්ලා ප්‍රායෝගිකව උගන්වන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ දැනුම නැහැ. ඒ නිසා ඔවුන් නිකම්ම නිකම් දරුවන්ට උගන්වනවා. දරුවෝ කුප්පියක් දා ගන්න එක තමයි කරන්නේ. ගරු ඇමතිතුමනි, කුප්පියක් දා ගන්නවා කියන්නේ subject එක දන්නා ශිෂ්‍යයකුගෙන් අනෙක් ශිෂ්‍යයන් ඉගෙන ගැනීමයි. ඒකට කියන්නේ "කුප්පිය" කියලා. ඉතින් ඒ කුප්පිය නැති වුණා නම් විශ්වවිද්‍යාලවල results ගන්න දරුවන් නැහැ. ඒක තමයි ඇත්ත. මේ අධ්‍යාපන ක්‍රමය මහා බොරුවක් ගරු ඇමතිතුමනි. මහා බොරුවක්. තමුන්නාන්සේ බලන්න. මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා, මේ අවුරුදු හතර ඇතුළත තමුන්නාන්සේට පුළුවන්, මේ රටේ උසස් අධ්‍යාපනය ඉහළම තත්ත්වයකට ගෙනැල්ලා කීර්තිමත්ම උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙන්න. ගරු ඇමතිතුමනි, මිනිහෙක් මැරෙනකොට ඉතුරු වෙන්න ඕනෑ එච්චරයි කියලායි මම කියන්නේ. මැරෙනකොට ඉතුරු වෙන්නේ මම කවුද, මම මොනවාද කළේ කියන එක විතරයි. තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේද, විපක්ෂයේද කියන එක නොවෙයි අදාළ වන්නේ. ඉන්නා තැන ඉඳගෙන මට කරන්න පුළුවන් මොනවාද කියන එක විතරයි ඕනෑ. කවුරුවත් නැති මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේ වාඩිවෙලා ඉන්න එක ගැන මම සතුටට පත් වෙනවා.

ගරු ඇමතිතුමනි, දැන් විෂයයක් ගෙනැල්ලා තිබෙනවා, විශ්වවිද්‍යාලය ඇතුළේ ක්‍රමවේදයක් "Eco-concept" එක කියලා. මේක ගැන ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාත් කිව්වා. ඉතින් මේ විවේචන නොවෙයි, මේවා නොකරත් බැහැ; කරලාත් බැහැ; කළාට වැඩකුත් නැහැ. මේවා හරියට "කීරි අලින්ට වීණා වයනවා වාගේයි" කියලා මට හිතෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පිරිසක් ඇවිල්ලා අමාත්‍යාංශයත් එක්ක, UGC එකත් එක්ක කථා කළාට වැඩක් වෙයිද කියලා මම තමුන්නාන්සේගෙන් අහනවා. වැඩක් නැහැ. ඇයි? උත්තරය හම්බවෙන්නේ මෙතැනින්. තමුන්නාන්සේලාගේ ආයතන තුළ තමුන්නාන්සේලා නිකම්ම නිකම් නිකමුන් විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ඇත්ත. Eco සංකල්පය ඇවිල්ලා තිබෙනවා. Eco සංකල්පය තුළින් වියදම අවම කරන එකයි මේ කරන්න යන්නේ. විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා තමුන්නාන්සේ අහන්න. Roneo කරලා දුන්නා, කොළ ටිකක්. Handout එක දුන්නේ කොළ ටිකක්. දැන් ඒක e-mail එකට එවන්න විධියක් හදලා තිබෙනවා. ගරු ඇමතිතුමා, මම විශ්වවිද්‍යාලයට යනකොට මට පරිගණකයක් තියා පළමු දවසේ බස් එකේ යන්න සල්ලි තිබුණේත් නැහැ. පරිගණකයක් තියා පළමු දවසේ විශ්වවිද්‍යාලයට යන්න - මාතරට යන්න -සල්ලි තිබුණේ නැහැ. තමුන්නාන්සේලා concepts හදනවා. තමුන්නාන්සේලා concept එක හදන්නේ "ලක්ෂ 10ක් රැකියා" කියලා යි. උඩ හදනවා concept එක, යට ඒක ක්‍රියාත්මක කරනවා. මහලක්වත් වෙන්නේ නැහැ. ඕක තමයි ඇත්ත. මම කියනවා, තමුන්නාන්සේ බහින්න එළියට. ඔය වීරත්වයෙන් එළියට බහින්න. "මම ඇමති කෙනෙක්" කියන මානසිකත්වයෙන් එළියට බහින්න. මේ රටේ සාමාන්‍ය මිනිහෙක් විධියට තමුන්නාන්සේ හිතන්න. මේ රටේ සාමාන්‍ය මිනිහෙක් විධියට තමුන්නාන්සේ අගමැතිතුමාටත් උපදෙස් දෙන්න. තමුන්නාන්සේට තවත් අගමැතිවරයාගෙන් සුදු හුණු ගාගන්න දෙයක් නැහැ. තමුන්නාන්සේට අගමැතිවරයාගේ හිතෛෂියෙකු වෙන්න, අප්‍රමාණව එතුමාට ළංවෙන්න තවත් වුවමනාවක් නැහැ. හැබැයි, අපේ රටේ නායකයන්ට තිබෙන ප්‍රශ්න මේවාද, ගරු ඇමතිතුමනි? අපේ රටේ නායකයා වන ජනාධිපතිවරයාට තිබෙන ප්‍රශ්නය, කොහොමද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගේ පක්ෂය කර ගන්නේ කියන එකයි. ආවේ, අවුරුදු 5කට කියලායි. නිර්පාක්ෂිකයි කියලායි ආවේ. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගේ කර ගන්නේ කොහොමද කියන එකයි දැන් එතුමාට තිබෙන ප්‍රශ්නය. එතැනින් එහාට දෙයක් තිබෙනවාද? නැහැ. එතැනින් එහාට තමුන්නාන්සේ දන්නවාද? නැහැ.

ඊළඟට, එක්සත් ජාතික පක්ෂයට තිබෙන ප්‍රශ්නය මොකක්ද? එක්සත් ජාතික පක්ෂයට තිබෙන ප්‍රශ්නය ගැන මම කියන්න යන්නේ නැහැ. මම මේ දේශපාලන ක්ෂේත්‍රයට නවකයෙක්. හැබැයි, සමහර දේවල් අපි දන්නවා; දකිනවා. ඒ දේවල් මේ රටට කියන්න ඕනෑ නැහැ. ගරු අමාත්‍යතුමනි, මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහෝදරත්වයෙන් සිටිය බව මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, නවක වදයට අති බහුතරයක් බණිනවා නේ. "නවක වදය" කියන එකේ තේරුම දැන ගෙනද ඔය කථා කරන්නේ?

නවක කාලය තරම් අත්දැකීම් ලැබෙන කාලයක් කොහේවත් නැහැ, ගරු ඇමතිතුමනි. මම එන්නේ කැබිතිගොල්ලාවේ ඉඳලා නම්, මේ කැබිතිගොල්ලාවේ කොල්ලෙක් කියා හඳුනාගැනීමටයි කැබිල්ලා කියලා කාඩ් එක දමන්නේ. මෙන්න කැබිල්ලා. පාරේ වැටිලා හිටියත් දන්නවා, මෙන්න "කැබිල්ලා" කියලා. මාස තුනක් එක පේළියට ගමන් කරනකොට අපි මුහුණු ටික හඳුනා ගන්නවා. මෙන්න "කැබිල්ලා" කියලා කවුරුත් හඳුනා ගන්නවා. සිංදුවක් කියන්න කිව්වාම, ඔහුට තිබෙන හැකියාව අපි හඳුනා ගන්නවා. හැබැයි ගරු ඇමතිතුමනි, ඒක විකෘති කරලා ඉවරයි. දේශපාලන හස්තය විසින් ඒ උප සංස්කෘතිය විනාශ කළා. මා විශ්වවිද්‍යාලය ඇතුළේ හිටපු මිනිහෙකු විධියට, නවක වදය කියන එක හරි ආදරණීය විධියට වින්ද මිනිහෙක්. Hostel එකේදී කලිසම ගලවන්න කිව්වාම කොල්ලෝ ඉන්න තැන කලිසම ගලවන එක ප්‍රශ්නයක් නොවෙයි, ගරු ඇමතිතුමා. හැබැයි විශ්වවිද්‍යාලයෙන් පිටත සිටින අය කිව්වේ කොහොමද? "හෙලුවෙන් ඉන්න ඉඩ සලස්සනවා" කියලායි. ගරු ඇමතිතුමනි, හැබැයි ඇඳුම් ඇඳගෙන හිටියාට මේ ආණ්ඩුවේ කී දෙනෙක් නම් සමාජය ඉදිරියේ හෙලුවෙන් ඉන්නවාද? අන්න, සමාජ ජාලා වෙබ් අඩවිවල අපේ ඇමතිවරුන් නිරුවත් කරලා තිබෙනවා. ඒ ඇමතිවරුන්ට ගිහිල්ලා බලන්න කියන්න, තම තමන්ගේ රූපය දිහා. අන්න, නිවැරදි රූපය සමාජ ජාලා වෙබ් අඩවිවල තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මේ අවුරුදු පහ ඇතුළත මේ රටේ අධ්‍යාපනය කෙරෙහි වැඩි ඕනෑකමකින් කටයුතු කරලා, මේ රටේ අධ්‍යාපනය නිසි තැනට ගෙන යන්න තමුන්නාන්සේට හැකියාව ලැබේවි කියලා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, මම විශ්වාස කරන ආකාරයට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය බද්ද විය යුත්තේ මහාමාර්ග අමාත්‍යාංශය සමඟ නොවෙයි, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟයි. අපේ දරුවන්ගේ අම්මලා පහ වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් එල්ලා ගෙන පන්තිවලට යනවා. O/L Exam එක කරන කොට ටිකක් අත් හැරලා දමනවා.

ඊළඟට, මොනවා හරි දෙයක් උකස් තියලා උසස් පෙළ පන්තිවලට යවනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ විශ්වාස කරන්න, අපේ ගම්වල සමහර අම්මලා දලු කඩන එක නවත්වලා රෑට වී කොටන්න ගිය අවස්ථා තිබෙනවා. අල්ලපු ගෙදර වී කොටන්න ගියා. ඇයි? මෝල් ගස් දෙකෙන් වී කෙටුවොත් විතරයි හාල් සේරුවක් හම්බ වුණේ. එහෙමයි ඔවුන් තමන්ගේ දරුවන් විශ්වවිද්‍යාලයට යැව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුප්පත් පවුලකින් පාර්ලිමේන්තුවට ආපු තරුණයකු විධියට මම දන්නවා,

හාල් නැතුව ගෙදර හිටපු දවසට තමයි දුප්පත්කමේ තරම දැනෙන්නේ කියලා. අණ්ඩ දමපු කලිසම ඇඳගෙන ගිය නිසා තමයි මට දුප්පත්ම පවුලක සිටින දරුවකුගේත් හැඟීම් තේරෙන්නේ. මාගේ ආසනය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණු එක මන්ත්‍රීවරයෙක් මේ වන විට හැම තැනම කිය කියා යනවා, ජීවිතේට පාර්ලිමේන්තුවට එන්න බැරි එවුන්ටත් "මහින්ද සුළඟ" නිසා පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ලැබුණාය කියලා. දේශපාලනඥයා කියන මිනිහා හැමදාම මිනිසුන් ඉදිරියට ගිහිල්ලා කියන්නේ, "මම තමුන්නාන්සේලා වෙනුවෙන් පෙනී ඉන්නවා, අපි දුප්පත් තමුන්නාන්සේලා වෙනුවෙන් පෙනී ඉන්නවා" කියලායි. හැබැයි දුප්පත් මිනිහෙකුට කවදාවත් උඩට එන්න දෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒක තමයි ඇත්ත කථාව. කවදාවත් උඩට එන්න දෙන්නේ නැහැ. හැබැයි දුප්පත් මිනිහෙකුගෙන් අහන්න, "ඔබ රටට කොයි තරම් ආදරේද? ඔබ මේ රටේ මිනිසුන්ට කොයි තරම් ආදරේද?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මේ ලෝකයේ තිබෙන්නේ තරගකාරී අධ්‍යාපන රටාවක් බව. Hostel එකක් නැති දරුවෝ අපේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගනිද්දී තව දරුවෙක් ඉගෙන ගන්න ඇමෙරිකාවට යනවා. මාතර රුහුණු විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත දරුවාත්, ඇමෙරිකාවේ ඉගෙන ගත්ත දරුවාත්, දෙදෙනාම අවසානයේදී job එකක් ගන්න එක තැනකට එනවා. ඒ දෙදෙනා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට ආවොත් පිට රට ඉගෙන ගත්ත මිනිහාටද, රුහුණු විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත මිනිහාටද job එක දෙන්නේ කියලා මම තමුන්නාන්සේගෙන් අහනවා, ගරු ඇමතිතුමනි. කාටද, job එක දෙන්නේ? Job එක දෙන්නේ අර පිට රට ඉගෙන ගත්ත මිනිහාට. ඇයි? ඌට තමයි ඔළුව තිබෙන්නේ; දැනුම තිබෙන්නේ කියලා තමුන්නාන්සේලා තීරණය කරන නිසා. හැබැයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගමන් කළ යුතු දිශාව මොකක්ද කියන එක පිළිබඳව කාටවත් තේරුමක් නැහැ. කාටවත් හැඟීමක් නැහැ. ඒක සිංහල වෙන්න පුළුවන්; දෙමළ වෙන්න පුළුවන්; මුස්ලිම් වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි උතුරේ ඇති වුණු සිද්ධිය. සිංහල ශිෂ්‍යයකුට එළව එළවා ගහන කොට ඒක බෙදා ගත්ත විධිය හරිද කියලා දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා අපි ඒක බෙදා ගත්තා. අපි ඒක බෙදා ගන්න විධියක් තිබුණා නේ. සංහිඳියාව ඇතුළේ ඒක බෙදා ගත්ත විධියක් තිබුණා. හැබැයි බෙදා ගන්න ඕනෑ එහෙමද, ගරු ඇමතිතුමනි? ඒක බෙදා ගන්න තිබුණේ එහෙම නොවෙයි. දෙදෙනාම ශිෂ්‍යයෝ කියන ගණයට දමලායි ඒක බෙදා ගන්න තිබුණේ. දෙමළද, මුස්ලිම්ද, සිංහලද කියලා නොවෙයි, "මේ අපේ ශිෂ්‍යයෙක්" කියන හැඟීමෙනුයි ඒක බෙදා ගන්න තිබුණේ. හැබැයි ඒ පසුතැවීම කවදාවත් තමුන්නාන්සේලාට හදන්න බැහැ. ඒ ගුටි කාපු ශිෂ්‍යයා සත්‍යය දන්නවා. ඒ ගුටි කාපු ශිෂ්‍යයාගේ හෘදය සාක්ෂිය සත්‍යය දන්නවා. අපි අතර තිබෙන්නේ ජාති භේදයක්, ආගම් භේදයක් නොවෙයි. මේ රටට සත්‍ය වපුරන්නයි අපට වුවමනා කරන්නේ, ගරු ඇමතිතුමනි. ඒකයි අපේ වුවමනාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල පරිසරය තුළ නවකයන් අතර ගොඩ නැඟී තිබුණු සහෝදරත්වය මේ වන විට සම්පූර්ණයෙන්ම අවසන්. ඒ කාලයේ විශ්වවිද්‍යාල පරිසරය තුළ නවකයන් අතර සහෝදරත්වයක් ගොඩනැඟිලා තිබුණා. දුප්පත් පවුලකින් ඇවිල්ලා ඉන්නේ කවුද, එයා කොයි තරම් දුප්පත්ද, එයාට උදවු කරන්න ඕනෑ කොහොමද කියලා ඉස්සර අපි දන්නවා. හැබැයි දැන් එහෙම හඳුනා ගැනීමක් සිදු වන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් තමුන්නාන්සේ මේ ගැන අහලා බලන්න. දැන් assignment එකක් කරන්න දුන්නාම මුලින්ම කරන්නේ නම් ටික දමන එකයි. රුවන්, තරංග, වාමික ආදී වශයෙන් නම් ටික දමනවා. ඊට පසුව එක එක් කෙනා ඒ assignment එක කරන්න දායක වුණු ප්‍රමාණය කොච්චරද කියලා සටහන් කරනවා. එක් කෙනෙක් සියයට 85යි; අනෙක් කෙනා සියයට 20යි; අනෙක් කෙනා සියයට 10යි කියලා group එකේ නායකයා ගිහිල්ලා lecturerට වාර්තාවක් දෙනවා. හැබැයි එදා එහෙම එකක් තිබුණේ නැහැ. මගේ සහෝදරයකුට මේ assignment එකට සම්බන්ධ වෙන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, එදා මම ඒක දැනගෙන සිටියා. නවකයන් කාලයේ දී සිදු වූ හඳුනා ගැනීමත් සමඟ ඔහුගේ ගෙදර ප්‍රශ්න තිබෙනවා, අම්මාට අසනීපයි, ඒ නිසා අපේ සහෝදරයාට එන්න වෙන්නේ නැහැ කියලා මම දැන ගෙන හිටියා. අනෙක් කෙනා මෙසන් වැඩපොළක බදාම අනන්න යනවා කියලා අපි දැන ගෙන හිටියා. ඒ නිසා assignment එකට ඔහුගේ දායකත්වය සියයට 10යි කියලා මම දැම්මේ නැහැ. විශ්වවිද්‍යාල තුළින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් තුළින් අද ඒ සහෝදරත්වය සම්පූර්ණයෙන්ම ඈතට ඇදගෙන ගිහිල්ලා ඉවරයි. ගරු ඇමතිතුමනි, යහපත් මිනිසුන් හදන්න, ඒ වාගේම මේ රට ඉදිරියට ගොඩ නඟන්න විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ගන්න පුළුවන් කාර්ය භාරය අති විශාලයි කියලා මම විශ්වාස කරනවා. මා විශ්වාස කරනවා, නිලධාරින් හැටියට වාඩි වෙලා ඉන්න අය කවදා හෝ දවසක විශ්වවිද්‍යාලයක හිටපු අයයි කියලා.

ගරු ඇමතිතුමනි, මට මතකයි, එක අවස්ථාවකදී මගේ විශ්වවිද්‍යාලය මාරු කරන්න වුවමනාවක් තිබුණු බව. එතකොට මා ස්වාධීන රූපවාහිනියේ වැඩ කරනවා. මට එහි වැඩ කරන්න විධියක් නැති නිසා මට විශ්වවිද්‍යාලය මාරු කරන්න අවශ්‍ය වුණා. මා හත් වතාවක් UGC එකට ගියා. UGC එකේ එක් කෙනෙක්වත් මාව ඇතුළට ගත්තේ නැහැ. ඔන්න වුණු දේ. UGC එකට හත් වතාවක් ගියා. එක වතාවක්වත් මාව ඇතුළට ගත්තේ නැහැ. මගේ ප්‍රශ්නයට ඇහුම් කන් දුන්නේ නැහැ, ලියුමක් දීලා යන්න කිව්වා. මා විශ්වාස කරනවා, දිරලා නැත්නම් ඒ ලියුම කොහෝ හෝ තැනක ඇති කියලා. තමුන්නාන්සේලා කියනවා, ශිෂ්‍යයන් පාරට බහිනවා වැඩියි කියලා. හැබැයි අද ශිෂ්‍යයකුගේ ප්‍රශ්නයක් පිළිබඳව පෞද්ගලිකව හෝ ගිහින් කථා කර ගන්න තැනක් නැහැ. ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න පිළිබඳව කථා කර ගන්න තැනක් නැහැ. ඒක තමයි ඇත්ත.

මේ පාර්ලිමේන්තුවේදී මා තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන, මේ රට හදන්න, මේ රට ගොඩ නඟන්න දායක වන අය විධියට තමුන්නාන්සේලාගෙන් මා එකම එක ඉල්ලීමයි කරන්නේ. මේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එකට එකතු කරලා එක අමාත්‍යාංශයක් කරන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ දරුවෝ, ගුරුවරු වේගයෙන් ඉදිරියට යනවා; උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක තැන නතර වෙලා තිබෙනවා. මේක හරියටම එකම දුම්රිය මාර්ගයේ ශීඝ්‍රගාමී දුම්රියයි, මන්දගාමී දුම්රියයි යනවා වාගෙයි. මන්දගාමී දුම්රිය හෙමිහිට ඉදිරියෙන් යනවා. ශීඝ්‍රගාමී දුම්රිය පිටුපසින් යනවා. එතකොට දුම්රිය දෙකම මන්දගාමීයි. ගරු ඇමතිතුමනි, දැන් වෙලා තිබෙන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මන්දගාමී ගමනක යනවා, අධ්‍යාපන අමාත්‍යාංශය ශීඝ්‍රගාමී දුම්රියක් විධියට යනවා. දෙක එක තැනකදී පැටලෙන බව මතක තබා ගන්න. දෙක එකට හැප්පෙනවා. තමුන්නාන්සේලාට හැප්පෙන එක දැන් තේරෙනවා. හැබැයි තමුන්නාන්සේලාට කරන්න දෙයක් නැහැ. හේතුව, කරන්න දෙයක් නැතිකම නොවෙයි. එයට හේතුව වෙලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳ දැක්මක් - vision එකක් - නැතිකම විතරයි.

ජීවත් වන කාලය තුළ පක්ෂය රැක ගන්න අසත්‍ය ප්‍රකාශ කරනවා. එහෙම තමයි දේශපාලනඥයන්ගේ විධිය. ඒ අසත්‍ය

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

දේවල් කියන්න. හැබැයි රට හදන්න මේ පාර්ලිමේන්තුවට ආපු අය විධියට, මේ මාතෘ භූමියේ ඉපදුණු සුජාත දරුවන් විධියට රට වෙනුවෙන් තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියත් එක්ක වැඩ කරන්නය කියන ඉල්ලීම මා කරනවා. ඒ ඉල්ලීම කරමින්, මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත් දරුවකු විධියට, නිදහස් අධ්‍යාපනයේ පුතකු විධියට මා ප්‍රාර්ථනා කරනවා, මේ ගෞරවනීය මාතෘ භූමියේ නිදහස් අධ්‍යාපනය තව තවත් රැකේවා, මේ රට හදන මිනිසුන් නිදහස් අධ්‍යාපනයෙන් තව තවත් බිහි වේවා, කවුරුන් පත් වුණත් මේ රටේ ආණ්ඩුවලට, ඇමතිවරුන්ට ඒ වෙනුවෙන් උදවු කරන්නට හැකියාව ලැබේවා!යි කියා. එසේ ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි! ස්තුතියි.

[பி.ப. 5.35]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

The Hon. Presiding Member, I have some issues to bring to the attention of the Minister of Higher Education and Highways and the Chairman of the University Grants Commission. But, I am going to speak in Tamil.

இந்தவேளையிலே, பரவலான முறையில் பலரதும் நாட்டி னதும் கவனத்திற்கு வராத விடயத்தை இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன். அதன்மீது பல்கலைக் கழக மானியங்கள் ஆணைக்குழுவும் உயர் கல்வி அமைச்சரும் உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டும் என்றும் எதிர்பார்க்கிறேன்.

யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் கல்வி நடவடிக்கை களுக்காகத் தெரிவுசெய்யப்பட்ட மகாதேவன் விஜயகுமார் என்ற மாணவன் தனது கற்றல் நடவடிக்கைகளை நிறுத்தி விட்டார். பகிடிவதை - "ராக்கிங்" -என்ற பெயரில் அவர் வதைக்கப்பட்டதே இதற்கான காரணம். இந்த விடயம் தமிழ்ப் பத்திரிகைகளில் செய்தியாக வெளிவந்தபோதும் அந்த மாணவன் தனது கல்வியைத் தொடர்வதற்கு வேண்டிய நடவடிக்கை எதனையும் யாழ். பல்கலைக்கழகத் துணைவேந்தர் வசந்தி அரசரட்ணமோ பல்கலைக்கழக நிர்வாகமோ மேற்கொள்ளவில்லை. மாணவன் வரப்பிரகாஷின் கொலையின் பின்னர், பல்கலைக்கழகங்களிலிருந்து பகிடிவதை முற்றாக அகற்றப்பட்டதாகச் சொல்லப்படுகிறது. ஆனாலும், பல்கலைக்கழகங்களில் அவை தொடரத்தான் செய்கின்றன. அதிலும், போரால் அதிகம் பாதிக்கப்பட்டு துன்பம், சித்திரவதை என்பவற்றில் அனுபவங்களைக் கொண்டிருக்கக்கூடிய யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் இத்தகைய கொடூரம் நடப்பதையும் அதனைத் துணைவேந்தரும் நிர்வாகமும் கண்டுகொள்ளாமல் இருப்பதையும் ஏற்றுக்கொள்ள முடியவில்லை. சமூகத்துக்கு முன்மாதிரியாக இருக்கவேண்டிய ஒரு பகுதியினர் இவ்வாறு கீழ்த்தரமான நடவடிக்கைகளைத் தங்கள் கல்வி நிறுவனத்தில் அனுமதித்திருப்பது கவலையளிக்கிறது. மாணவன் விஜயகுமார் மிகவும் பின்தங்கிய ஒரு கிராமத்தைச் சேர்ந்தவன். பின்தங்கிய அவனது சமூகத்திலிருந்து படித்துப் பல்கலைக்கழகத்திற்குத் தெரிவாகிய அவனை ஊக்குவித்து ஆதரவளித்திருக்க வேண்டும். அதுவே பல்கலைக்கழகம் போன்ற உயர் நிறுவனங்கள் ஆற்றியிருக்கக்கூடிய மிகச் சிறந்த பணி. ஆனால், அவ்வாறு நடக்கவில்லை.

2016ஆம் ஆண்டு வர்த்தகப் பிரிவில் இணைந்த விஜயகுமார் வெறும் 3 மாதங்களிலேயே தனது படிப்பைக் கைவிட்டார். சக மாணவர்களின் பகிடிவதை கட்டுக் கடங்காமல் சென்றமையே அதற்குக் காரணம். பகிடிவதை என்ற பெயரில் தினமும் கொடுமைப்படுத்தப்பட்ட அம்மாணவன், மன அழுத்தத்தினால் தனது படிப்பை நிறுத்திவிட்டு, தற்போது தந்தையுடன் சேர்ந்து கூலிவேலை செய்து வருகின்றான். பட்டதாரியாக ஓர் அரச வேலையில் அமரவேண்டும் என்ற அவரது கனவு சிதைக்கப்பட்டுள்ளது. உயர் கல்வி அமைச்சரும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவும் இவ்விடயத்தில் அதிக கவனம் செலுத்தி, அந்த மாணவன் வேறு பல்கலைக்கழகம் எதிலாவது கல்வியைத் தொடர்வதற்கு ஆவன செய்யவேண்டும். ஏற் கெனவே, மிக மோசமான நிர்வாகத்தைக் கொண்டுநடத்தும் யாழ்ப்பாணப் பல்கலைக்கழகத் துணைவேந்தர் இந்த விடயத்தில் நேர்மையாக நடந்து, அந்த மாணவனுக்கு நீதி வழங்குவார் என்று எதிர்பார்க்கமுடியாது. அந்த மாணவன் இதுதொடர்பில் தன்னிடம் முறைப்பாடு செய்யவில்லை என்ற ஒரு காரணத்தை மட்டும் முன்வைத்து இந்த விடயத்தைக் கைகழுவி விடுவார். எனவேதான் உயர் கல்வி அமைச்சரும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவும் இவ் விடயத்தில் தலையிட்டு நடவடிக்கை எடுக்கவேண்டும் என்று வலியுறுத்துகின்றேன். இந்த மாணவன் தனது பல்கலைக்கழகக் கல்வியை நிறுத்துவதற்குக் காரணமாக இருந்த மூத்த மாணவர்கள் தொடர்பில் பக்கச்சார்பற்ற விசாரணை ஒன்றை நடத்தி, குற்றவாளிகளைத் தண்டிக்கவும் நடவடிக்கை எடுக்கவேண்டும். அப்போதுதான் இனிவரும் காலங்களில் இத்தகைய சம்பவங்கள் இடம்பெறாது தடுக்கலாம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போர் முடிவடைந்து 7 ஆண்டுகள் நிறைவடைந்துவிட்டன. நல்லாட்சி அரசு பொறுப்பேற்று ஒரு வருடம் கடந்துவிட்டபோதும், யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் உட்கட்டுமான வசதிகளும் மாணவர்களுக்கான வசதிகளும் தேவையான அளவுக்கு மேம்பட்டிருப்பதாகத் தெரியவில்லை. எந்த முன்னேற்றமும் இல்லையென்று நான் கூறவில்லை. ஆனால் தேவையான, எதிர்பார்க்கப்பட்ட முன்னேற்றம் ஏற்பட்டுள்ளதா? என்றால் இல்லையென்றே சொல்லவேண்டியிருக்கிறது. யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் உட்கட்டுமான அபிவிருத்திக்கு வழங் கப்படும் நிதி போதுமானதாக இல்லையென்று அங்குள்ள ஆசிரியர்களும் அலுவலர்களும் குறைபடுகின்றனர். துணைவேந்தருக்கு பிடித்தமானவர்களுள்ள பிரிவுகளுக்கு அந்தப் பிரச்சினை இல்லை. என்றாலும் பெரும்பாலான பிரிவுகளில் உட்கட்டுமான வசதிகளை நன்றாக விரிவுபடுத்த வேண்டியுள்ளது. சில கட்டிடங்கள் 18 வருடங்களாக பூச்சுகடகூட பூசப்படாமல் இருக்கின்றன. சுத்தமான குடிதண்ணீரைப் பெறுவதும் சிக்கலாகவே இருக்கின்றது. யாழ்ப்பாணத்தின் நிலத்தடி நீர் மாசுபட்டிருக்கும் நிலையில் மாணவர்கள், ஆசிரியர்கள் அனைவருக்கும் கிடைக்கக்கூடிய வகையில் பாரியளவிலான நீர் சுத்திகரிப்பு நிலையம் பல்கலைக்கழகத்தில் அமைக்கப்பட வேண்டும். தற்போதுள்ள சிறிய, சிறிய தொகுதிகள் ஆசிரியர்களுக்கும் பணியாளர் களுக்கும் மட்டுமே பயனுள்ளவையாக இருக்கின்றன. அதிகமான பாவனை காரணமாக அவையும் விரைவிலேயே பழுதடைகின்றன. எனவே, முழுப் பல்கலைக்கழகத்திற்குமான சிறப்பான குடிநீர் விநியோகத்துக்கென நடுவண் சுத்திகரிப்புத் தொகுதியொன்று உடனடியாக நிறுவப்பட வேண்டும்.

யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் கணினி விஞ்ஞானப் பிரிவு ஆரம்பிக்கப்பட்டு 25 ஆண்டுகளாகிவிட்டன. ஆனால்,

இன்னமும் அதற்கான ஒரு தனிக் கட்டிடத்தொகுதி இல்லை. கணிதப் பிரிவின் ஒரு பகுதியிலேயே அது இன்னமும் இயங்கி வருகின்றது. உலகம் முழுவதும் கணினி யுகத்தில் மூழ்கிவிட்ட இன்றைய நிலையில் அதனை எதிர்கொள்ளக்கூடிய வகையில் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் கணினிப் பிரிவு இல்லாம லிருப்பது கவலையளிக்கின்றது. இந்த நிலைமை சீர்செய்யப் பட வேண்டும். இதற்கான முயற்சிகள் ஏற்கெனவே ஆரம்பிக்கப்பட்டுவிட்டன. ஆனாலும் காரியங்கள் ஆமை வேகத்திலேயே நகர்கின்றன. கணினிப் பிரிவுக்கெனத் தனியான கட்டிடம் அமைக்கும் பணிகளுக்கான ஆவணங்கள் தற்போது தேசிய திட்டமிடலுக்குப் பொறுப்பான அமைச்சில் தேங்கிக் கிடப்பதாகச் சொல்லப்படுகின்றது. நாங்கள் 25 வருடங்களாகக் காத்திருக்கின்றோம் என்பதைக் கொழும்பி லுள்ள அதிகாரிகள் உணர வேண்டும். பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவும் உயர் கல்வி அமைச்சரும் இந்த விடயத்தில் அதிக அக்கறை எடுப்பதன்மூலமே பணிகளை விரைவுபடுத்த முடியும்.

கடந்த 30 வருடங்களாக வடக்கில் நடந்த போரால் நாம் பின்தங்கியிருந்தோம். இனிமேலாவது இந்த உலகத்துடன் ஒத்தோடக்கூடிய வகையில் எம்மை நாம் தயார்படுத்த வேண்டியிருக்கிறது. துரதிருஷ்டவசமாக அதனைச் செய்வதற்கு நாம் கொழும்பையே எதிர்பார்த்திருக்க வேண்டியிருக்கிறது. கொழும்போ எப்போதும்போல் மாற்றாந்தாய் மனப்பான்மை யுடனேயே நடந்துகொள்கின்றது. இது இந்த நல்லாட்சியிலும் தொடர்வதைச் சகித்துக்கொள்ள முடியவில்லை. தலைமைகள் நேர்மையுடன் பேசுவதால் மட்டும் மாற்றத்தை ஏற்படுத்திவிட முடியாது. நேர்மையான, உண்மையான நடவடிக்கைகளும் அவசியம். அதனை முதலில் செய்யுங்கள்! நல்லிணக்கம் தானாகவே ஏற்படும்.

பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு புதிது புதிதாகப் பிரிவுகளை ஆரம்பிக்கின்றபோதும் பல்கலைக்கழகம் கேட்கின்ற தேவையான ஆளணியை வழங்குவதில்லை; குறைத்தே வழங்குகின்றது என்ற குற்றச்சாட்டு நீண்ட காலமாகவே உள்ளது. எல்லாப் பல்கலைக்கழகங்களிலும் இதுவேதான் நிலைப்பாடா? அல்லது இதிலும் வடக்குக்கு மட்டுமே இத்தகைய கவனிப்பா? என்பது தெரியவில்லை. ஆனால், பல புதிய பிரிவுகளுக்கும் ஏற்கெனவே இருக்கின்ற பிரிவுகளின் விரிவாக்கங்களுக்கும் போதியளவு ஆளணிகள் கிடைக்கவில்லை என்றே முறையிடப்படுகின்றது. எனவே, இந்த விடயத்தை கவனத்திற் கொண்டு உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

யாழ். பல்கலைக்கழகத்தின் கிளிநொச்சியிலுள்ள வளா கத்தில் தொழில்நுட்ப பீடம் புதிதாக ஆரம்பிக்கப் படவுள்ளது. ஆனால், அதற்கான உட்கட்டுமான வசதிகள் இன்னமும் சரிவர ஏற்படுத்தப்படவில்லை. இந்த ஆண்டில் இந்தப் பீடத்திற்கான மாணவர்கள் சேர்க்கப்படவுள்ள நிலையில் அதற்குரிய வசதிவாய்ப்பை அவர்களுக்கு விரைவாக ஏற்படுத்திக் கொடுக்க வேண்டியிருக்கின்றது. கிளிநொச்சி வளாகத்தில் கட்டுமானப் பணிகள் தொடர்ந்து நடந்துவருகின்றபோதும் பொறியல் பீடத்திற்கான பணிகளின் மீதே அதிக கவனம் செலுத்தப்பட்டு வருகின்றது. தொழில்நுட்பபீடம் மிகச் சிறப்பானது. அதற்கூடாக வெளிவரக்கூடிய மாணவர்கள் எதிர்காலத்தில் மிகச் சிறந்த தொழில்நுட்ப அறிவுள்ள வேலையாட்களாக உருவாகுவார்கள். தொழில்நுட்ப அறிவுள்ள வேலையாட்களுக்கு வடக்கில் பெரும் பற்றாக்குறை நிலவுகின்ற நிலையில், இந்தப் பீடம் எதிர்காலத்தில் மிகச் சிறந்த சக்தியை வடக்குக்கு வழங்க முடியும். எனவே, அதற்கான கட்டுமானங்களை விரைவுபடுத்தி அதனை ஏற்படுத்திக் கொடுக்க ஆவன செய்ய வேண்டும்.

அத்தோடு மாணவர்கள் பகிடிவதை மற்றும் குழு மோதல்களில் தேவையற்று ஈடுபடுவதைத் தவிர்க்கும் வகையில் அவர்களுக்கான பொழுதுபோக்கு மற்றும் விளையாட்டு வசதிகளையும் விரிவாக்க வேண்டிய தேவை இருக்கின்றது. அதன்மீதும் கவனம் செலுத்தப்படுவது அவசியம். தற்போது யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் அத்தகைய வசதிகள் போதியளவில் இல்லை என்பது கண்கூடு. மாணவர்களின் கல்வி விருத்தியில் கவனம் செலுத்தும் அதேவேளையில், அவர்களின் உடல், உள விருத்தியிலும் கவனம் செலுத்துவதே அவர்களை எதிர்காலத்தில் நல்ல குடிமக்களாக உருவாக்க உதவும்.

யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் அண்ணளவாக 7,000 மாணவர்கள் தற்பொழுது கல்வி பயின்று வருகின்றனர். இவர்களுக்கான விளையாட்டுச் செயற்பாடுகளுக்கான வசதிகள் யாழ்ப்பாணப் பல்கலைக்கழகம் கிளிநொச்சி பிராந்திய நிலையம் மற்றும் வவுனியா வளாகம் என்பவற்றில் ஏற்படுத்தப்பட வேண்டியுள்ளன. மேலும் நிர்வாகக் கட்டிடம், ஒளி வசதிகள், நீர்ப்பாசன வசதிகள், கூடைப்பந்தாட்டத் திடல் அபிவிருத்தி, வலைப் பந்தாட்டத்திடல் அபிவிருத்தி, மைதான மேற்பரப்புச் சமப்படுத்தல், கழிவு நீர்ப்பாசன வசதி, உள்ளகத் தெருக்கள், வாகனத் தரிப்பிட வசதி என்பன புனருத்தாரண நிதியிருந்து மேற்கொள்ளப்பட வேண்டியுள்ளது. இதற்காக எதிர்காலத்தில் விசேட நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப் படுமானால், இந்த வசதிகளை ஏற்படுத்துவது சாத்தியமாக அமையும். இதற்குப் புறம்பாகச் சர்வதேச தரத்திலான நீச்சல் தடாகமொன்றையும் பார்வையாளர் அரங்கையும் நிர்மாணிப் பதற்காக நிதி வசதிகள் ஏற்படுத்தப்பட வேண்டியுள்ளது.

கிளிநொச்சிப் பிராந்திய நிலையத்தில் அண்மையில் கல்விச் செயற்பாடுகள் ஆரம்பிக்கப்பட்ட நிலையில் அங்கு மைதான வசதி, உள்ளக விளையாட்டு அரங்கு உட்பட ஏனைய உட்கட்டுமான வசதிகளும் ஏற்படுத்தப்பட வேண்டியுள்ளது. இதற்கான விசேட நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்படும் பட்சத்தில், இப்பிராந்திய விளையாட்டுச் செயற்பாடுகளுக் கான வசதிகளைத் துரிதமாக முன்னெடுக்கக் கூடியதாக இருக்கும்.

வவுனியா வளாகமானது பம்பைமடுப் பிரதேசத்தில் தற்போது அபிவிருத்தி செய்யப்பட்டு வருகின்றது. இங்கு விளையாட்டு மைதான அபிவிருத்தி நிறைவடையும் தறுவாயில் உள்ளது. அதேநேரம் சிறிய உள்ளக விளையாட்டு அரங்கு நிர்மாணிக்கப்பட்டு அதனது பணிகள் நிறைவுறாத நிலைமையில் காணப்படுகின்றது. பார்வையாளர்களுக்கான நிர்மாண வசதிகளும் ஏற்படுத்தப்பட வேண்டியுள்ளது. இதற்கான நிதிகள் விசேடமாக ஒதுக்கப்பட வேண்டிய தேவை காணப்படுகின்றது.

பல்கலைக்கழகமானது தனித்து நூற்கல்வியினை மட்டும் போதிக்கும் நிறுவனமல்ல. மாறாக நாட்டினதும் பிரதேசத் தினதும் பொருளாதார மற்றும் சமூக கலாசாரத்தினை மேம்படுத்துகின்ற பாரிய கடமையினை அல்லது சமூகப் பொறுப்பினைக் கொண்டுள்ளது. கல்விசார் சமூகத்தின் நீண்டகாலக் கோரிக்கை என்றவகையில் நாட்டின் பொருளாதாரத்திற்குப் பெரும் பங்காற்றக்கூடிய திட்டமிடலை யாழ். பல்கலைக்கழகத்தினூடாகச் செய்ய வேண்டியது அரசின் தாற்பரியக் கடமை என்பதனை யாழ். மாவட்டத்தின் மக்கள் பிரதிநிதியாகிய நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அந்த வகையில் முதலாவதாக யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் உடனடியாக Faculty of Marine Engineering -கடல்சார் பொறியியல் பீடத்தினை ஆரம்பிக்குமாறு சம்பந்தப்பட்ட அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன். உங்கள்

[ගරු ඊ. සරවනපවන් මහතා]

அனைவருக்கும் நன்றாகத் தெரியும், வட மாகாணமானது கடல் வளத்தினைத் தன்னகத்தே கொண்டமைந்தது என்று. இந்தச் சிறப்பானது வேறெந்த மாகாணங்களுக்கும் இல்லாத வளம் ஆகும். அதுமாத்திரமின்றி 1980 காலப் பகுதியில் நாட்டின் மொத்த மீன் உற்பத்தியில் வடக்கு மாகாணம் மாத்திரம் 40 வீதமான காத்திரமான பங்களிப்பினைச் செய்து சிறப்பு நிலையில் இருந்தது. யுத்தத்தின் பின்னரும் யுத்தத்தின்போதும் இந்த நிலைமை தலைகீழாக மாறியுள்ளது. எனவே, மீண்டும் வட மாகாணத்தை எழுச்சிபெறச் செய்வதாயின், மீன்பிடித் துறையில் அதிக முதலீட்டை மேற்கொள்ள வேண்டும். அவற்றுள் பிரதானமானது மீன்பிடித்துறைசார் மீதான ஆய்வு மற்றும் அறிவியல் ரீதியான, விஞ்ஞான ரீதியான செயற்றிட்ட முன்னெடுப்புக்களாகும். இதற்கு ஏற்றாற்போல் காலத்தின் தேவை கருதி உடனடியாக Faculty of Marine Engineering ஐப் பொருத்தமான இடத்தில் வட மாகாணத்தில் உருவாக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

முன்னாள் துணைவேந்தரும் புகழ்பெற்ற பொறியியல் பேராசானுமான அமரர் துரைராஜா அவர்கள் பொறியியல் பீடத்தைக் கிளிநொச்சியிலும் Faculty of Marine Engineering ஐ முல்லைத்தீவிலும் உருவாக்கும் திட்டத்தினை ஏற்கெனவே முன்மொழிந்திருந்தார். மக்களில் அக்கறையுள்ள அரசாங்க மெனில், மீன்பிடித் தொழில்சார் துறையை மேம்படுத்தி மக்களது வாழ்வாதாரத்தை அதிகரிக்க நினைத்தால் கடல் பொறியியல் பீடத்தை முல்லைத்தீவில் உடனடியாக அமைக்க முன்வரவேண்டும். இதற்குப் பல்வேறு பொருளாதார நலன்களை முன்வைக்க முடியும். அவையாவன: நாட்டின் மீன் உற்பத்தி அதிகரிக்கும்; மீன் இறக்குமதி குறைவடையும்; அந்நியச் செலாவணி இழப்புக் குறைவடையும். மீன் ஏற்றுமதியில் ஓர் அதிகரிப்பை ஏற்படுத்தி வெளிநாட்டுச் செலாவணியை அதிகரிக்க முடியும். இது நாட்டின் ஒட்டுமொத்த வளர்ச்சிக்கும் பாரிய பங்களிப்பை ஏற்படுத்து வதுடன், அரசுக்கான மானியச் செலவு மற்றும் உதவித்தொகை வழங்கல் போன்ற செலவினை இல்லாமல் செய்யும். அத்துடன், கடல்சார் துறை சார்ந்த நேரடி மற்றும் மறைமுகத் தொழில் வாய்ப்புக்கள் ஏற்பட்டுத் தற்போது காணப்படும் வேலையின்மை போன்ற பிரச்சினைகள் இப்பிரதேசத்தில் இல்லாதுபோகும். எனவே, இத்திட்டத்தினை நடைமுறைப் படுத்த அனைவரும் முன்வரவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக யாழ்ப்பாணம் மற்றும் வட மாகாணத்திலுள்ள ஏனைய மாவட்டங்கள் விவசாய உற்பத்திற்குப் பெயர் பெற்றன. குறிப்பாக அங்கு வெங்காயம், மற்றும் மிளகாய் உற்பத்தி மிகவும் பிரபல்யம் பெற்றது. 1971ஆம் ஆண்டு வடக்கு, கிழக்கு மாகாணங்களில் சின்ன வெங்காய உற்பத்தி - red onions - 36,518 மெற்றிக் தொன்னாகவும் பெரிய வெங்காய உற்பத்தி 205 மெற்றிக் தொன்னாகவும் இருந்தது. மொத்த உற்பத்தி 36,723 மெற்றிக் தொன்னாகக் காணப்பட்டது. நாட்டின் ஏனைய பகுதிகளின் மொத்த வெங்காய உற்பத்தி 8,428 மெற்றிக்தொன்னாக மட்டுமே யிருந்தது. Dr. Preston S. Pattie, Agriculture Economist and Mr. Yapa M. Wickramasinghe, Agriculture Economist ஆகியோரின் 1993ஆம் ஆண்டின் "Present Status and Future Prospects of Onion Production in Sri Lanka" என்ற ஆய்வு அறிக்கையின்படி வடக்கு, கிழக்கின் வெங்காய உற்பத்தியானது நாட்டின் மொத்த உற்பத்தியில் 81.35 சதவீதமெனக் குறிப்பிடப்பட்டுள்ளது. இந்நிலைமையானது 1971ஆம் ஆண்டிலாகும். பின்னர் 1986ஆம் ஆண்டு அது 79 சதவீதமாக இருந்தது. யுத்தத்தின் பின்னர் நிலைமை மோசமடைந்துள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

தற்பொழுது பழச் செய்கையானது பாரிய முன்னேற்றத் தினை இயல்பாக வெளிப்படுத்த ஆரம்பித்துள்ளது. எனவே, மரக்கறி வகைகள் மற்றும் பிரபலமான யாழ்ப்பாணம் மற்றும் வன்னி மாவட்டங்களின் மாம்பழம், திராட்சை, தோடம்பழம், மாதுளம்பழம், அன்னாசி, பலாப்பழம் போன்றவற்றின் உற்பத்திகள் அதிகரித்தபோதும் விவசாயிகளின் வருமானம் மோசமாகப் பாதிப்படைந்துள்ளது. போதிய சந்தை வாய்ப்பின்மை, பாதுகாப்பான போக்குவரத்து - அதாவது பழுதடையாத வகையில் இடம் நகர்த்தும் தொழில்நுட்ப மின்மை, பழங்களைப் பதப்படுத்தும் மற்றும் களஞ்சியப் படுத்தும் குளிரூட்டியுடன் கூடிய வசதிகள் இன்மை, தொழில்நுட்ப வசதிகள் மற்றும் துறைசார் அறிவு இன்மை என்பவையே இவற்றுக்கான காரணங்களாகும். எனவே, அரசானது தற்போதைய சூழலுக்கும் சந்தை வாய்ப்புக்கும் ஏற்றாற்போல் பழச்செய்கை, பழங்களைக் கையாளல், பதப்படுத்தல், பொதியமைத்தல் மற்றும் சந்தைப்படுத்தலில் முன்னேற்றத்தை ஏற்படுத்தக்கூடிய வகையில் பழங்களையும் உணவுகளையும் பதப்படுத்தும் பாரிய தொழிற்சாலைகளை - fruit production industry - உருவாக்குவதன்மூலம் வறுமையில் வாழும் எமது விவசாயிகளைப் பாதுகாக்கலாம். வெளிநாடு களில் யாழ். மாவட்டப் பழவகைகளுக்கு நல்ல வரவேற்புக் காணப்படுகின்றது. எனவே, பழவகைகளைப் பதப்படுத்தி தகரத்தில் அடைத்து ஏற்றுமதி செய்வதன்மூலம் அதிக வெளிநாட்டு வருமானத்தை ஈட்டமுடியும். ஆகையால், அரசாங்கம் பல்கலைக்கழகங்களின்மூலம் இத்தகைய பட்டப் படிப்பு மற்றும் தொழிலையும், அதற்கான தொழிற் சாலைகளையும் மேம்படுத்த உடனடியாக நடவடிக்கை மேற்கொள்ள முன்வரவேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 5.48]

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ කථා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මේ පිළිබඳව කථා කරනකොට මා කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවූ බව. මෙම පනත විවිධ සංශෝධන ඔස්සේ ඇවිත්, අද මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට මෙතුවක් කල් පැවති වයස අවුරුදු 57න් විශ්‍රාම යෑමේ වයස් සීමාව අවුරුදු 57 සිට අවුරුදු 60 දක්වා දීර්ඝ කරලා තිබෙනවා.

ලංකාවේ විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා ගෙන ඇවිත්, ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලයක උපාධියක් හදාරපු අග්‍රාමාත්‍යවරයකු

නියෝජනය කරන රජයක් යටතේ මේ උත්තරීතර සභාව නියෝජනය කරමින් විශ්වවිද්‍යාල ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම මගේ භාග්‍යයක් කොට සලකනවා. මේ අවස්ථාවේදී ඒ ගැන ඉතාමත් ආඩම්බරයෙන් කථා කරන්න මා කැමැතියි. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ගැන කථා කරන කොට අපේ සහෝදර මන්ත්‍රීවරුන් කිව්වා වාගේම විශ්වවිද්‍යාල ජීවිතය තමයි ජීවිතයේ සුන්දරම කාලය කියලා අපි කාටත් කියන්න පුළුවන්. විශ්වවිද්‍යාලයේදී ඒ සුන්දර අත්දැකීම් ලැබූ උපාධිධාරී මහජන නියෝජිතයන් සියලු දෙනාම ඒ කාරණයත් එක්ක එකඟ වෙනවාය කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල ජීවිතය ගැන කථා කරන කොට මට මතක් වෙනවා, 1984 වර්ෂයේ අපි රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ගිහිල්ලා ප්‍රථමයෙන්ම නවක වදයට මුහුණ දුන් ආකාරය. සමහර වෙලාවට නවක වදය කියන එක අමිහිරි අත්දැකීමක් වුණත් අපි සුන්දරව ලැබූ ඒ නවක වදය අපි තවමත් බොහොම ආදරයෙන්, මිහිරියාවෙන් මතකයට නඟා ගන්නවා. අපි විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් විධියට නවක වදයත් එක්ක විවිධ අභියෝගවලට මුහුණ දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ විශ්වවිද්‍යාල කාල සීමාව තුළදී බොහොම අභාග්‍ය සම්පන්න කාල පරිච්ඡේදයකටත් අපි මුහුණ දුන්නා. ඒ 1984 - 85 වර්ෂවල තිබුණු භීෂණකාරී තත්ත්වයයි. ඒ නිසා තරුණ වයසේ සිටි අපට වසර හතරකින් හතරහමාරකින් උපාධිය සම්පූර්ණ කර ගෙන එළියට එන්න තිබුණු අවස්ථාව අහිමි වුණා. ඒ කාලයේ තිබුණු දේශපාලන වාතාවරණය නිසා විවිධ බලපෑම් එක්ක අපට වසර හතහමාරක් අටක් පමණ විශ්වවිද්‍යාලය තුළ ඉන්න සිද්ධ වුණා. නමුත් ජීවිතයේ විවිධ අභියෝග මධ්‍යයේ අපේ විශ්වවිද්‍යාල මිතුරු මිතුරියන් එක්ක බොහොම ලෙන්ගතුකමින්, සහෝදරත්වයෙන් ගත කරමින්, එක බත්පත බෙදා ගෙන කාපු ආකාරය මට මතකයි. ඇත්තටම මේ වකවානුවේ තරම් ඒ වකවානුවේ පහසුකම් තිබුණේ නැහැ. අද මේ පෞද්ගලික විශ්වවිද්‍යාලත් එක්ක අරගළ කරන කොට මට මතක් වෙනවා, අපිත් ඒ කාලයේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් හැටියට විදි බැස්ස ආකාරය. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ තරුණ ජීවිත ගැන කථා කරන කොට අද විශ්වවිද්‍යාල දරුවන් පාරට බැහැලා අරගළ කරන කොට මම දැක්කේ මගේ ජීවිතයේ අත්දැකීම්. ඒක තමයි අපට වසර හතරහමාරකින් උපාධිය සම්පූර්ණ කරලා එළියට එන්න තිබුණු අවස්ථාව අහිමි වෙලා ඒ සඳහා වසර හතක් ගත වුණු එක. ඒකට හේතු වුණේ මේ රටේ තිබුණු විවිධ බලපෑම් සහ විවිධ කණ්ඩායම්වල බලපෑම් ද කියලා මට හිතෙනවා.

ඇත්තටම මට මේ වෙලාවේ මේ උත්තරීතර සභාවේ සිට අපේ ආදරණීය විශ්වවිද්‍යාල දූවා දරුවන්ට පණිවිඩයක් දෙන්න තිබෙනවා. ජීවිතයේ තරුණ සමයේ අධ්‍යාපනය හදාරනවාය කියන එක ඉතාම වටිනා අවස්ථාවක්. ඒ කාලයේදී තරුණ ජවය නිසා පාරට බැහැලා, උද්ඝෝෂණ කරලා තමන්ගේ ජීවිතයේ වටිනා කාලය නාස්ති කරමින් මේ මූලාවට රැවටෙන්න එපාය කියන පණිවිඩය වැඩිහිටියෙක් විධියට, මවක් විධියට බොහොම ආදරයෙන් සහ ලෙන්ගතුකමිනුයි මම දෙන්නේ. මොකද, අපට ඒ කාලය ජීවිතයේ කවදාවත් ආපස්සට අදින්න බැහැ. එවැනි දේ තුළින් අපි අත්දැකීම් ලබා තිබෙනවා. ඒ සිදු වීම් එක්ක අපට රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වෙන්න සිද්ධ වුණේ තාරුණ්‍ය නිමා වෙන කොටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ අපි දකින තවත් දෙයක් තිබෙනවා. ඒ කාලයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබුණු පීඨ ගැන බලන විට අද විශ්වවිද්‍යාලවල දරුවන්ට ඉගෙන ගැනීම සඳහා නොයෙකුත් අවස්ථාවන්, විවිධ විෂය ධාරාවන් තිබෙනවා. රටේ අවශ්‍යතාව අනුව විශ්වවිද්‍යාලවල සමස්ත විෂය පද්ධතිය සැකසෙනවා නම් අද අපේ රටේ එකතු වෙලා ඉන්න කලා උපාධිධාරීන් පිරිසගේ විරැකියා ප්‍රශ්නය විසඳන්න අවස්ථාව සැලසෙනවාය කියා මම හිතනවා. අද අපේ රටේ උපාධිය ලබා ගත් දූවා දරුවන්ට තිබෙන ප්‍රධානතම ගැටලුව විරැකියාවයි. විරැකියාවට හේතුව මේකයි. විශ්වවිද්‍යාලවල පාඨමාලාවන් සකස් කර තිබෙන්නේ රටේ රැකියා අවස්ථා සඳහා පවතින ඉල්ලුමට නොවෙයි. ඒ නිසා අද මුහුණපාන ගැටලුවක් විධියට අපේ තරුණ පිරිසට රැකියා අවස්ථාවන් ලබා ගැනීම සඳහා කාලයක් ගෙවල්වලට වෙලා ඉඳලා, සමහර වෙලාවට තමන්ගේ උපාධියට සරිලන්නේ නැති ආකාරයේ වෘත්තීන්ට ඇතුළත් වෙන්න සිදු වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි, මේ වෙලාවේ අපට ප්‍රධානම ගැටලුව, අභියෝගය වෙලා තිබෙන්නේ මේ උපාධිධාරීන්ගේ විරැකියා ප්‍රශ්නය විසඳීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මම අපේ ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාට ගෞරවයෙන් යෝජනා කරනවා, මේ රටේ අවශ්‍යතාවට අනුව, ඉල්ලුමට සරිලන ආකාරයට මේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පාඨමාලාවන් ඇති කරලා, ඒ සඳහා දරුවන් නැඹුරු කරවීම ගැන අවධානය යොමු කරන්නය කියා. ඒක උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පමණක් නොවෙයි, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනිකුත් අමාත්‍යාංශවල එකතුවක් හරහා මෙය සිදු විය යුතුයි කියලා මා හිතනවා. ඒ කාරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන දැන් කථා කළා. පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන කථා කරනකොට මට මතක් වුණා, රාගම ඇති කරපු පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරුද්ධව මමත් එදා වෛද්‍ය ශිෂ්‍යාවක් විධියට එළියට බැහැලා, මහමෝදර, ගාල්ල ප්‍රදේශවල picketing ව්‍යාපාරවලට හවුල් වුණු ආකාරය. හැබැයි, 1993 සහ 1994 වසරවලදී මේ රාගම වෛද්‍ය පීඨයෙන් පිට වුණු - පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ - ශිෂ්‍ය ශිෂ්‍යාවන් සීමාවාසික කාලය තුළ අධ්‍යාපන කටයුතු හදාරනකොට අපත් සමග ප්‍රායෝගිකව සම්බන්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඔවුන් මේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ විවිධ රටවල විශේෂඥ වෛද්‍යවරු විධියට රැකියාවල නිරත වෙනවා. වෛද්‍ය උපාධිය හදාරපු කෙනෙකු විධියට මා කියන්න ඕනෑ, වෛද්‍ය උපාධියට විතරයි අද මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ කියන එක. මොකද, විවිධ ක්ෂේත්‍ර, විවිධ ධාරාවන් ඔස්සේ අනිකුත් හැම ක්ෂේත්‍රයකම පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරලා තිබෙනවා.

අද වනකොට මහත් ආන්දෝලනයකට ලක්වෙලා තිබෙන SAITM වෛද්‍ය විද්‍යාලය ගැන ගරු සභාවේ කථා කළා. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමනි, නියමිත ප්‍රමිතියකට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් තීරණය කරන ලකුණු මට්ටමකට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට මේ දරුවන් බඳවා ගැනීම සිදු කළොත්, මේ වනකොටත් අපේ රටට බලපාලා තිබෙන වෛද්‍යවරුන්ගේ හිඟය පියවා ගන්න ඉදිරියේදී අවස්ථාව ලැබේවි කියා මා හිතනවා. මොකද, මේ රටේ ආයෝජනය විය යුතු විශාල මුදල් සම්භාරයක් විදේශ රටවලට ඇදිලා යනවා. මේ දරුවන් විදේශ රටවලට ගිහිල්ලා, වෛද්‍ය විද්‍යාව හදාරලා ඇවිල්ලා, Act 16 කියන විභාගයට පෙනී ඉඳලා, මේ රටේ ලියා පදිංචි වෛද්‍යවරුන් වෙනවා. වෛරය, ක්‍රෝධය නැතිව, මේ දරුවන් නියම ප්‍රමිතියකට, නියම සුදුසුකම් එක්ක වෛද්‍ය විද්‍යාලවලට බඳවා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කළොත් අපේ රටින් පිට රටට යන සල්ලි ටික අපේ රටේම ආයෝජනය කරලා, අපේ රට තුළ නතර කර ගන්න පුළුවන් කියා මා හිතනවා.

[ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට තර්ක විතර්ක ගෙනෙනවා: practical training අඩුයි, clinical training අඩුයි, Community Medicine, Forensic Medicine සඳහා training අඩුයි කියලා. නමුත් මේ රටේ සායනික පුහුණු, ප්‍රායෝගික පුහුණු දෙනවා මා දකිනවා. අපේ රටේ දරුවන් වෙනත් රටවලට - චීනය, ඉන්දියාව, නේපාලය වැනි රටවලට- ගිහිල්ලා, කොයි ආකාරයක ප්‍රමිතිකරණයක් එක්ක මේ විෂයය සම්බන්ධයෙන් සායනික පුහුණු වීම් ලබනවාද කියලා කියන්න අප දන්නේ නැහැ. මා මේ අවස්ථාවේදී ඒ කාරණය ගැනත් අවධානය යොමු කරනවා. ප්‍රමිතිකරණයත් එක්ක වෛද්‍ය විද්‍යාලයට දරුවන් බඳවා ගැනීමට ක්‍රමවේදයක් ගෙනෙන ලෙස අපේ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාට මා යෝජනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Ishak Rahuman. Before he starts, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு மயில்வாகனம் திலகராஜா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. MYLVAGANAM THILAKARAJAH *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.59]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ගැන විනාඩි කිහිපයක් හෝ කථා කරන්න ලැබීම පිළිබඳව මා සතුටු වනවා. ලංකා ඉතිහාසයේ කවදාවත් සිදු වුණේ නැති විධියට මගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 900ක් iRoad project එක යටතේ පාරවල් හදන්න එතුමා ඉදිරිපත්වෙලා සිටිනවා. එම වැඩ කටයුත්ත පටන් ගැනීම පිළිබඳව මට විශාල සතුටක් දැනෙනවා. මා පළමුවෙන්ම එතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

දූෂිතම මහාමාර්ග පද්ධතිය තමයි එතුමාට බාර දීලා තිබුණේ කියලා ඔබ - අපි සියලු දෙනාම දන්නවා. මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් හැටියට ප්‍රේමසිරි කියලා පල් හොරෙක් හිටියා. ඒ වාගේ දූෂිත පාලන කාලයක් තිබුණු අවධියේ තමයි මෙතුමාට මේ අමාත්‍යාංශය බාර දුන්නේ. මෙතුමා දැන් එහි පිරිසිදු පාලනයක් අරගෙන යනවා. මහාමාර්ග අමාත්‍යාංශයේ දැන් සිටින සභාපතිතුමා, ඒ වාගේම ලේකම්තුමා ගරු ඇමතිතුමා යටතේ පසු ගිය අවුරුද්දක කාලය තුළ බොහොම අවංකභාවයෙන් යුතුව කටයුතු කර මහාමාර්ග පද්ධතිය අතින් අපේ රට විශාල සංවර්ධන යුගයකට අරගෙන ගිහිල්ලා තිබෙනවා. අපි සියලු දෙනාම දන්නවා, එදා වැඩ අවසන් කිරීමට අවුරුදු 30ක් යනවාය කිව්ව මහවැලි ව්‍යාපාරය, හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් අවුරුදු පහකින් අවසන් කිරීම සඳහා ගාමිණී දිසානායක මැතිතුමාට භාරදුන් බව. ඒ වාගේම තමයි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ විශාල ප්‍රශ්න තිබියදී දැන් එය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට භාරදී තිබෙනවා. හැමදාම මහ පාරේ හිටපු විශ්වවිද්‍යාල ළමයින්ගේ ප්‍රශ්නවලට ගරු ඇමතිතුමා විසඳුම් ලබාදීලා අද ඒ අයට හොඳ ගමන් මාර්ගයක් හදලා දීලා තිබෙන බව අපට පැහැදිලිවම දකින්න පුළුවන්.

අද විපක්ෂයේ අය SAITM එක ගැන කථා කරනවා. අද අපේ රටේ දරුවන් ලෝකයේ වෙනත් රටවලට ගිහිල්ලා රුපියල් කෝටි 2, 3 වියදම් කරලා ඉගෙන ගන්නවා අපි දකිනවා. ඒ සියලු දෙනාම මුදල් වියදම් කරලා අපේ අල්ලපු රට වන ඉන්දියාව, පාකිස්තානය, මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවල්වලට ගිහිල්ලා ඉගෙනගෙන නැවත ලංකාවට ආවාට පස්සේ විභාගයක් පවත්වලා ඒ අයටත් අපි රැකියා ලබාදෙනවා. ඇයි, අපි ඒ වාගේ දේවල් කරන්නේ? SAITM එක විපක්ෂයේ උදවිය එදා පටන් ගත් දෙයක් වුවත්, "මේවා වැරදි වැඩ, මේවාට ඉඩ දෙන්න එපා" කියලා අද ඒ අයම ළමයි ටික අවුස්සලා යවනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කාගේවත් කීම්වලට යටත් වෙන්න එපා. ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ඔබතුමාට විශාල කර්තව්‍යයක් භාරදීලා තිබෙනවා.

ඉතිහාසයේදී සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර අධ්‍යාපන ඇමතිතුමා මහ පෙරළියක් කළා වාගේ, දැන් සිටින අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් මැතිතුමා Ordinary Levelවලින් එහාට Advanced Level අනිවාර්යයි කියලා ගරු අගමැතිතුමාගේ උපදේශකත්වය අනුව තීරණයක් අරන් තිබෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමනි, ඒ වාගේම ඔබතුමා ඒ ළමයි මහ පාරට බස්සන්නේ නැතුව ඒ සියලුම ළමයින්ට උසස් අධ්‍යාපනය හොඳින් ලබාදෙනවා කියන විශ්වාසය මත ගරු අගමැතිතුමා එම අමාත්‍යාංශය ඔබතුමාට භාරදීලා තිබෙනවා. එවැනි විශාල විශ්වාසයකින් යුතුව ඔබතුමාට මේ අමාත්‍යාංශය භාරදීලා තිබෙනවා. ඔබතුමා දක්ෂයෙක්, ඔබතුමාට බැරි දෙයක් නැහැ. ඔබතුමා අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ පසු ගිය අවුරුද්දක කාලය තුළ මේ අමාත්‍යාංශයේ විශාල වෙනසක් කළා. ඒ නිසා කවුරු මොනවා කිව්වත්, කවුරු විවේචනය කළත් ඔබතුමා ඒවා ගණන් ගන්න එපා. ඉදිරි අවුරුදු 4ම පිටුපස හැරී බලන්නේ නැතුව ඔබතුමා යන ගමන ඉදිරියටම ගිහිල්ලා රටට සහ අධ්‍යාපනයට විශාල සේවයක් කරන්න කියා අප ඉල්ලා සිටිනවා.

ගරු අගමැතිතුමාගේ සංකල්පය අනුව, කවදාවත් නැති විධියට මෙවර අය වැයෙන් දළ දේශීය නිෂ්පාදනයෙන් අධ්‍යාපනය සඳහා සියයට 6ක් වෙන්කරලා තිබෙනවා. සමස්ත රටම දන්නවා, වෙනත් අමාත්‍යාංශවලට වඩා වැඩියෙන්, අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වෙන් කළේ "අධ්‍යාපනය නැතුව ලෝකයක් නැහැ" කියලා ගරු අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් දන්නා නිසායි කියලා. ඒ නිසා තමයි සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කළේ. ඉගෙනගත් අයට තමයි මුළු ලෝකයේම ඇවිදලා හැම දෙයක්ම කරගන්න පුළුවන් වෙන්නේ. ඉගෙන ගත්තේ නැති අයට කිසි දෙයක් කරගන්න බැහැ. පසු ගිය

රජය කාලයේ මොනවාද කළේ? අධ්‍යාපනය වෙනුවෙන් මුදල් වෙන් කළාද? සොච්චම් මුදලක් තමයි වෙන් කළේ. ඒකට හේතුව මොකක්ද? ඉගෙන ගත්තේ නැති කණ්ඩායමක් සිටියොත් තමන්ට හැමදාම රට පාලනය කරගෙන ඉන්න පුළුවන් කියලා ඔවුන් හිතුවා. ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ඒ විධියට කටයුතු කරන්න ගියේ නැහැ. ඔවුන් මොනවාද කළේ? අධ්‍යාපනය මේ ලෝකයටම හොඳ දෙයක් කියලා, සමස්ත ලංකාවටම අධ්‍යාපනය දීලා, මේ රට සිංගප්පූරුව වාගේ, ඇමෙරිකාව වාගේ, England වාගේ උසස් මට්ටමට ගෙනැල්ලා, අපේ රටත් ඉහළම අධ්‍යාපනයක් තිබෙන රටක් කියලා හඳුන්වාදෙන්න තමයි ඔවුන් උත්සාහ කරන්නේ. අද අපේ තරුණයන් පිට රටවලට ගිහිල්ලා කම්කරුවන් වශයෙන් වැඩ කරනවා. එහෙම නැතුව, ලංකාවේ සිටින ආදරණීය දරුවන්ට ලක්ෂ දෙකේ, තුනේ පඩියක් ලැබෙන රැකියාවක් ලබාදෙන්න කටයුතු කරන්න ඕනෑ කියලා තමයි ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ඒ විධියට කටයුතු කරලා තිබෙන්නේ.

